

චිරන්තන

සමාජික විද්‍යුත්
ඓතිහාසික අධ්‍යයන සඟරාව

වෙළුම III කලාපය II



චිරන්තන

සමාසික විද්‍යුත් ඓතිහාසික අධ්‍යයන සඟරාව

2026 පෙබරවාරි

වෙළුම III කලාපය I

ප්‍රධාන සංස්කාරක

ආචාර්ය ධම්මිකා කුමාරි මනතුංග

සංස්කාරක

කවීශා නානායක්කාර

එම්. ජේ. යූ. මෙරින්නගේ

මේධාවී මනතුංග

චිරන්තන - සමාජික විද්‍යුත් ඓතිහාසික අධ්‍යයන සඟරාව - වෙළුම III කලාපය I

2026 පෙබරවාරි

ප්‍රකාශනය : ඊ. එම්. අයි. පී. ඒකනායක
74 A 51, සෙන්ට්‍රල් ගාර්ඩන්ස්, රද්දොළුගම.

සමාරම්භක කතෘ සහ ප්‍රධාන උපදේශක : මහාචාර්ය අනුර මනතුංග

ISSN : ISSN 3030-7368

Barcode : 9 773030 736003

පිට කවරය සැකසුම - කවීශා නානායක්කාර

පරිගණක පිටු සැකසුම - කවීශා නානායක්කාර

සෝදුපත් පරීක්ෂාව - එම්. ජේ. යූ. මෙරින්නගේ

මෙය සමියුරු ප්‍රතිනිරීක්ෂිත **(Peer-reviewed)** සඟරාවකි.

කවරයේ ඡායාරූපය - අබු සිම්බල් දේවස්ථානය (The temples of Abu Simbel)

අබු සිම්බල් යනු පුරාණ ඊජිප්තුවේ වැදගත්ම පුරාවිද්‍යාත්මක ස්මාරකවලින් එකක් වන අතර එය ක්‍රි.පූ. 13 වන සියවසේදී II වන පාරාවෝ රැම්සෙස් විසින් වසර 3,200 කට පමණ පෙර ඉදිකරන ලද්දකි. මෙම ස්ථානයේ දැවැන්ත ප්‍රතිමා, ආකර්ෂණීය ගෘහ නිර්මාණ ශිල්පය, ආගමික වැදගත්කම සහ II වන රැම්සෙස්ගේ බලය පෙන්නුම් කරන දේශපාලන සංකේතවාදය සඳහා ප්‍රසිද්ධ, දැවැන්ත පර්වත කපා සකස්කරන ලද දේවාල දෙකක් ඇතුළත් වේ. එය පුරාණ ඊජිප්තු ඉංජිනේරු විද්‍යාවේ කැපී පෙනෙන උදාහරණයක් ද වන අතර 1960 ගණන්වල අස්වාන් වේල්ල නිසා ඇති වූ ගංවතුරෙන් අබු සිම්බල් බේරා ගැනීම සඳහා යුනෙස්කෝව විසින්, එහි ස්ථානගත කිරීම වෙනස් කිරීමේ කටයුතු මෙහෙයවූ විට ගෝලීය වශයෙන් ප්‍රසිද්ධ විය.

මෙම සඟරාවෙහි ඇතුලත් ලිපි පිටපත් කිරීම නැවත ප්‍රකාශයට පත්කිරීම, ඡායාරූපගත කිරීම හෝ කිසියම් ආකාරයකින් අනවසරයෙන් උපුටාගැනීම නොකළ යුතු අතර, දෘශ්‍යාබාධිත පුද්ගලයන්ගේ භාවිතය සඳහා ඔවුන්ටම විශේෂිත ක්‍රමයකට පිටපත් කිරීමට චිරන්තන අපගේ විශේෂ අනුග්‍රහය ලැබෙනු ඇත.

මෙම සඟරාව මඟින් ප්‍රකාශයට පත් කර ඇති පත්‍රිකාවන්හි අයිතිය සහ වගකීම ඒ ඒ ලේඛකයන් සතු වන අතර, ඒවායේ අන්තර්ගතය සම්බන්ධයෙන් වගකීමක් චිරන්තන කාර්යමණ්ඩලයට නොමැත.

ප්‍රධාන උපදේශකතුමන්ගේ පණිවුඩය



1996 දී ආරම්භ කරනු ලැබූ චිරන්තන සඟරාව දශක කීපයකට පසුව විද්‍යුත් ප්‍රකාශනයක් ලෙස නැවත ආරම්භ කිරීමට හැකිවීම සතුටට කරුණකි. පුරාවිද්‍යාව, ඉතිහාසය සහ මානවවිද්‍යාවට ප්‍රමුඛත්වය දෙමින් මානවශාස්ත්‍ර සහ සමාජයීය විද්‍යාවන් සඳහා වන බහුවිෂයික ශාස්ත්‍රීය ප්‍රකාශනයක් ලෙස එය වර්ධනය වනු දැකීම අපේ අපේක්ෂාවය. පරිනත මෙන්ම ආධුනික විද්වතුන් සඳහා තම පර්යේෂණ එළි දැක්වීමට චිරන්තන සඟරාව විවෘතය. අතීතය පිළිබඳව සාධක මත පදනම් වූ නව අර්ථකථන, නව සොයාගැනීම් සහ විශ්ලේෂණ ප්‍රකාශයට පත්කිරීම අපේ අපේක්ෂාවයි. එමෙන්ම සිංහල භාෂාවෙන් ලියවී නොමැති හෝ සිංහල පාඨකයන් සඳහා අවශ්‍යයැයි හැඟෙන විදේශීය භාෂාවන්ගෙන් ප්‍රකාශිත ලිපිවල පරිවර්තන හෝ සමෝධයන ලිපි මෙහි පළ කිරීමට ද සංස්කාරකවරුන් කටයුතු කරනු ඇත. වර්ෂ ගණනාවකට පෙර ලියන ලද, දුර්ලභ ලිපි, වාර්තා සහ වෙනත් ලේඛන නැවත ප්‍රකාශයට පත්කිරීම මඟින් පාඨකයන්ට ඒවා හඳුන්වාදීමටත් ප්‍රතිනිර්මාණ ලෙස එම දුර්ලභ ලේඛන ආරක්ෂා කරගැනීමටත් අපි බලාපොරොත්තු වෙමු. විශේෂයෙන් පුස්කොළ ලේඛන සහ අත්පිටපත් කෙරේ අපගේ විශේෂ අවධානය යොමුවනු ඇත.

චිරන්තන සඟරාවට පෙරදී ලිපි ලියූ ආධුනික ලේඛකයන් මෙන්ම එහි මුල් සංස්කාරකවරුන් ද දැන් ශාස්ත්‍රඥයන් ලෙස ඉහළ පිළිගැනීමක් ලබා තිබීම සතුටට කරුණකි. වත්මන් සංස්කාරකවරුන් ද, ලේඛකයන් ද එලෙස අනාගතයේ දී සම්භාවනාවට පාත්‍රවනු දැකීම එහි සමාරම්භකයා වශයෙන් මගේ අපේක්ෂාවය.

මහාචාර්ය අනුර මනතුංග
ජ්‍යෙෂ්ඨ මහාචාර්ය/පුරාවිද්‍යා අධ්‍යයනාංශය
කැලණිය විශ්වවිද්‍යාලය

ප්‍රධාන සංස්කාරකතුමියගේ පණිවුඩය



චිරන්තන ඓතිහාසික අධ්‍යයන සඟරාවේ ආරම්භය දශක තුනකට ආසන්න කාලයක් දක්වා ඈතට දිවයයි. මෙහි මුල්ම සඟරාව ප්‍රකාශයට පත් වූයේ 1996 වර්ෂයේ දී ය. විශ්වවිද්‍යාල විද්‍යාර්ථීන්, ආචාර්යවරුන් සහ වෙනත් විවිධ ක්ෂේත්‍රයන්හි පර්යේෂකයන්ට සිය පර්යේෂණ එළි දැක්වීම සඳහා චිරන්තන සඟරාව මහඟු පිටිවහලක් විය.

පසුගිය කාලවකවානුවේ රට තුළ හටගත් කොවිඩ් වසංගතය ඇතුළු අර්බුදකාරී වාතාවරණය චිරන්තන සඟරාව අඛණ්ඩව පවත්වාගෙන යාමට බාධාකාරී තත්වයන් උදා කළත් නැවත එය සක්‍රියව පවත්වාගෙන යාමට හැකිවීම සතුටට කරුණකි.

නැවත විද්‍යුත් මාධ්‍යයෙන් චිරන්තන සඟරාව එළි දැක්වීමේ කටයුතු සඳහා මූලාරම්භය ගත් මහාචාර්ය අනුර මනතුංග මහතාට මාගේ ගෞරවනීය ස්තුතිය පිරිනමමි. ප්‍රථම සඟරාවේ මා සමඟ සංස්කාරක ධූරයේ කටයුතු කළ ඉන්දිකා බුලන්කුලමෙ මහත්මිය ද සිහිපත් කරනු කැමැත්තෙමි. නව විද්‍යුත් සඟරාවේ සංස්කාරකවරුන් වන කවීශා නානායක්කාර, එම්. ජේ. යූ. මෙරින්නගේ හා මේධාවී මනතුංග මෙනවියන්ට ද මාගේ ස්තුතිය පිරිනමමි. චිරන්තන සඟරාවේ පත්‍රිකා විමර්ශණ මණ්ඩලය දක්වන ලද සහයෝගයට ද මාගේ ගෞරවනීය ස්තුතිය පිරිනමමි.

ආචාර්ය ධම්මිකා කුමාරි මනතුංග
අංශ ප්‍රධාන,
ඉතිහාස අධ්‍යයනාංශය
කැලණිය විශ්වවිද්‍යාලය

සංස්කාරකතුමියගේ පණිවුඩය



චිරන්තන විද්‍යුත් ඓතිහාසික අධ්‍යයන සඟරාවෙහි සංස්කාරකවරියක් ලෙසින් මාගේ දායකත්වය ලබා දීමට හැකි වීම පිළිබඳව මා අතිශයින් සතුටට පත් වෙමි. විශ්වවිද්‍යාල විද්‍යාර්ථීන්ට සහ ආදි විද්‍යාර්ථීන්ටත්, ආචාර්යවරුන්ට සහ වෙනත් ආයතනගත පර්යේෂකයන්ටත් සිංහල භාෂාවෙන් පර්යේෂණ පත්‍රිකා එළි දැක්වීමට චිරන්තන සඟරාව මහඟු අවස්ථාවක් ලෙස මම දකිමි.

සංස්කාරකවරියක ලෙසින් කටයුතු කිරීමට මා හට අවස්ථාව ලබාදුන් මහාචාර්ය අනුර මනතුංග මහතාට මාගේ ගෞරවනීය ස්තුතිය පිරිනමමි. ප්‍රධාන සංස්කාරක, ආචාර්ය ධම්මිකා මනතුංග මැතිණියට සහ සම සංස්කාරක එම්. ජේ. ඒ. මෙරින්නගේ සහ මේධාවී මනතුංග මෙනවියන්ද සිහිපත් කරමි. චිරන්තන සඟරාව එළි දැක්වීමේ කාර්යය සඳහා විශාල දායකත්වයක් ලබා දුන් පත්‍රිකා විමර්ශණ මණ්ඩලයේ ආචාර්යවරුන්ට සහ කථිකාචාර්යවරුන්ට මාගේ ගෞරවනීය ස්තුතිය පිරිනමමි. චිරන්තන සඟරාව සඳහා ලිපි ඉදිරිපත් කළ සියළු දෙනාට මාගේ ස්තුතිය පිරිනමන අතර, අවසන් වටයේ තෝරාගැනීම් අනුව ලිපි ප්‍රකාශයට පත් වන කතෘවරුන්ට මාගේ සුභ පැතුම් එක්කරමි.

ගුණාත්මක නව දැනුම උත්පාදන කාර්යය සඳහා චිරන්තන විද්‍යුත් ඓතිහාසික අධ්‍යයන සඟරාව ඉදිරියටත් සාර්ථකව පවත්වාගෙන යාමට හැකියාව ලැබේවා යි මම ප්‍රාර්ථනා කරමි.

කවීශා නානායක්කාර
පුරාවිද්‍යාව, පුරාණ ඉතිහාසය සහ සංරක්ෂණ අධ්‍යයනාංශය
උප්සාලා විශ්වවිද්‍යාලය
ස්වීඩනය

ප්‍රධාන සංස්කාරක

ආචාර්ය ධම්මිකා කුමාරි මනතුංග, අංශ ප්‍රධාන, ඉතිහාසය අධ්‍යයනාංශය, කැලණිය විශ්වවිද්‍යාලය

සංස්කාරක

කවීශා නානායක්කාර, පුරාවිද්‍යාව, පුරාණ ඉතිහාසය සහ සංරක්ෂණ අධ්‍යයනාංශය, උප්සාලා විශ්වවිද්‍යාලය, ස්වීඩනය

එම්. ජේ. යූ. මෙරින්නගේ, පුරාවිද්‍යා අධ්‍යයනාංශය, නාලන්දා විශ්වවිද්‍යාලය, බිහාර්, ඉන්දියාව

මේධාවී මනතුංග, ලයිසියම් ජාත්‍යන්තර පාසල, වත්තල

උපදේශණ මණ්ඩලය

ප්‍රධාන උපදේශක - ජ්‍යෙෂ්ඨ මහාචාර්ය අනුර මනතුංග, පුරාවිද්‍යා අධ්‍යයනාංශය, කැලණිය විශ්වවිද්‍යාලය

සම්මානිත මහාචාර්ය ඒ.ඒ.ඩී. අමරසේකර, පුරාවිද්‍යා අධ්‍යයනාංශය, කැලණිය විශ්වවිද්‍යාලය

ජ්‍යෙෂ්ඨ මහාචාර්ය එම්.කේ. වීරසිංහ, පුස්තකාල හා විඥාපන විද්‍යා අධ්‍යයනාංශය, කැලණිය විශ්වවිද්‍යාලය

ජ්‍යෙෂ්ඨ මහාචාර්ය ඩබ්.ඒ. වීරසූරිය, පුස්තකාල හා විඥාපන විද්‍යා අධ්‍යයනාංශය, කැලණිය විශ්වවිද්‍යාලය

ආචාර්ය සෙනරත් දිසානායක, පුරාවිද්‍යා අධ්‍යයනාංශය, කැලණිය විශ්වවිද්‍යාලය

ආචාර්ය ඉන්දිකා බුලන්කුලමෙ, ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය

ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය නදීකා රත්නබාහු, පුස්තකාල හා විඥාපන විද්‍යා අධ්‍යයනාංශය, කැලණිය විශ්වවිද්‍යාලය

පත්‍රිකා විමර්ශන මණ්ඩලය

ජ්‍යෙෂ්ඨ මහාචාර්ය අනුර මනතුංග, පුරාවිද්‍යා අධ්‍යයනාංශය, කැලණිය විශ්වවිද්‍යාලය

ජ්‍යෙෂ්ඨ මහාචාර්ය එච්.ඩබ්. බිහේෂ් ඉන්දික සම්පත්, අංශ ප්‍රධාන, සිංහල අධ්‍යයනාංශය, කැලණිය විශ්වවිද්‍යාලය

ආචාර්ය ධම්මිකා කුමාරි මනතුංග, අංශ ප්‍රධාන, ඉතිහාසය අධ්‍යයනාංශය, කැලණිය විශ්වවිද්‍යාලය

ආචාර්ය සීවලී බණ්ඩාර මනතුංග, ඉතිහාස හා පුරාවිද්‍යා අධ්‍යයනාංශය, රුහුණ විශ්වවිද්‍යාලය

ආචාර්ය අංජලී වික්‍රමසිංහ, සිංහල අධ්‍යයනාංශය, කැලණිය විශ්වවිද්‍යාලය

ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය නිලන්ති බණ්ඩාර, පුරාවිද්‍යා අධ්‍යයනාංශය, කැලණිය විශ්වවිද්‍යාලය

කවීශා නානායක්කාර, පුරාවිද්‍යාව, පුරාණ ඉතිහාසය සහ සංරක්ෂණ අධ්‍යයනාංශය, උප්සාලා විශ්වවිද්‍යාලය, ස්වීඩනය

සම්බන්ධීකරණ කටයුතු

එම්. ජේ. යූ. මෙරින්නගේ, පුරාවිද්‍යා අධ්‍යයනාංශය, නාලන්දා විශ්වවිද්‍යාලය, බිහාර්, ඉන්දියාව

පටුන

පිටු අංක

1. බුදුදහමේ ස්ථාවරත්වය සඳහා රජයේ සහභාගීත්වය පිළිබඳ අධ්‍යයනයක් (අනුරාධපුර පස්වන කාශ්‍යප පුවරු ලිපිය ඇසුරෙන්) - ජේ‍ය. මහාචාර්ය දිවාකර අනුරින් ඉන්දිකා, පී.ඒ.එස්.එස්. කෞෂල්‍යා ..... 01 - 09

2. අනුරාධපුර යුගයේ සිංහල ගී කාව්‍ය හා ගේය කාව්‍ය සම්ප්‍රදාය පිළිබඳ විමර්ශනයක් - ආචාර්ය එෂාන් ඉමල්ක විජේරත්න..... 10 - 24

3. දඹුල්ල ලෙන් විහාරය ආශ්‍රිත ප්‍රතිමා මඟින් පිළිබිඹු වන පෙරදිග සෞන්දර්යාත්මක ලක්ෂණ ; භරතමුණිගේ රස සංකල්පය ඇසුරෙන් - චතුමි සෙව්වන්දි කලහෙ පරණවිතාන..... 25 - 32

4. මාලගොඩ පුරාණ රජමහා විහාරයේ පැරණි නටබුන් සහ ප්‍රතිමා ගෘහයේ සිතුවම් පිළිබඳව විමර්ශනයක් - බී.එම්.රුවන් ප්‍රභාත් බස්නායක ..... 33 - 51

5. දළදා වහන්සේගේ ඉතිහාසය සහ ශ්‍රී ලාංකේය දේශපාලන ව්‍යුහය සකස් කිරීමෙහි ලා දළදා වහන්සේගේ දායකත්වය (කෝට්ටේ රාජධානිය දක්වා) - එච්. එන්. ඒ. කුමාරි..... 52 - 71

6. අනුරාධපුර යුගයේ ආරාමික රෝහල් පද්ධතිය තුළ පැවති සනීපාරක්ෂක හා අපද්‍රව්‍ය කළමනාකරණ තාක්ෂණය පිළිබඳ අධ්‍යයනයක් - ආර්. එම්. නිමේෂා සුරංජී..... 72 - 78

7. පැරණි රෝහණය සම්බන්ධ මැතකාලීන පුරාවිද්‍යාත්මක පර්යේෂණ පිළිබඳව විමර්ශනාත්මක අධ්‍යයනයක් - කේ.ඩබ්. වරුෂි සචින්තිකා සිල්වා..... 79 - 87

8. හස්එබූ කහාපණ කාසි හා එහි දක්නට ඇති සංකේතයන්හි සංස්කෘතික පසුබිම පිළිබඳව අධ්‍යයනයක් - එච්. එම්. යසංග ප්‍රවීන් වික්‍රමසිංහ, කේ. සඳුනි අප්සරා කෝට්ටගේ..... 88 - 113

බුදුදහමේ ස්ථාවරත්වය සඳහා රජයේ සහභාගීත්වය පිළිබඳ අධ්‍යයනයක් (අනුරාධපුර පස්වන කාශ්‍යප පුවරු ලිපිය ඇසුරෙන්)

ජ්‍යෙ. මහාචාර්ය දිවාකර අනුරින් ඉන්දිකා, සහකාර කථිකාචාර්ය කෞෂල්‍යා පී.ඒ.එස්.එස්.

[1]anurin@kln.ac.lk, [2]passkaushalya@gmail.com
[1]සිංහල අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය.
[2]සිංහල අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය.

සාරසංක්ෂේපය

ලෙන්ලිපි, ටැම්ලිපි, ගිරිලිපි, පුවරු ලිපි වශයෙන් ප්‍රභේද කිහිපයකි. බුදුදහමේ ස්ථාවරත්වය සඳහා රාජ්‍ය මැදිහත්වීම පිළිබඳ තොරතුරු අධ්‍යයනයේ දී අනුරාධපුර පස්වන කාශ්‍යප පුවරු ලිපිය පුරාවිද්‍යාත්මක මූලාශ්‍රයක් ලෙස වැදගත් වේ. මුල්කාලීන සෙල්ලිපිවල සඳහන්, බෞද්ධ විහාරස්ථාන කළමනාකරණය පිළිබඳ තොරතුරුවලට සාපේක්ෂව වැඩි ගිය යම් වෙනසක් පශ්චාත් බ්‍රාහ්මී අවධියේ දී හඳුනාගත හැකිවේ. එහි දී කාශ්‍යප පුවරු ලිපිය විශේෂ වේ. ජේතවනාරාම සංස්කෘත සෙල්ලිපියෙන් හෙළිවන විහාරස්ථාන කළමනාකරණයට රජයේ මැදිහත්වීම පිළිබඳ තොරතුරුවලට සාපේක්ෂ තොරතුරු රැසක් අනුරාධපුර පස්වන කාශ්‍යප පුවරු ලිපියෙන් හෙළි වේ. එකල පරිහානියට පත් වෙමින් පැවැති බුදුදහම ස්ථාවර කිරීමට බෞද්ධ විහාර පරිපාලන කටයුතු සඳහා රාජ්‍ය මැදිහත්වීම සිදු වී ඇත්තේ කෙසේද යන්න පිළිබඳ විමසීම මෙහි අරමුණ වේ. පරිහානියට පත් ව තිබූ බෞද්ධ විහාරස්ථාන කළමනාකරණයට රජය පනවන ලද නෛතික රීති එම විහාරස්ථානවල ස්වාධීනත්වයට සිදුකර ඇති බලපෑම සහ එයින් ශාසන ස්ථාවරත්වයට කෙබඳු බලපෑමක් සිදු වී තිබේද යන්න පිළිබඳ විමසීම පර්යේෂණ ගැටලුව වේ. මුඛ්‍ය මූලාශ්‍රය වශයෙන් Epigraphia Zeylanica Vol. I උපයෝගී කර ගන්නා ලදි. ගුණාත්මක පර්යේෂණ ක්‍රමවේදය යටතේ පුස්තකාල නිරීක්ෂණය යටතේ ග්‍රන්ථ පරිශීලනය, ශාස්ත්‍රීය ලිපි, පර්යේෂණ නිබන්ධන ආශ්‍රය කෙරිණි. බුදුදහමේ ස්ථාවරත්වය රඳවා ගැනීමට එයට මූලික වන භෞතික පරිසරය කළමනාකරණය කළ යුතු වේ. විහාරස්ථාන ඉදි කිරීම සහ ඒවා නඩත්තු කිරීමත්, පවත්වාගෙන යෑමට ගොඩනගා ඇති නෛතික රාමුව මෙන් ම භික්ෂූන් වහන්සේලා සම්බන්ධ විනය කටයුතු පනවා තිබීමත් මෙහිදී අධ්‍යයනය කළ හැකිවේ. එසේ ම වර්තමාන සමාජයට ආදර්ශයක් සපයන්නට මෙන් ම සාහිත්‍ය මූලාශ්‍රයවල පවතින තොරතුරුවල නිරවද්‍යතාව වඩාත් තහවුරු කරගන්නට, එකල සමාජ ස්වරූපය පැහැදිලි කරගන්නට ද මෙම පුවරු ලිපිය උපකාරී වන බව නිගමනය කළ හැකි වේ.

ප්‍රමුඛ පද : අනුරාධපුර, කළමනාකරණය, කාශ්‍යප පුවරු ලිපිය, විහාරස්ථාන, සෙල්ලිපි.

හැඳින්වීම

සෙල්ලිපි, ඉතිහාසය ගොඩනැඟීමේ දී විශ්වසනීය සහ නිරවද්‍ය කරුණු සපයාගත හැකි මූලාශ්‍රයක් ලෙස යොදා ගැනේ. භාෂාව හා අක්ෂර පරිණාමය, කාලවකවානුව නිශ්චය කිරීම, එවකට පැවැති සමාජ, දේශපාලන, ආර්ථික, සංස්කෘතික, ආගමික තොරතුරු අනාවරණය කර ගැනීම, මූලාශ්‍රයවල සත්‍යතාව තහවුරු කර ගැනීම, විදේශ සබඳතා සහ ඒවායේ බලපෑම තහවුරු කර ගැනීමට හැකි වීම යන්නෙන් සෙල්ලිපිවල වටිනාකම හඳුනාගත හැකිවේ. මුල්කාලීන සෙල්ලිපි පිළිබඳ අධ්‍යයනයේ දී විහාරාරාම කරවා පූජා කිරීම, ඒවායේ නඩත්තුව සඳහා කෙත්වතු, වතුපිටි පූජා කිරීම, මුදල් ආදිය පිදීම වැනි කරුණු අන්තර්ගත ය. අනුරාධපුර පස්වන කාශ්‍යප පුවරු ලිපිය මෙලෙස හඳුනාගත හැකි එක් සෙල්ලිපියකි.

කාශ්‍යප පුවරු ලිපිය රචනා කර ඇත්තේ පස්වන කාශ්‍යප රජතුමා යැයි පිළිගැනේ. අනුරාධපුර ජේතවනය අසල ගල්කඳු අතර රත්න ප්‍රාසාදයට ආසන්න ගල් වියන නම් ප්‍රදේශයෙන් හමුවන මෙය උස අඩි පහයි අඟල් හතරක් පමණ ද, පළල අඩි තුනයි අඟල් තුනක් පමණ ද වේ (අමරවංශ,1969). මෙහි පේළි හයකි. සිවුරැස් රාමුවක් සේ මනාව සකස් කළ ගල් පුවරුවක කොටා තිබේ. එයට පූර්වයේ එන ජේතවනාරාම සංස්කෘත ලිපියෙන් හෙළිවන බුදු දහමේ ස්ථාවරත්වයට රජයේ මැදිහත්වීම පිළිබඳ

තොරතුරුවලට සාපේක්ෂව ප්‍රාමාණික තොරතුරු රැසක් අනුරාධපුර පස්වන කාශ්‍යප පුවරු ලිපියෙන් හෙළි වේ. සෙල්ලිපි වර්ගීකරණය අනුව මෙය පශ්චාත් බ්‍රාහ්මී අවධියට අයත් ය. එනම් ක්‍රිස්තු වර්ෂ දහවන ශතකයට අයත් ය (අමරවංශ,1969).

එකල පරිහානියට පත් වෙමින් පැවැති බුදුදහම ස්ථාවර කිරීමට බෞද්ධ විහාර පරිපාලන කටයුතු සඳහා රාජ්‍ය මැදිහත්වීම සිදුවී ඇත්තේ කෙසේද යන අරමුණ පිළිබඳ විමසීමේ දී සනාථ වන්නේ, බුදු දහමේ ස්ථාවරත්වය පවත්වා ගැනීමට එකල පැවැති රාජ්‍ය පරිපාලනය ප්‍රජාතන්ත්‍රවාදීව යහපත් බලපෑමක් සිදු කර ඇති බව ය. රාජ්‍යයේ මධ්‍යස්ථ මැදිහත්වීම විහාරස්ථානයේ ස්වාධීනත්වය සුරක්ෂිත වීමට ඉවහල් වී ඇති අතර භික්ෂූන් වහන්සේලාගේ විනය පද්ධතිය තර වීමත් ලාභ ප්‍රයෝජන තකා සිදුවිය හැකි යම් ශාසන විරෝධී ක්‍රියාවන් පාලනය කිරීමට ද ඉවහල් වී ඇත. එය එකල දේශපාලන ක්‍රමයේ සංවර්ධනයට ද මහත් පිටිවහලක් වී ඇත. සංක්‍රමණ-ආක්‍රමණ පැවැති වකවානුවක සිදුවිය හැකි ශාසන පරිහානිය වළක්වා ගැනීමට මෙලෙස රාජ්‍යයේ මැදිහත්වීම යම් සාධනීය තත්ත්වයක් නිරූපණය කරයි.

රජය බුදුදහමේ ස්ථාවරත්වය පවත්වා ගැනීමට, බෞද්ධ විහාරස්ථාන කළමනාකරණය කිරීම කෙරෙහි අවධානය යොමු කිරීමේ ස්වරූපය කෙබඳු ද යන්න අනාවරණය කෙරෙන මෙම ලිපියෙන් එවකට පාලන තන්ත්‍රය හා ශාසනය අතර පැවැති සබඳතාවේ ස්වරූපය, බෞද්ධ විහාරස්ථානවල පැවැති තත්ත්වය, භික්ෂු ප්‍රජාව සම්බන්ධ ව පැවැති විනය නීතිරීති, විහාර අභ්‍යන්තර පාලනයෙහි ලා රාජ්‍ය මැදිහත්වීමේ ස්වරූපය යනාදී තොරතුරු මෙන් ම නීතියේ විනිවිද බව සහ ප්‍රජාතන්ත්‍රවාදී බව, පාලකයාගේ යුක්තිගරුක බව, පාලකයා සහ පාලිතයා අතර පැවැති සම්බන්ධය, පාලකයා තම තනතුර සම්බන්ධව දරන වගකීම සහ වගවීමේ ස්වරූපය, ජනතා අයිතිවාසිකම් සුරක්ෂිත කිරීම, රාජ්‍ය නිලධාරීන්ගේ කාර්යය භාරය සහ එය ව්‍යූහගත කොට ඇති ආකාරය, බලයේ විනිවිද බව සහ එය බෙදා දැක්වීම, ගිහි පැවිදි දණ්ඩන ක්‍රමයේ පැවැති ප්‍රජාතන්ත්‍රවාදී බව සහ මානුෂීය බව යනාදී තොරතුරු හෙළිදරව් කරගත හැකි ය. එසේ ම එකල රාජ්‍ය පාලන ප්‍රතිපත්ති සහ දේශපාලන රාමුව වර්තමාන සමාජයට යෝග්‍ය දැයි විමසා බැලීමට සහ අවබෝධ කර ගැනීමට මෙහි ලා අවස්ථාව උදා වේ.

පර්යේෂණ ගැටලුව සහ අරමුණ

එකල පරිහානියට පත් වෙමින් පැවැති බුදුදහම ස්ථාවර කිරීමට බෞද්ධ විහාර පරිපාලන කටයුතු සඳහා රාජ්‍ය මැදිහත්වීම සිදු වී ඇත්තේ කෙසේද යන්න පිළිබඳ විමසීම මෙහි අරමුණ වේ. පරිහානියට පත් ව තිබූ බෞද්ධ විහාරස්ථාන කළමනාකරණයට රජය පනවන ලද නෛතික රීති එම විහාරස්ථානවල ස්වාධීනත්වයට සිදුකර ඇති බලපෑම සහ එයින් ශාසන ස්ථාවරත්වයට කෙබඳු බලපෑමක් සිදු වී තිබේද යන්න පිළිබඳ විමසීම පර්යේෂණ ගැටලුව වේ.

පර්යේෂණ ක්‍රමවේදය

ගුණාත්මක පර්යේෂණ ක්‍රමවේදය යටතේ පුස්තකාල නිරීක්ෂණය සහ ශාස්ත්‍රීය ලිපි, සඟරා, පර්යේෂණ නිබන්ධන ද ආශ්‍රය කර ගන්නා ලදි. මෙම පර්යේෂණයට අවශ්‍ය තොරතුරු සම්පාදනය කර ගැනීම පිණිස මුඛ්‍ය මූලාශ්‍රය වශයෙන් Epigraphia Zeylanica Vol. I උපයෝගී කර ගැණිනි. මෙයට අමතර ව තොරතුරු සම්පාදනය කර ගැනීම උදෙසා මෙම පර්යේෂණය ආශ්‍රිත සෙසු ලිපි ලේඛන ද්විතියික මූලාශ්‍රය ලෙස උපයෝගී කරගනු ලැබුවා සේ ම සංසන්දනාත්මක අධ්‍යයනයෙහි ලා අනුරාධපුර යුගයේ තොරතුරු අන්තර්ගත ග්‍රන්ථ ද පරිහරණයට උපයෝගී කර ගන්නා ලදි.

ප්‍රතිඵල හා සාකච්ඡාව

පුරාවිද්‍යාත්මක මූලාශ්‍රයක් වන කාශ්‍යප පුවරු ලිපිය, ලාංකේය සමාජය අතීතයේ පැවැතියේ කෙසේද යන්නෙන් වටිනා තොරතුරු රැසක් හෙළිදරව් කරන්නෙකි. ඕනෑම දේශයක සමාජ, සංස්කෘතික,

ආර්ථික යනාදී සෑම පැතිකඩක් ම තීරණය වනුයේ එම රටේ පවතින පාලන යාන්ත්‍රණයේ ස්වරූපය අනුව බැව් මෙතෙක් ඉතිහාසගත තොරතුරු ආශ්‍රයෙන් විවරණය වේ. කාශ්‍යප පුවරු ලිපිය ලියැවෙන අවධිය වන විට එකල පැවැති සමාජ තත්ත්වය බුදුදහම කෙරෙහි යම් අනාරක්ෂිත තත්ත්වයක් මතු කොට තිබූ බැව් නිරීක්ෂණය වන්නෙකි. එහිලා යළි බුදුදහම නඟා සිටුවීමටත් මෙන් ම ස්ථාවරත්වය රඳවා ගැනීමටත් අවශ්‍ය රාජ්‍ය නීතිරීති මෙම සෙල්ලිපිය ආශ්‍රයෙන් ව්‍යුහගත කොට ඇති බැව් නිරීක්ෂණය වේ. බෞද්ධ විහාරස්ථාන කළමනාකරණය කිරීමට සහ බෞද්ධ විහාරවල පරිපාලනය මෙන් ම විනය කටයුතු සඳහා ද රාජ්‍ය මැදිහත්වීම පිළිබඳ කරුණු මෙම ලිපියේ අන්තර්ගත කොට ඇත. එයට පූර්වයේ ලියැවුණු එනම්, පූර්ව බ්‍රාහ්මී සහ අපර බ්‍රාහ්මී යුගවල ලියැවුණු සෙල්ලිපිවලින් එලෙස දීර්ඝ තොරතුරු අනාවරණය නො වේ.

කළමනාකරණය යනුවෙන් අදහස් කරන්නේ, 'කළ මනා දේ මනා ලෙස පාලනය කිරීම යි' (කළුආරච්චි,2003). සරල ව ගතහොත් සංවිධිතව කටයුතු කිරීම යි. එනම් ඕනෑම ආයතනයකින් අරමුණු හෝ පරමාර්ථ සාක්ෂාත් කර ගැනීම පිණිස මානව හා භෞතික සම්පත් මනා ලෙස ප්‍රයෝජනයට ගැනීම යි. කාශ්‍යප පුවරු ලිපියේ ද එවකට රාජ්‍ය පාලකයා පොදු අරමුණක් සාර්ථක ලෙස මුදුන් පමුණුවා ගැනීමට ශ්‍රමය, කාලය, ධනය, මනුෂ්‍යය සම්පත් අපතේ නොයවා උපරිම ප්‍රයෝජනයට ගැනීම උදෙසා මනා ලෙස සංවිධානාත්මක ව සකසමින්, හසුරුවමින් ප්‍රශස්ත මැදිහත් වීමක් සිදු කර ඇති බැව් නිරීක්ෂණය වේ. එහිදී,

මානව සම්පත් කළමනාකරණය

ආයතනික මූල්‍ය කළමනාකරණය

දේපළ හා පරිසර කළමනාකරණය

යන්නෙන් බුදුදහමේ ස්ථාවරත්වය රඳවා ගැනීමට මෙම බෞද්ධ විහාරස්ථාන කළමනාකරණය කිරීමට රජය මැදිහත් වී ඇති ආකාරය අධ්‍යයනය කළ හැකි ය.

විහාර අභ්‍යන්තර පාලනයේ දී මානව සම්පත් කළමනාකරණය ක්‍රමවත් ව පවත්වාගෙන යෑමට කටයුතු කර ඇති අන්දම නිරීක්ෂණය වේ. එනම් භික්ෂූන් වහන්සේලා සම්බන්ධ විනය ප්‍රතිපත්ති, විහාර සේවකයන්, මෙහෙකරුවන් සම්බන්ධ විනය ප්‍රතිපත්ති, විහාර පාලනය සඳහා ගිහි නිලධාරීන් සහ භික්ෂූන් වහන්සේලා එක්ව කටයුතු කළ යුතු ආකාරය පිළිබඳ කියවෙන ප්‍රතිපත්ති යනුවෙනි. කාශ්‍යප පුවරු ලිපියෙන් හෙළිවන බුදුදහමේ ස්ථාවරත්වය රඳවා ගැනීමට බෞද්ධ විහාරස්ථාන කළමනාකරණයට රාජ්‍ය මැදිහත් වීම යන්නෙන් නිරීක්ෂණය කිරීමේ දී ප්‍රබල ව ඉස්මතු වන කරුණ වන්නේ භික්ෂු සමාජය කළමනාකරණයට වැඩි ඉඩක් වෙන් කොට ඇති බව යි.

47 දුන් දසකැරැ මුත් වෑසර් පැත් පමුණු නො ගන්නා ඉසා ගොවිකම් නො කරනු ඉසා

මහනෙත්පා වහදූ දෙ අ

49 පිරිවෙන් ලදුවනට් පිඬ්පසයට් එක් දවසකට් අමුණක් සාල් ඉසා සතර් අකක් රන් ඉසා

හවුරුදු නිමි

50 යත සිවුර් මිලැයට් රන් දහසක් ඉසා මෙහෙකරුවනට් වැලිගමු දෙපයල ඉසා මෙහි

බද් මිනිසුන් මෙහෙ (Wickramasinghe 1912; 45)

සංඝ සමාජයට ගොවිතැන තහනම් කොට ජීවිත සුරක්ෂිත කර ගැනීමට ආහාරපාන ලබා දෙමින්, සිවුරු ලබා දෙමින් ද එනම් සිව්පසයෙන් සංග්‍රහ කරමින් ද රාජ්‍යයේ මැදිහත්වීමෙන් විහාරයේ සම්පත් මනා ලෙස කළමනාකරණය කර ඇති ආකාරය ද ප්‍රශස්ත මට්ටමකින් පැවැති බව පෙනේ. මෙයින් භික්ෂූන් වහන්සේලා ගිහි සමාජය සමඟ සීමා ඉක්මවා මුහුවීම වැළැක්වීම ද ඔවුන්ගෙන් ඉටුවිය යුතු ශාසනික මෙහෙය බාධවෙන් තොරව පවත්වාගෙන යෑමට ද අවශ්‍ය පසුබිම නිර්මාණය වීම ද මැනවින් ඉටු වී ඇත.

එය භික්ෂුවගෙන් සමාජය බලාපොරොත්තු වන සරල සහ අල්පේච්ඡ දිවි පැවැත්ම රඳවා ගැනීමට උපකාරී වන්නෙකි.

38 අස්වනු ඉසා මහණ් කරත් පිරිත් සතර් බණ්වර් පිණිස්වූවන් මහණ්කරනු ඉසා

මහණ්වන්නවුන් අතින් යම්

39 කවරි වතක් නොගන්නා ඉසා...

42 ද්දි තනට් වතැ කියෙන හිමියන් ගන්නා ඉසා නො සමග්න්වැ වසන පමණින් වඩා වත්

සිරිත් ඉක්මැ වන් වත්හිමි

43 යනුජ්...

48 වසටද් මෙ සිරිත් කරනු ඉසා මෙහිද් සෙසු අවසැද් උනුපොවා මහණ් නො කරනු ඉසා

මහකපාරා පිරිවෙනැ (Wickramasinghe 1912; 45)

එසේ ම ශාසනයට පැවිද්දන් ඇතුළු කර ගැනීම සම්බන්ධ ව ද රජයේ යම් මැදිහත් වීමක් පැවැති බව ද නිරීක්ෂණය කළ හැකි වේ. එවකට පැවැති දේශපාලන, ආර්ථික, සමාජ, අස්ථාවරත්වය සමඟ ඇති වූ ශාසනික පිරිහීම නැවත ශක්තිමත් කිරීමට මෙහිලා උත්සහ දරා ඇති බව විශද වේ.

> බුදුන් වහන්සේ විසින් පනවන ලද විනය නීති අනුව ස්ථවීර, මහස්ථවීර, උපධ්‍යාය මහෝපධ්‍යාය ආදී වැඩිහිටි භික්ෂූන්ගේ අනුශාසනා හා මාර්ගෝපදේශකත්වය යටතේ භික්ෂු සමාජය පාලනය විය (සුරවීර, 1962; 29).

ආර්ථික ලාභ ප්‍රයෝජන සහ සෙසු ලාභ ප්‍රයෝජන තකා බිහිවන ව්‍යාජ සහ නොවැදගත් භික්ෂු සමාජයක් බිහිවීමේ පසුබිම මැඩ පැවැත්වාලීමට මෙම විනය රීති වර්තමානයට ද ඉවහල් වන බව අවධාරණය වේ.

39 කවරි වතක් නොගන්නා ඉසා ගතුවන් දුහුවන් එ අවැස නොවසවනු ඉසා එක්

අවැස නැයන් සතර් දෙනෙකු නො ව

40 සවනු ඉසා දෙමුළැ බජ්තුවාක් අවසට් දායකයන් කළ නියත පමණින් වත් සිරිත්

නො ඉක්මැ වසැගින් සඟුන්

42 ද්දි තනට් වතැ කියෙන හිමියන් ගන්නා ඉසා නො සමග්න්වැ වසන පමණින් වඩා වත්

සිරිත් ඉක්මැ වන් වත්හිමි

43 යනුජ් එයට් පස වූ වත්හිමියනුජ් එ අවසැ නොවසවනු ඉසා උදහසින් දමබිදි යැවූ

වත්හිමියනුද් (Wickramasinghe 1912; 45)

ශාසනයේ පැවදි වූ පසු භික්ෂූන් වහන්සේලා ගෙවිය යුතු විනයවත් ජීවිතය පිළිබඳ ව රාජ්‍ය මැදිහත්වීමෙන් පනවා ඇති නීති ආඥයෙන් පාලන කාර්යක්ෂමතාව සහ ඵලදායීතාව පෙන්වා දෙයි. රටේ උතුම් ආයතනය ලෙස සලකන විහාරස්ථානයේ වෙසෙන මානව ජනයා රටට අවැඩක් කළහොත් එම ආයතනයෙන් ලැබිය යුතු නිසි ඵලය නොලැබී යන්නේ ය. එය එසේ නොවීමට භික්ෂූන් වහන්සේලා සම්බන්ධ ව දැඩි විනය රීති පනවමින් කටයුතු කිරීම එකල අස්ථාවර පාලන ස්වරූපය වෙනසකට මගපාදන්නට ඇත. එක් ආවාසයක ඥාතීන් හතර දෙනෙක් වාසය නොකළ යුතු බව, අසමඟි, දුශ්ශීල සහ නිතර ප්‍රයෝග කරන එමෙන් ම රටින් පිටුවහල් කළ භික්ෂූන්ට නැවත විහාරයට ඇතුළුවීමට තහනම් නියෝග පනවා ඇති අන්දම නිරීක්ෂණය කළ හැකිවේ. එය රාජ්‍ය කළමනාකරණය සාධනීය ලෙස ඉහළ

නංවන්නට සමත් වේ. එහිලා බුදුදහමේ ස්ථාවරත්වය රඳවා ගැනීමට මෙන් ම පැවැත්ම යහපත් ලෙස කළමනාකරණයට අවශ්‍ය පසුබිම නිර්මාණය කර ඇත.

එසේ ම භික්ෂූන් වහන්සේලාගේ සමාජීය සහ ශාසනික සේවාවන් ඉටුවීමට අවශ්‍ය වපසරිය ද ගොඩනංවා ඇති බව මෙම ලිපියෙන් පැහැදිලි වේ.

24 හර්නා ඉසා මිනී කොටා සඟුන් වන් තැනට් වන් කෙනෙකුන් ඇත එහි පහළවනුද්

ඔවුනුජ් විචාරකොට දම්බ්

25 දිව් යවන්නට් හර්නා ඉසා සෙසු බියෙන් වන් කෙනෙකුන් ඇත ගෙ දඩ් නො ගන්නා

ඉසා දෙස් නොයවනු ඉ

29 නු ඉසා අපිළිසරණ වත් හිමියන් ඉසා ලාභ ලදුවන් ඉසා අවස් ලදුවන් ඉසා කළහ යන

වරදක් අතපුවා

30 ත් මුළැ සඟුන් හින්දැ නිමවනු ඉසා සඟුන්විසින් නො නිමත් සම්දරුවන් හා මුල්වැ

විචාරකොට නිමවා පත් පත් (Wickramasinghe 1912; 44)

එවකට සංඝ අධිකරණයක් ද තිබූ බව පෙනී යයි. එහිලා රාජ්‍ය මැදිහත්වීම ප්‍රජාතන්ත්‍රවාදීව සිදු ව ඇති බවත්, විහාරස්ථානවල ස්වාධීනත්වය සුරක්ෂිත වී ඇති බවත් අනාවරණය වේ.

බෞද්ධ විහාරස්ථාන කරවා පූජා කරවීමෙන් අනතුරු ව ඒවායේ පැවැත්ම පිළිබඳ ව ද රාජ්‍ය පාලකයා කල්පනා කොට තිබූ බැව් පෙනී යන්නෙකි. එබැවින් විහාරස්ථාන පාලනය කළමනාකරණය කරමින් එහි පැවැත්ම රඳා පැවැතෙන ලෙස මූල්‍ය කළමනාකරණය සිදුකර ඇති ආකාරය හඳුනාගත හැකිවේ. නිදර්ශනාශ්‍රයෙන් ද පැහැදිලි කළ හැකි ය.

35 මබු ගන්වනු ඉසා අබහය්ගිරි වෙහෙර පිළිම ගෙහි ඉසා දාගබ්හි ඉසා මහබොා ගෙහි ඉසා

රුවන් පහාහි ඉ

36 සා බත්ගෙහි ඉසා ඇතුළ්කොට් මෙතුවාක්තැන් දෙමුළැ සැඟැ තනින් ස අවසින් ඉල්ලා හවු[රු]දු

නිමියෙතැ ලෙකම්

37 කොට් මහසන් මැන්දැ අස්වනු ඉසා සෙගිරි ද් දෙමුළැ සැඟැ තනින් ඉල්ලා හවු[රු]දු

නිමියනැ ලෙකම්කොට් මහසැඟැ

38 අස්වනු ඉසා මහණ් කරත් පිරිත් සතර් බණ්වර් පිණිස්වූවන් මහණ්කරනු ඉසා

මහණ්වන්නවුන් අතින් යම්

39 කවරි වතක් නොගන්නා ඉසා ගතුවන් දුහුවන් එ අවැස නොවසවනු ඉසා එක්

අවැස නැයන් සතර් දෙනෙකු නො ව (Wickramasinghe 1912; 45)

යන්නෙන් අභයගිරි විහාරයේ පිරිවෙනෙහි සහ දාගැබෙහි ද, මහබෝ ගෙයි ද, රත්න ප්‍රාසාදයේ ද, බත්ගෙයි ද යනාදී ස්ථානවලින් ලබා ගන්නා අයවැය නිකාය දෙකෙහි භික්ෂූන් වහන්සේලා අවුරුදු අවසානයේ ලියා සියලුදෙනා ඉදිරියේ එය ඉදිරිපත් කළ යුතු බවත් එසේ ම චේතියගිරි සහ අභයගිරි යන දෙමූළුවල භික්ෂූන් වහන්සේලාට අයත් ස්ථානවලින් ලැබෙන ආදායම අවුරුද්ද අවසානයේ මහා සංඝයා ඉදිරියේ අසන්නට සැලැස්විය යුතු බව ද දක්වන කරුණු ආශ්‍රයෙන් විහාරයේ මූල්‍ය විනය පවත්වා ගෙන යාමට ඉතා දැඩි නීති රීති පනවා ඇති ආකාරය අධ්‍යයනය කළ හැකිවේ. ආදායම සහ වියදම ලේඛනගත

යුතු වීම යන්නෙන් විහාර අභ්‍යන්තරයේ පැවැති දැඩි හා ප්‍රජාතන්ත්‍රවාදී පාලනය ඉස්මතු කරයි. මූල්‍ය කළමනාකරණය සම්බන්ධ ව මෙලෙස විනිවිද තත්ත්වයක් ඇති කිරීම ආයතනික සුරක්ෂිත බව තහවුරු කරන්නෙකි. එය රාජ්‍යයේ පැවැත්මට ද බලපෑම් කරන්නෙකි. මූල්‍ය වංචා ඇති වීමේ අවදානම අවම වනවා මෙන් ම සංඝ විනය ද වක්‍රාකාරව සුරක්ෂිත වේ.

51 යට් ඉසා පිරිවෙන් ලද්දන් තමනට් පිරිකැපු මෙ පසමුත් පිරිවෙනැ ඇතුළ් බැහැරි යම්

කවරි පසයක් තු

52 මනට් පිරිබොකළ සඟුන් සම්දරුවන් හිඳැවිචාර කොට් අවසින් පහ කරනු ඉසා

53 පිරිකැපු වතින් මුත් ඉතිරිතුවාක් දැයින් සඟුන් දසන් වටා කම් නවාම් පුජ සිතුවම් කොට්

වැඩියාක් ඇත ගම් ග

54 න්නා ඉසා... (Wickramasinghe 1912; 45,46)

අයවැය විනිවිද දැක්විය යුතුවාක් මෙන් ම පෞද්ගලික ව සෑම භික්ෂුවකගේ ම මූල්‍ය තත්ත්වය පාලනය කළ බැව් ඉහතින් පෙනී යයි. තමාට නියම කොටස හැර අන් දෑ පරිහරණය කළ නොහැකි බවත් ඉතිරි වන මූල්‍ය කොටස ඉඩම් මිල දී ගැනීමට යෙදවිය හැකි බවත් නීති රීති පැනවීමෙන් භික්ෂූන් අතර ඇති වන ගැටුම පාලනය කිරීමට මෙන් ම මූල්‍ය වංචා, විනය නීති කඩකිරීම් පාලනය කරන්නට ද අවකාශය ලැබී ඇති බවත් අධ්‍යයනය කළ හැකිවේ. රජයේ විහාරස්ථානවලට බෙදා හැරෙන මූල්‍ය කොටස් මෙහිදී මනා ලෙස කළමනාකරණයට ලක් වන්නේ මූල්‍ය පරිහරණයේ සීමා පනවා තිබීම හේතුවෙනි. එහිදී භික්ෂූන් මුදල් පෞද්ගලික ව පරිහරණය කිරීම අවම වේ. එය භික්ෂුවගේ විනය ගොඩනගන්නට සමත් වනවාක් මෙන් ම බුදුදහමේ යථාර්ථය ආරක්ෂා වෙමින් පැවැත්ම රඳවා ගැනීමට ද ඉවහල් වේ.

15 ඉසා සෙය් ගිරි වෙහෙර්හි ඉසා බද් තුවාක් ඇත් වෙහෙරැ ගම්බිමට් ඉසා මෙහිමෙ

අබැදි තුවක් වෙහෙර්හි ඉසා

16 රජ්මහවෙහෙර්හි ඉසා පිරිවෙන්හි ඉසා පියන්ගල්හි ඉසා මෙහෙණිවර්හි ඉසා සග් සතු

පුගුල් සතු ලාභ

17 යෙහි ඉසා බජ් තුවාක් රජ්කොල් කැමියන් වැදැ වැරියන් ගැල් ගොන් මීවුන් නොගන්නා

ඉසා ගස්කො (Wickramasinghe 1912; 44)

විහාර අභ්‍යන්තර පාලනය හා ගනුදෙනු කරන නිලධාරීගෙන් සිදුවිය හැකි අක්‍රමිකතා වැළැක්වීමට ද රජය පියවර ගෙන ඇති බැව් නිරීක්ෂණය වේ. විහාරය හා සම්බන්ධ මෙහෙකරුවන් සහ ගැල් ගොනුන් මී ගොනුන් අන් අයට ලබා ගත නොහැකි බව ද දක්වා තිබේ.

17 ...බජ් තුවාක් ගම්බිමට් රජ්කොල් කැමියන් වැදැ වැරියන් ගැල් ගොන් මීවුන් නොගන්නා

ඉසා ගස්කො

18 ළ් නොකපනු ඉසා මෙලාට්සී නොවද්නා ඉසා මිනී කෙටු කෙනෙකුන් ඇත ගමට් වැදැ

ඔවුන් මැ ඉල්ලන්මුත් සෙසු

21 පැටවු වරදට් වටාලා දඩ් නොගන්නා ඉසා ඇත්වෙහෙරැ ගම්බිමින් ගත් හැමෑ දඩ්

ඇත්වෙහෙරැ කම් න (Wickramasinghe 1912; 44)

යන්නෙන් විහාර ගම්බිම්වලින් ලබා ගන්නා දඩ මුදල් නැවත ආගමික සංස්ථාව වටා ම රඳවා තබා ගැනීමේ මූල්‍ය උපක්‍රමවලට ද යොමු වී ඇති බව අවධාරණය වේ. එය රජයේ මුදල් නැවත ආගමික සංස්ථාව වෙත හරවා යැවීමක් බව නිරීක්ෂණය වේ. එමඟින් විහාරාරාමවල භෞතික පරිසරයේ ස්ථාවරත්වය ආරක්ෂා කිරීමට සමත් වීමෙන් බුදුදහමේ ස්ථාවරත්වය රඳවා ගැනීමට ද ඉවහල් වේ.

බෞද්ධ විහාරස්ථාන කළමනාකරණය කිරීමෙහි ලා රාජ්‍යයේ වැදගත් ම මැදිහත් වීමක් ලෙස දේපළ කළමනාකරණය සැලකිය යුතු ය. ඒවා පිහිටුවීමට, ඉදිකිරීමට, පවත්වාගෙන යාමට රාජ්‍ය අනුග්‍රහයක් නොලැබේ නම් එය ශාසන පරිහානියට බලපාන ප්‍රධාන කරුණක් බවට පත් වේ. භික්ෂූන් වහන්සේලා පන්සීය නමකට වැඩ වාසය කිරීමට සැලසීම, සිවුපසයෙන් භික්ෂූන් වහන්සේලාට සංග්‍රහ කිරීම, දුර්භික්ෂ බිය දුරු කිරීම, විවිධ ජාතිකයන් බුද්ධ ශාසනයට ඇතුළත් කිරීම, ධාතු වන්දනා උත්සව පැවැත්වීම, බුද්ධ රත්නයට පූජා පැවැත්වීම, අභිධර්ම දේශනාව රන්පත්හි ලියා දැක්වීම හා මහා පූජා පැවැත්වීම, ආචාර්යපාදයන් හමුවේ ඒ ධර්ම දේශනාව ව්‍යඛ්‍යාන කිරීම, ස්වකීය භාෂාවෙන් බුදුගුණ වර්ණනයට හසු කිරීම යන්නෙන් ශාසන චිරස්ථිතිය ඇති කිරීමට අවශ්‍ය මූලික පසුබිම එවකට රාජ්‍ය මැදිහත් වීමේ ප්‍රතිඵලයක් ලෙස ක්‍රමානුකූල ව සැකසී ඇති අන්දම 6 - 14 දක්වා පේළි නිරීක්ෂණය කිරීමෙන් වටහා ගත හැකිවේ.

6 හය් මහරජ්යුතාර් මිරිසිවිටි සඟ්සෙන්අරම් කසුබ්රජ් මහවෙහෙර් කරය් අරි පන් සීයන්

වසවය් සුලබ්

7 සතර් පසයෙන් පුජ්යි සසුන් කොත් හුවයි ඇතිනකර් මඟුල් මහවෙයැ දකුණ් දොර් අසන්හි

රජ්වෙදහල්

8 කරය් රොව් බිය සමය් පොදොනවුලු පුලුඩාවුලුයෙන් කෙත් කම් සුලබ් කොට් සිරි ලක්

ළොන්දුර්වයි සා බියනි

9 වය් රට් සොයය්...

13 වො තුමන් සත්ලැඟු සවන හවුරුදුයෙහි අබය්ගිරි වෙහෙර් කපාරාමූළට් සලමෙය්වන්

පවු කරය් සඟුන්

14 වසවය් සතර පස සුලබ්කොට්... (Wickramasinghe 1912; 43)

යන්නෙන් ශාසනය නඟා සිටුවීම කෙරෙහි විහාර සිටුවා ස්ථිර කළමනාකරණයක් සිදු කර ඇති අන්දම වටහාගත හැකි වේ. මෙයින් බුදුදහමේ චිරස්ථිතිය උදෙසා එවකට පාලකයාට මනා දැක්මක් පැවති බව පෙනී යයි.

26 සා රජ්කොලෙන් බහා බුජ් සස්නෙහි අනුසසැ බැන්දැ දුන් පමණු උදහසැ නො ගන්නා

ඉසා කැමිනම් කළවුන් ග

27 ම් පාට්ට වැළ...

38 අස්වනු ඉසා මහණ් කරත් පිරිත් සතර් බණ්වර් පිණිස්වූවන් මහණ්කරනු ඉසා

මහණ්වන්නවුන් අතින් යම්

39 කවරි වතක් නොගන්නා ඉසා ගතුවන් දුහුවන් එ අවැස නොවසවනු ඉසා එක්

අවැස නෑයන් සතර් දෙනෙකු නො ව (Wickramasinghe 1912; 44,45)

විහාරස්ථානයේ දේපළ පිටතට නොයවා රාජ්‍යයෙන් වෙන් කළ පරිදි ම ස්ථිරසාර ව පවත්වා ගැනීමට මෙලෙස ක්‍රමෝපායන් යොදා ඇති බැව් අවධාරණය වේ.

නිගමනය

එවකට ඇති වෙමින් පැවැති සංක්‍රමණ සහ ආක්‍රමණ හමුවේ ඇති වුණු පරිහානිය, ලාංකේය සමාජ ක්‍රමයේ කේන්ද්‍රස්ථානය වන විහාරස්ථානය බිඳ වැටීමට බලපා ඇති බවත්, එය නැවත පූර්ව තත්ත්වයෙන් නඟා සිටුවීමටත් භික්ෂු විනය යහපත් ලෙස ප්‍රතිස්ථාපනය කිරීමටත් මෙම පුවරු ලිපියෙන් උත්සහා දරා ඇති බවත් නිගමනය කළ හැකි ය. විහාරස්ථානයේ පැවැත්ම බිඳ වැටීම සහ අස්ථාවරත්වයට පත්වීම මෙන් ම භික්ෂු විනය පිරිහීම යනු බුදුදහමේ අස්ථාවරත්වය ඇති කරන්නෙකි. එය වළක්වා ගැනීමට එවකට රජය උත්සහ දරා ඇති බැව් නිගමනය කළ හැකිවේ. එහිදී මානව සම්පත් කළමනාකරණය, ආයතනික මූල්‍ය කළමනාකරණය, දේපළ හා පරිසර කළමනාකරණය යන්නෙන් මෙය පිළිබඳ ව අධ්‍යයනය කළ හැකි විය. මානව සම්පත් කළමනාකරණය යටතේ විහාරස්ථානයට භික්ෂුවක් බඳවා ගැනීමේ සිට විනයගරුක ලෙස පැවැදි ජීවිතය ගත කිරීමට අවශ්‍ය පසුබිම රාජ්‍ය මැදිහත්වීම ඔස්සේ සිදු කර ඇති බවත් එය එවකට පැවැති රාජ්‍ය අස්ථාවරත්වයේ බලපෑමෙන් ආගමික කේන්ද්‍රය ගලවා ගැනීමට යෙදූ උපක්‍රමයක් බවත් නිගමනය කළ හැකි ය. එසේ ම විහාරස්ථානයේ මූල්‍ය තත්ත්වය සහ දේපළ අයුතු ලෙස පරිහරණය කිරීමෙන් වැළැක්වීමත්, ශාසනයට ඇතුළත් විය හැකි වන්නේ ඒ පිළිබඳ සැබෑවට ම උනන්දුව ඇති අයට පමණක් ය යන්නෙන් මෙම විනය නීතිරීති ආශ්‍රයෙන් පැහැදිලි වන්නේ චීවරධාරී මුවාවෙන් අයුතු ලාභ ප්‍රයෝජන ගැනීමට ඇති ඉඩකඩ රාජ්‍ය මැදිහත් වීම ඔස්සේ පාලනයට නතු කොට ඇති බව ය. මෙවැනි උපාය මාර්ග බුදුදහමේ ස්ථාවරත්වය මෙන් ම එය කෙරෙහි පවතින වගකීම සහ ගෞරවය ද සුරක්ෂිත කිරීමට ඉවහල් වන බැව් නිගමනය කළ හැකිවේ. එසේ ම කාශ්‍යප පුවරු ලිපිය ලියැවී ඇත්තේ එකල සමාජ ක්‍රමයට ගැළපෙන ලෙස වුව එය අද්‍යතන සමාජ ක්‍රමයට වුව ප්‍රබල බලපෑමක් ඇති කරන්නට සමත් වන බව ද නිගමනය කළ හැකි වේ. වර්තමානයේ ද බුදුදහමේ යථාර්ථය විකෘතියට පත් කිරීම සහ එයින් ඇතිව පවත්නා අස්ථාවරත්වය වළක්වා ගැනීමට අවශ්‍ය ආදර්ශය මෙහිලා ද ලබාගත හැකි බැව් නිගමනය කළ හැකිවේ.

ආශ්‍රේය මූලාශ්‍රය

ප්‍රාථමික මූලාශ්‍රය

Wickramasinghe, Don Marthino De Silva. (1912) **Epigraphia Zeylanica. vol. I.** Govrnment of Ceylon Oxford University Press.

ද්විතීයික මූලාශ්‍රය

අමරවංශ, කොත්මලේ. (1969) **ලක්දිව සෙල්ලිපි.** කොළඹ: ඇම්. ඩී ගුණසේන සමාගම.

අමරවංශ, කොත්මලේ. (1968) **සිංහල සාහිත්‍යලතා.** කොළඹ: සීමා සහිත කුලරත්න සහ සමාගම.

අල්විස්, ප්‍රේමචන්ද්‍ර (පරි.). (2009) **නොක්ස් දුටු ලක්දිව.** කොළඹ: සූර්ය ප්‍රකාශකයෝ.

කළුආරච්චි, එස්. පී. (2003) **කළමනාකරණය.** කොළඹ: කර්තෘ ප්‍රකාශන.

කරුණාරත්න, ඩේවිඩ්. (1955) **පුරාතන ලංකාවේ නීති ක්‍රමය.** කොළඹ: සීමා සහිත ඇම්. ඩී ගුණසේන සහ සමාගම.

කුලසූරිය, ආනන්ද. (1999) **සිංහල සාහිත්‍ය 1.** බොරලැස්ගමුව: සි/ස විසිදුණු ප්‍රකාශකයෝ.

චන්ද්‍රරත්න, පී. (2021) **ශ්‍රී ලංකාවේ බදු පුරාණය.** කොළඹ: ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ.

ජීනානන්ද, කෙරමිණියේ. (1966) **1966 සාහිත්‍ය දින විශේෂ කලාපය.** කොළඹ: රත්න ප්‍රකාශකයෝ.

දිවාකර, අනුරින් ඉන්දිකා. (2003) **ශාස්ත්‍රීය ලිපි සංග්‍රහය.** කොළඹ: ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ.

දිවාකර, අනුරින් ඉන්දිකා. (2015) **සෙල්ලිපි විමසුම.** කැලණිය: සම්භාව්‍ය ප්‍රකාශන.

දිවාකර, අනුරින් ඉන්දිකා. (2015) **සෙල්ලිපි හා සන්නස්වලින් හෙළිවන ලංකාවේ සමාජය.** කොළඹ: සමයවර්ධන පොත්හල (පෞද්ගලික) සමාගම.

ධම්මසිරි, දොඩන්ගොඩ සහ ධම්මානන්ද, හංවැල්ලේ (1965) **අනුරපුර ලිපි.** බොරලැස්ගමුව: ශාන්ති ප්‍රකාශකයෝ.

ධම්මකීර්ති, නිවන්දම ශ්‍රී. (2002) **සිංහල සාහිත්‍යයේ ස්වර්ණ යුගය.** දෙහිවල: බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය.

පඤ්ඤාසාර, ඔක්කම්පිටියේ. (2007) **සිංහල අක්ෂර රූප විකාසනය හා භාරතීය ආභාසය.** කර්තෘ ප්‍රකාශන.

මල්ලවආරච්චි, නිමල් සහ පඤ්ඤාසාර, ඔක්කම්පිටියේ. (2009) **සිංහල භාෂා විකාසය සහ ශිලා ලේඛන විමර්ශන.** කැලණිය මාධවී ප්‍රින්ටර්ස්.

මුදියන්සේ, නන්දසේන. (2016) **සිංහල ශිලා ලේඛන සංග්‍රහය.** කොළඹ: ඇස් ගොඩගේ සහ සහෝදරයෝ.

වික්‍රමසිංහ, මාර්ටින්. (2016) **සිංහල සාහිත්‍යයේ නැගීම.** කොළඹ: සි/ස සරස පෞද්ගලික සමාගම.

විමලජෝති, වෙල්ගම්මැද්දේ ශ්‍රී. (2012) *අනුරපුර සෙල්ලිපිවලින් හෙළි වන සංඝ සමාජය.* කොළඹ: සමයවර්ධන මුද්‍රණ ශිල්පියෝ.

විමලවංස, බද්දේගම. (2016) **සෙල්ලිපි සමාජය.** දෙහිවල: බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය.

සන්නස්ගල, පුංචි බණ්ඩාර. (2020) **සිංහල සාහිත්‍ය වංශය.** කොළඹ: ඇස් ගොඩගේ සහ සහෝදරයෝ.

සුරවීර, ඒ. වී. (1961) **අනුරාධපුර සංස්කෘතිය.** මහරගම: සමන් ප්‍රකාශකයෝ.

සුරවීර, ඒ. වී. (1962) **අනුරාධපුර සමාජය.** සොමිසඳ ප්‍රකාශන.

සුරවීර, ඒ. වී. (2014) **රාජාවලිය.** අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව.

සඟරා

ඇඳගම, මාලනී. (2000) **ශ්‍රී ලංකාවේ අනුරාධපුර යුගයේ භික්ෂු අධ්‍යාපනය,** *සංස්කෘතික පුරාණය, 3* (3), 18-25.

කරුණානන්ද, යූ.බී. (1993) **අනුරාධපුරයේ පිබිදීම,** *සංස්කෘතික පුරාණය, 1* (5), 13-16.

පුඤ්ඤසාර, ජුලම්පිටියේ. (2000) **අභයගිරි සංස්කෘත ශිලා ලේඛනයෙන් හෙළිවන ආගමික ජීවිතය,** *සංස්කෘතික පුරාණය, 3* (3), 26-29.

අනුරාධපුර යුගයේ සිංහල ගී කාව්‍ය හා ගේය කාව්‍ය සම්ප්‍රදාය පිළිබඳ විමර්ශනයක්

ආචාර්ය එෂාන් ඉමල්ක විජේරත්න
කථිකාචාර්ය, සෞන්දර්ය අධ්‍යාපන ගුරු විද්‍යාලය, ගිරාගම.
eshanpanhinda@gmail.com

සාරසංක්ෂේපය

අනුරාධපුර යුගය ශ්‍රී ලාංකේය භාෂා, සාහිත්‍ය හා සංස්කෘතික ඉතිහාසයේ ගී කාව්‍ය හා ගේය කාව්‍ය සම්ප්‍රදාය ආරම්භ වී විකාශනය වූ මූලික අවධියක් ලෙස සැලකේ. මෙම පර්යේෂණයේ අරමුණ වන්නේ අනුරාධපුර යුගයේ සිංහල ගී කාව්‍ය හා ගේය කාව්‍ය සම්ප්‍රදායේ මූලාරම්භය, විකාශනය, කාව්‍යාත්මක ලක්ෂණ සහ එහි ආගමික, සමාජීය හා රාජ්‍යමය භූමිකාව පුරාවිද්‍යාත්මක හා සාහිත්‍යමය මූලාශ්‍ර ඇසුරින් විචාරාත්මකව විමර්ශනය කිරීමයි. අධ්‍යයනය සඳහා ගුණාත්මක ඓතිහාසික පර්යේෂණ ක්‍රමවේදය අනුගමනය කරමින් කෝසවකන්ද, තිස්සමහාරාම, කිරින්ද හා වල්ලිපුරම් සෙල්ලිපි ඇතුළු පුරාවිද්‍යාත්මක මූලාශ්‍ර, මහාවංසය, දීපවංසය, පරමත්ථෙජෝතිකා, චුල්ලවග්ගපාලිය, සියබස්ලකරය සහ සීගිරි ගී වැනි ප්‍රාථමික සාහිත්‍යමය මූලාශ්‍ර මෙන්ම අදාළ ද්විතීයික විද්වත් ග්‍රන්ථ විචාරාත්මකව විශ්ලේෂණය කර ඇත. අධ්‍යයනයෙන් අනාවරණය වන්නේ ක්‍රිස්තු පූර්ව දෙවන සියවස වන විටත් සිංහල භාෂාවෙන් විරිත් නියමයන්ට අනුකූලව ගායනය සඳහා නිර්මාණය කරන ලද කාව්‍ය පැවති බවට සෙල්ලිපි මඟින් පුරාවිද්‍යාත්මක සාක්ෂි සපයන බවයි. එමෙන්ම ගේය කාව්‍යය ආගමික වන්දනා, විහාරාරාම ඉදිකිරීම්, රාජ ප්‍රශස්ති, ජනජීවිතය හා සංස්කෘතික උත්සව සමඟ සමීපව බැඳුණු සාහිත්‍යමය ප්‍රකාශන මාධ්‍යයක් ලෙස භාවිත වූ බව ද හෙළි වේ. සීගිරි ගී විමර්ශනය මඟින් ගී කාව්‍යයේ විරිත්, අලංකාර විධි, භාෂාමය පරිණතිය සහ කාව්‍යාත්මක නිර්මාණශීලීත්වය ඉහළ මට්ටමකට වර්ධනය වී තිබූ බව තහවුරු වේ. ඒ අනුව අනුරාධපුර යුගයේ සිංහල ගී කාව්‍ය හා ගේය කාව්‍ය සම්ප්‍රදාය පසුකාලීන සිංහල කාව්‍ය, ගී සාහිත්‍ය සහ ගායන සම්ප්‍රදායන්ගේ වර්ධනය සඳහා මූලික පදනම සපයා දුන්, ශ්‍රී ලාංකේය සාහිත්‍ය ඉතිහාසයේ ප්‍රමුඛ සංවර්ධන අවධියක් නියෝජනය කරන බව මෙම අධ්‍යයනයෙන් නිගමනය කෙරේ.

ප්‍රමුඛපද : අනුරාධපුර යුගය, සිංහල ගී කාව්‍ය,ගේය කාව්‍ය සම්ප්‍රදාය, සෙල්ලිපි, සීගිරි ගී

හැඳින්වීම හා අරමුණු

අනුරාධපුර යුගය ශ්‍රී ලාංකේය භාෂා, සාහිත්‍ය හා සංස්කෘතික ඉතිහාසයේ මූලික පදනම සකස් වූ යුගයක් ලෙස සැලකේ. මෙම යුගයේ සෙල්ලිපි, වංසකථා, අටුවා සහ අනෙකුත් සාහිත්‍යමය මූලාශ්‍රයන් තුළින් ගී කාව්‍ය හා ගේය කාව්‍ය සම්ප්‍රදායේ ආරම්භය, විකාශනය සහ භාවිතය පිළිබඳ වැදගත් තොරතුරු අනාවරණය වේ. විශේෂයෙන් කෝසවකන්ද, තිස්සමහාරාම, කිරින්ද වැනි සෙල්ලිපි හා වල්ලිපුරම් රන් සන්නස ආදියේ අන්තර්ගත පද්‍යමය නිර්මාණ අනුව ක්‍රිස්තු පූර්ව දෙවන සියවස වන විටත් සිංහල භාෂාවෙන් විරිත් නියමයන්ට අනුව ගායනයට සුදුසු කාව්‍ය රචනා වී තිබූ බවට පුරාවිද්‍යා සාක්ෂ්‍ය ලැබේ.

එසේ ම මහාවංසය, දීපවංසය සහ පරමත්ථෙජෝතිකා වැනි ග්‍රන්ථවල සඳහන් තොරතුරු අනුව ආගමික, රාජ්‍ය හා සමාජීය අවස්ථාවන්හි ගී හා ගේය කාව්‍ය භාවිත වූ ආකාරය ද හඳුනාගත හැකි ය. මෙම අධ්‍යයනයේ අරමුණ වන්නේ අනුරාධපුර යුගයේ සිංහල ගී කාව්‍ය හා ගේය කාව්‍ය සම්ප්‍රදාය පිළිබඳ සෙල්ලිපි හා සාහිත්‍යමය මූලාශ්‍රය අනුසාරයෙන් විචාරාත්මක සිදු කිරීමයි. ඒ මඟින් මෙම යුගයේ ගේය කාව්‍යයේ ආරම්භය, විරිත් ලක්ෂණ, භාෂාමය හා සාහිත්‍යමය විශේෂතා මෙන් ම ආගමික හා සමාජීය පසුබිම් ඔස්සේ ලාංකේය කාව්‍ය සම්ප්‍රදායේ වර්ධනය පිළිබඳ අවබෝධයක් ගොඩනැගීම අපේක්ෂා කරයි.

පර්යේෂණ ක්‍රමවේදය

අනුරාධපුර යුගයේ ආදි බ්‍රාහ්මී ලිපි අතරින් හමුවන අනුරාධපුර මරදන්කඩවලට ආසන්නයේ පිහිටි කෝසවකන්දෙන් හමුවන ක්‍රි. පූ. දෙවන සියවසට අයත් වන සෙල්ලිපිය මෙරටින් හමුවන ආදිතම ගී සෙල්ලිපිය යි, පළමු වන පද්‍ය ලිපිය යි. මෙම ගීය රචනා වී ඇත්තේ පළමු පාදය මාත්‍රා 9 ක් සහ සෙසු පාද මාත්‍රා 11 බැගින් වන පරිදි ය.[1] (එලුසඳැස් ලකුණ, 2005 : පි. 13) *"මහරඤඵ ගමණි අබයහ දෙවන පියශ (ර)මණි - බරිය මිලක - තිශ විහාරෙ කාරිතෙ කතිය"*[2] (Paranavitana, 1970 ; No 193, p. 16). මෙම ගී සෙල්ලිපියේ කියවෙන මහරඤඵ අබය ගැන කියවෙන තවත් සෙල්ලිපි සිතුල්පව්ව, සීලවකන්ද හා රිටිගලින් ද හමුවේ. මෙම පාලකයා දුටුගැමුණු ද නො එසේනම් වළගම්බා ද යන්න නිශ්චය කිරීම දුෂ්කර ය. (Gunawardana, 1983). දෙවියන්ට ප්‍රිය වූ ගමණි අබය මහරජුගේ රමණීය බිරිඳ කතී විසින් මිලකතිස විහාරය කරවන ලදී යන අරුතින් රචිත මෙම ලිපිය තුළින් ක්‍රි. පූ. දෙවන සියවස වන විට ලංකාවේ පද්‍ය කාව්‍ය, විරිත් ලකුණින් රචනා කළ බවට පුරාවිද්‍යාත්මක සාක්ෂ්‍ය ලැබේ. එසේ ම මෙහි විරුද ලක්ෂණ ද ගැබ්ව ඇති බව හඳුනාගත හැකි ය. කතී නම් රජුගේ භාර්යාව විරුද රචකයෙකු ලවා මෙය ලිය වූ බව ද පෙනේ. එසේ නම්, කෝසවකන්ද ලිපිය ලියන ලද්දේ ලංකාවේ මෙතෙක් හමුවන ආදිතම ගේය කාව්‍ය කර්තෘ විසිනි. එහෙත්, අවාසනාවකට එම ගේය කාව්‍ය කර්තෘ අඥාත ය. තවද, හම්බන්තොට දිස්ත්‍රික්කයේ තිස්සමහාරාම ලිපිය ද විරිත් ලක්ෂණ පෙන්නුම් කරන්නකි. *"මහරඤඵ අයක පරුමක පුසදෙවහ පොකරණි"*[3] (Paranavitana, 1970; No 703, p.53). යනුවෙන් මහරජුගේ ප්‍රමුඛ ආදායම් පාලක නිලධාරියා වූ පුඹදෙවගෙ පොකුණ පිළිබඳ දක්වෙන මෙම ලිපිය මාත්‍රා අටළොසකින් බඳින ලද සමුද්‍රඝෝෂ වෘත්තයෙන් රචනා කර තිබේ.[4] (එලුසඳැස් ලකුණ, 2005 : පි.56) මෙම ලිපිය භාතිකාභය රජු (ක්‍රි.ව. 7 - 19) දවස රචනා වන්නට ඇති බව අදහස් කෙරේ. (Paranavitana, 1945; pp 60-65). තිස්සමහාරාමයේ අකුරුගොඩැල්ලෙන් හමු වූ මේ ලිපිය ආදිතම සිවුපද විරිත ඇතුළත් පද්‍යමය සෙල්ලිපියක් ලෙස හඳුනාගත හැකි ය.

හම්බන්තොට දිස්ත්‍රික්කයේ මාගම්පත්තුවේ තිස්සමහාරාම අකුරුගොඩ අෂ්ටාශ්‍රය කුළුණු සෙල්ලිපිය ද පද්‍යමය ලිපියක් ලෙස හඳුනාගත හැකි ය.

"සිද්ධම් යගෙ දම සෙබයෙ නාම සග වඩම නෙ නාම මිවදිටික

[1] "නෙවෙන් ඇරින් වසමැ - යති පෙර අඩෙහි විසිමත්, පසඩෙහි දෙවිසිමත් වෙද - ගී ලකුණු වේ හෙ මෙසේ"
[2] "Maharajhaha Gamani Abayaha Devanapiyasa (Rajmani Bariya Milaka – Tisa – Vihare karitekatiya"
[3] "Maharajhasa ayaka parumaka – Pusadevaha Pokarani"
[4] "දෙසෙන් අටින් යති - අටලොස්මතින් බඳ හොත් වේ යැ සමුදුරුගොස් නම් - නිදසුන් දනු හෙ මෙසේ"

ජන අවටය නෙ හකියෙ සග අසා ටි සහ රජකි (ය) ගාමෙ
මිවදිටි බිනක අටි මතිම බුධ -
සරණ ගතෙ නාග උවරාජෙ නාම කඩ උවරාජ - කාලහි" (Paranavitana, 2001; pp. 211-213).

යහපතක් වේවා! යම් ගෘහ ධර්මයක් (වේද) ඒ භය නම් මිථ්‍යා දෘෂ්ටිය ස්වර්ගය නසන්නක් නම් වෙයි යනු ජන අවත්‍රායණ වූ ශාක්‍ය සංඝයාගෙන් රාජකීය ග්‍රාමයේ දී ඒ මම අසා (ගතිමි) මිථ්‍යා දෘෂ්ටියෙන් බිඳුණු ආධ්‍යාශයෙන් ඇළලී නාග උපරාජ නම් මම බුදුන් සරණ ගියේ (වෙමි) උපරාජ කාලයෙහි දී කරවන ලදි. මෙම ලිපිය ද මහාදාඨික මහානාග උපරාජ ලෙස සිටි අවධියේ දී ඔහු විසින් ම රචනා කරන ලද්දක් බව පෙනේ. එසේ ම, උපරාජ නග බුදුන් වහන්සේගේ ඉගැන්වීම් පිළිගැනීමට හේතුව ද කෙටියෙන් මෙහි දක්වා ඇත. මෙම පද්‍ය සෙල්ලිපිය තුළ ගේයකාව්‍ය ලක්ෂණ දැකගත හැකි ය. එබැවින් මෙය සෙල් ගී ලෙස නිර්වචනය කළ හැකි ය. තවද, පරණවිතානයන් පෙන්වා දී ඇත්තේ මෙහි විරිත් ලක්ෂණ දැකගත හැකි බව ය. *"මෙහි පළමුවැන්න උපගීති ලක්ෂණවලින් ද, දෙවැන්න ගී විරිත් ලකුණුවලින් ද යුක්ත ය. වෘත්ත විභාග අනුව, කිරින්දේ ගිරි ලිපියෙහි පළමු වැන්නේ පූර්වාර්ධයෙහි මාත්‍රා විසි හත බැගින්, අපරාර්ධයෙහි මාත්‍රා තිහ බැගින් ද යෙදීමෙන් ලැබෙන උපගීත ලක්ෂණ විද්‍යාමාන වෙයි."* (අභයසුන්දර, 2006)

සෙල්ලිපි තුළින් හමුවන සෙල්ලිපි ගී නොහොත් සෙල් ගී වශයෙන් මාතලේ දිස්ත්‍රික්කයෙන් හමුවන දෙමැදඔය ලිපිය, (අභයසුන්දර, 2006; 24) කුරුණෑගල දිස්ත්‍රික්කයෙන් හමුවන ගනේකන්ද විහාර ලිපිය, (අභයසුන්දර, 2006; 24) මොණරාගල සිට පොතුවිල් මාර්ගයේ 13 වන සැතපුම් කණුව අසලින් හමුවන කරඳපොළ ලිපිය, (චන්ද්‍රසිරි, 2001) කොළඹ දිස්ත්‍රික්කයේ කොරතොට විහාරයේ ගල් ගුහාවක් ඉදිරිපස දක්නට ලැබෙන ලිපිය ද හඳුනාගත හැකි ය. (චන්ද්‍රසිරි, 2001) මේවාට අමතරව රන්පත් ගී ලිපියක් ද හමුවේ. එනම්, යාපනය දිස්ත්‍රික්කයේ වඩමාරච්චි ප්‍රාදේශිය ලේකම් කොට්ඨාසයට අයත් වන වල්ලිපුරම් නම් ගමේ විෂ්ණු දේවාලයට අයත් වන භූමියේ කරන ලද කැණීමකින් වර්ෂ 1936 දී සොයාගත් ක්‍රි. පූ. දෙවන සියවසට අයත් වල්ලිපුරම් රන් සන්නස යි. *"සිධ මහරජ වහයහ රජෙහි අමෙන ඉසිගිරියෙ නකදිව බුජමෙහි බදකර අතනෙහි පියගුක තිස විහර කරිතෙ"* (Gunawardana, 1995). යනුවෙන් වසභ රජුගේ කාලයේ දී නාගදීපය පාලනය කළ ඉසිගිරිය නම් ඇමතියා විසින් යහපත් මුහුදු ප්‍රදේශය නමින් හැඳින් වූ නාගදීප පාලන ප්‍රදේශයේ පියංගුකතිස්ස නම් විහාරය කරවන ලදි යැයි එහි සඳහන් වේ. මෙහි විෂමපාද මාත්‍රා 8 බැගින් සහ සමපාද මාත්‍රා 11, 14 බැගින් වන පියුම් ගී විරිතට අනුව ලිය වී තිබේ. (එලුසඳැස් ලකුණ, 2005)

පූර්වයෙන් සඳහන් කළ තිස්සමහාරාම ලිපිය මෙන් ම කිරින්ද ලිපිය තුළින් ද පෙනී යන කරුණක් වන්නේ භාතිකාභය රජුගේ දවස ඔහුගේ සොයුරු මහාදාඨික මහානාග රෝහණයේ උපරජව සිටි බව ය. (Paranavitana, 2001). මෙකල රුහුණ අඛණ්ඩව ම අනුරාධපුර රජුන්ගේ සෘජු ග්‍රහණයේ පැවති අතර රුහුණ පාලනය කරන ලද්දේ උපරජු විසින් හෝ "රෝහණ බොජක" මේ නිලය ලත් අයෙකු බව සෙල්ලිපි මගින් තහවුරු වෙයි. (ධීරානන්ද හිමි, 2004; 166) කිරින්ද ලිපියේ සඳහන් වන්නේ මේ මහාදාඨික මහානාග පූර්වයෙන් බෞද්ධයෙකු නොවුණ ද පසුව ඔහු මිථ්‍යාදෘෂ්ටිය අතහැර දමා බුදුන් සරණ ගිය බව ය.

"සිද්ධම් අපරිමිතෙ ලොකහි බුධ සමෙ නති අඨාන පරම දුලබෙ
සවනුතෙ පතෙ අනුතරෙ සතෙ මහසරණෙ (ලො) ක චක බුධ නම සයබු
මෙගලහි විහරෙ නක උවරජ (නම) බුධ සරණ

ගතෙ මිවදිටික බිදිය (යහ මග පරයන) භූතෙ" [5] (Paranavitana, 2001; pp. 214- 217).

යහපතක් වේවා, අපිරිමිත මෙලොව බුදුන් සම සරණක් නැත. ඒ හිමි සැමතැන ය. එ සම වනු දුලබ දෙයකි; මහා සරණකි. කිසිවෙකුට නොදෙවෙනි තමාම සියල් දත් එහිමි ලොවට ම ඇසකි. *"මිසදිටුකම අතැර - යහමග යනු රිසිව මේ ගලේ විහාරෙදී - බුදුසරණ වැළඳගති නාග උපරජ තෙම"* කිරින්ද සෙල්ලිපිය කොටන ලද්දේ නටබුන් වූ ස්තූපයක් අසල විශාල ගල් පර්වතයක සිරස් මුහුණතක ය. හම්බන්තොට මාගම්පත්තුවේ තිස්සමහාරාමයේ කිරින්ද මුහුදු වෙරළේ පිහිටි පුරාණ බෞද්ධ විහාර භූමියේ මෙය පිහිටා තිබේ. *"මෙම සෙල්ලිපිය ගී දෙකකින් යුක්ත ය. පළමු වැනි ගීයෙන් කැරෙන බුදු ගුණ වැනුම විශිෂ්ට නිබන්ධ නෛපුණ්‍යය පළ කරන්නකි. පෙළ සකු බස් මැනවින් දත් වියතෙකුගේ රචනයකි. පළමුවැන්න උද්ගීති විරිතෙන් ද, දෙවැන්න ගී විරිතින් ද බදනා ලද සේ ගැනේ. පළමු වැන්නෙහි අපරිමිතෙ යන්න අපරිමිතේ යැයි ද, මහසරණෙ යන්න මහ සරණේ යැයි ද ගැයිය යුතු ය. විරිත රැකෙනු පිණිස ය."* (අභයසුන්දර, 2006; 23) මෙම පළමු ගේය කාව්‍යයේ එන විරිත දැනට සිංහල සාහිත්‍යයේ දක්නට නොලැබේ. දෙවන ගේය කාව්‍යයේ දැක්වෙන පරිද්දෙන් බුදුන් සරණ ගිය පසු මහාදාඨික මහානාග රජු, තමාත්, තම බිසවත්, පුතුන් දෙදෙනාත්, මංගල හස්තියාත්, මංගල අශ්වයාත්, සංඝයා වහන්සේට පූජා කළ බව ද කියවේ. (පරණවිතාන, 1964 ; 169) උක්ත ගේය කාව්‍ය රචකයා නිසඳස් කාව්‍ය ආකෘතිය, ඡන්දස් අලංකාර සහ ගේයපද යොදා ගනිමින් රචනා කළ මෙය රුහුණෙන් සොයාගත් ලංකාවේ ලියැවුණු පළමු වැනි බුදුගුණ ගීය ලෙස හඳුනා ගැනේ. (අභයසුන්දර, 2006; 23)

ප්‍රතිඵල

ගේය කාව්‍ය යන්න පුරාතන යුගයේ සාහිත්‍යමය මූලාශ්‍රයන්හි හඳුන්වා ඇත්තේ ගී යනුවෙනි. එසේ නම්, මෙකී ගී යන්න ඇතුළත් පැරණිතම සාහිත්‍යමය මූලාශ්‍රය වශයෙන් හඳුනාගත හැකිවන්නේ දික්සඳ සෙනෙවිරත් මහ පිරිවෙන් වැසි මහානාම හිමියන් විසින් රචිත මහාවංසය යි. මෙය ධාතුසේන රාජ්‍ය (ක්‍රි.ව. 455 - 473) කාලයේ දී රචනා වන්නට ඇතැයි අදහස් කෙරේ. මහාවංසයේ විජයාභිෂේකය විස්තර කෙරෙන හත්වන පරිච්ඡේදයේ,

"රත්තිං තූරිය සද්දඤ්ච සුත්වා ගීතරවඤ්ච සො පුච්ඡිත්වා සහසෙමානං කිං සද්දෝ? ඉති යක්ඛිණිං"
(මහාවංසය, 2012 ; 91)

ලෙස සඳහන් වේ. එනම්, රාත්‍රියෙහි සංගීතය මුසු ගීත නාදයක් ඇසී කුමරු "ඒ ශබ්දය කුමක්දැයි" එක්ව නිදන යකින්නගෙන් විමසුවේ ය. එසේ නම්, විජයාගමන අවධියේ පටන් ලංකාවේ ගීත ගායනය පැවති බව හඳුනාගත හැකි ය. මහාවංස ටීකාව වන වංසත්ථප්පකාසනියේ මෙය විස්තර කරනුයේ,

"සිරිසවත්ථුම්හි නගරෙ නක්ඛත්තං කීළන්තානං ගීත සද්දංච තූරිය සද්දංච" (Vamsatthappakasini, 1935; 259,14. 55- 58).

එනම්, සිරිසවත්ථු නගරයෙහි නැකත් කෙළි සඳහා සැරසෙන්නවුන්ගේ ගී හඬ සහ තූර්ය වාදනය ද අසා යනුවෙනි.

[5] "Siddham , Aparimite lokahi Budha Same nati athana parama dulabe Savanuta pate anutare sathe mahasarane loka caka Budha nama sayabhu", "Me – galahi cihare Naka uvara (Jena) ma budha – sarana gate miciya ditika bidiya (Yaha – maga – parayana) bhute"

දේවානම්පියතිස්ස රාජ්‍ය (ක්‍රි.පූ. 250 - 210) සමයේ දී මහාවංසයේ දැක්වෙන පරිදි, මිහිදු හිමියන්ගෙන් බුදු සසුන මෙරට පිහිටියේ දැයි විමසී ය. එහි දී දීපවංසය හා මහාවංසය දක්වනුයේ, මේ කරුණ සම්පූර්ණ වන්නේ උපෝසථ කර්ම හා වෙනත් සංඝකර්ම සඳහා මුළු නගරයම ඇතුළත් වන පරිදි සීමාවක් පිහිටුවීමෙනි. (ඌණපූරණ සහිතො මහාවංසො, 1959) එමෙන් ම මේ සම්බන්ධ උත්සවය ජනයා වෙත දැනුම් දීම උදෙසා සිදු කෙරෙන අලුයම පවත්වන ලද බෙර වාදනයක් මෙන් ම ස්තුති මංගල ගීත පුරයෙහි සිව් දිශාවෙහි පැතිර ගිය බව සඳහන් වේ.

> *"නානාතූරිය සංඝුට්ඨෝ බලෝඝ පරිවාරිතො ථුති මංගල ගීතෙහි පුරයනෙතා චතුද්දිසං"*
> (ඌණපූරණ සහිතො මහාවංසො, 1959 ; 87, 196)

මහාවංසයේ තිස් එක්වන පරිච්ඡේදයේ විස්තර වන්නේ මහාථූප ධාතු නිධානෝත්සවය පිළිබඳ ය. එසේ ම සක්‍රයා සහ සියලු දෙවිවරුන් ඉටු කළ කාර්යයන් පිළිබඳ දීර්ඝ විස්තරයක් ද එහි ඇතුළත් වේ. සක් දෙවියන් මිණි පළඟක්, රන් කරඬුවක් ද ගෙන දෙදෙව්ලොව දෙවියන් පිරිවරා පැමිණියේ ය. විශ්ව කර්ම දිව්‍ය පුත්‍රයා රත්රන් මණ්ඩපයක රන් කරඬුව තැබී ය. මහා බ්‍රාහ්මයා ඡත්‍රය දැරී ය. සන්තුසිත දිව්‍ය පුත්‍රයා වල් විදුනාව ද, සුයාම දිව්‍යපුත්‍රයා මිණිතල්වැට ද ගත්හ. සිව්වරම් දෙවිවරු කඩු රැගෙනත්, දෙතිසත් දෙවි කුමරියෝ ද දඬුපහන් ගෙන සිටියහ. පංචශීඛ ගාන්ධර්ව දිව්‍ය පුත්‍රයා තුන් යොදුන් බේලුවපණ්ඩු වීණාව වාදනය කරමින් සිටියේ ය. තිම්බරු සූරියවච්චසා පංචාංගික තූර්ය භාණ්ඩ ගෙන රඟ මඬලක් මවාගෙන සිටියේ ය. එසේ ම,

> *"දෙවපුතතා අනෙකා ච ජෙකවන්තා මහිද්ධිකා ගායන්තා සාධුගීතං තං අට්ඨංසු පි සමන්තතො*
> *මහා කාලෝ නාගරාජා ථුතියෝ සොසකෝ යීතෝ නාගනාටකමජ්ඣම්හි බුද්ධගුණ මනුස්සරි*
> *"ඉති පි සෝ භගවා"ති ආදිහි පි බණෙ පන නෙකපදසහස්සෙහි ගොතමං සක්‍යපුංගවං"* (මහාවංසය, 2012 ; 270)

සෘද්ධිමත් වූ ද, දක්ෂ වූ ද නොයෙක් දිව්‍යපුත්‍රයෝ භක්ති ගීත ගයමින් සිටියහ. මහාකාල නා රජු නාග නෘත්‍ය මධ්‍යයේ "ඉති පි සෝ භගවා" ආදි සහස් ගණන් පදයන්ගෙන් ගෞතම බුදුන් වහන්සේ ගුණ සිහිකරමින් තුති ගී ගැයුවේ ය. අහසෙහි දිව්‍යමය තූර්යනාද පැවතුණි. දිව්‍යමය සංගීතය පැතිරිණ.

මහාවංසයේ උක්ත සඳහන තුළින් සංගීතයට හා වාදනයට උචිත වන පරිදි බුදුගුණ ගී ගැයූ බව ද, භක්ති ගීත යන්න ද සඳහන් වේ. එසේ නම් ගැයිය හැකි ගේය කාව්‍යය අනුරාධපුර යුගයේ දී ගීත, ගී යන්නෙන් අරුත් දැක් වූ බව ද, බෞද්ධ ගීත සම්ප්‍රදායක් පැවතුණු බව ද පැහැදිලි වේ. පාලිබෝධි වංසයට පරිකථාවක් වශයෙන් ගුරුළුගෝමී ආචාර්යයන් විසින් සම්පාදනය කරන ලද ධර්ම ප්‍රදීපිකාවෙහි තුති මංගල ගීතයෙහි යන්නට විවරණ සපයමින් මෙසේ සඳහන් කොට ඇත. *"ස්තුතීන් යුත් මංගල ගීත නම් රත්නයට ද රජහට ද ස්තුති විසින් ප්‍රවෘත්ති ගීත යැ"* (ධර්මප්‍රදීපිකාව, 1953 ; 342) මෙම තුති මංගල ගීත පහළ වූයේ රුවන්වැලි මහා සෑයෙහි ධාතු නිදන් කරන දවසෙහි වග ගුරුළුගෝමීහු වැඩිදුරටත් පවසති. මෙම විස්තරයෙහි ඉතාම පැරණි හෙළ වදන් හා යෙදුම් කීපයක් දක්නට ලැබේ. (අභයසුන්දර, 2006 ; 25)

වංසකථාව තුළින් අනුරාධපුර යුගයේ දී පවත්වන ලද විවිධ උත්සව හා ක්‍රීඩා රැසක් පිළිබඳ අනාවරණය කරගත හැකි ය. මහාදාඨික මහානාග (ක්‍රි.ව 9 - 12) රජු දවස පවත්වන ලද ගිරිහණ්ඩ පූජා උත්සවය මිහින්තලේ කේන්ද්‍ර කොට ගෙන පවත්වන ලද බව මහාවංසයේ දැක්වේ.

> *"චෙතියපබ්බතාවට්ටිතෙ අලංකරිය යොජනං යොජාපෙත්වා චතුද්වාරං සමන්තා චාරුවිථිකං වීථියො උභතො පස්සෙ ආපනානි පසාරිය ධජග්ඝිකා තොරණෙහි මණ්ඩයිත්වා තහිං තහිං දීපමාලා සමුජ්ජොතං කාරයිත්වා සමන්තතො නටනච්චානි ගීතානි වාදිතානි අකාරයි"* (මහාවංසය, 2012 ; 303, 77 - 79)

චේතිය පබ්බතය වටා යොදුනක් දුර සරසා, වීදි හා දොරටු සතරක් ද කරවීය. වීදි දෙපස සල්පිල් තනවා ඒ ඒ තැන, ධජ , ඇඟෑ සහ තොරණවලින් අලංකාර කොට, හාත්පස පහන් පෙළින් ආලෝකවත් කරවා, නෘත්‍ය, නාටක, ගීත හා වාදනය කරවීය. මහාවංසයේ "ගිතානි" යනුවෙන් නෘත්‍ය, නාටක හා වාදනයට ගැයූ කාව්‍ය හඳුන්වා ඇත. එසේ නම්, අනුරාධපුර යුගයේ පාලි ව්‍යවහාරයෙන් ගේය කාව්‍යය යන්න ගීතානි ලෙස ද හඳුන්වා ඇති බව පෙනේ.

මහානාම රාජ්‍ය (ක්‍රි.ව.406 - 428) කාලයේ දී ලංකාවට වැඩම කරන ලද බුද්ධඝෝෂ තෙරණුවෝ එතෙක් හෙළ බසින් පැවති අටුවා පාලියට නැඟී ය. සුත්තනිපාතට්ඨකථා ඇසුරින් ලියන ලද පරමත්ථජෝතිකා අටුවාවේ ගී පිළිබඳ සඳහන් වේ.

> *" සීහල දීපේ මග්ගපස්සේ සස්සං රක්ඛන්තියා සීහල චේටිකාය සීහල කේනේව ජාතිජරාමරණං පටිසංයුත්තං ගීතං සුත්වා"* (පරමත්ථජෝතිකා, 1920; 335)

සිංහල දීපයේ මග අසල ඇල් කෙත් රකිනා සිංහල ගෙවිලියන් සිංහලයෙන් ජාති ජරා මරණ ආදියෙන් යුතු ගීයක් අසා යනුවෙන් එහි සඳහන් වීමෙන් පාලි අටුවා ග්‍රන්ථ ඇසුරේ ද ගී ගැයූ බව හඳුනාගත හැකි ය.

සාකච්ජාව

ගීතය පිළිබඳ බෞද්ධ ආකල්පය ද වඩාත් වැදගත් තේමාවකි. චුල්ලවග්ගපාලියේ ගීත ස්වරයෙන් ධර්ම දේශනා කිරීමේ ආදීනව පහක් ඇති බව පෙන්වා දී ඇත. (Cullavagga Pāli Manuscript ; 201 "පඤ්ච ආදිනවා ආයතකෙන ගීතසසරෙන ධම්මං ගායනතසස, අත්තාපි තස්මිං සරෙ සාරජජති, ගහපතිකා පි උජ්ඣායන්ති, සිරිකුත්තම් නිකාමය මානසස සමාධි භංගො හොති, පචජිමා ජනතා දිට්ඨානුගතිං ආපජ්ජති") මේ අනුව, පැහැදිලි වනුයේ ආයතක ගීත ස්වරය හෙවත් දීර්ඝ ලෙස ඇද පැද තාලයකට ගයන එනම් ගේය පද නොඑසේ නම්, ගේය කාව්‍ය ලෙස ධර්ම දේශනය සිදු නොකළ යුතු බව ය. ඊට හේතුව එලෙස ගායනය කිරීමෙන් ජන මනරංජනය වීමත්, එලෙසින් ධර්ම දේශනා සිදුකිරීමෙන් දුක්කටාපත්තියකට හේතු වීමයි. මෙසේ ගේය කාව්‍ය විලාසයෙන් ධර්ම දේශනය අකැප බව චුල්ලවග්ගපාලියේ මෙසේ සඳහන් වේ. *"න භික්ඛවෙ ආයතකෙන ගීතස්සරෙන ධම්මො ගායිතබ්බො යො ගායෙය්‍ය ආපතති දුක්කටස්ස"* (Cullavagga Pāli Manuscript ; 191) මහණෙනි, දික් වූ ගීත ස්වරයෙන් ධර්මය ගායනය නොකළ යුතු ය. යමෙක් ගායනය කෙරේ නම් ඔහුට දුකුලා ඇවැත්වේ යැයි සඳහන් වේ.

සිංහල ගේය කාව්‍යයේ වර්ධනයේ ප්‍රධාන අවස්ථාවක් හඳුනාගත හැකි වන්නේ සීගිරි ගී තුළින් ය. අනුරාධපුර යුගයේ සාහිත්‍ය පිළිබඳ අවබෝධ කර ගැනීමට ද සීගිරි ගී තුළින් නොමද පිටිවහලක් ලැබේ. සීගිරි රාජධානිය කාශ්‍යප රාජ්‍ය (ක්‍රි.ව.473 - 491) කාලයෙන් පසු අභාවයට පත්වීමෙන් පසුව, දීර්ඝ කාලයක් නන් දෙසින් සීගිරිය නැරඹීමට පැමිණි විවිධ තරාතිරම්වල ජනයා මේ ගී ලියා ඇත. සීගිරි ගී හත්වන, අටවන, නවවන, දහවන සියවස්වල දී රචනා කරන ලද ඒවා ය. සීගිරි ගී බොහෝ දුරට ගී කාව්‍ය ආකෘතියෙන් රචනා කර ඇත. සීගිරි කැටපත් පවුර පුරා කුරුටු ගෑ ගී කවි රචනා අතරින් 685 ක් කියවා ඒවා පාඨකයා අතට පත් කරන ලද්දේ සෙනරත් පරණවිතානගේ පර්යේෂණයන්ගෙනි. (Paranavitana, 1956). සීගිරි ගී රචකයන් හට සියබස්ලකරේ එන අලංකාර විධි ආභාසය වූ බව ද හඳුනා ගත හැකි ය. විශේෂයෙන් සීගිරි ගී රචකයන් උපමා, රූපක, ආක්ෂේප, අර්ථාන්තරන්‍යාස වැනි වූ අලංකාර විධි පවා භාවිත කර ඇත. සීගිරි ගී අතර *" ග - ගැයීම , ගනරිසි - ගායන රුචිය, ගන්ධර්ව - ගාන්ධර්ව, ගැයුම් - ගායනය, ගී- ගීත, ගී රස - ගීත මිහිර, නට - නාට්‍ය, වය - වැයීමේ - වාදනය, වෙණ - වීණාව යනාදී වචන දක්නට ලැබේ."* (Paranavitana, 1956).

සිගිරි කුරුටු ගී තුළින් එකල ගීත සහ ගායනය පැවති බව හඳුනාගත හැකි, සීගිරි ගී රැසක් ම හඳුනාගත හැකි ය. සිංහල ගේය කාව්‍ය සාහිත්‍යයේ ස්වර්ණමය අවධියක් මේ තුළින් හඳුනාගත හැකි ය. විශේෂයෙන් ම සුගේය කාව්‍යයන් රැසක් ම විවිධ විරිත්වලට අදාළව ලියැවුණු අවස්ථා හඳුනාගත හැකි ය.

"ත (මා මෙ) තමහ(ට) නොරුස්නා (ක්) නො කෙරෙජ් බල(ය) ගත් බෙයන්ද් හි සිටි (තමා) අම්බුයුක් මය් මහනෙ(ලින්) රුහු(ණින්) ආ(බෝ)ය (ල තම) සිත අම්බු යොමා ගෑ ගී" (Paranavitana, 1956).

අර්ථය : තමහට නොරුස්නා දෙයක් තමා මැ බලා නොකරයි. එසේ වුවද, බෙයන්ද්හි සිටි කතක් තමන් ගත් මහනෙලින් මා පිළිගත්තා ය. රුහුණින් ආ බොයල නමැත්තා ස්ත්‍රිය පිළිබඳ සිත යොමා ගැයූ ගී යයි. මෙම ගීයෙහි පළමු, තෙවන පාදයන්හි මාත්‍රා නවයකින් හා එකොළොසකින් ද, දෙවන, හතරවන පාදයන්හි එකොළොස බැගින් දැයි (සිව් පදයෙහි) ලඝු අක්ෂර දෙසාලිසකින් බඳින ලද යාගී නම් විරිත දැකගත හැකි ය.[6] (එලුසඳැස් ලකුණ, 2005) එ දවස වන විට ගේය කාව්‍ය තුළ පැවති ලාවණ්‍යය මේ තුළින් ප්‍රකට කෙරේ.

"සුක තොවි ගල බලා සිට ගී කියවන්නක් ත (මබ) ලවන් තුනු ඉග් තියෙ(ළ) කතුන් අප සිහිගිරි" (Paranavitana, 1956).

අර්ථය : ගල බලා සිට ගී කියවීම තම සැපතකි. සීගිරියෙහි තඹ පැහැති තොල්, සිහින් ඉඟ ඇති කාන්තාවෝ අප ශෝකයට පත් කළහ. මෙම ගීයෙහි විෂම පාදයන්හි මාත්‍රා නවයකින් හා දශයකින් ද, සම්පාදයන්හි මාත්‍රා දශයකින් හා එකොළොසකින් ද, මාත්‍රා සතළිසකින් බඳනා ලද වෘත්තය වන කවි ගී නම් විරිත දැකගත හැකි ය. (එලුසඳැස් ලකුණ, සංස්. වැලිපිටියේ සෝරත, කොළඹ 2005 "වසම්හිමත් නෙවෙන් - දෙසෙන් සෙමෙහි දසෙකොළොස්, සතළිස් මතින් බඳ හොත් කවි නම් මෙ මේ නිදසුන්")

"සවසති සමන් ගැ ගී අ(මඩ) ක් ලෙඩ් (සි) නොවි වරල් නිල්වලා සිහිල් ලබු ගැහැනි මය පෙලෙබු දි මන්ද සිනා බැල්ම(ක්)" (Paranavitana, 1956).

[6] "නවෙකොලොස් වසමැ - එකොළොස බැගින් සෙමෙහි, ලුහු බහළින් බදුයේ - යා ගී ය මේ නිදසුන්"

අර්ථය : යහපතක් වේවා! සමන් ගැයූ ගී යයි. කොමඩු ඇට වැනි සිනාව ද, සිතිල නිල් වලාකුළු වැනි එල්ලෙන වරල ද ඇති ගැහැනිය මඳ සිනා සහිත බැල්මක් දී මා සැනසුවා ය. මෙම ගීය ද යාගී විරිතට අනුව රචනා කරන ලද්දකි. එසේ ම මෙහි කියවෙන කථකයා ගීයක් ගැයූ බව ද සඳහන් වේ. එසේ නම් එකල ගීයක පැවති ගේයතා ගුණයෙන් හෙබි වචන මෙහි දැකගත හැකි බව ද කිව යුතු ය. තවද, ගී ගායනය කිරීමේ දී ඒවා විරිතට රචනා වූ බව මෙමගින් පෙනේ.

"ස්වස්ති (නොදෙ) යි කෙසේය් සිතෙ(ය්) කළ (යහ) ගී අසා මෙසේ බෙයන්ද්හි රන්වනන් අත ලු ලෙ(ද) පෙති (ම)හ(නෙ)ල් මලින් මල් (ඔ) ජලු ගී ගැහැනී ලියක් බෙයන්ද්හි රන්වනුන් අ(ත)රෙ මන ම තමහට මෙගත් හත්හි අතින් (මැ) ඩැලැ ඔ(ජ) ල මී ගී" (Paranavitana, 1956).

අර්ථය : යහපතක් වේවා! ම විසින් රචිත මේ යහපත් ගීය අසා බෙයදෙහි ස්ත්‍රිය (තමා) අත තුබූ දෙපෙති මහනෙල් මල්වලින් මල් නොදෙතියි (ඔබට) කුමක් නිසා සිතේ ද? ඔජලගේ ගීයයි බෙයදෙහි රන්වනුන් අතරෙහි එක් ගැහැනු ලතාවක් එක අතක තුබූ මල් අනික් අතින් මිරිකා මා සිත තමාට ම ගත්තා ය. ඔජල වෙමි (මේ මගේ) ගී යයි.

මේ ගීයෙහි විශේෂත්වය වන්නේ ගීයෙහි ස්ථායි කොටස එක් විරිතකින් ද, අන්තරාව තවත් විරිතකින් ද යුතුවන පරිදි තාල දෙකක්ට ගැයීමට උචිත පරිදි රචනා වී තිබීමයි. එනම්, පළමු ගීයෙහි විසම පාදයන්හි මාත්‍රා නවයකින් හා එකොළොසකින්, සමපාදයන්හි මාත්‍රා එකොළොසින් හා තෙළෙසකින් දැයි මාත්‍රා සිවු සාලිසකින් පබැඳූ විට නිමවෙන දුවග ගී නම් විරිත ද[7], (එලුසඳැස් ලකුණ, 2005; 18) පළමු පාදය බෙයන්ද්හි යන වචනයෙන් අවසන් වන්නේ නම් දෙවන ගීයෙහි විසම පාදයන්හි මාත්‍රා අටකින් හා දසයකින් ද, සමපාදයන්හි මාත්‍රා එකොළොසකින් හා තෙළෙසකින් දැයි මාත්‍රා දෙසාලිසකින් බඳින ලද බමර ගී නම් විරිත ද හඳුනාගත හැකි ය.[8] (එලුසඳැස් ලකුණ, 2005 ; 16)

මෙම සියලුම සීගිරි ගී විරිතකට ලියවුණේ මන්ද? සැබවින් ම විරිතකට ලියන ලද්දේ ගායනය උදෙසා ය. සංස්කෘත අලංකාර මෙන් ම කවි සමය පිළිබඳව ද ඔවුන් සතු ප්‍රතිභාව මේ ගී තුළින් පෙනේ. ගේයතා ගුණය මෙන් ම කවිතා ගුණය ද එකට කලතා කළ මේ නිමැවුම් පුරාණ ගේය කාව්‍යයේ එක් අවස්ථාවක් ලෙස පෙන්වා දිය හැකි ය.

"(මි) හින්ද් කී ගී නොලබන්නෙ බසක් ගී(ය) බන්ද්මි හො සෙර සෙ සිවි
ම යත් යත් අය්හ නො විද බ(ලම්)න් සොවින් හින්දනා" (Paranavitana, 1956).

අර්ථය : මිහින්ද් කී ගීය ශෝකයෙන් (ඈ දෙස) බලා හිඳිනා මා කියත් කියත් ම, අයහපතක් සිදු නොවුව ද ඈ සෙරක මෙන් සිනාසුණා ය. (එහෙත්) වචනයක් නොලබන්නෙම් ගීය රචනා කළෙමි. මෙම ගීයේ ඇතුළත් වන්නේ ද යා ගී විරිත යි. (එලුසඳැස් ලකුණ, 2005 ; 18) සීගිරි ගී රචකයන් අතර මේ විරිත ද බෙහෙවින් ප්‍රිය කළ විරිතක් බව පෙනේ. පැරණි ගේය කාව්‍යයේ විප්‍රලම්භ ශෘංගාර රසය ඉස්මතු වන සීගිරි ගීයක් ලෙස මෙය හඳුනාගත හැකි ය. මෙම සීගිරි ගීයෙහි විශේෂත්වය ගේය කාව්‍ය රචකයෙකු පිළිබඳව

[7] "නවෙකොළොස් වසමැ - ඇරින් තෙරින් සෙමෙහි දු, සිදුහල් මතින් බඳහොත් - දුවඟ ගී මේ නිදසුන්"
[8] "වසමැ අට දස මත් - සෙමෙහි දු ඇර තෙළෙසින්, ගෙතු බහල් මත්තෙන් - බඹර ගී නම් හෙ මෙසේ"

සඳහන් වී තිබීමයි. ඔහුගේ නම මිහින්ද් ය. ගී රචකයා ඇයට කොපමණ කතා කළත්, ඇගෙන් පිළිතුරක් නොලැබුණු බව සඳහන් කරයි.

"බොයිගමු වැසි ම කිවි මිහිදලැ ගී නුයුන් හැයි මතෙ ගිරි බල(ත) මෙය් අලුතින් ඇසින්
බලන්නට් මෙ(අ) තින මල්(ග)ත් ලියක් බින් සිත්තමෙ මෙ කව මිත් බතීන් එසිත්ත (ම) සිහි වී එත ඇ (සි වි)
බලත් මෙය නොමෙ සිත් ගත්තා හු කිවියර්හු නම් වෙ කි ලු සෙලති නෙත් මන්දක් (එ) පිටින්
යොතෙක් ඇදි වෙත" (Paranavitana, 1956).

අර්ථය : බොයිගමුවාසි කවි මිහිදල් වූ මගේ ගී ය. මේ සිත්තමෙහි අතින් මල් ගත් කාන්තාවක් ඇසින් බැලීමට පැමිණ මෙය බලන කල්හි (කෙනෙකුගේ) ඇස් ගිරි මුදුනට අදින්නී ය. මිත් බතීන් ඒ සිත්තම සිහි වී එක මේ කව ඇසුවේ වෙයි මෙය බලන කල්හි සිත නොඇදුණු අය කිවිවරහු නම්, එපිටින් සිට ලණුවක් අදින කල ඔවුන්ගේ ඇස් මදක් සෙලවෙතියි කියනු ලැබේ. මෙම ගීයෙහි එන ගේය කාව්‍ය රචකයා බොයිගමුවේ මිහිදල් නමැත්තෙකි. සිත්තම්වල රස නොවිඳින තැනැත්තා රූකඩයකට සමාන බව කියමින් ඔහු මේ ගීය කවිතා ගුණයෙන් ද අනුනව ලියා ඇත.

"ස්වස්ති මි(ත)ලු කිය (ලු ගී)
සුක තොප (වි) දි(වි) ගිය (මො) යින නො වියි නි(බි) දු තද
ගත මයි නිවසෙ මෙහි (එ) ත (සිත හැ) දි සිට මොයිනට" (Paranavitana, 1956).

අර්ථය : යහපතක් වේවා, මිතලු කියා ලූ ගීය. (තා) මොවුන්ට (මේ කතුන්ට) සිත ඇදී සිට එන කල්හි මොවුන්ගේ (හදවත) තද නොවී තිබියදීත්, මා මෙහි පදිංචි වූ නිසා තගේ ප්‍රීතිය අතුරුදහන් විය.
මේ ගීය ද යා ගි විරිතින් රචනා කරන ලද්දකි. (එලුසඳැස් ලකුණ, 2005) ගායනය කරන කවි ලිවීමේ දී සීගිරි ගී රචකයන් විසින් වැඩි වශයෙන් ම භාවිතයට ගන්නා ලද්දේ යා ගී විරිත බව කිව යුතු ය.

"(අතුළ) විටි පෙරිවෙනැ වැසි ද (ය) ල් බතිමි. ස්වස්ති
නොසිටිහු අ යන කල මෙ ගි ඇසෙ (ත එත් වෙ) ත මයි
ත කියු බ(සවී) නොසසු අසද්හ යන්නක් මියුලැසි" (Paranavitana, 1956).

අර්ථය : අතුළ විට පරිවේණවාසි දයල් බති වෙමි. යහපතක් වේවා ආ! මා එනකල් ඔවුහු (කාන්තාවෝ) නොසිටියහ. මේ ගී ඇසෙන විට ඔවුහු මා වෙත එති "මියුලැසියන් විශ්වාස නැත" යනුවෙන් තා කී වචනය මෙසේ අසත්‍ය වේ. මේ ගීතය රචනා වී ඇත්තේ දුවඟ ගී විරිතට ය. (Paranavitana, 1956). මීට පෙර සාකච්ඡා කළ පරිදි මෙම විරිත සීගිරි ගී රචකයන් ගී පබැඳීමේ දී සුලබ ලෙස භාවිත කළ විරිතක් බව හඳුනා ගත හැකි ය. ගී ගැයූ බවට මෙම සීගිරි ගීය ද නිදසුනකි.

"ස්වස්ති මහමෙත් හිමියා අබුනාල් හිමියබුයුන් ග ලියු (මෙ) ගී
නොජනම් හ මුන් මිහි විලබු කුම් ජැයක් ආව
මෙ ලිය පියෙ එයුන් මෙ තමන් දිවිය වියි පවසා" (එලුසඳැස් ලකුණ, 2005)

අර්ථය : යහපතක් වේවා. මහමෙත් ස්වාමියාගේ බිරිඳ වූ ගාල් ස්වාමිදුව ගයා ලියූ ගීය. මොවුන් මෙහි විල නමැති කාන්තාව (වෙත) කවර කරුණක් සඳහා ආවේ දැයි නොදනුම්හ. ඔවුහු (මෙය) තමන්ගේ ජීවිත (පුරුද්ද) වී යැයි කියා මෙය ලියා ලුයෙමි. යාගී විරිතට අනුව ලියවී ඇති මෙම ගීයෙහිද ගී ගැයූ බව සඳහන් වේ.

"වෙණමාණ වැසි සිවල බතිමි. බල බැද ගී) බලනනට රමණී අහස පොකුණ කැටැබිති ගෙහිනුහු සිතතම ගී රස පූ කෙ(නක) මෙන් නො" (Paranavitana, 1956).

අර්ථය : වෙණවාණවාසි සිවල බත වෙමි. (සීගිරිය) බලා බැඳි ගීය. අහස, පොකුණ, කැටපත් පවුර බලන්නට රමණීය යි. සිත්තමෙහි ගැහැනු ගී රස පානය කළ අය මෙන් නොවෙත්ද? මෙම ගීය අනුව, සුන්දර දර්ශනයක් නැරඹීම සඳහා ගී ගයමින් සුදානම් වන්නා වූ පිරිසක් පිළිබඳව හඳුනාගත හැකි ය. එසේම, මෙම ගීය කවි ගී විරිතට අනුව රචනා වී ඇත. (Paranavitana, 1956). එම විරිත ද මීට පූර්වයෙන් සීගිරි ගීවල දක්නට ලැබුණි. මෙලෙසින් සිංහල ගේය කාව්‍යයේ ඉතිහාසය පිළිබඳ විමසීමේ දී සීගිරි ගී තුළ එලුසඳෑස් ලකුණේ ඇතුළත් වූ ගී, යා ගී, කවි ගී, දුවඟ ගී, යොන් ගී, බඹර ගී, උමතු ගී, මත් ගී, පියුම් ගී, යොන්මත්වැල් ගී, කාරිකා ගී, ගජගැමි ගී, පෙද ගී, සමුදුරු ගොස්, නරඟ රඟ යන විරිත් අනුව රචිත ගී දැකගත හැකි ය. (එලුසඳැස් ලකුණ, 2005)

සීගිරි ගී පිළිබඳ සමස්ත විග්‍රහයක යෙදෙන අනුරාධ සෙනෙවිරත්න පෙන්වා දෙනුයේ, සීගිරි ගී තුළ කාව්‍ය සම්ප්‍රදායන් දෙකක් ඇති බව ය. එකක් සංස්කෘත කවි සමය අනුව හැඩ ගැසුණු පණ්ඩිත ගෝචර කවි සම්ප්‍රදාය යි. දෙවැන්න ජනකවි සම්ප්‍රදාය යි. (සෙනෙවිරත්න, 2007) එපමණක් නොව සීගිරි ගී තුළ ගේය කාව්‍යයක දක්නට ලැබෙන ගී කාව්‍ය ආකෘතිය වගේ ම සිවුපද කාව්‍ය ආකෘතීන් ද කාව්‍යාත්මක ලෙසින් ලියැවුණු අවස්ථා නොමදව හඳුනාගත හැකි ය.

"නොහිද කසුන් ගිරිදේ අ සිරි ලක් සිහිගිරි *පසු*
පන්සිය අග්නන් සගයන්නා කෙළෙ *පසු*
එඩි රූපු දප් බින්දල(ය්) අ(ත) ළෙ (නැගැ) බෙයද් ආ *හිසු*
වහසින් (ත) ම මිලියෙන් ඇස කළෙ සි (ට) අග්නන්ම *දසු"* (Paranavitana, 1956).

අර්ථය : අප ශ්‍රී ලංකාවේ සීගිරිය, කාංචන පර්වත රාජයා පසු පසින් නොතැබී ද? පන් සියයක් අඟනෝ ස්වර්ගයට යන තැනැත්තා ප්‍රමාද කළෝ ය. කාන්තාවෝ මඳ සිනාවෙන් හා ඇසිපිය හෙළීමෙන්, අහංකාර සතුරන්ගේ දර්පය බිඳ (ගල්) තලාව නැග බෙය ද මුදුනට ආ මා දාස භාවයට පත් කළාහු ය.

මෙම සිවුපද ආකෘතිය සුලබ ලෙස ගේය කාව්‍ය සාහිත්‍ය පෝෂණය වීමට බලපා ඇත. එබැවින් එහි මූලික අවස්ථාව ගැබ් වී ඇත්තේ සීගිරි ගී තුළ බව පහත නිදර්ශන විමසීමෙන් ද වටහාගත හැකි ය.

"කොමුල් අමඬ ලෙඬ ලින *සී*
එ බොන්ද් මියුර් යහ බැ *සි*
එකපල් දල වන් *දිගැසී*
මන ජල් (ව)යි (සිත්) *නොමුසී"* (Paranavitana, 1956).

අර්ථය : (ඇය) ලු කොමළ සිනාව කොමඩු ගෙඩියක ඇට (පෙළට සමානය). ප්‍රිය වචනය එහි මදය මෙන් මියුරු ය. (ඇගේ) දික් වූ ඇස් එහි පිට පොත්ත වැනි ය. (ඇය මගේ) සිත ජ්වලිත කරයි සිත හැර නොයයි.

හමුල් මරු ජහස් සුයුහස් සන්දල්ලා
තුරු ගල් කොහල් හු මල ගල්හි හැල්ලා
ගණනින් මුත් කලබ් කළ තම්බ ළපල්ලා

පැරැය දිගැස් ත දුන් හසුන් කුම් වාල්ලා" (Paranavitana,1956).

අර්ථය : සුළං හැමිය. දලු ලා තිබූ ගස් සිය දහස් ගණන් පතිත විය. කොහා නාද කළේ ය. මලය පර්වතයෙහි දිය ඇලි විය. ගණනින් නැති කණාමැදිරියන් විසින් රාත්‍රිය තඹ දලු පැහැ කෙරිණ. දිගැසිය තී දුන් පණිවුඩයෙන් කවර පිහිටක් සිදුවේද? මෙම සීගිරි ගීයෙහි විශේෂත්වයක් වන්නේ එය එළිසම පද්‍යයක් වීමයි. එසේ ම, උසස් කවිතා ගුණයකින් ද යුතු වේ.

සීගිරි ගීයෙහි විරිත් ලක්ෂණ පිළිබඳ විග්‍රහ කිරීම ප්‍රථමයෙන් සිදු කරන ලද්දේ සෙනරත් පරණවිතානයන් ය. ඉක්බිතිව මේ ගී පිළිබඳ විචාරකයන්ගේ නොමද අවධානයට ලක් වූහ. ගේය කාව්‍ය සම්ප්‍රදායක් බිහිවීමට සීගිරි ගීයෙහි වෘත්ත ආකෘති මූලික ලෙස බලපා ඇත. *"සීගිරි කැටපත් පවුරු ගීත අතර දක්නට ලැබෙන ගීවලින් වැඩි සංඛ්‍යාව එනම්, මුළු ගී සංඛ්‍යාවෙන් හාරසිය තුනක්ම යා ගී විරිතට අනුව බඳන ලද ගී වෙයි. යා ගී විරිතෙහි මාත්‍රා සංඛ්‍යාව හතළිස් දෙකකි. පළමුවන හා දෙවන පාදයේ මාත්‍රා නවය හා එකොළොස බැගින් ද, තුන්වන හා සතරවන පාදයේ පිළිවෙළින් එකළොස බැගින් ද වේ. මීළඟට වැඩිම සංඛ්‍යාව ඇත්තේ කවි ගී විරිතට ය. එහි සංඛ්‍යාව අසූහයකි. මාත්‍රා යෙදෙන්නේ 9. 10. 10. 11 වශයෙන් 40 කි. ඊළඟට දුවඟ ගී විරිතට බඳනා ලද ගී යි. එහි මාත්‍රා සංඛ්‍යාව 9.11.11.13 ය. බමර ගී විරිතට බඳනා ලද ගී විටී අටක් ද දක්නට ලැබේ. එහි මාත්‍රා වැටෙන්නේ 8.11.19.13 වශයෙන් 42 කි. උමතු ගී විරිතට බඳනා ලද ගී එකොළසක් ද වේ. එහි මාත්‍රා ගණන 8.8.8.13 වශයෙන් මාත්‍රා 8.11.10.11 යනුවෙන් මාත්‍රා 40 කි. මත්වල ගී විරිතෙන් බඳනා ලද ගී දෙකක් ඇත. එහි මාත්‍රා සිටින්නේ 8,11.8.13 වශයෙන් 40 කි. පියුම් ගී ලද ගීයක් ද වේ. ගී විරිතෙන් බඳනා ලද ගී දෙකක් ද වේ. එහි මාත්‍රා 8.11.9.13 වශයෙන් 41 ක් ද ගැනේ"* (සෙනෙවිරත්න, 2007)

අනුරාධපුර යුගයේ සිංහල ගේය කාව්‍යය සම්ප්‍රදාය පැවති බවට නිදසුන් සියබස්ලකරින් හඳුනාගත හැකි ය. මෙම කෘතිය දැනට ලංකාවෙන් හමුවන පැරණිතම කෘතියයි. සංස්කෘත පඬිවරයෙකු වූ දන්ඩින් කාව්‍යාදර්ශයේ අනුවාදයක් ලෙස මෙම කෘතිය පෙන්වා දිය හැකි ය. සියබස්ලකරේ කතුවරයා සලමෙවන් නම් විරුදය දරූ සේන නමැත්තෙකි. ඇතමෙකු අදහස් කරනුයේ ඔහු iv වන සේන රජු බව ය. එහෙත්, එම අදහස ඇතැම් ඉතිහාසඥයෝ ප්‍රතික්ෂේප කරති. සංස්කෘත ග්‍රන්ථය අනුගමනය කළ ද මෙහි දේශීය ලක්ෂණ ද ඇතුළත් වන බැව්"පෙදෙන් බුදු සිරිතැ"යනුවෙන් පද්‍ය කාව්‍යයක් සඳහා බුද්ධ චරිතය වස්තු කොටගත යුතු බව සඳහන් වීමෙන් පැහැදිලි වේ. සියබස්ලකර තුළ එදවස පැවතුණු ගී පිළිබඳව ද සඳහන් වේ. එනම්," ලිය ගී ගදෙව්නි බිජි - තවර වුවපුල් තඹරේ" (සියබස්ලකර විවරුව, 1963 ; 59) යනුවෙන් මෙකල ලිය ගී ගැයූ බව සඳහන් වේ. එසේ නම්, ලංකාවේ පැරණිම ග්‍රන්ථයේ ගී ගැයීම, පිළිබඳ සඳහන් වීමෙන් එදවස ද ගේය කාව්‍ය පැවති බව නිගමනය කළ හැකි ය. සියබස්ලකරේ එන තහංචිය වූයේ පද්‍යයෙන් වර්ණනා කළ හැක්කේ බුද්ධ චරිතය පිළිබඳව බව ය. එබැවින් කවීහු බුද්ධ චරිතය වෙනුවට බෝධිසත්ත්ව චරිතය මාතෘකා කර ගත්හ. එහෙත්, රාජවර්ණනා තහංචි වුයේ නැත. එබැවින් අනුරාධපුර යුගයේ දී ගී ගයන ලද්දේ රජුන් උදෙසා ප්‍රශස්ති වශයෙන් බව හඳුනාගත හැකි ය. එසේ නම්, අප අවධානයට යොමු විය යුතු අනුරාධපුර යුගයේ රාජ ප්‍රශස්ති ගායනය වූයේ නම් එවැනි ගේයකාව්‍ය ප්‍රබන්ධ ඇතුළත් වුයේ කුමන මූලාශ්‍රයවල ද

යන්නයි. එවැනි වූ ප්‍රශස්ති පුරාවිද්‍යාත්මක මූලාශ්‍රයන් සුලබ ලෙස දැකිය හැකි ය. මෙම අධ්‍යයනයේ මීළඟ අදියර තුළින් විමසා බැලෙනුයේ ගේය කාව්‍යමය ප්‍රශස්ති ඇතුළත් සෙල් ගී පිළිබඳව ය.

සිංහල ගේය කාව්‍ය රචනයේ තවත් අවස්ථාවක් වන්නේ ප්‍රශස්තිමය ස්වරූපයෙන් රචනා කරන ලද සෙල්ලිපි ය. මෙම ප්‍රශස්ති සෙල්ලිපි "කවීන්ට විනා රජවරුන්ට හෝ වාර්තාකරුවන්ට හෝ ගල් වඩුවන්ට හෝ පූර්වෝක්ත ශිලා ලිපි සම්පාදනය කළ නොහෙන බව සත් සුදක් සේ පැහැදිලි ය. ක්‍රිස්තු පූර්ව අවදියෙහි සිට යම්තාක් කාලයක් රජවරුන්ට වාර්තාකරුවන්ට හෝ ගල්වඩුවන්ට ඒ කාර්ය කළ හැකිව තිබුණි. මන්දයත්, පැරණි ශීලා ලිපිවල බොහෝ විට තිබුණේ ලෙන් පුජා වැනි කිසියම් පිංකමක් ගැන පේලි කිහිපයක වාර්තාවක් බැවිනි. එහෙත් පූර්වෝක්ත ශිලා ලිපි රචනා කර ඇත්තේ සංස්කෘත කවි සමය ගැන, අලංකාර ශාස්ත්‍රය ගැන දැනුමක් ඇති උදවිය යි. තවද ඔවුනන් රචනා කළේ ගද්‍ය කාව්‍ය පමණක් නොවේ. ඔව්හු පද්‍ය කාව්‍ය ද රචනා කළහ." (ආරියරත්න, 2014 ; 33) තවද, මෙම සෙල්ලිපි අධ්‍යයනයේ දී පෙනී යනුයේ මුල් පේළි කිහිපය ගැයීමට උචිත පරිදි රචනා කර ඇති බව ය. ගේය කාව්‍යමය ප්‍රශස්තියක් එම පේළිවල දක්නට ලැබීම සුවිශේෂත්වයකි. එසේනම්, වෘත්තීයමය ගේය කාව්‍ය රචකයන් රජුන් උදෙසා මෙම ප්‍රශස්ති රචනා කළ බව ද, ඔවුන් විරුද රචනා කිරීමේ දී එහි ආරම්භය ගීතාත්මක ලෙස ප්‍රශස්තිමය ස්වරූපයෙන් රචනා කළ බැව් හඳුනාගත හැකි ය. විශේෂයෙන් ම පූර්ව බ්‍රාහ්මී යුගයේ ලිපිවල නොව අපර බ්‍රාහ්මී යුගය, පශ්චාත් බ්‍රාහ්මී යුගය යන යුගවලට අයත් සෙල්ලිපිවල මේ ලක්ෂණය දැකගත හැකි ය. මතු දැක්වෙන නිදර්ශන මේ සඳහා විමසිය හැකි ය.

"මගුල් සිහසුන් රක් ගල් තල අරා වදන් බෙරසි (නා)
නෙත් රුපු වරණින් ඇඩි මන්ද සින්දූ සි පැරැක්මෙන් වැ (ජ)" (ශිලාලේඛන සංග්‍රහය, 2000 ; 15)

පස්වැනි දප්පුල (ක්‍රි.ව. 940 - 952) රජු දවස ලියැවුණු මේ ලිපිය රජුගේ අභිෂේකයෙන් දෙවන වසරේ දී වීරාංකුරා අරමවාසී සඟනට කැප සරුප් පරිදි දුන් රන් කලන්ද දෙසියයක් ගැන වාර්තා කිරීමේ දී රාජ විරුද ප්‍රශස්තිය රචනා කළ විරුද රචකයා එය කාව්‍යමය බස් වහරින් මෙන් ම ගැයීමට උචිත පරිදි ගේය කාව්‍යමය ස්වරූපයෙන් රචනා කරන ලද්දක් බව පෙනේ.

"ස්වසති සිරිබර් සැහැ කුල කොත් ගුණ අමබරණින් සැ දි ලක් පොලො මෙහෙසනට් තලා ටික් බන්දූ දසරදධම් සතර" (ශිලාලේඛන සංග්‍රහය, 2000 ; 17)

උක්ත ශිලා ලිපි කොටස් විමසීමෙන් බලන විට පෙනී යනුයේ ඒවා වෘත්තීයමය විරුද රචකයන් විසින් ලියූ බව සහ එසේ ලිවීමේ දී ඒ සියල්ලෙන් ම එකම ශෛලියක් එහි දී අනුගමනය කර ඇති බවයි. සැහැල්ලක් මෙන් එක පෙළට ගැයීමේ හැකියාවක් ඒවා තුළ දැකිය හැකි ය. එසේ නම්, අනුරාධපුර යුගයේ ගේය කාව්‍යයේ හැඩරුව මේවා තුළ යම්තාක් දුරකට නියෝජනය වන බව ද, ඒවා අතිශයෝක්ති අලංකාරයෙන් මෙන් ම රූපකාලංකාර, උපමාලංකාර බාහුල්‍යයක් යොදා ගන්නා බව විමර්ශනය කළ හැකි ය. *"මගුල් සිහසුන් රත්ගල්තල, රුපු වරණින්, සොම් නිමල ගුණ වතුර, ආදී වූ රූපකාලංකාර, අරා වදන් බෙරසිනා, ඇඩිමන්ද සින්දූ, වැනි උපමාලංකාර ආදියෙන් අලංකෘත මේවා ගද්‍ය රචනා ලෙස රචනා කළද, සියබස්ලකර වැනි පද්‍ය කෘතීන්ගේ ආභාසය ලබාගනිමින් විරුද රචකයන් මේවා රචනා කළ බව කිව හැකිය. එබැවින්, පූර්වෝක්ත සෙල්ලිපි නොහි කවීන් පිරිසක් විසින් රචනා කරන ල ද බව පෙන්වා දෙන*

සාක්ෂ්‍ය නම් උපමාලංකාර, රූපකාලංකාරාදිය බහුල අතිශයෝක්ති පූර්වක සාටෝපවත් භාෂාවය." (ආරියරත්න, 2014 ; 34)

"සිරිබර කැතකුල කොත් ඔකාවස් පරපුරෙන් බට සව්ගුණමුලින් උතුරන් මිහින්දේ මහයා සිරි සරහු පිණිසැ විමල් ගුවන්හි පාළ නව බ(ග්ල) සන්දියෙක් බන්දු කුලෙන් ..." (ශිලාලේඛන සංග්‍රහය, 2000)

පුලියන්කුලම් පුවරු ලිපිය පිහිටුවීමේ අරමුණ වුයේ, අරමක් කරවා කපාරමුලට අයත් පුවරම් වෙහෙරින් භික්ෂූන් දොළොස්නමක් එහි වස්වා සිවුපසයෙන් උවටැන් කරනු සඳහා ගම්බිම් පිදීමත්, ඒ සියල්ලක් මතුවටත් නොකඩවා කරවීම හා එම අරමට සහ වෙහෙරට අයත් ගම් වැසියන්ගේ ආරක්ෂාව සඳහා ව්‍යවස්ථාවක් පිහිටුවීමයි. (අමරවංස හිමි, 2014) මෙම ලිපියේ එන භාෂාව පිළිබඳ විමසීමේ දී පෙනී යනුයේ කාව්‍යමය බස් වහරක් රූපාකාලංකාර සහ උපමාලංකාර භාවිත කරමින් යොදාගෙන ඇති බව ය. එනම්," *දිළින්ද් මන කලා පුරා"* හෙවත් දිලින්දන්ගේ සිත්විල් පුරවාත, කුලුණ් මහමෙයින් හෙවත් කරුණා මේඝයෙන් , කුලුනු රජදන් වහරෙ" හෙවත් කරුණා මහාදාන වර්ෂා ආදී රූපකාලංකාර භාවිත කර ඇත. තවද, *" නවබ(ග්ළ) සන්ද් ලෙයක් බන්දු"* හෙවත් බක් මස පෑයු නව සඳ රේඛාවක් බඳු යන රමණීය උපමාලංකාරයක් භාවිත කර තිබේ. බක්මහේ නව සඳ බැලීම සැබවින් ම අලුත් අවුරුදු චාරිත්‍රයකි. ඒ පිළිබඳ පුලියන්කුලම් සෙල්ලිපියේ සඳහන් වූ උපමාවේ ආභාසය ලැබූ සිගිරි ගී රචකයන් හඳුනා ගත හැකි ය. එනම්,

> *"අගනිනි අත් සලම් මෙ ගී පොහොන්නෙක් නැති ද නවබග් ල සන්ද් දුටි මිනිසක්හු නොවජන්නෙයි"* (Paranavitana, 1956).

අර්ථය :- කාන්තාවනි (මේ ගීයට අනුව) අත් සලව් (එසේ කොට) මේ ගීය පෝෂණය කරන්නේ නැතිද? බක් මස අලුත් ළා සඳ දුටු තැනැත්තෙකු වර්ජනය කළ යුතු නොවේ.

මේ ගීය රචනා කළ තැනැත්තා බක් මාසයේ මුල් භාගයේ දී සීගිරිය නැරඹීමට ගොස් ඇත. එම අවස්ථාවේ දී ඔහු ළා සඳ දැකලා මේ මංගල කරුණ සිහිගිරි මුදුනේ දී දුටු ප්‍රීතියෙන් ගියක් ගයා ඇත. මේ ගායනයට තාලය අල්ලා ඊට සහභාගි වන්නැයි ඔහු සීගිරි කතුන්ගෙන් ඉල්ලයි. එහෙත්, සීගිරි ලළනාවන්ගෙන් ඊට ප්‍රතිචාරයක් නොලැබීම නිසා ඔහු මේ ගීය සීගිරි බෙයදේ ලියා නවබගසඳ දුටු අයෙකු නොතකා නොහල යුතු නොවේ යැයි අදහස් දක්වා ඇත. මේ උපමාව සීගිරි ගේය කාව්‍ය රචකයාට ආභාසය වන්නට ඇත්තේ පුලියන්කුලම් පුවරු ලිපියෙන් විය යුතු ය. එසේ නම් මේ ගේය කාව්‍ය රචකයා අනුරාධපුර පුලියන්කුලමේ සිට පැමිණි අයෙකු විය හැකි ය. පුලියන්කුලම විහාරස්ථානයේ දී ඔහු මේ සෙල්ලිපිය කියවුවෙකු විය හැකි ය. එබැවින් ඔහුට එහි ආභාසය ලැබුවා විය නොහැකිද? පුලියන්කුලම සෙල්ලිපිය කරුණු කිහිපයක් අතින් වැදගත් ය. එක් කරුණක් නම් මේ ලිපිය ලියන ලද්දේ කවුරුන්ද යන වග ලිපියේ පැහැදිලිව සඳහන් කර තිබීමයි. මෙම ලිපිය ක්‍රි.ව.10 වන සියවසට අයත් යැයි අදහස් කර තිබේ. (අමරවංස හිමි, 2014)

මෙම ලිපිය ලියවී ඇත්තේ අබාසපමෙවන් රජුගෙන් දොළොස්වැන්නේ දී බව සඳහන් වේ. මේ ලිපිය "උදාමහයා" (උදය මහාපාද) ඔහුගේ පියාවන මහින්ද මහයා (මහින්ද මහාපාද) මව වන කිතා රැජින (කිත්තා රාජිනී) ඔහුගේ පුතා වන කිතග් බෝ ඇපා (කිත්තග්ග බෝධි ආදිපාද) සහ අබාසලමෙවන් (අභය සිලා මේඝවණ්ණ) හතරවන දප්පුල ආදීන් පිළිබඳ ඓතිහාසික තොරතුරු සඳහන් කර ඇත. (අමරවංස හිමි,

2014) මෙම ලිපියේ කතුවරයා උදාමහයා සෙනෙවිතුමා බවද "උදා මහයා පින්සිරිසර්තුමා" හෙවත් උදාමහයා පුණ්‍ය ශ්‍රී සාර සාමන්ත උතුම් ලෙස සඳහන් කර ඇත. එසේ නම් අපට නිගමනය කළ හැකි ප්‍රධාන කරුණක් වන්නේ සෙල්ලිපිහි සඳහන් වන ආදිතම ගේය කාව්‍ය කර්තෘවර නාමය වන්නේ උදාමහයා බව ය.

නිගමනය

අනුරාධපුර යුගයේ සිංහල ගී කාව්‍ය හා ගේය කාව්‍ය සම්ප්‍රදාය පිළිබඳ සිදු කළ මෙම අධ්‍යයනයෙන් පැහැදිලි වන්නේ ශ්‍රී ලාංකේය කාව්‍ය සම්ප්‍රදායේ මූලික පදනම මෙම යුගය තුළ ස්ථාපිත වූ බවයි. කෝසවකන්ද, තිස්සමහාරාම, කිරින්ද ලිපිය ඇතුළු සෙල්ලිපිවල අන්තර්ගත පද්‍යමය නිර්මාණ විමර්ශනය කිරීමෙන් ක්‍රිස්තු පූර්ව දෙවන සියවස වන විටත් සිංහල භාෂාවෙන් විරිත් නියමයන්ට අනුකූලව ගායනයට සුදුසු කාව්‍ය රචනා වී තිබූ බවට පුරාවිද්‍යා සාක්ෂ්‍ය අනාවරණය වේ. එමෙන් ම මෙම සෙල්ලිපි මඟින් ගේය කාව්‍යය ආගමික පුද පූජා, විහාර නිර්මාණ, රාජ ප්‍රශස්ති සහ සමාජීය සිදුවීම් සමඟ සම්බන්ධ වූ සාහිත්‍ය ප්‍රකාශන මාධ්‍යයක් ලෙස භාවිත වූ ආකාරය ද පැහැදිලි වේ. මහාවංසය, දීපවංසය, පරමත්ථෙජෝතිකා, චුල්ලවග්ගපාලිය, සියබස්ලකර සහ සීගිරි ගී වැනි සාහිත්‍යමය මූලාශ්‍ර විමර්ශනය කිරීමෙන් ගී හා ගේය කාව්‍ය සම්ප්‍රදාය ආගමික, රාජ්‍ය, සංස්කෘතික සහ ජනජීවිතය සමඟ සමීපව බැඳී වර්ධනය වූ බව හඳුනාගත හැකිවිය. විශේෂයෙන් සීගිරි ගී තුළින් ගී කාව්‍යයේ විරිත්, අලංකාර විධි, භාෂාමය පරිණතිය සහ කාව්‍යාත්මක නිර්මාණශීලීත්වය ඉහළ මට්ටමකට පත්ව තිබූ බව පැහැදිලි වේ. එමඟින් අනුරාධපුර යුගය අවසන් වන විට සිංහල ගේය කාව්‍ය සම්ප්‍රදාය පරිණත සාහිත්‍ය ප්‍රවණතාවක් බවට පත්ව තිබූ බව තහවුරු වේ. තවද, අනුරාධපුර යුගයේ ගී කාව්‍යය හුදෙක් විනෝදාස්වාදය සඳහා පමණක් නොව ආගමික භක්තිය ප්‍රකාශ කිරීම, රාජ්‍ය බලය සහ රාජකීය ගුණ වර්ණනා කිරීම, සමාජීය වටිනාකම් සුරක්ෂිත කිරීම සහ සංස්කෘතික අනන්‍යතාව තහවුරු කිරීම සඳහා ද යොදාගත් ප්‍රබල සාහිත්‍ය මාධ්‍යයක් වූ බව ද නිගමනය කළ හැකි ය. අනුරාධපුර යුගයේ සිංහල ගී හා ගේය කාව්‍ය සම්ප්‍රදාය ලාංකේය සාහිත්‍ය ඉතිහාසයේ ප්‍රාථමික සහ මූලික සංවර්ධන අවධියක් නියෝජනය කරන බවත්, එම සම්ප්‍රදාය පසුකාලීන සිංහල කාව්‍ය, ගී සාහිත්‍ය සහ ගායන සම්ප්‍රදායන්ගේ වර්ධනය සඳහා ශක්තිමත් පදනමක් සපයා ඇති බවත් නිගමනය කළ හැකි ය.

ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය

අභයසුන්දර, ප්‍රණීත්. (2006). *බෞද්ධ ගීත මඤ්ජරී*. කොළඹ.

අමරවංස හිමි, කොත්මලේ. (2014). *ලක්දිව සෙල්ලිපි*. කොළඹ.

ආරියරත්න, සුනිල්. (2014). *විරුද සහ විරිදු*. කොළඹ.

එලුසදැස් ලකුණ (වැලිවිටියේ සෝරත හිමි, සංස්.). (2005). කොළඹ.

උණපූරණ සහිතො මහාවංසො (බුද්ධදත්ත හිමි, සංස්.). (1959). කොළඹ.

චන්ද්‍රසිරි, දොරවක ජයතුංග. (2001). *සෙල්ලිපි ගී*. කොළඹ.

ධර්මප්‍රදීපිකාව. ධම්මානන්ද, ශ්‍රී ධර්මරාම නාහිමි. (1953). විද්‍යාලංකාර මුද්‍රණාලය, කැලණිය.

ධීරානන්ද හිමි, හගුරන්කෙත. (2004). *රාජත්වය, රාජ්‍යය සහ ආගම: ක්‍රි.පූ. තෙවැනි සියවසේ සිට ක්‍රි.ව. තෙවැනි සියවස දක්වා*. වරකාපොල.

පරමත්ථෙජෝතිකා: සුත්ත නිපාත අට්ඨකතාව. (1920). කොළඹ.

පරණවිතාන, එස්. (1964). සද්ධාතිස්ස රජු පටන් සහ රජු දක්වා කාලය. හේමචන්ද්‍ර රාය (සංස්.), *ලංකාවිශ්වවිද්‍යාලයේ ලංකා ඉතිහාසය* (1 කාණ්ඩය, පි. 169). කැලණිය.

මහාවංසය (චන්ද්‍රා වික්‍රමගමගේ, සංස්.). (2012). (1 වෙළුම). බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය, දෙහිවල.

සෙනෙවිරත්න, අනුරාධ. (2007). සිංහල ගී කාව්‍ය සම්ප්‍රදාය. කොළඹ.

සියබස්ලකර විවරුව (අලවූ ඉදි සැබිහෙල, සංස්.). (1963). කොළඹ.

ශිලාලේඛන සංග්‍රහය (දොන් මර්තීනු ද සිල්වා වික්‍රමසිංහ, සංස්.; සද්ධාමංගල කරුණාරත්න, පරි.). (2000). (1 වෙළුම). පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව. (වෙස්සගිරිය පුවරු ලිපිය අංක 01).

Cullavagga Pāli Manuscript. MS No.69/L1, H.C.P. Bell Collection, Colombo: National Museum.

Gunawardana, R. A. L. H. (1983). Prelude to the state: An early phase in the evolution of political institutions in ancient Sri Lanka. *The Sri Lanka Journal of the Humanities, 8*.

Gunawardana, R. A. L. H. (1995). *Historiography in a time of ethnic conflict: Construction of the past in contemporary Sri Lanka*.

Malalasekara, G. P. (Ed.). (1935). *Vamsatthappakāsinī* (Vol. 1).

Paranavitana, S. (1945). Brahmi inscriptions in Sinhalese verse. *Journal of the Ceylon Branch of the Royal Asiatic Society, 36*(98), 60–65.

Paranavitana, S. (1956). *Sigiri graffiti* (Vols. 1–2).

Paranavitana, S. (1970). *Inscriptions of Ceylon* (Vol. 1: *Early Brahmi inscriptions*).

Paranavitana, S. (2001). *Inscriptions of Ceylon* (Vol. 2, Pt. 2: *Late Brahmi inscriptions*) (M. Dias, Ed.).

දඹුල්ල ලෙන් විහාරය ආශ්‍රිත ප්‍රතිමා මඟින් පිළිබිඹු වන පෙරදිග සෞන්දර්යාත්මක ලක්ෂණ ; භරතමුණිගේ රස සංකල්පය ඇසුරෙන්

චතුමි සෙව්වන්දි කලහෙ පරණවිතාන
සහකාර කථිකාචාර්ය, ලලිත කලා අධ්‍යනාංශය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය.
chathumisewwandi95@gmail.com

හැඳින්වීම

මධ්‍යම පළාතේ, මාතලේ දිස්ත්‍රික්කයේ, දඹුල්ල ප්‍රදේශයේ, වගපනහපල්ලේසිය පත්තුවේ පිහිටි රංගිරි දඹුලු රජමහා විහාරය හෙළ කලාකරුවාගේ කලාත්මක භාවිතාව මැනවින් පසක් කරවන ස්ථානයක් වූවා සේම දකුණු ආසියාවේ විශිෂ්ටතම චිත්‍ර කලාගාරය ලෙස අවිවාදයෙන් පිළිගත හැක (කරුණාතිලක,2025:398). එය මහනුවර සම්ප්‍රදායේ චිත්‍ර කලාවේ අභිමානය මැනවින් නිරූපණය කරයි. ලෙන් පහකින් සැදුණු දඹුලු රජමහා විහාරයේ බුද්ධ ප්‍රතිමාවන් මෙන්ම ජාතක කතා, බුදු සිරිත සහ ලක්දිව හා සබැඳි සුවිශේෂී සිදුවීම් පාදක කර ගනිමින් සිතුවමට නඟන ලද චිත්‍ර නිර්මාණ ද රාශියක් දක්නට ලැබේ. එකී ලෙන් ලෙස, දේවරාජ ලෙන, මහාරාජලෙන, මහා අලුත් විහාරය, දෙවන අළුත් විහාරය, පශ්චිම විහාරය යනාදී වශයෙන් හඳුනාගත හැකි ය. ඉතිහාසමය කරුණු අනුව විමසා බැලීමේදී දඹුලු විහාරයේ ආරම්භය වළගම්බා රාජ්‍ය සමය දක්වා දිවයයි. ඓතිහාසික මූලාශ්‍රවලින් තහවුරු කිරීම සෑහෙන තරම් අපහසු පරම්පරා කතා අනුව දඹුලු පර්වතය සොයාගන්නේ වට්ටගාමිණිඅභය (වළගම්බා) ක්‍රි. පූ. 103 සහ 89-77 රජුගේ කාලයේ වන අතර එහි ඇති ලෙන් විහාරවලින් පශ්චිම විහාරය, මහා රාජ විහාරය, හා දෙවි රජ විහාරය නමින් හැඳින්වෙන විහාර මන්දිර තුන කරවන ලද්දේ මෙම රජතුමා විසින් යැයි සැලකේ (ඉලංගසිංහ,1987:06). මෙම විහාරස්ථානයට ප්‍රවේශ වන දොරටුව අභියස සිට එහි ගමනාන්තය දක්වාම ගමන් කිරීමේ දී ඉතාමත් අලංකෘත වූ ස්වභාවික පරිසරයක් කලාත්මකව ප්‍රතිනිර්මාණය කර ඇති ආකාරය මෙම ස්ථානයෙන් දැක බලා ගත හැකි ය. ඒ සඳහා නේකවිධ දෘශ්‍ය කලා කෘතීන්ගේ ආධාරය ලැබ තිබේ. එලෙස කලාත්මක සෞන්දර්ය ප්‍රතීයමාන කරවීමේ අදිටනින් නිර්මාණය කරන ලද දෘශ්‍ය කලා නිර්මාණයන් ලෙස, චිත්‍ර, ප්‍රතිමා, කැටයම්, ගෘහනිර්මාණ ශිල්පය දැක්විය හැක. ඒ අනුව දඹුල්ල ලෙන් විහාරය අභ්‍යන්තරයේ නිර්මාණය කර ඇති ප්‍රතිමාවන්ගෙන් භරතමුණි පඬිවරයාගේ රස සංකල්පයට අනුව පෙන්නුම් කෙරෙන පෙරදිග සෞන්දර්යාත්මක ලක්ෂණ පිළිබඳව මෙමඟින් විමසුමට ලක් කෙරේ.

විමර්ශනය

පොදු බෞද්ධාගමික විහාරස්ථානයන්ට කේන්ද්‍රගත වූ ප්‍රස්තුතයන් තේමාත්මක භාවිතාවන් වශයෙන් යොදා ගැන්මට දඹුලු විහාර දෘශ්‍ය කලා ශිල්පියා උත්සුකව ඇත. බුදුසිරිත, ජාතක කතා, ශ්‍රී ලංකාව හා සබැඳි සුවිශේෂී සිදුවීම් තේමාවන් වශයෙන් ප්‍රමුඛවම දැකගත හැකි ය. විහාරස්ථානය හා සැදැහැවත් දායකයින් සමීපස්ථ කරවීමේ අදිටනින් මෙලෙස සිතුවම්කරණ කාර්යය සිදුකොට ඇත. තවද බුදුරදුන්ගේ මහා

කරුණාව විදහාලන අන්දමින් නිරූපිත බුද්ධ ප්‍රතිමාවන් මෙන්ම විෂ්ණු, කතරගම වැනි දේව ප්‍රතිමාවන් ද මෙහි නිර්මාණය කර ඇති අන්දම දැක බලා ගත හැකි ය. මෙහි පවත්නා තවත් සුවිශේෂතාවයක් වනුයේ විහාරස්ථානයට අනුග්‍රහය දක්වන ලද රාජකීයන්ගේ ප්‍රතිමාවන් ද මෙහි නිර්මාණය කර තිබීමයි. අන් විහාරස්ථානයන් හා සැසඳීමේදී මහනුවර රාජධානි සමයේදී ඉදිකළ මූර්තීන් අතර දැකිය හැකි සුවිශේෂී කරුණක් වශයෙන් එය දැක්විය හැකි ය. හරතමුණි පඬිවරයාගේ රස සංකල්පයට අනුව මෙම ප්‍රතිමා මඟින් විවිධ රසයන් ජනනය වේ. භරතමුණි පඬිවරයා විසින් රචිත නාට්‍ය ශාස්ත්‍රය පෙරදිග විචාර කලාව පදනම්ව එනම් පෙරදිග චින්තනය මත නිමවී තිබේ. එය නාට්‍ය හා සංගීත කලාවන් පිළිබඳව ලියැවුණු පැරණිතම ග්‍රන්ථය වශයෙන් ද සැලකේ.

"විභාවානුභාව ව්‍යභචාරි සංයෝගාද් රස නිෂ්පත්තිඃ"

එනම් විභාව, ආනුභාව, ව්‍යාභිචාරී යන අංග ත්‍රිත්වය සංයෝගයෙන් රසය උත්පාදනය වන බවයි.

රස නිෂ්පත්තියේ පළමු භාවය වන්නේ 'විභාව' වේ. එය ආලම්භන විභාව හා උද්දීපන විභාව වශයෙන් දෙයාකාර වේ. මෙහි ආලම්භන විභාව යනු යම් පුද්ගලයෙකුගේ සිතේ භාවමය හැඟීම් උත්පාදනයෙහිලා අරමුණු වන වස්තුව හෝ පුද්ගලයා ය. උද්දීපනය යනු යම් භාවයක් ඉපදවීමට හේතුවන අවට පරිසරයයි. රස නිෂ්පත්තියේ ද්විතීක භාගය වන්නේ ආනුභාවයයි. ආනුභාවය වනාහි ප්‍රධාන භාවයකින් හටගන්නා ප්‍රතිඵලයකි. ප්‍රධාන භාවය ඇති වූ කල ශාරීරිකව සිදුවන අනෙකුත් වෙනස්වීම් ආනුභාවයයි. භාව උද්දීපනයේ අවසන් කොටස වන්නේ ව්‍යභිචාරී භාවයයි. ප්‍රධාන භාවයට අමතරව උත්පාදිත අප්‍රධාන භාවයන්, හැඟීම් මීට නිදසුන් ලෙස දැක්විය හැකි ය. විභාව, ආනුභාව, ව්‍යභිචාරි බව එකට ක්‍රියා කිරීමෙන් ශාන්ත රසය උපදී. රස නිෂ්පත්තිය යන තේමාව සැලකීමේ දී යම් කලා නිර්මාණයක් පංචේන්ද්‍රානුභූතියෙන් අවබෝධ කරගන්නා පුද්ගලයා තුළ මානසිකව චෛතසිකමය වශයෙන් උත්පාදනය වන ක්‍රියාවලියක් ලෙස දැක්විය හැකි ය. එහිදී එකී කලා නිර්මාණය සමඟ ඒකාත්මික වීම හෝ ඉන් විනිර්මුක්ත වීම පුද්ගලානුබද්ධ වේ.

මහාරාජ ලෙනෙහි සමාධි බුද්ධ ප්‍රතිමාව

දඹුලු විහාරයේ මහාරාජ ලෙනට ප්‍රවිෂ්ට වූ පුද්ගලයකුගේ නෙත ගැටෙන්නේ සමාධි ඉරියව්වෙන් වැඩ සිටින හිඳි බුද්ධ ප්‍රතිමාවකි (රූපය 01). එය නෙත ගැටුණු කල්හි ඔහුගේ සිතෙහි ශාන්ත රසයක් උපදී. එනම් එම පුද්ගලයාට ශාන්ත රසයක් උත්පාදනය වීමට උපකාරී වූයේ හිඳි බුද්ධ ප්‍රතිමාව වූ බැවින් එම ප්‍රතිමාව ආලම්භන විභාවය ලෙස දැක්විය හැකි ය. බුදු පිළිමයෙන් ශාන්ත රසය උත්පාදිතව අප තුළ කරුණාව, වන්දනීයත්වය, ආගමික භක්තිය ජනිත වීමට මහාරාජ ලෙන් ගුහාවේ අවට පරිසරය ද ප්‍රමුඛතවම බලපෑමක් ඇති කළ බැව් පෙනී යන කරුණකි. එය උද්දීපන විභාව ලෙස සැලකිය හැක. විශේෂයෙන්ම මහාරාජ ලෙන් ගුහාවේ සන්සුන් පරිසරය, අඳුරු - මෘදු ආලෝකය, සමාධි පිළිමය වටා ඇඳ ඇති සිතුවම් හා එම සිතුවම් වල වර්ණ භාවිතය මෙන්ම ඒ අවට සිදු කරන පූජාමය වතාවත් මඟින් ශාන්ත රසය උද්දීපනය කරනු ඇත. මහරජලෙනෙහි සමාධි බුද්ධ ප්‍රතිමා පේළියට ඉහළින් ඉදිරිපිට කොටස ප්‍රධාන වශයෙන් කොටස් දෙකකට බෙදා ඇතත් ප්‍රතිමා වලට පිටුපස කොටස පොළොවට සම්බන්ධ වන තෙක් විහිදී යන වියන්තලයේ පිට බරාදය උතුරු කෙළවරේ සිට සිතුවම් රැසකි. උතුරු කෙළවර සිට දකුණු

දිශාවට ගමන් කරන විට මුලින්ම රහතන් වහන්සේලා කිහිප නමක් ද ඉන්පසු විෂ්ණු සමන් යයි සැලකෙන දේව රූප දෙකට පිටුපසින් කොටසෙහි සඟ දෙවි හා කතරගම සහ සමන් දෙවියන්ගේ සිතුවම් ද සිතුවමට නඟා ඇත. කතරගම දෙවියන් දැක්වෙන සිතුවමෙහි අත් දොළසක් මෙන් ම දකුණු පස එක් අතකින් කුකුළකුගේ රුව සහිත ධජයක් දරා ගෙන සිටින අයුරින් දැක්වීම විශේෂිත ය (කරුණාතිලක,2025:427-428). මෙම ලෙන් විහාරයේ වියන්තලය සම්පූර්ණයෙන්ම සිතුවම්වලින් අලංකාර කොට ඇත. විශාලතම ලෙන් විහාරය වන මෙහි ප්‍රවේශ බිත්තියේ සිට ඉදිරියට පොළොව සම්බන්ධ වන තෙක් වියන්තලය පිටු පස බරාදය දක්වා විහිදී යයි. ප්‍රධාන හිටි පිළිමය හා හිඳි පිළිම වහන්සේලා නිර්මාණය කර ඇති සීමාවෙන් පිටුපස කොටස ද (බරාඳය) ආවරණය වන පරිදි වියන් සිතුවම් ඇඳ ඇත. බුදු පිළිම පේළියෙන් ඉදිරි පස කොටසෙහි වියන් සිතුවම් විශාල ප්‍රමාණයේ කොටුවලට බෙදා ඒවා නැවත තීරුවලට බෙදා සිතුවම් නිර්මාණය කර ඇත. උතුරු දොරටුවෙහි වම් පස හරස් බිත්තියේ සිට ආරම්භ වන සිතුවම්වලින් වැඩි ප්‍රමාණයක් ආවරණය වන්නේ ඒකාකාරී කොටු මෝස්තරයකින් හා මල් මෝස්තර වලිනි (කරුණාතිලක,2025:422) (රූපය 02). මහාරාජ ලෙනෙහි ඇඳ ඇති මෙම සිතුවම් ද උද්දීපන විභාවයක් සේ ක්‍රියාකර ශාන්ත භාවය ඇති කරයි. මහාරාජ ලෙනෙහි සමාධි බුද්ධ ප්‍රතිමාව මඟින් ඇති වන ශාන්ත නැමැති භාවයේ අනුභාව ලෙස සන්සුන් වීම, නිශ්චල ශරීරය නිශ්චල දෘශ්ටිය ආදිය දැක්විය හැක. ශාන්ත නම් භාවයේ ව්‍යභිචාරී භාවය ලෙස විශ්වාසය, සමතා භාවය ආදිය දැක්විය හැක. මෙම අංග එකිනෙකට ක්‍රියා කිරීමෙන් ශාන්ත රසය උපදී.



(රූපය 01. මහාරාජ ලෙනේ කරවා ඇති බුදුරදුන්ගේ සමාධි බුද්ධ ප්‍රතිමාව)



(රූපය 02. මහාරාජ ලෙනේ වියන්සිතුවම් හා ප්‍රතිමා)

දේවරාජ ලෙනෙහි සැතපෙන බුද්ධ ප්‍රතිමාව

සම්බුද්ධ පරිනිර්වාණය වූ කල්හි මහා පොළොව පවා කම්පාවට පත් කළ මහත් ශෝචනීය සිදුවීමක් විය. ලොවක් එකතු කළ සම්බුද්ධාලෝකය නම් ප්‍රදීපය නිවී යාම සැදැහැවත් චෛතසිකයන් ශෝකී භාවයෙන් පුරවාලනු ලැබී ය. මෙහිදී දේවරාජ ලෙනේ ප්‍රතිමා ශිල්පියා ඉතාමත් තාත්විකව මෙම අවස්ථාව මූර්තියට නැංවීමට සමත්ව ඇත.(රූපය 03) අදාළ මූර්තිය දර්ශනය වන පිරිස් තුළ ශෝකය නම් භාවය උපදී. බුදුරදුන්ගේ නිසල ශ්‍රී දේහය. අඩවන් වූ දෙනෙත් සහ අනෙකුත් ශරීරාංග පවා ශෝකය උත්පාදනයෙහිලා මහඟු කාර්යභාරයක් ඉටු කරයි. තවද ශෝකය නම් භාවයෙන් කරුණා රසය උපදී. ඒ අනුව මුලින්ම ශෝකී භාවයට පත්වන මිනිසා තුළ අනතුරුව කරුණා රසයක් උපදින්නේත් අදාළ මොහොතේ නිර්මාණ කරන ඒ ශිල්පියා දැක්වූ කලාත්මක කුසලතාවය නිසා ය. සම්බුද්ධ පරිනිර්වාණය මහා පරිනිර්වාණ සූත්‍රයේ දැක්වෙන්නේ පහත පරිදි ය.

"භාග්‍යවතුන් වහන්සේ ඉතාම ඉක්මනින් පිරිනිවන් පෑහ. දහම් ඇස් ඇති බුදුරජාණන් වහන්සේ ඉතා ඉක්මනින්ම පිරිනිවන් පෑහ යැයි කියමින් කෙස් විසිරුවාගෙන හඬති. සමහරෙක් හිස අත් බැඳගෙන හඬති. තව කෙනෙක් මැදින් කැඩුනාක් මෙන් ඇද වැටෙති. ඇතැමෙක් බිම පෙරලෙති. නැවත නැවතත් පෙරලෙති" (පාලි සිංහල මහා පරිනිබ්බාන සූත්‍රය, 2018: 268).




(රූපය 03. දේවරාජ ලෙනේ කරවා ඇති බුදුරදුන්ගේ සැතපෙන බුද්ධ ප්‍රතිමාව)

ඒ අනුව සාහිත්‍යමය මූලාශ්‍රයන්ගෙන් උකහා ගත් තොරතුරු මත පිහිටා ස්වකීය කලාත්මක කුසලතාවය සෞන්දර්යාත්මක රුචිකත්වය ඇතිවන පරිදි නිර්මාණය කර ඇති බැව් පෙනීයයි. තවද මෙම සැතපෙන පිළිමය නැරඹීමෙන් ප්‍රේක්ෂකයා තුළ ශෝකාත්මක හැඟීමක් පහළ වෙයි. එනම් එමඟින් කරුණා රසය උත්පාදනය වේ. මෙහි අදාළ අවස්ථාව වශයෙන් සම්බුද්ධ පරිනිර්වාණය දැක්වීමට පුළුවන. කරුණා රස උත්පාදනය වීමෙන් දෑස් අඩවන් වීම, නළල යම් පමණකට රැලි ගැන්වීම, කම්මුල් හැකිලීම, කඳුළු සැලීම වැනි ශාරීරික හා මුහුණේ වෙනස්වීම් නිරූපණය කෙරේ.

හිටි බුද්ධ ප්‍රතිමා

ශාක්‍යසිහ වූ සම්මා සම්බුදුරදුන්ගේ රූ වරුණා මෙතෙකැයි කියා නිම කළ නොහැකි ය. දෙතිස් මහා පුරුෂ ලක්ෂණයන් හා අසූවක් අනුව්‍යඤ්ජනයන්ගෙන් අලංකෘත බුදු සිරුර කලාකරුවාට වුවද ග්‍රහණය කර ගැන්ම උගහට කරුණක්ව තිබේ. නමුදු පුරාණ භාරතයේ කණිෂ්ක රජ දවස බුදු රුව රූපකායෙන් ගෙනහැර පෑම පෙර පැවති සංකේතාත්මක බුදුන් නිරූපණය කළ කලාවට අභියෝගයක් ගෙනදුන් කරුණක් විය. කෙසේවෙතත් එතැන් පටන් බුද්ධ ප්‍රතිමා නිර්මාණය වූ අතර ශ්‍රී ලංකාවේ මහනුවර රාජධානි සමයේ දී බුදුරදුන් සියල්ලන්ටම වඩා උසස් බැව් නිරූපණයට එනම් බුදුරදුන් දේවාතිදේව බව ප්‍රකාශනයට උත්සුක විය. ඒ සඳහා අනුරාධපුර, පොළොන්නරුව වැනි යුගවලදී අසීමිතව කරුණාව පෙන්වන බුද්ධ නේත්‍රයන්ගෙන් විනිර්මුක්තව විවෘත දෙනෙත් යොදා ගැනුණි. එමඟින් බුදු රුව දකින සැදැහැවතුන් තුළ බය නම් ස්ථායී භාවය උත්පාදන වී එමඟින් භයානක රසය උපදින්නේ බුදුරදුන්ගේ ආධ්‍යාත්මික ගුණ නිරූපණයට වඩා බුදුරදුන් සතු බලවත් බව පෙන්වීමට මෙම භයානක රසය උපයෝගී කරගත් බැව් පෙනී යයි.



(රූපය 04. විවෘත දෙනෙත් සහිතව නිර්මාණය කළ හිඳි බුද්ධ ප්‍රතිමාවක්)

නමුත් ප්‍රතිමාවන් අතර දැකිය හැකි පසුකාලීන ව නිර්මාණය කළ බුදුරුවකින් නවවන රසය වන ශාන්ත රසය ජනනය කරවන බැව් මනාව නිරීක්ෂණයෙන් දැකගත හැකිවේ.



(රූපය 05. සමාධි බුද්ධ ප්‍රතිමාවක්)

රාජ ප්‍රතිමා

අන් විහාරස්ථානයන්හි දැකිය නොහැකි අන්දමින් රාජ ප්‍රතිමා හා සිතුවම් කලාත්මකව නිරූපිත විහාරස්ථානයක් වශයෙන් දඹුලු විහාරය හඳුනාගත හැකි ය. මෙහි ප්‍රගමණයට උරදුන් වළගම්බා රජු, නිශ්ශංකමල්ල රජු, කීර්ති ශ්‍රී රාජසිංහ රජු වැනි නරපතින්ගේ රූ මූර්තියට නංවා ඇත්තේ ඊට පෙරදිග රසවාදයේ එන රසයන් ද අන්තර්ගත කරවමිනි. මෙම රාජකීය ප්‍රතිමාවන්ගෙන් උත්සාහ නම් භාවය උත්පාදනය කරවනු ලබන අතර එහි ප්‍රතිඵලයක් වශයෙන් වීර රසය ද ජනනය කරවයි. රාජකීයයන් සතු වූ නිර්භීත භාවය, වීරත්වය ප්‍රතිනිරූපණයෙහිලා එකී රස භාවයන් මහඟු රුකුලක් සපයයි. රස සූත්‍රයට අනුව ඒ ඒ රජවරුන්ගේ චරිතය ආලම්භන විභාව වන අතර බුදු පිළිම අතර ඔවුන්ගේ පිළිම තබා ඇති ස්ථාන අනුව හැඩ ගැසෙන අවට පරිසරය උද්දීපන විභාවය සේ ක්‍රියා කරයි. සන්සුන් මුහුණ, සංයමය සහිත දෘෂ්ටිය අනුභාව වේ. ගෞරවය, විශ්වාසය හා භක්තිය ව්‍යභිචාරී භාව වේ. මේවා සියල්ල එකිනෙකට සංයෝජනය වීමෙන් වීර රසය උපදී.



(රූපය 06. කීර්ති ශ්‍රී රාජසිංහ ප්‍රතිමාව)



(රූපය 07. වළගම්බා රාජ ප්‍රතිමා)

නිගමනය

ඒ අනුව, දඹුලු ලෙන් විහාරය ආශ්‍රිත ප්‍රතිමා පෙරදිග සෞන්දර්යවේදයය අනුගතව එනම් භාරතීය සෞන්දර්යවේදය (භරතමුණිගේ රසවාදය) කලාත්මක හා සෞන්දර්යාත්මක ආකාරයකින් විශ්ලේෂණය කිරීමෙන් ඒවායේ ගැඹුරු සමාජ-සංස්කෘතික අගය වඩාත් පැහැදිලි වේ. තවද දඹුල්ල ලෙන් විහාරයේ දෘශ්‍ය සම්ප්‍රදාය උපදේශාත්මක පොහොසත්කම සහ භක්තිමත් විස්තාරණය මත ගොඩනඟා ඇති දකුණු ආසියානු සෞන්දර්යයක් පිළිබිඹු කරයි. මෙලෙස විමසා බලන කල දඹුල්ල ලෙන් විහාරයේ ප්‍රතිමා

නිර්මාණයන් පෙරදිග ඉන්දීය සෞන්දර්ය විද්‍යා න්‍යායට පොදුවේ අනුගත කළ හැකි ය. ඉතා සුවිශේෂී කලාත්මක භාවිතාවන් ලෙස අවසන් වශයෙන් නිගමනයට එළැඹිය හැකි ය.

ආශ්‍රේය මූලාශ්‍රය

පාලි සිංහල මහා පරිනිබ්බාන සූත්‍රය (2018)

ඉලංගසිංහ, මංගල (1987) **රන්ගිරි දඹුලු විහාරය**, සීමාසහිත ශ්‍රීදේවි ප්‍රින්ටර්ස්, දෙහිවල.

කරුණාතිලක, මංජුල (2025) **දඹුල්ල ලෙන් විහාරයේ බිතු සිතුවම් සහ සුවිශේෂීතා, රංගිරි දඹුලු වෙහෙර වත**, සංස්. අජිත් තල්වත්ත, දඹුල්ල රජමහා විහාරය, දඹුල්ල.

මාලගොඩ පුරාණ රජමහා විහාරයේ පැරණි නටබුන් සහ ප්‍රතිමා ගෘහයේ සිතුවම් පිළිබඳව විමර්ශනයක්

බී.එම්.රුවන් ප්‍රභාත් බස්නායක

තාවකාලික සහාය කථිකාචාර්ය, ඉතිහාස හා පුරාවිද්‍යා අධ්‍යයනාංශය , ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය

සාරසංක්ෂේපය

ජනප්‍රවාදගත සාධක මුඛ්‍ය කොට දඹදෙණි රාජධානිය අවධිය නියෝජනය කරන භූමියක් ලෙස සැලකෙන කන්දෙගෙදර මාලගොඩ පුරාණ රාජමහා විහාරය වයඹ පළාතේ කුරුණෑගල දිස්ත්‍රික්කයේ දඹදෙණිය උඩුකහ නැගෙනහිර කෝරළයෙහි අලව්ව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයෙහි 985, කන්දෙගෙදර උතුර ග්‍රාම නිලධාරී වසම තුළ පිහිටා තිබෙන විහාරස්ථානයකි. අලව්ව නාරම්මල මාර්ගයේ අලව්වෙ සිට 8km ප්‍රමාණයක් ගෙවා මහරච්චිමුල්ල මංසන්ධියට පැමිණ එතැන් සිට ගල්ගමුව මැටියගනේ මාර්ගයේ කිලෝමීටරයක් පමණ පැමිණෙන විට මෙම විහාරස්ථානය දැක ගත හැකිය. මෙහි ඉතිහාසය හැදෑරීමෙහිලා සාහිත්‍ය මූලාශ්‍රයන්ගෙන් ආලෝකයක් නොලැබෙන තරම් ය. එසේම පුරාවිදු සාධක ද ප්‍රමාණාත්මක පරාසයක් කරා අනාවරණය නොවීමත් මේ ආශ්‍රිත පූර්ව අධ්‍යයනයන් නොවීමත් නිසා පර්යේෂකයාට වැඩිමනක් ජනප්‍රවාද මත යැපෙන්නට සිදු වී තිබේ. මෙම ලිපිය තුළ මූලික වශයෙන් විහාරස්ථානයේ දක්නට ලැබෙන පැරණි නටබුන් සහ වසර සියයකට වඩා පැරණි ප්‍රතිමා ගෘහය සහ සිතුවම් පිළිබඳව විමර්ශනය කිරීම අපේක්ෂිත ය. විශේෂයෙන්ම සිතුවම්කරණය විෂයෙහි බලපෑ කොළඹ යුගයෙහි පහතරට චිත්‍ර ශෛලිය ආභාසය නිතැතින්ම විද්‍යමාන වේ. මෙම භූමියේ විසිර ඇති පැරණි නෂ්ටාවශේෂ පිළිබඳ විධිමත් පර්යේෂණයන් සිදුවිය යුතු අතර වර්තමානයේ අවිධිමත් සහ නොසැලකිලිමත් ප්‍රතිසංස්කරණ කරණ කොටගෙන නටබුන්, පැරණි ආකෘතිය සහ සිතුවම් විනාශ වීමේ අවධානමට ලක්වී නැත්තේ ද නොවේ.

මුඛ්‍ය පද - මාලගොඩ පුරාණ රජමහා විහාරය , නටබුන් , ප්‍රතිමා ගෘහය, සිතුවම් , පහතරට චිත්‍ර සම්ප්‍රදාය

හැඳින්වීම

කාලිංග මාඝගේ ආක්‍රමණයෙන් පොළොන්නරු රාජධානිය බිඳවැටීමත් සමග ක්‍රි.ව.1232 දී තුන්වන විජයබාහු රජු (ක්‍රි.ව.1232 -1236) දඹදෙණි රාජධානිය පිහිටුවා ගන්නා අතර ඉනික්බිතිව රාජ්‍යත්වයට පත් දෙවන පැරකුම්බාවන් (ක්‍රි.ව.1236 - 1270) යටතේ රාජධානිය එහි උපරිම සංවර්ධනය කරා ගමන් ගත් බව පෙනේ (ලියනගමගේ 2013: 121 -205). දඹදෙණි රාජධානියට අතිශය ආසන්නයේ ස්ථානයක පිහිටා ඇති මෙම මාලගොඩ පුරාණ රජමහා විහාරය සහ තදාසන්න කලාපය තුළ දඹදෙණි රාජධානිය හා බැඳි ජනප්‍රවාද, විශ්වාස ගණනාවක් ගොඩනැගී ඇත. මේ දක්වා මෙම යථෝක්ත විහාරස්ථානය හා සම්බන්ධ ජනප්‍රවාදගත සාධක සහ පවත්නා පුරාවිද්‍යා නෂ්ටාවශේෂ විෂයෙහි ඓතිහාසික හා පුරාවිද්‍යාත්මක දෘෂ්ටියෙන් පර්යේෂණාත්මක ප්‍රවේශයක් යටතේ අධ්‍යයනයක් සිදුනොවී ඇති අතර මෙමගින් ඊට පර්යේෂණාත්මක පසුබිමක් සැපයීම අපේක්ෂිත ය.

පර්යේෂණ ගැටලුව

මාලගොඩ පුරාණ රජමහා විහාරයෙහි ආරම්භය එහි විසිරී ඇති නෂ්ටාවශේෂ සාධක අනුව ඓතිහාසික වශයෙන් තහවුරු කරන ලද ලාංකේය ඉතිහාසයෙහි එක් යුගයක් නියෝජනය කළ හැකි වුව ද එහි වත්මන් ප්‍රතිමා ගෘහය වසර සියයකට ආසන්න මෑත ඉතිහාසය නියෝජනය කරන්නකි. ඒ අනුව මෙම පර්යේෂණය හරහා මෙම විහාරස්ථ වත්මන් ප්‍රතිමා ගෘහයෙහි සිතුවම්කරණයේ සුවිශේෂීතාවය කුමක් ද? එය ලාංකේය යටත් විජිත සහ පශ්චාත් යටත් විජිත විහාර සිතුවම්කරණයන් සමගින් සමපාත වනුයේ කෙසේ ද? එසේම වර්තමානයෙහි මෙම විහාරස්ථානයේ ශේෂව පවත්නා නටබුන් එහි ඉතිහාසය ගොඩනැගීමෙහිලා දක්වන දායකත්වය සහ විහාරස්ථානය ආරම්භයේ සිට වර්තමානය දක්වා ඓතිහාසික විකාශනය කෙබදු වී ද? යන පර්යේෂණ පැනයන් විමර්ශනය කිරීමට අපේක්ෂිත ය.

පර්යේෂණ අරමුණු

මාලගොඩ පුරාණ රජමහා විහාර භූමිය සහ අතීතයේ විහාරස්ථානයට අයත්ව තිබෙන්නට ඇතැයි සැලකිය හැකි ප්‍රදේශය තුළ සැලකිය යුතු පුරාවස්තු ප්‍රමාණයක් විසිරී ඇති අතර විහාරස්ථානය ආශ්‍රිත පසුගිය සියවසෙහි සිදුකෙරී ඇති සංවර්ධන කාර්යයන් අතරතුර මතු වූ නෂ්ටාවශේෂ ද වෙයි. මේ දක්වා මෙකී අවශේෂ විෂයෙහි පුරාවිද්‍යාත්මක මැදිහත් වීමක් සිදු වී නැත. වර්තමානයෙහි දක්නට ලැබෙන ප්‍රතිමා ගෘහය වුව ද වසර සියයක් ඉක්මවන අතර එහි ඇති ප්‍රතිමා සහ සිතුවම් කොළඹ යුගයේ පහතරට සිතුවම් ශෛලිය ආභාසය මැනවින් විද්‍යමාන කරයි. ඒ අනුව මෙම ලිපිය හරහා වර්තමානයෙහි ශේෂව පවත්නා නෂ්ටාවශේෂ විෂයෙහි පුරාවිද්‍යාත්මක මැදිහත්වීමක අවශ්‍යතාවය පෙන්වා දීමත් විහාරස්ථානය වටා කේන්ද්‍රගතව ඇති ජනප්‍රවාද සහ ඓතිහාසික දත්ත යම් පමණකට හෝ ඒකාබද්ධ කර අනාගත පර්යේෂණයකට අවැසි පදනම නිර්මාණය කිරීමත් මූලික අපේක්ෂාව වේ.

සාහිත්‍යය විමර්ශනය

මෙම පර්යේෂණයට අදාළ මූලාශ්‍ර විභාගයේ දී පැහැදිලි වූ ප්‍රධානතම සාධකය වන්නේ මාලගොඩ පුරාණ විහාරය පිළිබඳ පුළුල් ඓතිහාසික හෝ පුරාවිද්‍යාත්මක විමර්ශනයක් පූර්වයෙහි සිදු වී නොමැති බවයි. ඓතිහාසික වංශකතා, පුරාවිද්‍යාත්මක වාර්තා හෝ යම් ප්‍රකාශිත ශාස්ත්‍රීය අධ්‍යයනයක මෙම විහාරස්ථානය පිළිබඳ සාකච්ඡා කොට නොමැත. මෙම විහාරය පිළිබඳ රචනා වී ඇති එකම මූලාශ්‍රය වනුයේ 1932 වර්ෂයේ දී තෙරිපැහැ පඤ්ඤාසාර නම් හිමි නමක විසින් රචනා කරන ලද 'කන්දෙගෙදර මාලගොඩ විහාර වර්ණනාව' නම් කාව්‍යයකි. එය අභිනව විහාර මන්දිරය විවෘත කිරීමේ උත්සවය නිමිති කොට ගෙන විහාර මන්දිරයේ සිතුවම්, ප්‍රතිමා ආදියෙහි විචිත්‍රත්වය කවියට නගමින් රචනා කරන ලද්දකි.

නමුත් විහාරයෙහි ආරම්භය සහ ඓතිහාසිකත්වය පිළිබඳ සාධක ජනප්‍රවාද හා වාචික සම්ප්‍රදායන් හරහා යම්තාක් දුරකට සංරක්ෂණය වී ඇත. වාචික සම්ප්‍රදායන් හෝ ජනප්‍රවාද මගින් ඓතිහාසික දත්ත ආරක්ෂා

කළ හැකි නමුත් ඒවායේ සත්‍යතාවය ඉතා සූක්ෂ්මව වෙනත් මූලාශ්‍රයන් ද සහය කර ගනිමින් ඒකාබද්ධ ප්‍රවේශයකින් ඇගයිය යුතුය.

ක්‍රමවේදය

මේ පිළිබඳ අධ්‍යයනය සඳහා සාහිත්‍ය මූලාශ්‍ර සහ පූර්ව පර්යේෂණ අධ්‍යයනයන් විරල වූයෙන් සම්පූර්ණ වශයෙන්ම පාහේ ක්ෂේත්‍ර ගවේෂණය ඔස්සේ තොරතුරු ලබාගන්නා ලද අතර එහි දී ක්ෂේත්‍රයේ නෂ්ටාවශේෂ, වාස්තු විද්‍යාත්මක ලක්ෂණ සහ සිතුවම් අධ්‍යයනය කිරීම සිදුකළ අතර සම්මුඛ සාකච්ඡා හරහා දත්ත රැස් කිරීම ද සිදු කරන ලදී. මෙම පර්යේෂය තුළ දැක්වෙන විහාරස්ථානයට අදාළ සියලුම ඡායාරූප සහ සැලසුම් ආදිය පර්යේෂකයා විසින්ම ක්ෂේත්‍ර අධ්‍යයනයේ දී ලබා ගන්නා ලද සහ පිළියෙළ කරන ලද ඒවා බව සැලකිය යුතුය.

මාලගොඩ පුරාණ රජමහා විහාරයේ ඉතිහාසය

කන්දෙගෙදර මාලගොඩ පුරාණ රාජමහා විහාරස්ථානයේ ඉතිහාසය ජනප්‍රවාදගත සාධක වලට අනුකූලව ලක්දිව තෙවන රාජධානිය වූ දඹදෙණිය රාජධානි අවධිය දක්වා දිවයන්නකි. විධිමත් පුරාවිදු ගවේෂණයකට තවමත් මෙම භූමිය ලක් වී නොමැති අතර ආසන්න වශයෙන් දඹදෙණි රාජ්‍ය අවධියට අයත් යැයි අනුමාන කළ හැකි පුරාවිද්‍යාත්මක වටිනාකමකින් යුත් නෂ්ටාවශේෂ අදටත් විහාර භූමිය තුළ දැකිය හැකිය. ඒ අනුව මෙම විහාරස්ථානය පූර්වයෙහි දඹදෙණියේ රජ කළ නැම්බඹර කලිකාල සාහිත්‍ය සර්වඥ පණ්ඩිත දෙවන පැරකුම්බාවන් විසින් කරවන ලද විහාරයක් බවට විශ්වාස කෙරෙයි (සරණපාල හිමි 2022: සම්මුඛ සාකච්ඡා). මෙම විහාරස්ථානයේ නාමය වන "මාලගොඩ" යන්නෙහි ප්‍රභවය සම්බන්ධව ජනප්‍රවාදගත අර්ථකථන කිහිපයක්ම පවතී. මෙම ප්‍රවෘත්තීන්ගේ කථා ශරීරයේ සුළු වෙනස්කම් හැරුණු විට විහාරස්ථානයේ නාමයෙහි සම්භවය සඳහා බලපෑ මූලය එකක් බව පෙනේ. එවකට දෙවන පැරකුම්බාවන් දඹදෙණියේ සිට ගව්වෙන් ගව්ව විහාරයන් කරවූ බවත් මෙම විහාරය ද එසේ කරවන ලද විහාරයන්ගෙන් එකක් බවත් ජනප්‍රවාදයේ පවතී. රජු මෙම විහාරය කරවන අවධියේ මෙහි ස්තූපයේ ධාතු නිධානෝත්සවයකට සපැමිණ එම අවස්ථාවේ එම වෙහෙර කෙරෙහි පැහැදී තමා පැලඳ සිටි ගෙල මාලය මෙම දාගැබට පූජා කරන ලද බවත්, ඉනික්බිතිව රජු පිරිවරා හුන් අමාත්‍යයෝ ද බිසෝවරු ද ආදී කොට ගත් ජනයා රජු අනුව යමින් තම ගෙල මාලයන් ද දාගැබට පූජා කොට ඇත. මෙසේ සියලු දෙනා තමා පැළඳි ගෙල මාල පූජා කිරීම නිසා ගෙල මාල සමූහයක් ඒකරාශී වූ අතර එය දුටු රජු එයට මාලගොඩ යැයි කීවේ ලු. එවක් පටන් මෙම විහාරස්ථානය මාලගොඩ යන නාමයෙන් වහරන ලද බැව් ජනප්‍රවාදයේ කියැවෙයි (සරණපාල හිමි 2022: සම්මුඛ සාකච්ඡා). එසේම මෙම විහාරයේ දෙවන පැරකුම්බාවන්ගේ මාල හත් පොටක් නිදන්ගත නිසා මාලගොඩ යනුවෙන් වහරන ලද බව ද ජනප්‍රවාදයේ එයි (බණ්ඩාර 2022: සම්මුඛ සාකච්ඡා). කෙසේ වුව ද පළමුවැන්න විහාරස්ථානයේ නාමයෙහි සම්භවය සම්බන්ධයෙන් වඩාත් ගැළපෙන බව පෙනේ.

මෙම විහාරස්ථානය සම්බන්ධයෙන් සඳහන් ලිඛිත මූලාශ්‍රයක් මේ දක්වා හමු වී නැති අතර දඹදෙණි අවදියෙන් පසු නැවත මෙම විහාරය පිළිබඳ තොරතුරු ජනප්‍රවාද තුළ සඳහන් වන්නේ ක්‍රිස්තු වර්ෂ දහසය වන සියවස ආශ්‍රිතව ය. එනම් පෘතුගීසීහු ලක්දිව වෙරළබඩ තැනිතලාවේ බලයට පත්ව සිටි අවධියේ ඔවුහු

බෞද්ධ වෙහෙර විහාර විනාශ කිරීමෙහි නියුක්ත වී සිටි අතර එසේ පැමිණි ප්‍රතිකාල් සේනාවන් මෙම විහාරය ගිනිබත් කොට විනාශ කරන ලද බවත් ඔවුහු මැණික්කඩවර බලකොටුව හරහා මෙහි පැමිණි බවත් කියැවේ. ඒ සමඟ මෙම විහාරස්ථාන දැඩි පරිහානියකට පත්වූ බව සිතිය හැකිය. ඉන්පසුව මහනුවර යුගයේ දී කීර්ති ශ්‍රී රාජසිංහ රජ දවස අඹමල්ලේ හිමියන්ගෙන් (අරුක්ගොඩ හිමි) ඇරඹී ඉද්දමල්පාන සංඝ පරපුරෙහි හිමිනමක් මෙම විහාරස්ථානයට පැමිණ කටුකොහොල් හරවා නැවත විහාරස්ථානය ප්‍රකෘතිමත් කොට ඇත (සරණපාල හිමි 2022: සම්මුඛ සාකච්ඡා). එවක් පටන් ඓතිහාසික ඉද්දමල්පාන කීර්ති ශ්‍රී රාජසිංහ රාජමහා විහාර පරම්පරාව යටතේ කන්දේගෙදර මාලගොඩ පුරාණ රජමහා විහාර පරම්පරාවේ ස්වාමීන් වහන්සේලා වන

- අපවත් වී වදාළ ඉද්දමල්පාන සඟ පරපුරෙහි ප්‍රධානී පූජ්‍යපාද අරුක්ගොඩ නාහිමිපාණන් වහන්සේ
- 1864 වර්ෂයේ පූජ්‍යපාද වැවල ධම්මජෝති නායක ස්වාමීන් වහන්සේ
- පූජ්‍යපාද හමන්ගල්ලේ සෝණුත්තර ස්වාමීන් වහන්සේ
- පූජ්‍යපාද නෙලුම්දෙනියේ අත්ථදස්සි ස්වාමීන් වහන්සේ
- ගොඩාකුරුව පුරාණ විහාරාධිපති පූජ්‍යපාද ඉද්දමල්පානේ සෝභිත ස්වාමීන් වහන්සේ
- කන්දේගෙදර මාලගොඩ පුරාණ රාජමහා විහාරාධිපති පූජ්‍යපාද හරිගල සුමනාභිධාන නායක ස්වාමීන් වහන්සේ (අපවත් වීම 1973 වර්ෂයේ)
- නැබඩවතුර පුරාණ විහාරාධිපති පූජ්‍යපාද පලපලුවාවේ රතනපාල ස්වාමීන් වහන්සේ
- විහාර පරම්පරාවේ විහාරාධිපති වයඹ පළාතේ ප්‍රධාන අධිකරණ සංඝනායක පූජ්‍යපාද ශාස්ත්‍රපති බෝපිටිය ශ්‍රී සෝමරතනාභිධාන නායක ස්වාමීන් වහන්සේ
- නැබඩවතුර පුරාණ විහාරාධිපති දඹදෙණි හත්පත්තුවේ ප්‍රධාන අධිකරණ සංඝනායක පූජ්‍යපාද පන්දෙණියේ සරණංකරාභිධාන නායක ස්වාමීන් වහන්සේ
- කන්දෙගෙදර මාලගොඩ පුරාණ රජමහා විහාරාධිපති පූජ්‍යපාද ධර්මාචාර්ය මාදුරුමුල්ලේ සීලරතනාභිධාන නායක ස්වාමීන් වහන්සේ
- ජාත්‍යන්තර මැලේසියා ලංකා බෝධිරාමය භාරකාර හා ධර්ම ප්‍රචාරක ශාස්ත්‍රපති පූජ්‍යපාද මීවැවේ සුමංගල ස්වාමීන් වහන්සේ (අපවත් වීම 2003 වර්ෂයේ)
- ඓතිහාසික කැගල්ල හරිගල ඉද්දමල්පාන කීර්ති ශ්‍රී රාජසිංහ රජමහ විහාරය, ඓතිහාසික අලව්ව කන්දෙගෙදර මාලගොඩ පුරාණ රජමහා විහාරය, වෙන්නොරුව ගොඩාකුරුව පුරාණ විහාරය, බෝයවලාන ශ්‍රී බෝධිරුක්ඛාරාම පුරාණ විහාරය, ලාහුපන ඇල්ලේ ශ්‍රී ගංගාරාම පුරාණ විහාරය, විල්ගමුව ගල්ළිඳයායේ හේන සීල භාවනා මධ්‍යස්ථානය ඇතුළු විහාර පරම්පරාවේ විහාරාධිපති ,හිටපු නියෝජ්‍ය විදුහල්පති, කෝරළ තුන සහ පහළ බුලත්ගම ඇතුළු සතර කෝරළ මහදිසාවේ ප්‍රධාන අධිකරණ සංඝනායක විනය කීර්ති ශ්‍රී සෝමරතන ශ්‍රාස්ත්‍රවේදී පූජ්‍යපාද හරිගල සරණපාල නායක ස්වාමීන් වහන්සේ - (වත්මන් විහාරාධිපති)
- පූජ්‍යපාද වහදිවල සීලවංශ ස්වාමීන් වහන්සේ - (වත්මන් විහාරාධිකාරී)

වැඩ වාසය කොට ඇත (සීලවංස හිමි 2022: සම්මුඛ සාකච්ඡා). වර්තමානයේ අක්කර පහකට ආසන්න භූමි වපසරියක ව්‍යාප්ත වී ඇති විහාරස්ථානය අතීතයේ ඊට වඩා වැඩි භූමි ප්‍රමාණයක් වසා පැතිර තිබූ බවට සාධක ද දක්නට ලැබේ. විහාරස්ථානය අවට පෞද්ගලික ඉඩම් වල අදටත් පැරණි ගල්ටැම්, පොකුණු ආදියෙහි නෂ්ටාවශේෂ වලට අයත් සාධක විද්‍යාමාන වේ. එසේම විහාරස්ථානයේ පැරණි ටැම්පිට විහාරයක් තිබී ඇති අතර එය විසිවන සියවසේ මුල් දශක වල කඩා ඉවත් කොට ඇත (සරණපාල හිමි 2022: සම්මුඛ සාකච්ඡා). විහාරාධිපති හිමියන් දක්වන තොරතුරු වලට අනුව එය බොහෝ විට මහනුවර යුගයේ අග භාගයේ නිර්මාණය වූවක් වන්නට ඇතැයි අනුමාන කළ හැකි අතර මෙම විහාරස්ථානයට ආසන්න විහාරස්ථානයක ද මහනුවර යුගයේ අග භාගයට අයත් වාස්තු විද්‍යාත්මක ලක්ෂණ සහිත ටැම්පිට විහාර ගෘහයක් දැකිය හැකිය. ඊට අමතරව පැරණි බුද්ධ ප්‍රතිමා සහ තවත් ප්‍රතිමාවන් විහාරස්ථාන භූමියෙන් හමුවී ඇති අතර ඒවා පිළිබඳ මතුවට සාකච්ඡා කෙරෙයි.

පූර්වයෙහි සඳහන් කරන ලද පරිදිම මාලගොඩ පුරාණ රාජමහා විහාරස්ථානයේ ඉතිහාසය ජනප්‍රවාදගත සාධක වලට අනුකූලව දඹදෙණි රාජධානි අවධිය දක්වා දිව යයි. ඒ අනුව වර්තමාන විහාර භූමිය තුළ තිබී අවම වශයෙන් දඹදෙණි රාජ්‍ය අවධියට අයත් යැයි සැලකිය හැකි ප්‍රතිමා පහක් හමු වී තිබේ. මේවා විහාරයේ සංවර්ධන කටයුතු සඳහා විහාර භූමිය සෑරීමේ දී විසිවන සියවසේ මුල් දශකවල පොළව අභ්‍යන්තරයෙහි තිබී හමුවී ඇත (සරණපාල හිමි 2022: සම්මුඛ සාකච්ඡා). එයින් ප්‍රතිමා දෙකක් අදටත් පැරණි ස්වරූපයෙන් දෘශ්‍යමාන වන අතර අනෙකුත් ප්‍රතිමා ත්‍රිත්වය ප්‍රතිසංස්කරණය කරන ලදුව විහාර මන්දිරයෙහි තැන්පත් කොට ඇත. ප්‍රතිසංස්කරණයට බඳුන් වීම නිසා ඒවායේ පුරාවිද්‍යාත්මක වටිනාකම ගිලිහී ගොස් ඇති අතර මුල් ස්වරූපය හඳුනා ගැනීමට නොහැකි මට්ටමක පවතියි. අද වන විට මුල් ස්වරූපයෙන් ම දැකබලා ගත හැකි පිළිම ද්විත්වයෙන් ප්‍රධාන ප්‍රතිමාව බුද්ධ ප්‍රතිමාවකි (01 රූපය බලන්න) .මෙම ප්‍රතිමාව ඇතුළු අනිකුත් ප්‍රතිමා හමුවූ ස්ථානය වර්තමාන බෝධීන් වහන්සේට ආසන්න ස්ථානයක් වන අතර ඒ අනුව එම ස්ථානය පැරණි පටිමාඝරයක් වන්නට ඇතැයි අනුමාන කළ හැකිය. පූර්වයෙහි සඳහන් කළ පරිදි මෙම විහාරයට එල්ල වූ ප්‍රතිකාල් ආක්‍රමණය නිසා හෝ ප්‍රතිමාව මතුකර ගැනීමේ දී ප්‍රතිමාව පිළිබඳ නොදැන කැණීම් උපකරණ භාවිතය නිසා හෝ ප්‍රතිමාව දැඩි අලාභ හානියට ලක් වී ඇත. මෙය වර්තමානයේ වෙනම ගෘහයක තැන්පත් කොට ප්‍රදර්ශනය උදෙසා තබා ඇත. මෙම විහාරස්ථාන භූමිය පුරාවිද්‍යාත්මක ස්ථානයක් ලෙස ප්‍රකාශයට පත් වීමක් හෝ මෙම පුරාවස්තු මේ වනතුරු පුරාවිද්‍යාවේ ඇසට හසු වී නොමැත. යථෝක්ත ප්‍රතිමාව පිළිබඳ සැලකුවිට එය උස අඩි 5යි අඟල් 7ක කිරිගරුඬ පාෂාණයෙන් කරන ලද ප්‍රතිමාවකි. මෙහි පාද වර්තමානය වනවිට ශේෂ වී නොමැති අතර පාද සමගින් සමස්ත ප්‍රතිමාව උස අඩි 6කට ආසන්න මානව ප්‍රමාණයේ නිර්මාණයක් වූ බව පෙනේ. සමහංග ඉරියව්වෙන් නිර්මිත හිටි බුද්ධ ප්‍රතිමාවක් වන මෙහි බුදුන් වහන්සේගේ දකුණත ආශිංසන (ආශීංස) මුද්‍රාවෙන් නිරූපිත ය. මෙය අභය මුද්‍රාව යැයි ද සැක කළ හැකි නමුත් බොහෝ දුරට ආශිංසන මුද්‍රාවට සමාන වේ. ප්‍රතිමාවේ වම් අත කැඩී ගොස් ඇති අතර එහි ස්වරූපය අනුව එය කටක හස්ත මුද්‍රාවෙන් නිරූපිත ව තිබෙන්නට ඇතැයි අනුමාන කළ හැකි වේ. වමත ඉහලට එසවීම නිසා වම් උරහිස හරහා වැටුණු සිවුරු පට ශිල්පියා මනාවට නිරූපණය කොට ඇත. එම නිසා කැඩී ගොස් ඇති වම් හස්තයෙන් නිරූපණය වන්නේ කටක හස්ත මුද්‍රාව බවට අනුමාන කළ හැකිය. මෙහි නිර්මාණ ශිල්පියා ආශිංසන

මුද්‍රාවෙන් නිරූපිත බුදුන්ගේ වම් හස්තය සිරුරෙන් වෙන් කොට නිරූපණය කොට නොමැති අතර කිරිගරුඬ පාෂාණය එතරම් ශක්තිමත් පාෂාණයක් නොවීම ඊට හේතුව වූ බව පෙනේ. මෙම ප්‍රතිමාවේ චීවරයේ රැළි ආදිය කිසිවක් හඳුනාගත නොහැකි අතර මෙය ඒකාංශ පාරුපනයෙන් යුක්තව නිමවන්නට ඇතැයි සිතිය හැකිය. එසේම මෙම ප්‍රතිමාවේ තාක්ෂණික ශිල්පීය ක්‍රමයේ සුවිශේෂීත්වයක් ද ඉතා සූක්ෂමව ප්‍රතිමාව අධ්‍යයනය කරන කල පෙනේ. එනම් ප්‍රතිමාව ඉදිරිපස කොටස හා පසුපස කොටස වශයෙන් වෙන වෙනම නෙළා පසුව එකට සම්බන්ධ කරන ලද බව පෙනේ. විශේෂයෙන් මෙතරම් විශාල කිරිගරුඬ ගල් කුට්ටියක් නෙළාගත හැකි පාෂාණයක් අවට ප්‍රදේශයේ දැකගත නොහැකි අතර බොහෝවිට වෙනත් ප්‍රදේශයකින් මෙම ස්ථානයට ගල්කුට්ටිය හෝ නෙළන ලද ප්‍රතිමාව ගෙන ආවා විය හැකිය. වෙනත් ස්ථානයක ප්‍රතිමාව නෙළා කොටස් දෙකක් වශයෙන් මෙම ස්ථානයට ගෙනවිත් සම්බන්ධ කිරීම හෝ ගල් කුට්ටි දෙකක් වශයෙන් මෙම ස්ථානයට ගෙනවිත් මෙහිදී ප්‍රතිමාව නිර්මාණය කළා වන්නට ද ඉඩ තිබේ. කොටස් දෙකක් වශයෙන් පැවැති පසුව එම කොටස් සම්බන්ධ කිරීමෙන් මෙම ප්‍රතිමාව නිර්මාණය කර ඇති බව රූපයෙන් පැහැදිලි වේ. විහාරස්ථානයේ ඉතිහාසය ජනප්‍රවාදගතව දඹදෙණි රාජධානියට අයත්ව පැවති නිසා මෙම ප්‍රතිමාව ද එම යුගයට අයත් යැයි සලකන නමුදු පවත්නා ලක්ෂණ අනුව මෙය ක්‍රි.ව. දහතුන්වන සියවසට වඩා පැරණි විය හැකිය. ප්‍රතිමාවට අධික ලෙස හානි සිදුවීම නිසා එහි සියුම් කලා ලක්ෂණ හඳුනාගත නොහැකි අතර බුදුන් වහන්සේගේ මුහුණේ ඇස්, නාසය සහ මුඛය වැනි අංග පවා විද්‍යමාන නොවේ. ප්‍රතිමාව මතු කරගත් ආසන්න අවධියේ 1960 දශකයේ දී පමණ හිටපු පුරාවිද්‍යා කොමසාරිස් ආචාර්ය චාල්ස් ගොඩකුඹුර මහතා මෙම ප්‍රතිමාව නිරීක්ෂණය කළ බව විහාරාධිපති හිමියන් සඳහන් කරන නමුත් ඒ හැරුණු විට එතුමා දක්වන ලද අදහසක් හෝ වෙනයම් අදහස් දැක්වීමක් පිළිබඳව ද සඳහන් නොවේ.





01 රූපය - ඉපැරණි හිටි බුද්ධ ප්‍රතිමාව

(පර්යේෂකයා විසින් ලබා ගන්නා ලද්දකි: 2022)



02 රූපය - බෝධිසත්ත්වවරයෙකුගේ යැයි අනුමාන කළ හැකි ප්‍රතිමාව

(පර්යේෂකයා විසින් ලබා ගන්නා ලද්දකි: 2022)

වර්තමානයේ මුල් ස්වරූපයෙන් හඳුනාගත හැකි දෙවන ප්‍රතිමා වන්නේ අංක 02 ප්‍රතිමාවයි. මෙය ආසන්න වශයෙන් උස අඩි 4 අඟල් 6 ප්‍රමාණයකින් නිර්මිත පිළිමයකි. මෙහි ශරීරයේ ශීර්ෂය කැඩී ගොස් ඇති අතර දෙඅත් සම්පූර්ණයෙන්ම කැඩී ගොසිනි. සමභංග ඉරියව්වෙන් නිරූපිත මෙම ප්‍රතිමාව ස්ඵටික හුණුගල් වලින් කරන ලද ප්‍රතිමාවක් බව හැඟේ. මෙම ප්‍රතිමාවේ මුහුණේ ඇස්, නාසය සහ මුඛය ඉතා සියුම්ව නිරීක්ෂණය කළ විට හඳුනා ගත හැකිය. හිසෙහි ශීර්ෂාභරණයක් පැළඳ සිටින මෙය බොහෝවිට බෝධිසත්ත්ව ප්‍රතිමාවක් හෝ රජ පිලිමයක් වන්නට ඇතැයි සිතිය හැකිය. ජටා මකුටයේ කැටයම් හෝ පැළඳ සිටින ආභරණවල කැටයම් ශේෂ වී නොමැති අතර පවත්නා සාධක අනුව ඉහත නිගමනයට එළැඹිය හැකිය.

ප්‍රතිමා ගෘහය සහ සිතුවම්




03 රූපය - වත්මන් ප්‍රතිමා ගෘහය

(පර්යේෂකයා විසින් ලබා ගන්නා ලද්දකි: 2022)

මෙම විහාර මන්දිර සම්ප්‍රදාය මහනුවර යුගයේ දක්නට ලැබෙන ආකාරයේ සාමාන්‍යයෙන් ලෙස ගොඩ නගන ලද විහාරයන්හි ආකෘතිය ගත්තකි. මෙය ගර්භ ගෘහය, ඒ වටා දිවෙන ප්‍රදක්ෂිණා පථය සහ ප්‍රවේශ මණ්ඩපයකින් සමන්විත ගන්ධකුටි සම්ප්‍රදායේ ප්‍රතිමා ගෘහ අකෘතිය ගත්තකි. මෙම විහාර මන්දිරය බු.ව.2466 (ක්‍රි.ව.1922) දී ඉදිකිරීම් කටයුතු ආරම්භ කරන ලදුව බු.ව 2476 (ක්‍රි.ව.1932) වැන්නේ විහාර කර්මාන්තය නිමවා ඇත. මෙසේ විහාර කර්මාන්තය ආරම්භ කරන ලද සහ අවසාන කරන ලද වර්ෂයන් විහාර ගෘහයට ප්‍රවේශවන ද්වාරයට ඉහළින් පිහිටි බිත්තියේ සටහන් කොට ඇත. අඩියක් පමණ උස් වූ පාදමක් මත ගොඩ නගන ලද මෙම ප්‍රතිමා ගෘහය දිගින් අඩි 48 ක් හා පළලින් අඩි 40.8 ක ප්‍රමාණයෙන් යුතු දැවැන්ත ප්‍රතිමා ගෘහයකි. දෙමහල් ස්වරූපයෙන් මෙය ඉදිකොට ඇති අතර ඇතුළත ඇතුළු ගෘහයකින් හා ඉන් බාහිර ප්‍රදක්ෂිණා ගෘහයකින් යුක්ත වේ. විහාර මන්දිරයට ඇතුල්වීමට එක් ද්වාරයක් පමණක් ඇති අතර ප්‍රධාන දොරටුවේ සිට ඉදිරිපසට විවෘත බරාදයක් නිර්මාණය කර ඇති අතර පසුකාලීන ප්‍රතිසංස්කරණ වලට පසුව වර්තමානයේ බරාදය ආවෘතව දැකගත හැකිය. එසේම විහාර මන්දිරය නැගෙනහිර දිශාවට මුහුණලා ඉදි කොට ඇති අතර ඇතුල් ගෘහයට ආලෝකය ලබාගැනීමට වීදුරු යොදන ලද කවුළු දැකගත හැකි වේ. දර්ශනීය මකර තොරණක් ප්‍රධාන දොරටුව ඔස්සේ ප්‍රදක්ෂිණා ගෘහයට ඇතුළුවත්ම ඇතුළු ගෘහයට ප්‍රවිෂ්ට වන දොරටුව වටා ගොඩනඟා ඇත. මහනුවර සම්ප්‍රදායෙහි ප්‍රතිමා ගෘහයන්හි ආවේණික නිර්මාණාංගයක් වන මෙය ප්‍රතිමා ගෘහයට පිවිසෙන්නෙකුගේ සිත තුළ යම් තිගැස්මක් ඇතිකරවනු නොඅනුමාන ය. ගඩොල්


සහ මැටි බදාමයෙන් නිර්මාණය කර ඇති මෙහි ඉහළ කිහිඹි මුහුණෙන් (කීර්ති මුඛය) නිකුත්වන ලියවැලක් දෙපසින් මකරුන් දෙදෙනකු විසින් ගිලින ස්වරූපයෙන් දක්වා තිබේ. මෙම ලියවැල අතිශය අලංකාර මාලා කර්මයන්ගෙන් හා ලතා කර්මයන්ගෙන් අලංකාරවත් කොට තිබේ. කිහිඹි මුහුණෙන් නිකුත්වන ලියවැල දෙපසට බෙදී යන ස්ථානයෙහි දී නාරිලතා මල සැරසිල්ලක් වශයෙන් යොදාගෙන ඇත. මෙම මකර රූපය රූපාවලිය නම් සංස්කෘත ග්‍රන්ථයෙහි සඳහන් වන අයුරින්ම ඇතෙකුගේ හොඬවැලක්, සිංහයෙකුගේ පාද, ඌරකුගේ කන්, කිඹුලෙකුගේ දත්, වඳුරෙකුගේ නේත්‍රයන්, මත්ස්‍යයෙකුගේ ශරීරය සහ ගුරුලෙකුගේ පියාපත් වලින් යුක්තව ඉතා දර්ශනීය ස්වරූපයෙන් නිමවා ඇත (කුමාරස්වාමි, 2011: 83). මෙම සිතුවම් ස්වාභාවික වර්ණ උපයෝගී කරගනිමින් නිර්මාණය කර ඇති අතර නිල්, කහ, රතු, කොල සහ සුදු ආදී මූලික වර්ණ බෙහෙවින් ඒ අතර උපයෝගී කරගෙන ඇත. මකර තොරණට ඉහළින් දිව්‍ය රූප දක්වා ඇති අතර වම්පස හස්තියෙකු මත වැඩ සිටින දේව රූපයකුත්, දකුණුපස ගුරුළෙකු වැනි පක්ෂියෙකුත් මත වැඩසිටින දේව රූපයකුත් දක්නට ලැබේ. එසේම මකර රූපයන් ද්විත්වයෙහි වල්ගය තිරිඟි තලය වැනි සාම්ප්‍රදායික කැටයමක් මගින් අලංකාර කොට ඇත. එමෙන්ම මකර තොරණට පහළින් (උළුවස්සට ඉහළින්) නුවර යුගයේ නිලමේවරයෙකු සහ භික්ෂූන් වහන්සේ නමක් පසුතලයෙහි දක්වමින් දළදා වහන්සේ සිතුවමට නගා තිබේ. දළදා වහන්සේගේ සිතුවම සහිත ඵලකය දෙපසින් අල්ලාගෙන සිටින ආකාරයේ කුඩා කුමාර රූප දෙකක් සිතුවම් කර ඇති අතර එම සිතුවම් දේශීය චිත්‍ර ශෛලියට වඩා මධ්‍යකාලීන යුරෝපීය චිත්‍ර ආභාෂයන්හි දේවදූතයන් සිහිගන්වයි. මෙම මකරුන් විහාර මන්දිරයන් තුළ ඉදිකිරීම කුමන අරමුණක් සහිතව සිදු වුවා ද යන්න පිළිබඳ විවිධ මතවාද ඉදිරිපත් වී ඇත. එසේම ආනන්ද කුමාරස්වාමි මහතා මකරා වනාහි රාශි චක්‍රයේ සංකේතයක් බවද අනංගයාගේ ධජයේ මකර රුව දැක්වෙන බව ද දක්වා ඇත (කුමාරස්වාමි, 2011: 82). මෙම මකර රූපය මගින් ජලය සංකේතවත් කරන බවත් එමගින් වරුණ දෙවියන් අදහස් කරන්නේ ය යන්න පිළිබඳව ද මත ඉදිරිපත් වී තිබේ.



04 රූපය - පැති පෙනුම
(පර්යේෂකයා විසින් නිර්මාණය කරන ලද සැලසුමකි : 2022)




05 රූපය - පිටුපස පෙනුම
(පර්යේෂකයා විසින් නිර්මාණය කරන ලද සැලසුමකි : 2022)



06 රූපය - ඉදිරිපස පෙනුම
(පර්යේෂකයා විසින් නිර්මාණය

විහාරයේ ඇතුළු ගෘහයේ ප්‍රතිමා

ඇතුළු ගෘහයට පිවිසෙනවාත් සමගම වම්පස දර්ශනීය හිඳි බුද්ධ ප්‍රතිමාවහන්සේ වැඩ සිටින අතර ආසන්න වශයෙන් අඩි 8ක උස ප්‍රමාණයෙන් සහ අඩි 6 ක පළලින් යුක්තව මෙම ප්‍රතිමාව නිර්මාණය කර ඇත. විහාර බිම් සැලැස්මෙහි A නමින් දක්වා ඇති ස්ථානය මෙම ප්‍රතිමාව වැඩ සිටින ස්ථානය යි. කොළඹ යුගයේ ප්‍රතිමා සම්ප්‍රදායට අනුකූලව ගොඩනැඟුණු ප්‍රතිමාවක් ලෙස මෙම ප්‍රතිමාව හැඳින්විය හැක. මෙම ප්‍රතිමාවෙහි බුදුන් වහන්සේ වීරාසන ක්‍රමයට වැඩ සිටින අතර ධ්‍යාන මුද්‍රාව නිරූපිත වෙයි. චීවරයේ රැළි මහනුවර සම්ප්‍රදායට



07 රූපය - ප්‍රතිමා ගෘහයේ බිම් සැලැස්ම

(පර්යේෂකයා විසින් නිර්මාණය කරන ලද සැලසුමකි : 2022)

සාපේක්ෂව ස්වාභාවිකව ශරීරයට ඇලුණු ස්වරූපයකින් දක්වා ඇති අතර මහනුවර සම්ප්‍රදායේ ප්‍රතිමාවන්හි දක්නට ලැබෙන උත්තුංග දේහධාරී බව(නිග්‍රෝධ පරිමණ්ඩල කාය) මෙම ප්‍රතිමාවෙහි ද දක්නට ලැබෙයි. බුදුන්ගේ ශීර්ෂයේ කෙස් අක් බඹරුන්ගේ ස්වරූපයෙන් දක්වා ඇති අතර නෙළුම් කැකුළක හැඩය ගත්

සිරස්පතක් ද දක්නට ලැබේ. චීවරය රතු පැහැයට හුරු තැඹිලි පැහයෙන් නිරූපිත අතර ශරීරය කහ පැහැයෙන් වර්ණ ගන්වා ඇත. ගඩොල් හා මැටි බදාමයෙන් මෙම ප්‍රතිමාව නිමවා ඇති අතර බුදුන් වහන්සේ අඩවන් වූ දෙනෙතින් යුක්තව වැඩ සිටියි. මෙම ප්‍රතිමාව තුළ බුදුන් වහන්සේගේ ලඹ සවන් එතරම් දිගු ස්වරූපයෙන් නිරූපණය කොට නොමැත. එමෙන්ම බුදුන් වහන්සේ වටා ඇති ප්‍රභා මණ්ඩලය රතු (රෝස පැහැය) සහ සුදු පැහැයෙන් ගිනි දැල්ලක සැරසිලි රටාවකින් වර්ණ ගන්වා ඇත. ඒ වටා නිල්, රතු, කොළ, කහ ආදී වර්ණයන්ගෙන් යුතු මාලා කර්මයකින් අලංකාරවත් කොට තිබේ. ප්‍රතිමාව පසුබිමෙහි බිත්තියේ බුදුන් වහන්සේට නමස්කාර කරනු ලබන රහතන් වහන්සේලාගේ සිතුවම් රූපගත කොට ඇත.

ඇතුළු ගෘහයට ප්‍රවිෂ්ට වනවාත් සමගම සෘජුවම දක්නට ලැබෙන ප්‍රධාන බුද්ධ ප්‍රතිමාව වන්නේ මෙම ප්‍රතිමාව යි. විහාර සැලසුමෙහි B අක්ෂරයෙන් දක්වා ඇත්තේ මෙම ප්‍රතිමාව විහාර ගෘහය තුළ ස්ථානගත කොට ඇති ස්ථානයයි. බුද්ධ පරිනිර්වාණය මූර්තිමත් කරනු ලබන මෙම පිළිමය අඩි 17ක දිග ප්‍රමාණයකින් යුක්තව නිර්මාණය කොට ඇත. බුදුන් වහන්සේ දකුණු ඇලයෙන් සිංහ සෙයියාවෙන් වැඩ සිටින මෙම ප්‍රතිමාවෙහි වම් පාදය මදක් පසුපසට පැමිණි ස්වරූපයෙන් දක්වා තිබේ. ඒ අනුව මෙම ප්‍රතිමාව බුද්ධ පරිනිර්වාණය සංකේතවත් කරනු ලබන ප්‍රතිමාවක් ලෙස හැඳින්විය හැකිය. හිඳි බුද්ධ ප්‍රතිමාවට සාපේක්ෂව චීවරයේ රැළි මහනුවර සම්ප්‍රදායට අනුව යමින් දිය රැල්ලේ ස්වරූපයෙන් නිර්මාණය කොට තිබේ. චීවරය රතු පැහැයට හුරු තැඹිලි පැහැයෙන් සහ බුදුන්ගේ ශ්‍රී ශරීරය කහ වර්ණයෙන් වර්ණ ගන්වා ඇත. බුදුන් වහන්සේගේ ශීර්ෂයෙහි කෙස් අක් බඹරුන්ගේ ස්වරූපයෙන් නිමවා ඇති අතර ශීර්ෂය මුදුනෙහි පංචාංගුලි සිරස්පතක් දක්නට ලැබෙයි. ප්‍රතිමාව ගඩොල් හා මැටි බදාම අමුද්‍රව්‍ය කොට නිමැවුනකි. මේ ප්‍රතිමාව ප්‍රතිමා ගෘහයෙහි පිහිටීම අනුව දකුණු දිශාවට හිස සිටින සේ නිර්මාණය කොට ඇත. ප්‍රතිමාවෙහි දකුණු කෙළවර සාරිපුත්ත සහ මොග්ගල්ලාන මහ රහතන් වහන්සේලාගේ ප්‍රතිමාවන් ද්විත්වයක් කරවා තිබේ. ඒවා අඩි 6 කට ආසන්න මානව ප්‍රමාණයෙන් නිර්මිත ප්‍රතිමා වේ. බුදුන් වහන්සේගේ ප්‍රභා මණ්ඩලය පෙර පරිදිම ගිනි දැල්ල මෝස්තරය සහ මල් මාලාවන්ගෙන් අලංකාර කොට තිබේ. බුදුන් වහන්සේ පිරිවරා වැඩ සිටින ආකාරයෙන් ප්‍රතිමාවට පසුපස බිත්තියේ බුදුන් වහන්සේට වැඳ සිටින ඉරියව්වෙන් රහතන් වහන්සේලාගේ රූ සිතුවමට නගා තිබේ.



08 රූපය - හිඳි බුද්ධ ප්‍රතිමාව

(පර්යේෂකයා විසින් ලබා ගන්නා ලද්දකි: 2022)



09 රූපය - සැතපෙන බුද්ධ ප්‍රතිමාව (පරිනිර්වාණ ප්‍රතිමාව)

(පර්යේෂකයා විසින් ලබා ගන්නා ලද්දකි: 2022)



A රූපය



B රූපය

මෙම ප්‍රතිමාව විහාරයෙහි ඇතුළු ගෘහයෙහි හිඳි බුද්ධ ප්‍රතිමාවට ආසන්නයේ නිර්මාණය කොට ඇත. විහාර බිම් සැලැස්මෙහි C අක්ෂරයෙන් දක්වා ඇත්තේ මෙම පිළිමය ස්ථානගත කොට ඇති ස්ථානය යි. මෙම බුද්ධ ප්‍රතිමාව ආසන්න වශයෙන් අඩි 6ක පමණ උසකින් යුක්ත වන අතර වමතින් කටකහස්ත මුද්‍රාවෙන් ද දකුණතින් ආශීස (ආශිංසන) මුද්‍රාවෙන් ද නිරූපණය කොට තිබේ. එසේම සමභංග ඉරියව්වෙන් නිරූපිත මෙම ප්‍රතිමාව පද්ම පීඨයක් මත වැඩ සිටින ආකාරයෙන් දක්වා ඇත. මෙම විහාර කර්මාන්තය කරවන අවධියේ විහාර භූමියෙන් ඉපැරණි ශෛලමය ප්‍රතිමාවන් පහක් පොළොව අභ්‍යන්තරයේ තිබී හමුව තිබේ. එම ප්‍රතිමාවන්ගෙන් එක් බුද්ධ ප්‍රතිමාවක් එම ස්වරූපයෙන් ම වර්තමානයේ ද දැකගත හැකිය. (01 රූපය බලන්න.) ඒ සමඟම හමු වූ අනෙකුත් බුද්ධ ප්‍රතිමාව එවකට විහාරාධිපති ස්වාමීන් වහන්සේ විසින් විහාර කර්මාන්තය කරවූ මූර්ති ශිල්පීන් ලවා ශිලා ප්‍රතිමාව ආවරණය වන පරිදි බදාමයෙන් පිළිසකර කොට වර්තමානයේ දැකගත හැකි මෙම හිටි බුද්ධ ප්‍රතිමාව නිර්මාණය කොට තිබේ (සරණපාල හිමි 2022: සම්මුඛ සාකච්ඡා). ඒ අනුව බදාමෙන් කරන ලද පිළිසකර කිරීම් හේතුවෙන් ප්‍රතිමාවේ පැවති මුල් ස්වරූපය වර්තමානයේ හඳුනාගත නො හැකිය. ඒ අනුව මෙම ප්‍රතිමාවේ අභ්‍යන්තර ප්‍රතිමාව කිරිගරුඬ ප්‍රතිමාවක් වන්නට ඇතැයි අනුමාන කළ හැකිය. වර්තමානයේ දිස් වන්නේ ඉපැරණි ශිලා ප්‍රතිමාව වටා බදාමෙන් පිළිසකර කරවා නිමකරන ලද ප්‍රතිමාවයි. මෙම ප්‍රතිමා ද්විත්වයම එකම ස්ථානයකින් හමුවූ නිසා A රූපයෙහි දක්වා ඇති ප්‍රතිමාවේ මුල් ස්වරූපය බොහෝ දුරට B රූපයේ දක්වා ඇති ප්‍රතිමාවට සමාන වන්නට ඇතැයි අනුමාන කළ හැකිය. මෙම බුද්ධ ප්‍රතිමාවෙහි බුදුන් වහන්සේගේ ප්‍රභා මණ්ඩලය ද පූර්වයෙහි විස්තර කරන ලද ප්‍රතිමාවන්ගේ මෙන්ම මහනුවර සම්ප්‍රදායයේ ශෛලිය ලක්ෂණ අනුව රතු , කහ, කොළ, නිල් සහ සුදු ආදී වර්ණ භාවිත කරමින් ගිනි දැල්ලක ස්වරූපයෙන් සිතුවම් ගත කොට ඇති අතර අලංකාර මාලා කර්මයන්ගෙන් විචිත්‍රවත් කොට ඇත.

ප්‍රදක්ෂිණා ගෘහයේ සිට ඇතුළු ගෘහයට පිවිසෙන්නෙකුට දකුණු පසින් මෙම සුවිසල් ප්‍රතිමාව දැක ගත හැකිය. ගඩොල් හා මැටි බදාමයෙන් කරවන ලද මෙම ප්‍රතිමාව ආසන්න වශයෙන් අඩි 18 ක් පමණ උසකින් යුක්තව නිර්මාණය කොට තිබේ. මෙම ප්‍රතිමාවෙහි ජටා මකුටයේ 'අමිතාභ' බුදුන් වහන්සේගේ රූපයක් සිතුවම් ගත කොට ඇති අතර ඒ අනුව මෙම ප්‍රතිමාව අවලෝකිතේශ්වර බෝධිසත්වයින්ගේ ප්‍රතිමාවක් බවට නිගමනය කළ හැකිය. සමභංග ඉරියව්වෙන් නිරූපිත මෙම ප්‍රතිමාවෙහි දකුණතින් නෙළුම් මලක් දරා සිටින අතර වම් අත වැළමිටෙන් මදක් නවා හස්තය යමෙකුට ආශිර්වාද කරන ස්වරූපයෙන් දක්වා තිබේ. ප්‍රතිමාවේ වම් උරහිස වැසෙන පරිද්දෙන් සළුවක් පොරවා ඇති අතර යටි කය ධෝතියකට සමාන වස්ත්‍රයකින් අලංකාර කොට තිබේ. ආභරණයන්ගෙන් විභූෂිතව නිර්මාණය කොට ඇති මෙම ප්‍රතිමාව රාජ කුමාර අවලෝකිතේශ්වර ප්‍රතිමාවක් බවට ඉඳුරාම නිර්ණය හැකිය. ප්‍රතිමාව වටා වාහල්කඩක් සංකේතවත් වන ආකාරයේ තොරණ කැටයමක් දක්නට ලැබේ. ප්‍රතිමාව පසුබිමෙහි බිත්තියේ විශාල මන්දිරයක සිතුවමක් දැකගත හැකි අතර තොරණ ඉහළ දෙපස සේසතක් සහ චාමරයක් අතැති දිව්‍ය රූප

දෙකක් දක්වා ඇත. එසේම ප්‍රතිමාව වර්ණ ගැන්වීමට කොළ, කහ, රතු, නිල්, සහ සුදු යනු මූලික වර්ණ සහ තවත් බොහෝ මිශ්‍ර වර්ණයන් ද භාවිතා කොට ඇති සෙයක් පෙනේ. මෙම ප්‍රතිමාකරණය විෂයෙහි තුළ විශේෂයෙන් කොළඹ යුගයේ දකුණු පළාතේ චිත්‍ර ශෛලීය ආභාසය වැටී ඇති බව මැනවින් අධ්‍යනය කරන කල පැහැදිලි වේ.

(11) සහ (12) රූපයන්හි දැක්වෙන ප්‍රතිමා ද්විත්වය ද විහාර භූමියෙන් සොයා ගන්නා ලදුව වර්තමානයේ දිස්වන ස්වරූපයට ප්‍රතිසංස්කරණය කොට ඇත. එවකට විහාරාධිපති හිමියන්ගේ අනුදැනුම මත එසේ හමු වූ ශිලා ප්‍රතිමා දෙකෙන් එක් ප්‍රතිමාවක් පැරකුම්බා රජු මූර්තිමත් කෙරෙන අයුරින් සහ අනෙක් ප්‍රතිමාව දුටුගැමුණු රජු නිරූපණය කෙරෙන අයුරිනුත් විහාර කර්මාන්තයේ නියුතු මූර්ති ශිල්පීන් ලවා නිම කිරීමට කටයුතු කොට තිබේ (සරණපාල හිමි 2022: සම්මුඛ සාකච්ඡා). මෙසේ මෙම ප්‍රතිමා ප්‍රතිසංස්කරණය කිරීම හේතුවෙන් මේවායේ මුල් ස්වරූපය වර්තමානය වනවිට හඳුනාගත නොහැකි ය. මෙම ප්‍රතිමා බොහෝ දුරට 02 රූපය දැක්වෙන ප්‍රතිමාවට සමාන වූවා විය හැකිය. ඇතැම් විට මෙම ප්‍රතිමාවන්හි මුල් ස්වරූපය රජ පිළිම හෝ බෝධිසත්ත්ව ප්‍රතිමාවක් වන්නට බොහෝ ඉඩකඩක් තිබේ.

පරාක්‍රමබාහු රජුගේ යැයි සැලකෙන ප්‍රතිමාව සමභංග ඉරියව්වෙන් නිරූපිත අතර දෙඅත් ඉදිරියට දිගු කොට සිටින ආකාරයෙන් දක්වා තිබේ. ප්‍රතිමාවේ උඩුකය නිර්වස්ත්‍ර වන අතර ආභරණවලින් සරසා ඇත. යටිකය ධෝතියකට සමාන වස්ත්‍රයකින් අලංකාර කොට තිබේ. ප්‍රතිමාවේ මුහුණ උඩු රැවුලකින් හා යටි රැවුලකින් යුක්තව නිරූපණය කර ඇත. මෙම ප්‍රතිමාවේ හිස් පළඳනාව ඉහලට උස් වූ ස්වරූපයෙන් දක්වා තිබේ. මෙම හිස් පළඳනාව ප්‍රතිමාවේ තේමාවට එතරම් අනුරූප වන බවක් නොපෙනේ. බොහෝ විට එම තත්ත්වය ඇති වන්නට ඇත්තේ මෙම ප්‍රතිමාව නිර්මාණයට යොදා ගත් පැරණි ශිලා ප්‍රතිමාවේ ශීර්ෂයේ පැවති හැඩය නිසා වන්නට පුළුවන.

දුටුගැමුණු රජුගේ නමින් නම්කර ඇති අනෙක් ප්‍රතිමාවෙහි ද උඩුකය නිර්වස්ත්‍ර වන අතර පැරකුම්බා රජුගේ ප්‍රතිමාවෙහි තරම් උඩුකය ආභරණවලින් සරසා නැත. යටිකය ධෝතියකට සමාන වස්ත්‍රයකින් දක්වා ඇති අතර දකුණත වැලමිටෙන් නවා ඉදිරියට දිගු කොට සිටින ආකාරයෙන් දක්වා ඇත. වමත ඍජුව පහළට දිගු කොට සිටින සේ සමභංග ඉරියව්වෙන් මෙම ප්‍රතිමාව නිමවා තිබේ. හිස් පළඳනාව ද ඉතා සරල චාම් ස්වරූපයක් ගන්නා අතර එය කැටයමින් අලංකාර කොට නැත. මෙම ප්‍රතිමා ද්විත්වයම සැලකිල්ලට ගත් විට මෙම ප්‍රතිමා වර්ණ කිරීම සඳහා ශිල්පියා අවර්ණ සුදු පැහැය (දීප්තිමත් නොවූ) සහ නිල් සහ කළු වර්ණ පමණක් භාවිතා කොට තිබීම සුවිශේෂී වේ. මෙම ප්‍රතිමා ද්විත්වයම ආසන්න වශයෙන් අඩි පහක පමණ උස ප්‍රමාණයෙන් යුක්තය.



10 රූපය

අවලෝකිතේශ්වර බුද්ධ ප්‍රතිමාව



11 රූපය

දුටුගැමුණු ප්‍රතිමාව



12 රූපය

දෙවන පරාක්‍රමබාහු ප්‍රතිමාව

(පර්යේෂකයා විසින් ලබා ගන්නා ලද්දකි: 2022)

ඇතුළු ගෘහයේ ඉහළ ඉදිකොට ඇති දැවමුවා වියන මත උද්භිද ගණයේ චිත්‍ර සිතුවම් ගත කොට තිබේ. රතු, කහ, කොළ, නිල් සහ සුදු ආදී වර්ණ මැනවින් උපයෝගී කොට ගනිමින් වියන් තලය මත මෙම නෙළුම් මල් මෝස්තර රටා මවා ඇත. මහනුවර සිතුවම් ශෛලිය තුළ ශිල්පීන් භාවිතා කළ සාම්ප්‍රදායික සිංහල නෙලුම් මල් මෝස්තරයන් අභිබවා ඉතා සංකීර්ණ සැරසිලි රටාවන් මෙහි දී භාවිතා කොට ඇති අතර ඇතුළු ගෘහයේ සැතපෙන බුද්ධ ප්‍රතිමා වහන්සේට ප්‍රතිමුඛව පිහිටි බිත්තියේ ඉහළ බුදුන්වහන්සේගේ සත් සතිය සිතුවම් ගත කොට ඇත. කොළඹ යුගයේ චිත්‍ර ශෛලිය ආභාසය සහිත මෙම සිතුවම් ප්‍රදක්ෂිණා ගෘහයේ ඇඳ ඇති සිතුවම් වල චිත්‍ර ශෛලියට ඉඳුරාම වෙනස් වෙයි. රතු, කොළ කහ, නිල්, සුදු සහ දුඹුරු ආදී වර්ණ මෙම සිතුවම් සඳහා භාවිතා කොට ඇති අතර මෙම සිතුවම් වල ශෛලිය අනුව ප්‍රදක්ෂිණා ගෘහයේ සිතුවම් කල චිත්‍ර ශිල්පියා නොව වෙනත් ශිල්පියෙක් විසින් මෙම චිත්‍ර සිතුවම් ගත කළ බවට අනුමාන කළ හැකිය. මහනුවර අවධියේ මෙන් තීරු චිත්‍ර සංරචන ක්‍රමයක් සහ අඛණ්ඩ කථන ක්‍රමයක් මෙම සිතුවම් තුළ දක්නට නොමැති අතර විශාල අවකාශයක් තුළ මැනවින් මානව රූප සම්පිණ්ඩනය කොට තිබේ. පර්යාවලෝකන සිද්ධාන්තය සිතුවම් ඇඳීමේ දී උපයෝගී කොට ගෙන ඇති අතර මෙම සිතුවම් ප්‍රෙස්කෝ සිකෝ (වියළි බදාම මත සිතුවම් ඇඳීම) ක්‍රමයට නිමවා ඇත.

ප්‍රදක්ෂිණා ගෘහයෙහි සිතුවම් සහ මූර්ති

මෙම ප්‍රතිමා ගෘහයෙහි ප්‍රතිමා හා සිතුවම්හි ශෛලිය සලකා බලන කල ඇතුළු ගෘහයේ ප්‍රතිමා සහ ප්‍රදක්ෂිණා ගෘහයේ සිතුවම් සහ ප්‍රතිමා කළ ශිල්පියා දකුණු ලංකාවේ චිත්‍ර හා මූර්ති ශිල්පියෙකු වන අතර ඔහු සුප්‍රකට චිත්‍ර ශිල්පියෙකු වන එම්.සාර්ලිස් මහතාගේ සොහොයුරෙකු බව සඳහන් වේ. ඔහුගේ නම 'අරණෝලිස්' යනුවෙන් ද තවත් විටෙක 'සරණේරිස්' යනුවෙන් ද ජනයා සඳහන් කරතුදු ඒ පිළිබඳ නිශ්චිත එකඟතාවයක් නොමැති බව පෙනේ (සරණපාල හිමි 2022: සම්මුඛ සාකච්ඡා). කෙසේ නමුත් එම්.සාර්ලිස් චිත්‍ර ශිල්පියාගේ චිත්‍ර ශෛලීය ආභාසයෙහි සෙවනැල්ල මෙම සිතුවම් කෙරෙහි වැටී ඇති බව සියුම්ව මෙම සිතුවම් සහ මූර්ති අධ්‍යයනය කරන කළ පැහැදිලි වෙයි.



13 රූපය
විහාරස්ථානයේ සිතුවම් කොට ඇති සිදුහත් කුමරු ශිල්ප දැක්වීම නිරූපණය කරන සිතුවම
(පර්යේෂකයා විසින් ලබා ගන්නා ලද්දකි: 2022)



14 රූපය
එම්.සාර්ලිස් මහතාගේ සිදුහත් කුමරු ශිල්ප දැක්වීම නිරූපණය කරන සිතුවම
(අන්තර්ජාලය ඇසුරිනි.)

මෙම සිතුවම් වල තේමාව, වර්ණ සංකලනය, මානව රූප සම්පිණ්ඩනය ආදිය බොහෝ දුරට එම්.සාර්ලිස් මහතාගේ චිත්‍ර ශෛලියට සමාන ලක්ෂණ පෙන්වයි. ප්‍රදක්ෂිණා ගෘහයෙන් ඇතුළු ගෘහයට ප්‍රවේශ වීමට ඇති දොරටුවේ මකර තොරණට දෙපසින් දැවැන්ත දොරටුපාල රූප ද්විත්වයක් සහ සිංහ රූප ද්විත්වයක් දක්නට ලැබේ. ආභරණයන්ගෙන් විභූෂිතව කඩුවක් අතැතිව නිර්මාණය කර ඇති මෙම දොරටු පාල රූප ත්‍රිභංග ඉරියව්වෙන් නිරූපිත අතර අඩි 18කට ආසන්න ප්‍රමාණයේ උසකින් යුක්තය. ප්‍රතිමාවේ ශීර්ෂ පළඳනාව කොටස් හතරකින් යුක්තව නිර්මාණය කර ඇති අතර යටිකයට ධෝතියකට සමාන වස්ත්‍රයක් ද එසේම උඩුකයට උරහිස හරහා වැටෙන සළුවක් ද නිර්මාණය කොට තිබේ. එසේම උඩුකයට විසිතුරු ආභරණ පැළඳ සිටින මෙම ප්‍රතිමාවේ ඇඳුම් ආයිත්තම් සහ ආභරණ ඉන්දියානු ස්වරූපයක් පෙන්නුම් කරයි. ප්‍රතිමාව වර්ණ ගැන්වීම සඳහා දුඹුරු,කොළ, කහ, සුදු සහ තවත් බොහෝ දීප්තිමත් මිශ්‍ර වර්ණයන් භාවිතා කොට ඇත. එසේම දොරටුව දෙපස නිර්මාණය කර ඇති මුව අයාගෙන සිටින කේශර සහිත සිංහ රූප දෙක ද ඉතාමත්ම තාත්වික ස්වභාවයෙන් නිර්මාණය කර ඇති අතර කහ, රතු සහ දුඹුරු වර්ණ එම රූප වර්ණවත් කිරීම සඳහා යොදාගෙන ඇත

ප්‍රදක්ෂිණා ගෘහයෙහි බිත්ති මත ඇඳ ඇති අතර සුද්ධෝදන රජතුමාගේ සහ බිම්බිසාර රජතුමාගේ සිතුවම් උස අඩි 7.5 සහ පළල අඩි 3.6 ප්‍රමාණයේ විශාල තලයක් තුළ සම්පිණ්ඩනය කරන ලද සිතුවම් වේ.

ප්‍රදක්ෂිණා ගෘහයෙහි නැගෙනහිර දිශාවේ බිත්තියේ උම්මග්ග ජාතකයට අදාළ සිදුවීම් සිතුවම් ගතකොට ඇත.



15 රූපය - බිම්බිසාර රජතුමා



16 රූපය - සුද්ධෝදන රජතුමා

(පර්යේෂකයා විසින් ලබා ගන්නා ලද්දකි: 2022)

සමස්තයක් වශයෙන් ප්‍රදක්ෂිණා ගෘහයේ ඇති සිතුවම් හා ප්‍රතිමා විචාරය කරන කළ සිතුවම් වල මානව රූප සහ මිනිස් සත්ත්ව ප්‍රතිමා විචිත්‍ර ලෙස යොදා ගෙන ඇති අතරම යොදා ඇති වස්ත්‍රාභරණ පෙරදිග ශෛලිය ආභාසයක් පෙන්නුම් කරයි. විශේෂයෙන් සිතුවම් සහ ප්‍රතිමා විෂයෙහි භාවිතා කර ඇති ඇඳුම් ආයිත්තම් ඉන්දියානු සම්ප්‍රදායේ ඇඳුම් පැළඳුම්වල ලක්ෂණ පෙන්නුම් කෙරෙයි. සිතුවම් වල ත්‍රිමාණ ලක්ෂණ ඉතා මැනවින් මතුකොට දක්වා ඇති අතර පර්යාවලෝකන සිද්ධාන්තය ද මැනවින් උපයෝගී කරගත් සෙයක් පෙනේ.

එසේම දීප්තිමත් වර්ණ භාවිතා කර ඇති අතර චිත්‍ර අවකාශයේ ගැඹුර මතුවන සේ ස්වභාවිකවාදී ශෛලියකින් රූප සංරචනය කොට තිබේ. විහාරයේ සිතුවම් කළ ශිල්පියා යම්තාක් දුරකට පුනරුදු යුගයේ චිත්‍ර ශෛලිය ආභාසය ලත් බව මනාව මෙම සිතුවම් අධ්‍යයනය කරන කළ පැහැදිලි වේ.



17 රූපය - කේවට්ටයා සහ චූලනී රජු අතර සතර කන් මන්ත්‍රණය

(පර්යේෂකයා විසින් ලබා ගන්නා ලද්දකි: 2022)

ප්‍රදක්ෂිණා ගෘහයේ ඇති ඇතුළු ගෘහයේ පිටත බිත්තිය වටා බුද්ධ චරිතයට අදාල සිදුවීම් සිතුවම් ගත කොට ඇති අතර ඒ යටතේ

- බෝධිසත්වයින් තුසිත දිව්‍ය ලොව වැඩ සිටීම.
- සිද්ධාර්ථ කුමාරෝත්පත්තිය
- සිදුහත් කුමරු ගිහිගෙය හැරයාම.
- සිදුහත් කුමරු කන්ථක අසු පිට නැගී නික්ම යාම හා හිසකෙස් ඡේදනය කිරීම.
- පස්වග මහණුන්ට ධර්ම දේශනා කිරීම.
- සුජාතාවගේ කිරිපිඬු දානය

දක්වා සිතුවම් මූර්තිමත් කොට තිබේ. එමෙන්ම එතැන් සිට බටහිර දිග කොටසේ සාම ජාතකයට අදාළ සිදුවීම් මූර්තිමත් කොට ඇත.

එමෙන්ම ප්‍රතිමා ගෘහයේ බිම් සැළැස්මේ G අක්ෂරයෙන් දක්වා ඇති ස්ථානයේ විෂ්ණු හා කතරගම දෙවියන් වෙනුවෙන් වෙන්වූ දේවාලය දැකිය හැකිය. ගම්පොල අවධියේ හින්දු ආභාසය හේතුවෙන් ප්‍රතිමා ගෘහයන් තුළ හින්දු දෙවිවරු උදෙසා දේවාල තැනීම ආරම්භ වූ අතර එම සම්ප්‍රදාය 20වන සියවස වන විටත් සමාජය විසින් අනුගමනය කළ බව මේ හරහා පැහැදිලි වේ. එසේම ඇතුළු ගෘහයට ප්‍රවිශ්ට වීමට ඇති දොරටුවේ ඇඳ ඇති අටමස්ථානයට අදාල සිතුවම් ද සුවිශේෂී වේ. 19වන සියවස අගභාගයේ සහ 20වන සියවසේ මුල් භාගයේ සංරක්ෂණ කටයුතුවලට පෙර පැවති ස්වරූපයෙන් ථූපාරාමය, අභයගිරිය, මිරිසවැටිය ආදී ස්ථාන සිතුවම් කොට තිබේ. එසේම ප්‍රධාන ප්‍රදක්ෂිණා ගෘහයෙහි වියන් තලයේ බ්‍රහ්ම ලෝක 16ට අදාල සිතුවම් ඇඳ තිබේ.



18 රූපය - ඇතුළු ගෘහයෙහි දොරටුවේ ඇති සිතුවම්

(පර්යේෂකයා විසින් ලබා ගන්නා ලද්දකි: 2022)



19 රූපය - ශ්‍රී මහා බෝධිය වැඩම කරවීම

(පර්යේෂකයා විසින් ලබා ගන්නා ලද්දකි: 2022)

ශ්‍රී මහා බෝධිය ලංකාවට වැඩම කිරීම සංකේතවත් කරන මෙම සිතුවමෙහි සුවිශේෂීත්වය වන්නේ මෙය සිතුවම කළ ශිල්පියා විසින් බෝධිය වැඩම කරන පෙරහැරෙහි පළමුවෙන්ම බෞද්ධ කොඩියක් රැගත් අයෙකු දැක්වීමයි. ක්‍රි.පූ. 3වන සියවස වනවිට බෞද්ධ කොඩිය නිර්මාණය වී නොතිබුණා සේම ක්‍රි.ව.1885 බෞද්ධ කොඩිය නිර්මාණය වීම සහ ලාංකේය බෞද්ධ පුනරුදයේ ආභාසය මෙම සිතුවම කෙරෙහි වැටී ඇති බව පැහැදිලි වේ. මෙම ප්‍රතිමා ගෘහය වර්තමානය වන විට වසර සියයක් පමණ පැරණි අතර සිතුවම් හා ප්‍රතිමා තවමත් මැනවින් ආරක්ෂා වී ඇත. විහාර මන්දිරය මේ දක්වා සුළු ප්‍රතිසංස්කරණයන්ට භාජනය වී ඇතත් සිතුවම් හා ප්‍රතිමා විෂයෙහි හානියක් සිදු වී නොමැත. ප්‍රතිමා ගෘහයට අමතරව විහාරස්ථානයේ බණ මඩුව එහි දැවමුවා වියන සහ ඒ වටා ඇති සිතුවම් ද සුවිශේෂී වේ. දැවමුවා වියන මධ්‍යයෙහි හංස පූට්ටුව සහිත සැරසිල්ලක් දක්නට ලැබෙයි. එසේම ඒ වටා

ශිලාමය ගල් පුවරු යොදා සකසන ලද බිත්තියේ වෙස්සන්තර ජාතකය සිතුවම් ගත කොට ඇත. මෙම බණ මඩුව විහාර මන්දිරය ඉදිකිරීමට සමකාලීනවම ඉදි කරන ලද්දක් වන අතර හීන්බබා නම් අයෙකු විසින් මෙහි චිත්‍ර කර්මයන් සිදු කළ බව සඳහන් වේ (සරණපාල හිමි 2022: සම්මුඛ සාකච්ඡා). කෙසේ නමුත් මෙම ප්‍රතිමා හා සිතුවම් කෙරෙහි කාලයාගේ ඇවෑමෙන් සිදුවන විනාශයන් සහ අනවබෝධී ප්‍රතිසංස්කරණ හේතුවෙන් වන විනාශයන් ද නැත්තේම නොවේ.

සමාලෝචනය

කලාවේ ක්‍රමික විකාශනය සහ සංවර්ධනය පිළිබඳ සාකච්ඡා කිරීමේ දී විවිධ කාලවකවානු වල සමාජීය, දේශපාලන ආර්ථික සහ ආගමික ක්ෂේත්‍රයන්ගේ බලපෑම නිතැතින්ම දැකගත හැකිය. යථෝක්ත විහාර මන්දිරයේ සිතුවම් පිළිබඳ සාකච්ඡා කිරීමේ දී මහනුවර අවදියෙන් පසු බිහිවූ කොළඹ යුගයේ චිත්‍ර ශෛලිය ආභාසය සිතුවම් කෙරෙහි වැටී ඇති ආකාරය දැකගත හැකි අතර යටත් විජිත ශ්‍රී ලංකාවේ දහනව වන සියවසෙහි අග භාගයෙහි සහ විසිවන සියවසෙහි මුල් දශක කිහිපය තුළ පැවැති බෞද්ධ පුනරුද ව්‍යාපාරයේ බලපෑම ද යම් මට්ටමකින් මෙම සිතුවම් කෙරෙන් ප්‍රකට වේ. විහාරස්ථානයේ පවතින නෂ්ටාවශේෂ තවදුරටත් අධ්‍යයනයන්ට භාජනය විය යුතු අතරම සාහිත්‍ය සේම පුරාවිද්‍යාත්මක මූලාශ්‍ර ද සූක්ෂමව මෙන්ම තුලනාත්මකව අධ්‍යයනය කිරීම හරහා මෙතෙක් අනාවරණය නොවූ ඓතිහාසික තොරතුරු විශාල ප්‍රමාණයක් අනාවරණය කර ගැනීමට නිසැක වශයෙන්ම හැකිවනු ඇත.

ආශ්‍රිත මූලාශ්‍රය

කුමාරස්වාමි, ආනන්ද (2011) , **මධ්‍යකාලීන සිංහල කලා** ,දෙහිවල : තිසර ප්‍රකාශකයෝ

පඤ්ඤාසාර හිමි , තෙරිපැහැ (1932). **කන්දේගෙදර මාලගොඩ විහාර වර්ණනාව.** කෑගල්ල: විද්‍යා කල්ප යන්ත්‍රාලය.

බණ්ඩාර , එම්.එච්. විජේතුංග (2021), **මාලගොඩ පුරාණ රාජමහා විහාරයේ ඉතිහාසය හා ග්‍රාමීය ජනප්‍රවාද** : සම්මුඛ සාකච්ඡා

ලියනගමගේ, අමරදාස (2013), **මධ්‍යකාලීන ලංකා ඉතිහාසය**, බත්තරමුල්ල: අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව.

සරණපාල හිමි , හරිගල (2021), **මාලගොඩ පුරාණ රාජමහා විහාරයේ ඉතිහාසය** : සම්මුඛ සාකච්ඡා

සීලවංස හිමි , වහදිවල (2021) ,**මාලගොඩ පුරාණ රාජමහා විහාරයේ ඉතිහාසය** : සම්මුඛ සාකච්ඡා

ඡායාරූප

(මෙහි දක්වා ඇති ඡායාරූප සියල්ල පර්යේෂකයා විසින් ලබාගන්නා ලද ඒවා බව සැලකිය යුතුය.)







20 රූපය - ඇතුළු ගෘහයේ වියන් සිතුවම්



21 රූපය - සුජාතාවගේ කිරිපිඩු දානය දැක්වෙන ප්‍රතිමා



22 රූපය - මහා පදුම ජාතකය




23 රූපය - ගුත්තිල පඬිතුමාගේ වීණා වාදනය





24 රූපය - විශාඛා සිටු දියණියගේ ප්‍රතිමාව



25 රූපය - ජූජක බමුණාට දරුවන් දන් දීම.



26 රූපය - සිද්ධාර්ථ කුමාරෝත්පත්තිය දැක්වෙන



27 රූපය - සිද්ධාර්ථ කුමරු ගිහිගෙය හැරයාම



28 රූපය - කන්ථක අසු පිට ජන්න ඇමති සමග නික්ම යාම



29 රූපය - පස්වග මහණුන්ට ධර්මය දේශනා කිරීම





30 රූපය - ප්‍රදක්ෂිණා ගෘහයෙහි වියන් සිතුවම්



31 රූපය - අනේපිඬු සිටුතුමාගේ ප්‍රතිමාව

දළදා වහන්සේගේ ඉතිහාසය සහ ශ්‍රී ලාංකේය දේශපාලන ව්‍යුහය සකස් කිරීමෙහි ලා දළදා වහන්සේගේ දායකත්වය (කෝට්ටේ රාජධානිය දක්වා)

එච්. එන්. ඒ. කුමාරි

ඉතිහාස අධ්‍යයන අංශය, සමාජීය විද්‍යා පීඨය, කැලණිය විශ්වවිද්‍යාලය

htnanuradha@gmail.com

සංක්ෂේපය

කිත්සිරිමෙවන් (කීර්ති ශ්‍රී මේඝ) රාජ්‍ය කාලයේ දී බුදුන් වහන්සේගේ දන්ත ධාතූන් වහන්සේ මෙරටට වැඩම කරවාගෙන ඒම සිදු වුණි. එසමයේ සිට ම රාජ්‍ය අනුග්‍රහය සහිත ව බෞද්ධාගමික පූජනීය වස්තුවක් වශයෙන් මෙරට බෞද්ධ වැසියන්ගේ වන්දනාමානයට පාත්‍ර වූ දළදා වහන්සේ නොබෝ කලකින් ම වඩාත් වැදගත් ම පූජනීය වස්තුව බවට ද පත් විය. අනුරාධපුර රාජධානි සමයේ දී දළදා වහන්සේ හුදෙක් බෞද්ධාගමික පූජනීය සංකේතයක් ලෙස සලකා වන්දනාමානයට පත් වූ නමුත් ක්‍රමානුකූල ව එය දේශපාලන සංකේතයක් බවට ද පත් වුණි. පොළොන්නරු රාජධානි සමයේ සිට ආගමික පූජනීය වස්තුවක් ලෙස මෙන් ම දේශපාලන බලය තහවුරු කර ගැනීමේ සංකේතයක් වශයෙන් ද දළදා වහන්සේ භාවිත කිරීමට මෙරට පාලකයින් උත්සාහ කළ බව තත්කාලීන දේශපාලන ඉතිහාසය පිරික්සීමෙන් හඳුනාගත හැකි ය. දේශපාලන අධිකාරි බලය පෙන්වාලීමේ සහ තහවුරු කිරීමේ සංකේතයක් බවට පත් වූ දළදා වහන්සේ රජුගේ භාරයෙහි රාජමාලිගය සමීපයේ ඉදි කළ මැඳුරක තබා වන්දනාමාන කිරීම සිදු වූ අතර රජුගේ පාලනය නිත්‍යානුකූල වූයේ දළදා වහන්සේගේ භාරකාරිත්වය ඔහු සතු වුවහොත් පමණකි යන අදහසක් තිබුණි. බෞද්ධාගමික පූජනීය වස්තුවක් ලෙස මෙරටට රැගෙන එන ලද දළදා වහන්සේ: දේශපාලන බලය තහවුරු කර ගැනීමේ සංකේතයක් වශයෙන් භාවිත කිරීමේ දී අනුගමනය කළ උපක්‍රම මොනවා ද? යන්න මෙම අධ්‍යයනයට පාදක වුණු ගැටලුව යි. මෙම අධ්‍යයනයේ අරමුණ වන්නේ දළදාව රාජත්වයේ සංකේතයක් ලෙස සැලකීම නිසා පාලකයන් ඒ සඳහා කටයුතු කළ ආකාරය සහ ඒ මගින් මෙරට දේශපාලන ව්‍යුහයෙහි ඇති වුණු වෙනස්කම් හඳුනා ගැනීම යි. මෙහි දී ඓතිහාසික පර්යේෂණ ක්‍රමවේදය අනුව ප්‍රාථමික හා ද්විතීයික සාහිත්‍ය මූලාශ්‍රය මෙන් ම පුරාවිද්‍යා මූලාශ්‍රය පරිශීලනය කරමින් ගුණාත්මක දත්ත විශ්ලේෂණ ක්‍රමවේදය අනුව තොරතුරු රැස් කෙරේ. ආගමික පූජනීය වස්තුවක් වූ දළදා වහන්සේ දේශපාලන සංකේතයක් වීම හා සමගාමී ව පාලකයා එහි භාරකරුවා බවට පත් විය. එය සුරැකීම රජුගේ වගකීම වූ අතර දළදා වහන්සේ ආරක්ෂා කිරීම, පුද සත්කාර කිරීම සහ ප්‍රදර්ශන පවත්වමින් දළදාවේ භාරකාරිත්වය ප්‍රදර්ශනය කිරීමට මොවුහු උත්සාහ කළ බව හඳුනාගත හැකි ය. එම උත්සාහයට සාපේක්ෂ ව ශ්‍රී ලාංකේය දේශපාලන ව්‍යුහය තුළ රාජ්‍ය පාලන අයිතිය නිත්‍යානුකූල කිරීමේ ප්‍රමුඛ සාධකය දළදා වහන්සේ බවට පත් වූ බව හඳුනාගත හැකි ය.

මුඛ්‍ය පද : බෞද්ධාගම, දළදාව, දේශපාලනය, රාජත්වය, භාරකාරත්වය

හැඳින්වීම

දන්ත ධාතූන් වහන්සේ ලංකාවට වැඩම කරවනු ලබනුයේ ක්‍රිස්තු වර්ෂ හතරවන සියවසේ දී වන අතර එවක ලංකා පාලකයා වූයේ කිත්සිරිමෙවන් රජු ය. බුදුන් වහන්සේගේ වාම දළදා වහන්සේ මෙසේ ලක්දිවට වැඩම කළ අතර කිත්සිරිමෙවන් රාජ්‍ය කාලයේ පටන් රාජ්‍ය අනුග්‍රහය සහිත ව දළදා වහන්සේ වන්දනාමානයට ලක් විය. බුදුන් වහන්සේගේ වාම දළදාව මෙරටට වැඩම කරවීම පිළිබඳ ව ප්‍රාථමික මූලාශ්‍රය ගණනාවක ම තොරතුරු සඳහන් වේ. අනුරාධපුර රාජධානි සමයේ දී බෞද්ධාගමික පූජනීය සංකේතයක් ලෙස සැලකුණු නමුත් පොළොන්නරු රාජධානි සමයේ සිට දේශපාලන බලය තහවුරු කර ගැනීමේ සංකේතයක් වශයෙන් දළදාව භාවිත කිරීමට පාලකයින් උත්සාහ කර තිබේ. ඒ තත්ත්වය යටතේ දී දළදා වහන්සේ රජුගේ බලය නීත්‍යානුකූල වීමෙහි ලා අවශ්‍ය සාධකයක් බවට පත් විය. මෙහි දී වාම දළදා වහන්සේ ලංකාවට වැඩම කරවීමේ පුවත සහ දළදා ඉතිහාසය සම්බන්ධයෙනුත්, දළදා වහන්සේ රාජත්වයේ සංකේතයක් වශයෙන් භාවිත කළ ආකාරය සහ එහි දී පාලකයන් අනුගමනය කළ ක්‍රියා පිළිවෙත කුමක් ද? එය දේශපාලන ව්‍යුහය කෙරෙහි බලපෑ ආකාරය සම්බන්ධයෙනුත් අවධානය යොමු කෙරෙනු ඇත.

අරමුණ

රාජත්වය සහ බැඳුණු ප්‍රමුඛත ම ආගමික පූජ්‍ය වස්තුව වන දළදා වහන්සේ දේශපාලන බලය ස්ථාවර කරන සංකේතයක් වශයෙන් අතීතයේ සිට ම භාවිත කෙරුණු බව හඳුනාගත හැකි ය. ආගමික පූජනීය සංකේතයක් වශයෙන් දළදා වහන්සේ වෙත ඉහළ ගෞරවයක් හිමි වුණු අතර පසුකාලීන ව දේශපාලන බලය තහවුරු කර ගැනීමේ දී ද දළදා වහන්සේගේ භාරකාරිත්වය වැදගත් කොට සලකනු ලැබිණි. අනුරාධපුර රාජධානි සමයේ සිට කෝට්ටේ රාජධානි සමය දක්වා දළදා වන්දනාවේ ඉතිහාසය විශ්ලේෂණය කිරීම සහ දේශපාලන බලය තහවුරු කර ගැනීමේ සංකේතයක් ලෙස දළදාව සැලකීම නිසා පාලකයන් ඒ සඳහා කටයුතු කළ ආකාරය සහ ඒ මගින් මෙරට දේශපාලන ව්‍යුහයෙහි ඇති වුණු වෙනස්කම් හඳුනා ගැනීම මෙම අධ්‍යයනයේ අරමුණු වේ.

ක්‍රමවේදය

වාම දළදා වහන්සේගේ ඉතිහාසය අලළා ලියන ලද දළදා වංසය, දාඨාවංසය, ධාතුවංසය, දළදා පූජාවලිය, දළදා සිරිත වැනි මූලාශ්‍රය සහ බුදුන් වහන්සේගේ ධාතු බෙදීම පිළිබඳ විස්තර ඇතුළත් මහාපරිනිබ්බාන සුත්‍රය, සුත්ත නිපාතය වැනි බෞද්ධ මූලාශ්‍රය ආදියත් මහාවංසය, පූජාවලිය, හත්ථවනගල්ලවිහාර වංසය, එළඅත්තනගලු වංසය, රාජරත්නාකරය, රාජාවලිය, සුළුරාජාවලිය, අස්ගිරි තල්පත, ගිරා සන්දේශය, සැළලිහිණි සන්දේශය, හංස සන්දේශය, ෆාහියන් දේශාටන වාර්තාව වැනි ප්‍රාථමික සාහිත්‍ය මූලාශ්‍රය සහ පස්වන මිහිඳු රජුගේ අනුරාධපුර මහාපාලි දාන ශාලාව අසලින් හමු වූ ලිපිය, පළමුවන විජයබාහු රජුගේ වේලෙක්කාර ද්‍රවිඩ ලිපිය, නිශ්ශංකමල්ල රජුගේ ගල්පොත ශිලාලේඛනය, හැටදාගෙයි බරාඳයෙහි ඇති ලිපිය සහ ප්‍රීතිදානක මණ්ඩප ලිපිය, වික්‍රමබාහු රජුගේ විගුලවත්ත ලිපිය සහ නියම්ගම්පාය ලිපිය වැනි ශිලාලේඛන මූලාශ්‍රය මෙන් ම දළදා මාලිගාවල අවශේෂ වූ නටබුන් ආදියත්, දළදා වහන්සේ සම්බන්ධ ඉතිහාසය පිරික්සීමෙහි ලා පාදක කරගත හැකි ය. ඒ අනුව ඓතිහාසික පර්යේෂණ ක්‍රමවේදය අනුගමනය

කරමින් ප්‍රාථමික සහ ද්විතීයික සාහිත්‍ය මූලාශ්‍රය මෙන් ම පුරාවිද්‍යා මූලාශ්‍රය පරිශීලනය කරමින් ගුණාත්මක දත්ත විශ්ලේෂණ ක්‍රමවේදය අනුව තොරතුරු රැස් කෙරේ.

ප්‍රතිඵල සහ සාකච්ඡාව

ක්‍රිස්තු වර්ෂ හතරවන සියවසේ දී මෙරටට වැඩම කරවනු ලැබුවේ බුදුන් වහන්සේගේ වාම දළඳා වහන්සේ වන අතර මූලාශ්‍රය විස්තරවලට අනුව ද ඒ බව තහවුරු වෙයි (දාඨාවංස, 2000, පිටු 83,84). සම්බුද්ධ පරිනිර්වාණය සිදු වීමට ආසන්න අවස්ථාවක දී බුදුන් වහන්සේ විසින් සිදු කරන ලද අධිෂ්ඨානයක් හේතුවෙන් පරිනිර්වාණයෙන් පසු තථාගතයන් වහන්සේගේ ධාතූන් කිහිපයක් විසිරුණු අතර ධාතු කිහිපයක් ශේෂ විය. බුද්ධ පරිනිර්වාණය පිළිබඳ ව මහාපරිනිබ්බාන සූත්‍රයෙහි දැක්වෙන විස්තර අනුව සම්බුද්ධ ශාසනය ලෝකයේ සෑම තැනක ම පැතිරී නැති හෙයින් බුදු සසුනේ අනාගත අභිවෘද්ධිය සහ ව්‍යාප්තිය උදෙසා බුද්ධ පරිනිර්වාණයෙන් පසු අබැටක් පමණ ධාතු ලබා ගෙන තමන් වසන තැන චෛත්‍ය ඉදි කොට මහජනයා ස්වර්ගයට යේවයි සිතා බුදුන් වහන්සේ ධාතු විසිරෙන ලෙස අධිෂ්ඨාන කර ඇත. ඒ අනුව අධිෂ්ඨාන බලයෙන් ලළාට ධාතුව, අකු ධාතූන් වහන්සේලා ද්වය සහ සතර දළඳා වහන්සේලා යන ධාතූන් වහන්සේලා හත ශේෂ වී ඇත (දීඝ නිකායට්ඨකථා පළමුවන කොටස, 2008, පි. 539). ධාතුවංස විස්තරයෙහි ද නොවිසුරුණු ධාතූන් ලෙස මෙම ධාතූන් වහන්සේලා හත නම් කර තිබේ (සිංහල ධාතුවංශය, 2012, පි. 91). මෙසේ ශේෂ වූ ධාතූන් වහන්සේලා හතක් බව සඳහන් වුව ද ග්‍රීවා ධාතුව ද මේ අතරට ඇතුළත් විය යුතු ය. නොවිසුරුණු ධාතූන් වහන්සේලා හතක් බව දක්වමින් ග්‍රීවා ධාතුව පිළිබඳ ව මූලාශ්‍රය විස්තරයෙහි සඳහන් නොවනුයේ බුදුන් වහන්සේගේ සෑයෙහි ගිනි නිවී යාමට පෙර සාරිපුත්ත තෙරුන්ගේ අතවැසි සරහු තෙරුන් එය ලබා ගත් නිසා විය යුතු ය. මෙසේ ලබා ගත් ග්‍රීවාස්ථි ධාතුව මහියංගන සෑයෙහි නිධන් කළ බව මහාවංසය, ධාතුවංසය සහ දළඳා සිරිත වැනි මූලාශ්‍රය මගින් ද පැහැදිලි වේ (සිංහල මහාවංසය, 2003, 20:18-20, සිංහල ධාතුවංශය, 2012, පිටු. 364-366 සහ දළඳා සිරිත, 1961, පි. 14).

බුදුන් වහන්සේ අධිෂ්ඨාන කරගත් පරිදි ම ධාතූන් වහන්සේලා ශේෂ වූ අතර සම්බුද්ධ පරිනිර්වාණයෙන් පසු ධාතු ලබා ගැනීම උදෙසා ගැටුම් ඇති විණි. මල්ල රජ දරුවන්ගේ උපවර්තන නම් සල් උයනේ දී බුදුන් වහන්සේ පිරිනිවන් පෑ බැවින් මුල් අවස්ථාවේ දී ධාතූන් වහන්සේලා සියල්ලෙහි ම භාරකාරිත්වය ඔවුන් සතු වූ බවත්, දින හතක් නගර ශාලාවේ ආරක්ෂිත මැදිරියක ධාතූන් වහන්සේලා තැම්පත් කර තැබූ බවත් දීඝනිකායට්ඨකථාවෙහි සඳහන් වෙයි (දීඝනිකායට්ඨකථා, 2008, පි. 540). තථාගතයන් වහන්සේගේ පිරිනිවන් පෑම පිළිබඳ ව දැනගත් සෙසු රාජ්‍යවල පාලකයන් ද ධාතූන් වහන්සේලා ලබා ගැනීමට උනන්දු වූ අතර මොවුහු පළමුවෙන් හසුන්පත් සහ දූතයන් මගින් ධාතු ලබා ගැනීමට උත්සාහ කළහ. නමුත් එය සාර්ථක නොවූ බැවින් සාමකාමී ප්‍රතිපත්තිය අත්හැර සිව්රඟ සේනා පිරිවරාගෙන යුද්ධ කිරීමෙන් ධාතූන් වහන්සේලා අයිති කර ගැනීමට යොමු වූහ. අවසානයේ දී ද්‍රෝණ නමැති බමුණාගේ මූලිකත්වයෙන් ධාතූන් වහන්සේලා ලබා ගැනීමට පැමිණි රාජ්‍ය අටක පාලකයන් අතර ධාතූන් බෙදා දීම සිදු විණි. මහාපරිනිබ්බාන සූත්‍රයේ දැක්වෙන පරිදි බුදුන් වහන්සේගේ රන්දෙණ විවෘත කළ අවස්ථාවේ රජවරු ශෝකී ව හඬා වැටෙන

අතරතුර ද්‍රෝණ බමුණා රහසේ ම දකුණු දළදාව ගෙන තලප්පාවේ සඟවා ගෙන, ඉතිරි ධාතූන් වහන්සේලා සියල්ල සමාන කොටස් අටකට බෙදා ඇත (දීඝනිකායට්ඨකථා, 2008, පි. 546).

මේ අවස්ථාවේ දී සියලු ම ධාතූන් ස්වභාවික නැළියෙන් නැළි සොළොසක් බවට පත් වූ හෙයින් සියලු දෙනාට ම ධාතූන් වහන්සේලා සහිත නැළි දෙකක් ලැබී තිබේ. ද්‍රෝණ බමුණා සඟවා ගත් දකුණු දළදාව ශක්‍ර දෙවියන්ගේ මැදිහත් වීමෙන් දෙව්ලොව සිළුමිණි සෑයෙහි තැම්පත් කළ බැවින් ඔහු ධාතූන් වහන්සේලා බෙදූ නැළියත්, ප්‍රමාද වී පැමිණි පිප්ඵලි වනයේ මෝරියවරුන් බුදුන් වහන්සේගේ සෑයෙහි අළුත් රැගෙන තම තමන්ගේ රාජ්‍යවල චෛත්‍ය ඉදි කර තිබේ. මහාපරිනිබ්බාන සූත්‍ර විස්තරයේ දී වාම දළදා වහන්සේ කලිඟු පුරයේ රජුන්ගේ අනුග්‍රහයෙන් පුදනු ලබන බව සඳහන් වේ (දීඝ නිකායට්ඨකථා දෙවන කොටස, 2005, පි. 265). මහාපරිනිබ්බාන සූත්‍රයෙහි සඳහන් නොවන ධාතු බෙදීම පිළිබඳ වෙනස් ආකාරයේ විස්තර මූලාශ්‍රයන්හි ඇතුළත් වී තිබෙන බව හඳුනාගත හැකි ය (කහඳ, 1986, පිටු. 03,04). ද්‍රෝණ බමුණා ධාතු බෙදන අවස්ථාවේ දී පිළිවෙළින් එක් දකුණු දළදාවක් හිස් ආවරණයෙහි ද, අනෙක් දකුණු දළදාව දෙකකුල් අතර ද, එක් වාම දළදාවක් ඉනෙහි ද සඟවා ගෙන ඇති නමුත් ඒ සෑම අවස්ථාවක දී ම ඔහුට නොදැනෙන සේ දළදා වහන්සේලා වෙනත් පිරිස විසින් ලබාගෙන ඇත (කහඳ, 1986, පිටු. 03,04.). පළමුවෙන් සඟවා ගත් දකුණු දළදාව ශක්‍ර දෙවියන් ද, දෙවනුව සඟවා ගත් දකුණු දළදාව ජයසේන නම් නා රජු විසින් ද, තෙවනුව සඟවා ගත් වාම දළදාව ගන්ධාර දේශයෙහි බැතිමතෙක් විසින් ද ලබාගෙන ඇත. මේ අවස්ථාවේ දී බෙම නම් රහතන් වහන්සේ විසින් වාම දළදාව දර සෑයෙන් ම රැගෙන ගිය බව ද සඳහන් වෙයි. මෙසේ විවිධ දෙවිවරුන් සහ බැතුමතුන් විසින් ලබා ගත් දළදා වහන්සේලා විවිධ ප්‍රදේශවල තැන්පත් කරනු ලැබූ නමුත් මෙම දළදා වහන්සේලාගෙන් එක් දකුණු දළදාවක් සහ වාම දළදාවක් මෙරටට වැඩම කරවනු ලැබූ බව හඳුනාගත හැකි ය.

ධාතුවංසයෙහි සඳහන් වන ජයසේන නමැති නා රජු විසින් රැගෙන ගිය දකුණු දළදාව කාවන්තිස්ස රාජ්‍ය කාලයේ දී මහාදේව තෙරුන්ගේ ශිෂ්‍යයකු වූ මිහිඳු නමැති තෙරුන් වහන්සේ විසින් නාග භවනින් තම්බපණ්ණි නම් වූ මෙරටට වැඩම කරවා ගිරිඅබා රජුගේ පාලනයෙහි පැවති සේරු නුවර ඉදි කළ චෛත්‍යයෙහි තැන්පත් කර වූ බව ධාතුවංසයෙහි විස්තර කර ඇත (සිංහල ධාතුවංශය, 2012, පිටු. 598 සහ 607). ලංකාව තුළ පවතින අනෙක් දළදා වහන්සේ සෙංකඩගල දළදා මාලිගයෙහි තැම්පත් කර ඇති වාම දළදා වහන්සේ ය. කාලිංගයේ සිට පැමිණි හේමමාලා කුමරිය සහ දන්ත කුමරු වාම දළදා වහන්සේ මෙරටට වැඩම කර වූ බව දාඨාවංසයෙහි සඳහන් වේ (සන්න සහිත දාඨාවංශය, 2000, පිටු. 89,90) නලාටධාතුවංස විස්තරයේ දී මෙසේ වැඩම කරවනු ලැබුවේ යටි වම් දළදාව (අධොවාමදන්තධාතුං) බව නිශ්චිත ව ම සඳහන් කරයි කිත්සිරිමෙවන් රාජ්‍ය කාලයේ දී (ක්‍රි.ව.303-331) කලිඟුරට සිට මෙරටට වැඩම කරවනු ලැබූ දළදා වහන්සේ කාලිංගය වෙත හිමි වූයේ බෙම තෙරුන් වහන්සේ විසින් එහි පාලක බ්‍රහ්මදත්ත රජු වෙත ලබා දුන් බැවිනි. මෙම පුවත දාඨාවංසය, දළදා පූජාවලිය, දළදා සිරිත, දළදා වංසය වැනි මූලාශ්‍රය කිහිපයක ම සඳහන් වෙයි. දළදා වහන්සේ මෙරටට වැඩම කිරීම පිළිබඳ ව සංක්ෂිප්ත ව තොරතුරු ඉදිරිපත් කරන මහාවංස කතුවරයා මේ පුවත සම්බන්ධයෙන් වැඩි සැලකිල්ලක් නොදැක් වූ බව ගම්‍ය වේ. ඇතැම්විට මහාවංස කතුවරයා පාදක කරගත් මූලාශ්‍රය තුළ දළදා පුවත පිළිබඳ තොරතුරු අල්ප වීම නිසා මෙසේ වූවා විය හැකි ය. නොඑසේ නම් ඇතැම් වියතුන් පෙන්වා දෙන පරිදි දළදා වහන්සේගේ

භාරකාරීත්වය අභයගිරි විහාරවාසී භික්ෂූන් වෙත පවරා තිබුණු හෙයින් ද, මහාවිහාරවාසී භික්ෂූන් වහන්සේලා මහාවංසය සම්පාදනය කළ හෙයින් ද දළදා වහන්සේ පිළිබඳ තොරතුරු අල්ප වූවා විය හැකි ය.

කලිඟුරට බ්‍රහ්මදත්ත රජු මිථ්‍යාදෘෂ්ටිකයෙක් බව කියවෙන අතර ඔහු පසු ව බුදුදහම කෙරෙහි පැහැ දී බෞද්ධයකු වීමෙන් අනතුරුව දළදා වහන්සේ වෙත ද අනුග්‍රහය දක්වා තිබේ (දාඨාවංස, 2000, පි.86). පළමු වරට දළදා වහන්සේ උදෙසා මැඳුරක් ඉදි කොට ජීවමාන බුදුන් වහන්සේ සේ සලකා පුද පූජා පැවැත් වීම සහ රාජ්‍ය අනුග්‍රහය සහිත ව දළදාව ආරක්ෂා කිරීමට අවැසි පදනම සකස් කරනුයේ ඔහු විසිනි (එම, පි. 89). බ්‍රහ්මදත්ත රජුගේ ඇවෑමෙන් පසු පාලනයට පිවිසි අනුප්‍රාප්තික පාලකයන් විසින් ද දළදා වහන්සේ වෙත අනුග්‍රහය දක්වා ඇති අතර වසර 800කට ආසන්න කාලයක් කලිඟුරට තුළ දළදා වහන්සේ සුරක්ෂිත ව පැවතී ඇත. ක්‍රිස්තු වර්ෂ හතරවන සියවසේ දළදා වහන්සේ ලංකාවට වැඩම කරවන අවධියේ කලිඟුරට පාලනය මෙහෙය වූයේ ගුහසීව රජු විසිනි. මේ රජු සම්බන්ධ විස්තරවල ද රජු පළමුවෙන් මිථ්‍යාදෘෂ්ටිකයෙක් වශයෙන් හඳුන්වා දෙන නමුත් දළදා පෙරහැරක් නැරඹීමෙන් අනතුරුව දළදාව සහ බුදුදහම කෙරෙහි පැහැ දී එතෙක් අනුග්‍රහය දැක් වූ මිථ්‍යාදෘෂ්ඨිකයන් නගරයෙන් බැහැර කර බුදුදහමට අනුග්‍රහය දැක් වූ බව සඳහන් වේ (දළදා වංසය, 1916, පි.05). රජු බෞද්ධාගමට නැඹුරු වීම හා සමගාමී ව ඇති වූ ව්‍යාකූල තත්ත්වය නිසා දළදාවේ ආරක්ෂාවට ද බාධා මතු විය. පැවති ව්‍යාකූලත්වය වඩාත් උග්‍ර කරවමින් ක්ෂීරධාර රජුගේ බෑණණුවෝ දෙදෙනෙක් දළදා වහන්සේ ලබා ගැනීම උදෙසා යුද්ධයට පිවිසි බැවින් මේ අවස්ථාවේ දී තමන් යුද්ධයෙන් පරාජය වුවහොත් දළදා වහන්සේ ආරක්ෂා සහිතව සීහළද්වීපයේ සිය මිතුරු මහසෙන් රජු වෙත ගෙනයන ලෙස සිය දියණිය හා බෑණණුවන් දැනුවත් කරමින් ගුහසීව රජු ද යුද්ධයට පිවිස ඇත (දළදා පූජාවලිය, 1893, පි.27). යුද්ධයේ දී ගුහසීව රජු පරාජයට පත් වූ බැවින් වාම දළදා වහන්සේ ද රැගෙන හේමමාලා සහ දන්ත කුමරු ත්‍රාමලිප්තියෙන් නැව් නැග ලංකාද්වීපයට පැමිණ තිබේ.

දළදා වහන්සේ ලංකාවට වැඩම කරවීම පිළිබඳ තොරතුරු ඇතුළත් සමහරක් මූලාශ්‍රය පරීක්ෂා කර බැලීමේ දී දළදාව ලංකාවට වැඩම කරවනු ලැබුවේ පෙර සිට ම දෙරට අතර පැවති මිත්‍රත්වයක් නිසා බව අනාවරණය වේ (රාජාවලිය, 1923, පි. 51). මහසෙන් රජු (ක්‍රි.ව.276-303) සහ ගුහසීව රජු සමකාලීන පාලකයන් වශයෙන් හඳුන්වා දෙන මූලාශ්‍රය විස්තර තුළ අවස්ථා කිහිපයක දී ලක් රජු දළදා වහන්සේ ලබා ගැනීම අරබයා දූතයන් සහ පුද පඬුරු ආදිය කලිඟුරටට යැව් බව ද කියවෙයි (සුළුරාජාවලිය, 1914, පි.07). නමුත් මහසෙන් රාජ්‍ය කාලය සම්බන්ධයෙන් කියවෙන මහාවංසය හෝ වෙනත් පැරණි මූලාශ්‍රයක හෝ එවැනි පුවතක් ඇතුළත් වී නොමැති අතර පූජාවලිය හෝ රාජාවලියෙහි ද මෙබඳු විස්තරයක් ඇතුළත් නොවේ. පොළොන්නරු යුගයේ දී ලියන ලදැයි සැලකෙන දාඨාවංසය සහ පසුකාලීන ව ලියැවුණු දළදා පූජාවලිය, සුළුරාජාවලිය, රාජරත්නාකරය වැනි ඇතැම් දේශීය මූලාශ්‍රය තුළ මෙම පුවත සඳහන් වේ. කිත්සිරිමෙවන් රාජ්‍ය කාලයේ දී (ක්‍රි.ව.303-331) දළදා වහන්සේ අලළා රචනා කරන ලද සිංහල දළදා වංසයෙහි මෙබඳු පුවතක් ඇතුළත් වූවා නම් දාඨාවංසය, දළදා පූජාවලිය, සුළුරාජාවලිය, රාජරත්නාකරය වැනි කෘති සම්පාදනයේ දී මේවායේ කතුවරුන් විසින් එම කෘතිය මූලාශ්‍රය කරගත්තා විය හැකි ය. නමුත් මහාවංස කතුවරයාට හෝ දඹදෙණි යුගයේ විසූ උගත් පඬිවරුන්ට හෝ මෙම කෘතිය මූලාශ්‍රය කරගත

නොහැකි වූයේ ඇයි ද යන ගැටලුව මෙහි දී මතු වේ. දළදාවේ භාරකාරිත්වය අභයගිරිවාසී භික්ෂූන්ට පැවරුණු බැවින් කිත්සිරිමෙවන් සමයේ දී ලියැවුණු එම දළදා වංසය නම් කෘතිය ද අභයගිරි භික්ෂුවක් විසින් සම්පාදනය කළ බව අනුමාන කළ හැකි ය. එය එසේ වූවා නම් මහාවංස කතුවරයා හිතාමතා ම මෙම කෘතිය පරිශීලනය නොකළා විය හැකි ය.

කෙසේ වෙතත් වසර 800කට ආසන්න කාලයක් පුරා සිය රාජ්‍යයට අයත් ව තිබූ, පූර්ව පාලකයන් ආරක්ෂා කර ගනිමින් රැක ගත් දළදා වහන්සේ වැනි වටිනා ආගමික වස්තුවක් කලිඟු පාලකයා කිසිදු මිත්‍රත්වයක් නොමැති ව නොදන්නා රාජ්‍යයක පාලකයකුට ලබා දුන්නේ නම් එය ද සැක සහිත ය. අනෙක් අතට මහසෙන් රජු දූතයන් සහ පුද පඬුරු කලිඟුරටට යවා දළදා වහන්සේ ඉල්ලා සිටින්නේ දළදාව එහි තිබෙන බව නිශ්චිත ව ම දැනගෙන සිටි බැවිනි. මහසෙන් රාජ්‍ය අවධියට පෙර සිට ලංකාව සහ කලිඟුරට අතර විවිධාකාරයේ සම්බන්ධතා ගොඩනැඟී තිබුණු හෙයින් තත් අවධිය වනවිටත් එවැනි සම්බන්ධතා දෙරට අතර පැවති බව අනුමාන කරමින් දළදා වහන්සේ මෙරටට වැඩම කරවනු ලැබුවේ දෙරට අතර පැවති මිත්‍රත්වය නිසා ය යන අදහස කිසියම් දුරකට පිළි ගැනීම සාධාරණ යැයි හැඟේ. නමුත් දළදා වහන්සේ වැඩම කිරීමේ පුවතට අදාළ ව කලිඟුරට සම්බන්ධ මූලාශ්‍රය තුළ එන විස්තරවල පවතින ඓතිහාසික සත්‍යතාව සම්බන්ධයෙන් ද සලකා බැලීම අත්‍යවශ්‍ය ය. දළදාව පළමුවෙන් ම භාරගනු ලැබුවේ කලිඟුරට බ්‍රහ්මදත්ත රජු විසින් වන අතර එම පෙළපතට අයත් කාසිරාජ සහ සුනන්ද වැනි රජුන් කිහිපදෙනෙක් ද දළදා වහන්සේ උදෙසා අනුග්‍රහය දැක් වූ බව මූලාශ්‍රය විස්තරයෙහි සඳහන් වේ (දාඨාවංස, 2009, පිටු. 91,92). ක්‍රිස්තු වර්ෂ හතරවන සියවසේ දළදා වහන්සේ මෙරටට වැඩම කරවන විට ගුහසීව රජු කලිඟුරට පාලනය මෙහෙය වන ලදී. ඔහුට සමකාලීන ව වෙනත් ඉන්දියානු ප්‍රදේශ මුල් කරගෙන සිටි පාලකයන් කිහිපදෙනකු පිළිබඳ ව තොරතුරු ද දළදා පුවතෙහි ඇතුළත් වන අතර පාටලීපුත්‍රය පාලනය කළ පණ්ඩු රජු සහ ඔහුගේ පුත්‍රයා, ඔහුගේ සාමන්තවරයකු ලෙස කටයුතු කළ චිත්‍රයාන, ඛීරධාර සහ ඔහුගේ බෑනා, උදේනි රජු සහ ඔහුගේ පුත්‍ර දන්ත කුමරු යන අය මේ අතර වෙති (දළදා පූජාවලිය, 1893, පිටු. 25,26).

දළදා පුවත පරීක්ෂා කිරීමේ දී ඊට පසුබිම් වූ කථා පුවතේ සත්‍යතාවය පිළිබඳ ව විවිධ අදහස් පවතින බව හඳුනාගත හැකි ය. දළදා වංසය, දළදා පූජාවලිය වැනි මූලාශ්‍රය විස්තරවලට අනුව දළදා වහන්සේ මෙරටට වැඩම කරවනු ලැබූ ක්‍රිස්තු වර්ෂ හතරවන සියවසේ දී පාටලීපුත්‍රය මුල් කරගෙන පාලනය මෙහෙය වූයේ පණ්ඩු නම් රජු බව දැක්වෙතත් තත් අවධිය තුළ උතුරු ඉන්දියාවේ විශාල අධිරාජ්‍යයක් ගොඩනගාගෙන පාලනය මෙහෙය වූයේ ගුප්ත රාජවංශයේ සමුද්‍රගුප්ත රජු ය. දළදා පුවතෙහි සඳහන් වන පණ්ඩු නමැති රජු පිළිබඳ ව ගුප්ත රාජවංශය තුළ සඳහන් නොවන අතර මූලාශ්‍රයෙහි සඳහන් පණ්ඩු රජු කුමන පෙළපතකට අයත් ද යන්න පැහැදිලි නොවේ. එමෙන් ම දළදා පුවත සම්බන්ධ විස්තරයන්හි කලිඟු පෙළපතට අයත් පාලකයන් ලෙස විග්‍රහ කරන බ්‍රහ්මදත්ත, කාසිරාජ, සුනන්ද සහ ගුහසීව වැනි පාලකයන් ද නිශ්චිත ව ම ක්‍රිස්තු වර්ෂ හතරවන සියවසේ දී හෝ ඊට ආසන්න කාලය තුළ වාසය නොකළ බව ද ඇතැම් විද්වත්හු පෙන්වා දෙති (සන්න සහිත දාඨාවංසය, 2000, පිටු. xviii,xix.). ඔවුහු එවැනි අදහස් දරනුයේ මෙනම්වලින් යුතු පාලකයන් පිළිබඳ ව ජාතක කථා සහ පුරාණ ග්‍රන්ථ ආදියෙහි තොරතුරු සඳහන් වුවත් ක්‍රිස්තු වර්ෂ හතරවන සියවසට හෝ ඒ ආසන්න කාලය සම්බන්ධයෙන් විස්තර සඳහන් වන වෙනත් මූලාශ්‍රය කිසිවක මෙබඳු පාලකයන් පිළිබඳ ව සඳහන් නොවීම නිසාත් ය. මෙම විද්වතුන්ට අනුව බ්‍රහ්මදත්ත, කාසිරාජ,

සුනන්ද සහ ගුහසීව යන මොවුහු විවිධ කාලවලට සහ රාජවංශවලට අයත් පාලකයන් වන අතර ක්‍රිස්තු වර්ෂ හතරවන සියවසට අයත් නොවූවන් ය. මේ අනුව දළදා වහන්සේ ක්‍රිස්තු වර්ෂ හතරවන සියවසේ දී ලංකාවට වැඩම කරවීමේ පුවත සත්‍ය වුව ද එම පුවතෙහි කියවෙන චරිත සැබැවින් ම තත් අවධිය තුළ ජීවත් වූවා ද යන්න සම්බන්ධයෙන් ප්‍රශ්නකාරී තත්ත්වයක් පවතින බව එහි ඉතිහාසය අධ්‍යයනයේ දී පැහැදිලි වේ.

ආගමික පූජ්‍ය වස්තුවක් වන දළදා වහන්සේගේ ආරක්ෂාව සම්බන්ධයෙන් ඇති වූ තර්ජනකාරී වාතාවරණය නිසා මෙරටට වැඩම කරවනු ලැබී ය (දළදා පූජාවලිය, 1893, පි. 27). සමහරක් මූලාශ්‍රයවල දැක්වෙන්නේ මහසෙන් රජු අවස්ථා කිහිපයක දී දළදා වහන්සේ ලබා දෙන මෙන් ඉල්ලීම් කර තිබූ නිසාත්, සීහළද්වීපයෙහි දී දළදාව ආරක්ෂා වේ යැයි සිතූ නිසාත් කලිඟු රජු දළදාව මෙරටට වැඩම කරවීමට තීරණය කළ බව ය (සුළුරාජාවලිය, 1914, පි. 07). දළදා වහන්සේ වැඩම කරන අවස්ථාවේ දී මෙරට පාලනය මෙහෙය වූයේ කිත්සිරිමෙවන් රජු ය. දළදා වහන්සේ වැඩම කරවමින් පැමිණි දන්ත කුමරු සහ හේමමාලා කුමරිය ලංකා පටුනින් දිවයිනට ඇතුළු වූ අතර ඒ ආසන්නයේ පිහිටි දේවාලයක විවේක ගත් බවත්, ඉන්පසු ව මේඝවිහාරයෙහි තෙරුන් වහන්සේ කෙනකු වෙත දළදා පුවත දන්වා රජු වෙත දළදා වහන්සේ පිළිගන්වා පූජා කළ බවත්, මූලාශ්‍රය විස්තරයෙහි කියවෙයි (දළදා පූජාවලිය, 1893, පි. 31 සහ දාඨාවංස, 2000, පිටු. 194-196). කිත්සිරිමෙවන් රජු මොවුන් විසින් ගෙන එන ලද දළදාව සැබෑ ලෙසින් ම බුදුන් වහන්සේගේ දන්ත ධාතූන් වහන්සේ විය හැකි ද? යනුවෙන් සැක කිරීම නිසා දළදා වහන්සේ ඒ අවස්ථාවේ දී ප්‍රාතිහාර්ය දැක් වූ බවත් රජුගේ සැකය දුරු වීමෙන් අනතුරුව නොයෙකුත් ආකාරයේ පුද සත්කාර කරමින් දළදා වහන්සේ වෙත අනුග්‍රහය දැක් වීමත් සිදු කර ඇත. මූලාශ්‍රය විස්තර පරීක්ෂා කිරීමේ දී රජුගේ මූලිකත්වයෙන් දළදා මැඳුරක් ඉදි කරවීම සහ අභයගිරි විහාරවාසී භික්ෂූන් වහන්සේලා වෙත දළදා වහන්සේගේ භාරකාරිත්වය පැවරීම පිළිබඳවත් දළදා පෙරහැර පැවැත් වීම සහ දළදා වහන්සේ උදෙසා පැවැත් විය යුතු පූද පූජා නියම කිරීම ආදී කාර්යයන් රැසක් සිදු වුණු බවත් විස්තර කර ඇත.

මේ ආකාරයෙන් පළමුවෙන් ම දළදා වහන්සේ මෙරටට වැඩම කරවන ලද අවධියේ සිට ම රාජ්‍ය අනුග්‍රහය සහිත ව දළදා වහන්සේ උදෙසා පුද සත්කාර සිදු කෙරුණු බව හඳුනාගත හැකි ය. දේශපාලන බලය තහවුරු කර ගැනීමේ සංකේතයක් ලෙස දළදාව සැලකීමට යොමු වූ නිසා රජු මේ අයුරින් දළදා වහන්සේ වෙත අනුග්‍රහය දක්වා ඇති අතර කිත්සිරිමෙවන් රාජ්‍ය කාලයේ සිට ම මෙරට දේශපාලන ව්‍යුහය තුළ දළදා වහන්සේ වැදගත් සංකේතයක් බවට පත් විය. බෞද්ධ වැසියන්ගේ වන්දනාවට පාත්‍ර වූත්, දේශපාලන බලය නිත්‍යානුකූල කිරීමේ සංකේතය වූත්, දළදා වහන්සේ ආරක්ෂා කිරීම සහ දළදා වහන්සේ උදෙසා පුද සත්කාර කිරීම පළමුවෙන් ම කිත්සිරිමෙවන් රජුගෙන් ඇරඹී අතර එය ක්‍රමානුකූල ව විකාශනය විය. වංසකථා ඇතුළු මූලාශ්‍රය පරීක්ෂා කර බැලීමේ දී වරින්වර බලයට පත් ලාංකේය රජුන් සහ රැජිනියන් මෙරට බහුතර බෞද්ධ ජනතාවගේ මුදුන් මල්කඩ වැනි දළදා වහන්සේ උදෙසා අග්‍රගන්‍ය පුද සත්කාර පැවැත් වූ බවත් දළදා වහන්සේගේ ආරක්ෂාව උදෙසා ක්‍රියා කළ බවත් හඳුනාගත හැකි ය. ඔවුන් එලෙස ක්‍රියා කළේ දළදා වහන්සේ රාජත්වයේ සංකේතයක් වශයෙන් සැලකූ නිසාවෙනි. දාඨාවංස විස්තරය පරීක්ෂා කර බැලීමේ දී කිත්සිරිමෙවන් රාජ්‍ය කාලයෙන් පසු ව පළමු වරට දළදා වහන්සේ උදෙසා චාරිත්‍රානුකූල ව පුද සත්කාර පවත්වා ඇත්තේ බුද්ධදාස රජු ය (දාඨාවංස, 2000, පි.220). බෞද්ධාගමට ලැදි

පාලකයකු වශයෙන් කැපී පෙනෙන සේවයක් කළ බුද්ධදාස රජුගේ දළදා අනුග්‍රහය සම්බන්ධයෙන් දාඨාවංස විස්තරයෙහි සඳහන් වුව ද මහාවංසයෙහි ඒ පිළිබඳ ව සඳහන් නොවේ. රජුගේ වෙනත් ශාසනික සේවාවන් මහාවංස කතුවරයාගේ ඇගයුමට පාත්‍ර වුවත් දළදා අනුග්‍රහය පිළිබඳ ව වාර්තා නොකළේ ඇයි ද යන්න පැහැදිලි නොවේ.

වංසකථා විස්තරය පරීක්ෂා කර බැලීමේ දී මිත්සෙන් රජු විසින් ද දළදා වහන්සේ වෙත අනුග්‍රහය දක්වන ලද බව හඳුනාගත හැකි ය. සොරෙක් නමින් වංසකථාකරුවා හඳුන්වා දෙන මිත්සෙන් රාජත්වයට පත් වීමෙන් පසුව බොහෝ පිංකම් කර ඇත. සැණකෙළියට යනු පිණිස දළදා ගෙයි ඇතා ගෙන ඒමට රජු අණ කළ බව මහාවංස විස්තරයෙහි සඳහන් වෙයි (සිංහල මහාවංසය, 2003, 38:07-10). නමුත් වෙනත් මූලාශ්‍රයන්හි දළදා වහන්සේ වන්දනා කිරීම උදෙසා මිත්සෙන් රජු දළදා මැඳුරට ගිය බවක් පමණක් දක්වා තිබෙන බව හඳුනාගත හැකි ය (පූජාවලිය, 1999, පි. 778.). ධාතුසේන රාජ්‍ය කාලය සම්බන්ධ මූලාශ්‍රය විස්තර පිරික්සීමේ දී ත් දළදා අනුග්‍රහය පිළිබඳ ව තොරතුරු අනාවරණය කරගත හැකි ය. ධාතුසේන රජු දළදා මැඳුරෙහි දිරා ගිය කොටස් ප්‍රතිසංස්කරණය කිරීමට අනුග්‍රහය දැක් වූ බවත්, දළදා වහන්සේ තැම්පත් කිරීම උදෙසා කරඬුවක්, මැණික් යොදා සකස් කරන ලද වළල්ලක් සහ රන් පියුම් (නෙළුම් මල්) ඇතුළු ගණන් කළ නොහැකි තරමේ පූජා සිදු කළ බව මහාවංස විස්තරයෙහි සඳහන් වේ (සිංහල මහාවංසය, 2003, 38:71-74). පළමුවන අග්‍රබෝධි රාජ්‍ය කාලයේ දී ද දළදා වහන්සේ වඩා හිඳුවීම උදෙසා දළදා ගෙයක් කරවන ලද බව මහාවංසයෙහි දැක්වෙන අතර දළදා වහන්සේ තැන්පත් කරනු පිණිස රන් කරඬුවක් කර වූ බවත් එහි කියවෙයි (එම, 41:33,34). අනුරාධපුරයේ රජ පැමිණි තුන්වන මුගලන් රජු විසින් ද දළදා වහන්සේ උදෙසා පුද සත්කාර පවත්වන ලද බව මහාවංස විස්තරයෙහි සඳහන් වන නමුත් වෙනත් මූලාශ්‍රය තුළ මෙම පුවත් සඳහන් නොවේ (එම, 42:44,45).

මානවම්ම රාජ්‍ය කාලය සම්බන්ධ මහාවංස සහ පසුකාලීන ව ලියැවුණු රාජාවලිය, සුළුරාජාවලිය, රාජරත්නාකරය වැනි මූලාශ්‍රයන්හි ඇතුළත් තොරතුරු පරීක්ෂා කර බැලීමේ දී දළදා අනුග්‍රහයක් සම්බන්ධයෙන් විස්තර හෙළි නොවන නමුත් දළදා සිරිතෙහි ඇතුළත් යම්යම් තොරතුරු මගින් මානවම්ම රාජ්‍ය කාලයේ දී දළදා වහන්සේගේ භාරකාරිත්වය සම්බන්ධයෙන් ක්‍රියා කළ උතුරුමුළ විහාරය සහ එම භික්ෂූන් වහන්සේලාට රාජ්‍ය අනුග්‍රහය හිමි වූ බවට තොරතුරු හෙළිවෙයි (දළදා සිරිත, 1961, පි. 42). දළදා වහන්සේ මෙරටට වැඩම කළ මුල් අවධියේ දී එහි භාරකාරිත්වය සම්බන්ධයෙන් කටයුතු කරනු ලැබුවේ අභයගිරි විහාරවාසී භික්ෂූන් වහන්සේලා වුවත් උත්තරමූළ විහාරය ආරම්භ වීමෙන් පසු එය වෙනස් වී දළදා වහන්සේගේ භාරකාරිත්වය උතුරුමුළ භික්ෂු පරපුර වෙත පැවරුණි. උතුරුමුළ විහාරය ඉදි කරනු ලැබුවේ මානවම්ම රජුගේ අනුග්‍රහයෙන් බව දළදා සිරිතෙහි මෙන් ම පූජාවලියෙහි ද සඳහන් වන අතර භික්ෂූන් වහන්සේලා හයසියයක් ද මෙහෙකරුවන් සහ නොයෙකුත් ශිල්ප කර්මාන්ත දක්ෂ වූ දාඨාධාතු ආරක්ෂකයන් ද සහිත ව උත්තරෝළමූළ විහාරය පැවිදි වූ සිය සහෝදරයාට භාර දුන් බව කියවෙන අතර මෙම තොරතුරු අනුව මානවම්ම රජු කිසියම් ආකාරයෙන් දළදා වහන්සේ සහ සමග සම්බන්ධයක් පැවති ස්ථානයක් ගොඩනැගීමේ කාර්යයට සම්බන්ධ වූ බව හඳුනාගත හැකි වේ (දළදා සිරිත, 1961, පි. 42 සහ පූජාවලිය, 1999, පි. 780).

උතුරුමුළ පිරිවෙන මහානාම රජු විසින් කරවන ලද බව ඉහත මූලාශ්‍රයන්හි සඳහන් වුව ද ඇතැම් විද්වතුන් මේ සම්බන්ධයෙන් වෙනස් ආකාරයේ අදහස් ද ඉදිරිපත් කර ඇත. මේ සම්බන්ධයෙන් අදහස් දක්වන කඹුරුගමුවේ වජිර හිමි පෙන්වා දෙනුයේ ක්‍රිස්තු වර්ෂ දහවන සියවස වනවිට උතුරුමුළ විහාරය සංස්ථාපිත ආයතනයක් ලෙස පැවති බව ය (වජිර හිමි, 2008, පි. 157). පූජාවලිය සහ දළදා සිරිත වැනි මූලාශ්‍රයන්හි සඳහන් පරිදි අභයගිරියට අයත් උත්තරෝළිය විහාරය මානවම්ම රාජ්‍ය කාලයේ දී ඉදි කරන ලද බව නිශ්චිත ව ම පිළි ගතහොත් දළදා වහන්සේ ආරක්ෂා කිරීමේ වගකීම සහ දළදා පෙරහැර මෙන් ම ප්‍රදර්ශන ආදිය පැවැත් වීමේ අධිකාරිය උතුරුමුළවාසී භික්ෂූන් වෙත පැවරුණේ තත් අවධියේ දී බව පිළිගත හැකි ය (පූජාවලිය, 1999, පි. 780 සහ දළදා සිරිත, 1961, පි. 42). දළදා වහන්සේගේ ආරක්ෂාව උදෙසා රාජකීය සෙබළුන් යෙදවීමට මානවම්ම රජු ක්‍රියා කළ බව ද මූලාශ්‍රයගත විස්තරවලින් හෙළිවන අතර පළමු වරට දළදාවේ ආරක්ෂාව උදෙසා සෙබළුන් යෙද වූ අවස්ථාව ද මෙය යි (පූජාවලිය, 1999, පි. 780). දළදා වහන්සේගේ ආරක්ෂාව පිණිස මෙසේ සෙබළුන් යෙදවීම මගින් පැහැදිලි වනුයේ ද රාජත්වයේ සංකේතයක් වශයෙන් දළදා වහන්සේ වෙත ඉහළ පිළි ගැනීමක් හිමි ව තිබූ බව යි. ඒ නිසා දළදා වහන්සේගේ ආරක්ෂාව සම්බන්ධයෙන් වැඩි අවධානයක් යොමු කිරීමට පාලකයන් උනන්දු වී ඇත. තත් අවධිය තුළ පැවති කිසියම් ආකාරයේ අස්ථාවරත්වයක් හේතුවෙන් දළදා වහන්සේ අනාරක්ෂිත වූ බවක් මූලාශ්‍ර විස්තරයන්ගේ ද සඳහන් නොවන බැවින් සිය දේශපාලන අධිකාරිත්වය යටතේ දළදා වහන්සේ තම භාරයෙහි පවතින බව ඒත්තු ගැන්වීමේ අරමුණ මෙසේ හමුදා ආරක්ෂාව යෙදවීම කෙරෙහි හේතු වූ බව පැහැදිලි ය.

මහාවංස විස්තර පරීක්ෂා කර බැලීමේ දී දෙවන සේන රාජ්‍ය කාලයේ දී ත් දළදා වහන්සේ උදෙසා සියලු පූජෝත්සව සිදු කළ බව සඳහන් වන නමුත් සෙසු මූලාශ්‍රය ආදියෙහි එබඳු පුවතක් සඳහන් නොවේ (සිංහල මහාවංසය, 2003, 51:22,23). හතරවන සේන රාජ්‍ය කාලය සම්බන්ධ මහාවංස විස්තරයේ දී ත් දළදා වහන්සේ උදෙසා පැවැත් වූ පුද පූජා පිළිබඳ ව විස්තර කර ඇති අතර නොයෙක් රුවන්වලින් සරසන ලද දළදා කරඬුව සතර වෙහෙරට වැඩම කරවා ධාතු පූජා පැවැත් වූ බව එහි දැක්වෙයි (එම, 54:04-06). හතරවන මහින්ද රාජ්‍ය කාලයේ දී නුවර මැද දැවී ගිය දළදා ගෙය රජුගේ අනුග්‍රහයෙන් නැවත ඉදි කළ බව සඳහන් වන අතර තත් අවධිය වනවිටත් දළදා වහන්සේ උදෙසා රාජ්‍ය අනුග්‍රහය හිමි වූ බව හඳුනාගත හැකි ය (එම, 54:46,47). මූලාශ්‍රය විස්තර පරීක්ෂා කිරීමේ දී අනුරාධපුර යුගයට අයත් පාලකයින් කිහිපදෙනකු ම දළදා වහන්සේ උදෙසා විවිධ පුද පූජා පැවැත් වූ බවත් දළදා වහන්සේ වැඩ සිටින මාලිගයට නොයෙකුත් ආකාරයේ අනුග්‍රහයන් සිදු කළ බවත් හෙළි කරගත හැකි ය. නමුත් ඇතැම් පාලකයන් සිය දේශපාලන අරමුණු සාක්ෂාත් කර ගැනීමේ පරමාර්ථයෙන් අත්තනෝමතික ව ක්‍රියා කළ යම්යම් අවස්ථාවල දී දළදා වහන්සේ අනාරක්ෂිත තත්ත්වයට පත් වූ බවත් පෙනේ. පූර්වයේ දී දළදා වහන්සේට සහ වෙනත් බෞද්ධ විහාරවලට පූජා කර තිබූ වටිනා රන්, මුතු, මැණික් ඇතුළු වස්තුව කොල්ල කෑමට පවා ඇතැම් පාලකයන් නොපසුබට ව කටයුතු කර තිබේ (එම, 61:54-60).

කෙසේ වෙතත් බෞද්ධ ආගමික පූජනීය සංකේතයක් වශයෙන් මෙන් ම දේශපාලන බලය තහවුරු කිරීමේ සංකේතයක් වශයෙන් ද දළදා වහන්සේ ආරක්ෂා කිරීමට අනුරාධපුර පාලකයන් උත්සාහ ගත් බව පැහැදිලි ය. ඇතැම් පාලකයෙක් වෙහෙර විහාර කොල්ලකමින් අත්තනෝමතික ව හැසිරුණත් තත් අවධියේ දී

බලයට පත් රජවරුන් බොහෝමයක් බෞද්ධාගම සම්බන්ධයෙන් උනන්දුවක් දක්වමින් දළදා පුද පූජා ඇතුළු චාරිත්‍ර ඉටු කළ බව හඳුනා ගැනීමට පුළුවන. කිත්සිරිමෙවන් රාජ්‍ය කාලයේ සිට අනුරාධපුර රාජධානි අවධිය බිඳ වැටීම දක්වා කාලය තෙක් බලයට පත් පාලකයන් ආගමික සංකේතයක් වශයෙන් සලකා දළදා වහන්සේ උදෙසා අනුග්‍රහය දැක්වීම සිදු කළ නමුත් පොළොන්නරු රාජධානි කාලයේ සිට ක්‍රමානුකූල ව දළදා වහන්සේ ආගමික සංකේතයක් ලෙස සැලකීමට වඩා දේශපාලන අධිකාරිත්වය ප්‍රදර්ශනය කිරීමේ සංකේතයක් ලෙස භාවිතයට ගැනුණු බව ඉතිහාසය පිරික්සීමෙන් හෙළි කරගත හැකි ය (පූජාවලිය, 1999, පි. 799). පසුකාලීන පාලකයන් බොහෝමයක් දළදා වහන්සේ උදෙසා අනුග්‍රහය දැක් වූයේ එය බෞද්ධාගමික පූජ්‍ය වස්තුවක් වූ බැවින් පමණක් නොව රාජත්වයේ ද සංකේතයක් වශයෙන් සැලකූ නිසා ය. පොළොන්නරු රාජධානි අවධියට අයත් යැයි සැලකෙන පාලකයන් කිහිපදෙනකු ම දළදා වහන්සේ උදෙසා නොයෙකුත් පුද පූජා පැවැත් වූ බව හඳුනාගත හැකි අතර පළමුවන විජයබාහු රාජ්‍ය කාලයේ දී දළදා වහන්සේ උදෙසා නැවතත් පූර්ව චාරිත්‍රානුකූල ව වන්දනාමාන කිරීම ආරම්භ වූ බව පෙනේ (සිංහල මහාවංසය, 2003, 60:16). අනුරාධපුර යුගයට අයත් පාලකයන් අතරින් අවසන් වරට දළදා වහන්සේ උදෙසා අනුග්‍රහය දක්වන ලද්දේ හතරවන මිහිඳු රජු විසිනි. මූලාශ්‍රය විස්තරයෙහි නැවත දළදා වහන්සේ සම්බන්ධ තොරතුරු සඳහන් වනුයේ මිහිඳු රජුගේ රාජ්‍ය කාලයෙන් වසර අසූ තුනක් ගත වීමෙන් පසු ව රාජත්වයට පැමිණි පොළොන්නරුවේ පළමුවන විජයබාහු රාජ්‍ය කාලයේ දී ය. ඒ අනුව වසර 83ක පමණ කාලය තෙක් දළදා වහන්සේ පිළිබඳ තොරතුරු වංසකථා ඇතුළු මූලාශ්‍රයවල සඳහන් වී නොමැති බවක් පෙනී යයි.

පස්වන සේන රජු හෝ පස්වන මිහිඳු රාජ්‍ය කාලවල දී දළදා වහන්සේ උදෙසා අනුග්‍රහයන් සිදු කළ බවක් හෝ දළදා වහන්සේ සම්බන්ධ වෙනත් තොරතුරක් හෝ වාර්තා නොවන අතර පස්වන මිහිඳු රාජ්‍ය කාලයේ දී එල්ල වූ චෝළ ආක්‍රමණය හමුවේ අගනුවර ද බිඳ වැටිණි. වංසකථා ඇතුළු මූලාශ්‍රය තුළ ආක්‍රමණිකයන් විසින් අනුරාධපුර ඇතුළු තදාසන්න ප්‍රදේශයෙහි පැවති බෞද්ධ වෙහෙර විහාර විනාශ කළ බව සඳහන් වුව ද දළදා මැඳුරට හානි පැමිණ වූ බවක් සඳහන් නොවෙයි. ඒ අනුව තත්කාලයේ දී දළදා වහන්සේ අනුරාධපුර අගනගරයෙහි තැන්පත් කර නොතිබුණු බව අනුමාන කරමින් කඹුරුගමුවේ වජිර හිමි දක්වන අදහසට එකඟ විය හැකි ය (වජිර හිමි, 2008, පි. 168). ආක්‍රමණිකයන් බෞද්ධ වෙහෙර විහාර කොල්ලකමින් වස්තුව පැහැර ගන්නා විට දී දළදා වහන්සේගේ භාරකාරිත්වය පැවරුණු උතුරුමුළ භික්ෂු පරපුරට අයත් තෙරුන් වහන්සේලා විසින් ආරක්ෂාව උදෙසා දළදාව වෙනත් ප්‍රදේශයකට වැඩම කරන්නට ඇති බව වජිරා රත්නසූරිය අනුමාන කරයි (එම.). නමුත් නිශ්චිත ව ම මෙසේ සිදු වූ බව පිළි ගැනීමට තරම් සාධක නොවේ. වංසකථා ඇතුළු මූලාශ්‍රයවල, ආක්‍රමණය හමුවේ අගනුවර චෝළ පාලනයට නතු වූ නිසා රජු හස්තසාර වස්තුව රැගෙන රුහුණු ප්‍රදේශයට පළා ගිය බව සඳහන් වුවත් හස්තසාර වස්තුව අතර දළදා වහන්සේ පැවති බවක් ද නිශ්චිත ව ම සඳහන් නොවේ (සිංහල මහාවංසය, 2003, 55:07).

කෙසේ නමුත් මේ සමයේ දී දළදා වහන්සේ අනුරාධපුරයෙහි තැන්පත් කර තිබුණේ නම් අනිවාර්යෙන් ම චෝළයන්ගේ මැදිහත් වීම නිසා දළදාව අනාරක්ෂිත තත්ත්වයට පත්වනු ඇත. බෞද්ධ වෙහෙර විහාර කොල්ලකමින් විනාශකාරී ලෙස හැසිරුණු චෝළයෝ ඇතැම් විහාරාරාම ද්‍රවිඩ කෝවිල් බවට පත් කරනු ලැබූහ. වෙල්ගම්වෙහෙර චෝළයන් විසින් රාජරාජපෙරුම්පල්ලි යනුවෙන් හඳුන්වනු ලැබූ අතර වෙහෙර විහාර ආදියට පූර්ව අනුරාධපුර පාලකයන් විසින් පූජා කර තිබුණු රන්, රිදී, මුතු, මැණික් ඇතුළු වස්තුව

පවා ඔවුහු පැහැර ගෙන තිබේ (මුදියන්සේ, 1997, පිටු. 145,146). චෝළයන් යටතේ අනුරාධපුරය කේන්ද්‍ර කරගෙන පැවති බෞද්ධ වෙහෙර විහාර අනාරක්ෂිත තත්ත්වයට පත් වූ ආකාරය පිළිබඳ ව සලකා බැලීමේ දී දළදා වහන්සේ ඒ වනවිට අනුරාධපුරයේ පැවතියේ නම් චෝළයන්ගේ මැදිහත් වීමෙන් එය ද විනාශ වීමට ඉඩ තිබුණු බව පෙනේ. චෝළයන් පොළොන්නරුව කේන්ද්‍ර කරගෙන පාලනය කරනු ලැබූ අවධියේ දී හෝ දළදා වහන්සේ අනුරාධපුර හෝ පොළොන්නරුව තුළ හෝ තැන්පත් කර තිබුණු බවට සාධක හමු නොවේ. රජරට ප්‍රදේශය චෝළ ආධිපත්‍යයට නතු වූ අවස්ථාවේ දී නිශ්චිත ව ම දළදා වහන්සේ වෙනත් ප්‍රදේශයකට වැඩම කළා ද? එසේ නම් කවුරුන්ගේ මැදිහත් වීමෙන් ද? යන්න සම්බන්ධයෙන් කිසිදු සඳහනක් වංසකථා ඇතුළු මූලාශ්‍රය තුළ අන්තර්ගත නොවන අතර චෝළ ආක්‍රමණිකයන්ගේ මැදිහත් වීමෙන් දළදා වහන්සේ විනාශ කළ බවක් ද සඳහන් නොවේ. ඇතැම්විට මූලාශ්‍රය තුළ නිශ්චිත වශයෙන් තොරතුරු ඇතුළත් නොවනුයේ තත් අවධියේ දී දළදා වහන්සේ අගනුවරින් බැහැර වෙනත් ප්‍රදේශයක තැන්පත් කර තිබුණු නිසා විය හැකි ය.

වේලෙක්කාර සෙල්ලිපියෙහි දැක්වෙන තොරතුරු අනුව පළමුවන විජයබාහු රාජ්‍ය කාලයේ දී උත්තරෝළ මූළයට අයත් ව පැවති දළදා වහන්සේ උදෙසා ස්ථිර වාසස්ථානයක් කර වූ බව සඳහන් වේ (*Epigraphia Zeylanica* Vol. II, 1928, pp. 242-255). ඒ අනුව ආක්‍රමණය සිදු වූ අවධියේ සහ චෝළ පාලනය ක්‍රියාත්මක වූ අවධියේ දී දළදා වහන්සේගේ භාරකාරීත්වය උත්තරෝළමූළ විහාරීය භික්ෂූන් භාරයේ පැවති හෙයින් උන් වහන්සේලා දළදාව ආරක්ෂා කර ගැනීම උදෙසා කටයුතු කළ බව පිළි ගැනීම නිවැරදි යැයි හැඟේ. චෝළයෝ රජරට ප්‍රදේශය තුළ පාලනය සිදු කළ අවධියේ දී රුහුණ කේන්ද්‍ර කරගෙන දේශීය පාලකයන් බලයට පත් වුව ද ඔවුන්ගේ අනුග්‍රහය දළදා වහන්සේ වෙත ලැබුණු බවක් මූලාශ්‍රය විස්තරයෙහි සඳහන් නොවේ. එසේ වුවත් පළමුවන විජයබාහු කුමරු පොළොන්නරුවේ පාලනයට පත් වූ අවධියේ දී දළදා වහන්සේ පොළොන්නරුවට වැඩම කළ බවට තොරතුරු හඳුනාගත හැකි ය. මේ අනුව හතරවන මිහිඳු රාජ්‍ය කාලයේ සිට පළමුවන විජයබාහු රාජ්‍ය කාලය දක්වා වර්ෂ අසූතුනක් (83) තුළ දළදා වහන්සේ අප්‍රසිද්ධ ව කුමන හෝ විහාරයක තැන්පත් කර පුද පූජා පවත්වන්නට ඇති බවත් විජයබාහු රජු යටතේ නැවත දේශීය පාලනය ස්ථාපනය වීම සහ දිවයින එක්සේසත් කර බුදු සසුනට අනුග්‍රහය දැක්වීම හා සමගාමී ව යළිත් දළදා වහන්සේ අගනුවරට වැඩම කරවා රාජ්‍ය අනුග්‍රහය සහිත ව දළදා මැඳුරෙහි තැන්පත් කරවා ඇත.

මහාවංස විස්තරය පරීක්ෂා කර බැලීමේ දී රජු පොළොන්නරුවේ දළදා මැඳුරක් ඉදිකරනු ලැබූ බව කියවෙන අතර ඒ අනුව පළමුවරට පොළොන්නරුවෙහි දළදා මැඳුරක් ඉදි කළ අවස්ථාව මෙය යි (සිංහල මහාවංසය, 2003, 60:16). පළමුවන විජයබාහු රාජ්‍ය කාලයේ දී ඉදි කරන ලද දළදා මැඳුර පිළිබඳ තොරතුරු දළදා වංසය නමැති මහනුවර රාජධානි සමයේ ලියැවුණු කෘතියෙහි ද සඳහන් වන අතර මෙම මූලාශ්‍රය තුළ ඇතුළත් තොරතුරු අනුව තත් අවධියේ දී දළදා වහන්සේ පොළොන්නරුව අගනුවර සමීප ස්ථානයක පිහිටුවා තිබුණු බව පැහැදිලි වේ (දළදා වංසය, 1916, පි. 11). වේලෙක්කාර ද්‍රවිඩ ලිපියෙහි ද පොළොන්නරුවේ දළදා මැඳුර ඉදි කිරීම සම්බන්ධයෙන් විස්තර සඳහන් වන අතර මොග්ගල්ලාන තෙරුන් වහන්සේගේ මූලිකත්වයෙන් දළදා වහන්සේගේ ආරක්ෂාව සම්බන්ධ සියලු බලතල වේලෙක්කාර හමුදාව වෙත පැවරූ බවත් ඒ අවස්ථාවේ දී භටයන් විසින් ඇති කරගත් සම්මුතිය පිළිබඳවත් මෙම ලිපියේ දීර්ඝ

ලෙස සඳහන් වෙයි (*Epigraphia Zeylanica* Vol. II, 1928, pp. 242-255). පළමුවන විජයබාහු රජු සහ බුරුම රජු අතර පැවති මිත්‍රත්වය සම්බන්ධයෙන් පරීක්ෂා කර බැලීමේ දී ත් දළදා වහන්සේ සම්බන්ධයෙන් යම්යම් ආකාරයේ වැදගත් ඉල්ලීම් සිදු වූ බව හඳුනාගත හැකි වේ (*ibid.*). බුරුමයේ අනුරුද්ධ රජු දන්ත ධාතූන් වහන්සේ බුරුමයට ලබාදෙන මෙන් ඉල්ලීම් සිදු කළ බව ජී. ඊ. හර්වේ විසින් ද පෙන්වාදෙන අතර මේ අනුව තත් අවධියේ දී දළදා වහන්සේ ලංකා රාජ්‍ය සතුව තිබෙන බව විදේශීය රජුන් දැන සිටි බව හෙළිවෙයි (Harvey, 1925, p. 32). එමෙන් ම දළදාව ලබා ගැනීම උදෙසා බුරුම රජු මේ ආකාරයෙන් ඉල්ලීම් සිදු කරනු ලැබුවේ සමකාලීන ලංකා පාලකයාගෙන් වන හෙයින් තත් අවධියේ දී දළදා වහන්සේ රාජ්‍යයේ රජුගේ භාරකාරිත්වය යටතේ තිබුණු බව ද පැහැදිලි වේ. මූලාශ්‍රය විස්තර පරීක්ෂා කිරීමේ දී පෙනීයන තොරතුරු අනුව මේ අවස්ථාවේ දී විජයබාහු රජු දළදා වහන්සේගේ ආකෘතියක් මැණික් කරඬුවක තැන්පත් කොට බුරුමය වෙත යවා ඇත.

දළදා වහන්සේ උදෙසා පුද පූජා පැවැත්වීමේ සම්ප්‍රදාය නැවත වරක් විජයබාහු රාජ්‍ය කාලයේ දී ආරම්භ වන අතර එතැන් පටන් පසුකාලීන පොළොන්නරු පාලකයෝ ද දළදා වහන්සේ උදෙසා පුද පූජා පැවැත් වීම සිදු කළහ. විජයබාහු රාජ්‍ය කාලයේ දී බිඳ වැටෙමින් පැවති පූර්ව සම්ප්‍රදායයන් යළිත් ස්ථාපනය කිරීම සිදු වූ නමුත් රජුගේ ඇවෑමෙන් පසු ව ඇති වූ දේශපාලන ව්‍යාකූලත්වය හමුවේ යළිත් අරාජික තත්ත්වයක් දිවයින තුළ ඇති විණි. ඒ හේතුවෙන් යළිත් වරක් බෞද්ධාගම සම්බන්ධයෙන් මෙන් ම දළදා වහන්සේ සම්බන්ධයෙන් ද යම්යම් ආකාරයේ අනාරක්ෂිත තත්ත්වයන් ඇති විය. මිත්තා කුමරියගේ මැදිහත් වීමෙන් ඇති කළ කුමන්ත්‍රණය අවසානයේ ජයබාහු කුමරු පරාජය කරමින් විජයබාහු රජුගේ පුත්‍ර වික්‍රමබාහු පොළොන්නරුවේත්, මනාභරණ දක්ඛිණ දේශයේත්, කීර්තිශ්‍රීමේඝ දොළොස්දහස්රටෙහිත් සහ සිරිවල්ලභ අටදහස්රට යන ප්‍රදේශවලත් පාලන කටයුතු සිදු කළහ. පොළොන්නරුව කේන්ද්‍ර කරගෙන උතුරු ප්‍රදේශයේ පාලනය මෙහෙය වූ වික්‍රමබාහු කුමරු තමාට එරෙහි ව ඇති වුණු කුමන්ත්‍රණය උදෙසා භික්ෂූන් වහන්සේලා මැදිහත් වූ හෙයින් පළමුවෙන් බෞද්ධ විරෝධී පිළිවෙතක් අනුගමනය කළ අතර දළදා වහන්සේ උදෙසා පූර්ව රජුන් විසින් පූජා කළ නොයෙකුත් මැණික්, මුතු ආදිය ද සඳුන්, අගිල්, කපුරු ද රන් ආදියෙන් නිමවන ලද්දා වූ පිළිම පැහැරගෙන නොයෙක් විනාශයන් සිදු කර ඇත.

මේ අවස්ථාවේ දී මූලායතනයේ භික්ෂූන් වහන්සේලා ආරක්ෂාව පිණිස දළදා වහන්සේ රෝහණයට වැඩම කර වූ බව මහාවංස විස්තරයෙහි සඳහන් වේ (සිංහල මහාවංසය, 2003, 61:60). මෙම සිදුවීම සම්බන්ධයෙන් අදහස් දක්වන වික්‍රමසිංහට අනුව මෙහි දී ද මූලිකත්වයක් ගෙන ඇත්තේ දළදා වහන්සේ වේලෙක්කාර භටයන්ගේ ආරක්ෂාව යටතට පත් කළ උත්තරමූලායතනයේ මොග්ගල්ලාන තෙරුන් වහන්සේ ම ය (වජිර හිමි, 2008, පි. 175). නැවත වරක් දළදා වහන්සේ අනාරක්ෂිත තත්ත්වයට පත් වූ බැවින් උන් වහන්සේ දළදාව ආරක්ෂා කිරීම උදෙසා ක්‍රියා කළ බව ඔහුගේ අදහස යි. මෙලෙස දොළොස්වන සියවසේ පළමුවන පරාක්‍රමබාහු රාජත්වයට පත්වන තෙක් ම දළදා වහන්සේ රෝහණයේ තැන්පත් කර තිබුණු අතර ඒ වනවිට දළදා වහන්සේ රුහුණේ මනාභරණ රජුගේ භාරකාරිත්වය යටතේ පැවතිණි (සිංහල මහාවංසය, 2003, 71:06-13). දෙවන ගජබාහු රජුට උපකාර කරන මුවාවෙන් රාජ්‍ය බලය ලබා ගැනීමට කළ කුමන්ත්‍රණයෙන් මෙන් ම රජුගේ අවසාන මොහොත සම්බන්ධ වංසකථා විස්තරයෙන් ද දළදා වහන්සේ ඔහුගේ භාරයෙහි පැවති බව පැහැදිලි වේ. මනාභරණ රජුගේ ඇවෑමෙන් පසු දළදා වහන්සේගේ භාරකාරිත්වය

සම්බන්ධයෙන් අධිකාරිය පවත්වා ගෙන යාමට සුගලා බිසව සමත් වූවා ය. රෝහණය මුල් කරගෙන පාලන කටයුතු මෙහෙය වූ මනාහරණ සහ සුගලා දේවිය වෙතට දළදා වහන්සේ භාර කරනු ලැබුවේ කවුරුන් ද යන්න නිශ්චිත ව ම සඳහන් නොවන නමුත් මණාහරණ රජුගේ ඇවෑමෙන් පසු රුහුණේ සාමන්තවරුන් විසින් සුගලා දේවියට නායකත්වය පවරන ලද බව වංසකථා විස්තරයෙහි සඳහන් වෙයි (සිංහල මහාවංසය, 2003, 71:06-13).

පළමුවන පරාක්‍රමබාහු රජුට ද තම රාජත්වය ස්ථිර වශයෙන් ම ජනතාවට ඒත්තු ගැන්වීමට දළදා වහන්සේ බෙහෙවින් අවශ්‍ය විය (එම, 74:90-113). සුගලා බිසව සහ පරාක්‍රමබාහු රජු අතර දළදා වහන්සේ අරබයා ඇති වූ යුද්ධය සම්බන්ධ වංසකථා විස්තර පරීක්ෂා කර බැලීමේ දී තත් අවධියේ දී දේශපාලන බලය ස්ථාවර කිරීමට දළදා වහන්සේගේ භාරකාරිත්වය කොතෙක් දුරට වැදගත් වූවා ද යන්න පැහැදිලි වේ. සුගලා බිසව දළදා වහන්සේ මුහුදු මාර්ග ඔස්සේ වෙනත් ස්ථානයකට රැගෙන යාමේ සැකයක් මතු වූ බැවින් රජු මුහුදු ප්‍රදේශයේ රැකවල් යෙදූ බව මහාවංස විස්තරයෙහි සඳහන් වේ (එම, 74:102-113). මෙවැනි උපායයන් මගින් ද දේශපාලන අධිකාරිය තහවුරු කර ගැනීම උදෙසා දළදා වහන්සේ කොතෙක් දුරට වැදගත් වූවා ද යන්නත් එහි ආරක්ෂාව පිළිබඳ ව පාලකයන් අවධානය යොමු කළ ආකාරයත් පැහැදිලි වේ. පරාක්‍රමබාහු රජු දළදා වහන්සේ සිය භාරයට ගැනීමත් සමග නැවත දළදාව පොළොන්නරුවට වැඩම කරවනු ලැබූ අතර නුවර මැද දළදා ගෙයක් ඉදි කර දළදා පුද පූජා සිදු කර තිබේ (එම, 74:183-250). මහාවංස විස්තරයෙහි රජුගේ දළදා අනුග්‍රහය පිළිබඳ ව දීර්ඝ ලෙස විස්තර කරන අතර පසුකාලීන මූලාශ්‍රයවලත් රජු වාර්ෂික ව දළදා පූජා පැවැත් වූ බව සඳහන් වේ (පූජාවලිය, 1999, පි. 783 සහ රාජාවලිය, 1923, පි. 58). මෙසේ නැවත දළදා වහන්සේ රජුගේ භාරකාරිත්වය සහිත ව පොළොන්නරුවෙහි තැන්පත් කිරීම සිදු විණි. පරාක්‍රමබාහු රජු ඉදි කරන ලද දළදා මාලිගා දෙකක් සහ රජුගේ උපදෙස් පරිදි මහින්ද නම් ඇමතිවරයා ඉදි කරන ලද මාලිගාව ද ඇතුළු ව මාලිගා තුනක් පිළිබඳ ව වංසකථා විස්තරයෙන් අනාවරණය වන අතර මෙම ඉදිකිරීම් සම්බන්ධ පුරාවිද්‍යා සාධක ද හමු වී ඇත (සෙනෙවිරත්න, 2001, පි. 32).

නිශ්ශංකමල්ල රාජ්‍ය කාලයේ දී ද දළදා වහන්සේ උදෙසා සිරිත් පරිදි පුද පූජා පැවැත් වූ බව හඳුනාගත හැකි අතර පෙර නොපැවැති ඇතැම් පූජා විධි තත් අවධියේ දී ක්‍රියාත්මක වූ බව හඳුනාගත හැකි ය (*Epigraphia Zeylanica* Vol. II, 1928, pp. 85-90). රජු තම දියණිය සර්වාංග සුන්දරි කුමරිය සහ පුත්‍රයා වූ වීරබාහු ආදිපාද කුමරු දළදා වහන්සේ වෙත භාර කළ බවත් පසු ව රන් කරඬු සහ දාගැබ් දළදා වහන්සේ උදෙසා පූජා කරමින් එකී භාරයන්ගෙන් දරුවන් නිදහස් කරගත් බව හැටදාගේ ලිපියෙහි සඳහන් වන අතර ප්‍රීතිදානක මණ්ඩප ලිපියේ ද ඒ බව සඳහන් වේ (*ibid*, pp. 85-90 and p. 170). සමකාලීන ව ලියැවුණු මූලාශ්‍රය කිහිපයක ම රජුගේ දළදා අනුග්‍රහයන් සම්බන්ධයෙන් තොරතුරු සඳහන් වේ (සිංහල මහාවංසය, 2003, 80:18-20 සහ දළදා සිරිත, 1961, පි. 43). මෙම මූලාශ්‍රය විස්තර පිරික්සීමේ දී රජුගේ මැදිහත් වීමෙන් දළදා වහන්සේ උදෙසා ශෛලමය දළදා ගෙයක් කර වූ බව ද හඳුනාගත හැකි ය (සිංහල මහාවංසය, 2003, 80:18-20, පූජාවලිය, 1999, පි. 784 සහ රාජරත්නාකරය, 1995, පි. 105). ගල්පොත සෙල්ලිපිය, ප්‍රීතිදානක මණ්ඩප ලිපියෙහි සහ හැටදාගේ බරාඳයෙහි ඇති ශිලාලේඛන ඒ බව සනාථ කරන සාධක ය (*Epigraphia Zeylanica* Vol. II, 1928, pp. 98-123, p. 170 and p. 87). නිශ්ශංකමල්ල රාජ්‍ය කාලයෙන් අනතුරුව

නැවතත් ලංකා දේශපාලනය තුළ ඇති වුණු ව්‍යාකූලත්වය හේතුවෙන් දේශපාලන අරාජිකත්වයක් ඇති වූ අතර පාලකයන් කිහිපදෙනකු කෙටි කාලයක දී ම බලයට පත් වුණු අතර ඔවුන්ගෙන් සමහරෙක් දළදා වහන්සේ උදෙසා පූර්වයේ පටන් සිදු කෙරුණු පුද පූජා තවදුරටත් පවත්වාගෙන යාමට උනන්දු නොවූ බව පෙනේ.

ලීලාවති රැජිනගේ පාලන කාලයේ දී දළදා වහන්සේගේ ඉතිහාසය සංග්‍රහ කරමින් දාඨාවංසය නමැති ග්‍රන්ථය සම්පාදනය කෙරුණු අතර පොළොන්නරුවේ රාජගුරු චෝළිය තෙරුන් වහන්සේගේ මූලිකත්වයෙන් එම කෘතිය සම්පාදනය කර ඇත (සන්න සහිත දාඨාවංසය, 2000, පි. vii). පරාක්‍රම නම් ඇමතිගේ ආරාධනාවෙන් කෘතිය රචනා කෙරුණු බව එහි විස්තර වන නමුත් මේ කෘතිය සම්පාදනය කිරීම උදෙසා ලීලාවති රැජිනගේ දායකත්වයක් ලැබුණු බව නිශ්චිත ව සඳහන් නොවේ. නිශ්ශංකමල්ල රාජ්‍ය කාලයෙන් පසු ව දළදා වහන්සේ සම්බන්ධයෙන් රාජ්‍ය අනුග්‍රහය හිමි වුණු බව හඳුනා ගැනීමට තරම් වැදගත් තොරතුරු වංසකථා ඇතුළු මූලාශ්‍රය විස්තරවල සඳහන් නොවේ. තත් අවධියේ දී පැවති දේශපාලනික ව්‍යාකූලත්වය සහ බල අරගල හේතුවෙන් පාලකයන් තම තමන්ගේ ආරක්ෂාව සහ ජීවිත රැක ගනිමින් බලය රැක ගැනීමට උනන්දු වූ බැවින් බෞද්ධාගම පිළිබඳ ව උනන්දුවක් නොදක්වන ලදී. පරාක්‍රම පාණ්ඩ්‍ය රාජ්‍ය සමයේ දී එල්ල වූ කාලිංග මාඝ ආක්‍රමණය සහ සමගාමී ව දරුණු ලෙස බෞද්ධ විහාරාරාම විනාශ කිරීම යළිත් ඇරඹිණි (සිංහල මහාවංසය, 2003, 80:52-80). මේ අවස්ථාවේ දී දළදා භාරකාරිත්වය සම්බන්ධ වගකීම් පැවරුණු තෙරුන් වහන්සේලාගේ මූලිකත්වයෙන් දළදා වහන්සේ ආරක්ෂාව පිණිස කොත්මලේ ප්‍රදේශයට වැඩම කරවා සතුරන් අතට පත් නොවන ලෙස සඟවා තැබුණු බව වංසකථාවේ සඳහන් වන අතර නැවතත් රාජකීය අනුග්‍රහය සහිත ව දළදා වහන්සේ උදෙසා පුද සක්කාර කිරීම ආරම්භ වූයේ දඹදෙණියේ රජ පැමිණි තුන්වන විජයබාහු රාජ්‍ය කාලයේ දී ය (පූජාවලිය, 1999, පි. 785).

දඹදෙණියේ ආරම්භක පාලකයා වශයෙන් රාජත්වයට පත් තුන්වන විජයබාහු රජු විසින් කොත්මලේ සඟවා තිබූ දළදා වහන්සේ බෙලිගල පර්වතයේ ඉදි කළ දළදා මන්දිරයෙහි තැන්පත් කළ අතර දළදා වහන්සේ උදෙසා දෛනික ව සහ වාර්ෂික ව සිදු කළ යුතු පුද පූජා-පෙරහැර පවත්වා ඇත. දළදා වහන්සේගේ භාරකාරිත්වය හිමි සංඝ පරපුරට සංඝාරමය පූජා කිරීම සහ දළදා වහන්සේ සහ එහි ආරක්ෂාව භාර තෙරුන් වහන්සේලා උදෙසා පුද පඬුරු නියම කිරීම සඳහා ඇතුළු අනුග්‍රහයන් සිදු කර ඇති අතර මාඝ ආක්‍රමණය හමුවේ නැවත වතාවක් අනාරක්ෂිත තත්ත්වයට පත් දළදා වහන්සේ ආරක්ෂා කිරීමේ කාර්යය ද රජුගේ මැදිහත් වීමෙන් ඉටු වූ බව පෙනේ. මහාවංසය, පූජාවලිය, හත්ථවනගල්ලවිහාර වංසය, දළදා සිරිත, දළදා පූජාවලිය, එළු අත්තනගලු වංසය, දළදා වංසය, රාජරත්නාකරය, රාජාවලිය සහ සුළුරාජාවලිය ඇතුළු මූලාශ්‍රයන්හි තුන්වන විජයබාහු රජුගේ දළදා අනුග්‍රහය සම්බන්ධයෙන් තොරතුරු සඳහන් වේ (සිංහල මහාවංසය, 2003, 81:17-40, පූජාවලිය, 1999, පි. 785, හත්ථවනගල්ල විහාර වංසය, 1982, පිටු. 74-80, දළදා සිරිත, 1961, 43,44, දළදා පූජාවලිය, 1893, 34, එළු අත්තනගලු වංසය, 2008, පි. 68, දළදා වංසය, 1916, පි. 11, රාජරත්නාකරය, 1995, 107,108, රාජාවලිය, 1923, පි. 61 සහ සුළුරාජාවලිය, 1914, පිටු. 15,16). තුන්වන විජයබාහු රජුගේ අනුප්‍රාප්තිකයා වූ දෙවන පරාක්‍රමබාහු රජු දළදා වහන්සේ දඹදෙණියට වැඩම කරවා එහි දළදා මැඳුරක් ඉදි කොට පුද සත්කාර කර ඇත (එළු අත්තනගලු වංසය, 2008, පිටු. 69,70).

දළදා ප්‍රදර්ශනයක් පැවැත් වීම, දළදා වහන්සේ තැන්පත් කිරීම පිණිස කරඬු තුනක් කරවීම, දළදා වහන්සේ උදෙසා විවිධ පූජා පැවැත් වීම, තුන් මසක් නොකඩවා දළදා පූජා පැවැත් වීම සහ දොළොස් වර්ෂයක් පුරා රජුගේ මැදිහත් වීමෙන් දළදා වහන්සේ උදෙසා පහන් පූජා කිරීම ආදී වූ නොයෙක් ආකාරයේ අනුග්‍රහයන් සිදු කළ බව මහාවංසයෙහි මෙන් ම දළදා සිරිත, දළදා පූජාවලිය, පූජාවලිය, රාජරත්නාකරය, දළදා වංසය ඇතුළු මූලාශ්‍රයන්හි ද සඳහන් වෙයි (සිංහල මහාවංසය, 2003, 81:07-53, දළදා සිරිත, 1961, 43,44, දළදා පූජාවලිය, 1893, පි. 35, පූජාවලිය, 1999, පිටු. 787-789, රාජරත්නාකරය, 1995, පිටු. 112-114, දළදා වංසය, 1916, පි. 11). දඹදෙණි රාජධානි සමයේ දී දළදා වහන්සේ පිළිබඳ වැඩි අවධානයක් ලබා දීම සිදු වූ අතර රාජත්වය පැවරීමේ දී දළදා වහන්සේ ද අනුප්‍රාප්තිකයාට පැවරීම සිදු විය (සිංහල මහාවංසය, 2003, 81:78,79). මෙසේ දළදා වහන්සේ සමග රාජ්‍ය පවරා දීමෙන් පෙනී යනුයේ ද තත් අවධියේ දී දළදා වහන්සේ සහ එහි භාරකාරත්වය දේශපාලන බලය ස්ථාවර කිරීමේ සාධකයක් වශයෙන් සැලකුණු බව යි. හතරවන විජයබාහු රාජ්‍ය කාලයේ දී ත් දළදා වහන්සේ උදෙසා රාජ්‍ය අනුග්‍රහය හිමි වූ අතර දළදා ගෙයි නවකම් කරවීම, දළදා සහ පාත්‍රා ධාතූන් වහන්සේගේ ආරක්ෂාව පෙරට වඩා දැඩි කිරීම, පුද පූජා පැවැත් වීම, පොළොන්නරුවේ දළදා ගෙය ප්‍රතිසංස්කරණය කර දළදා වහන්සේ එහි වැඩම කර මහා පූජා පැවැත් වීම ආදී නොයෙක් අනුග්‍රහයන් රජුගේ මූලිකත්වයෙන් සිදු වුණු බව මහාවංසය, පූජාවලිය, රාජරත්නාකරය, දළදා වංසය ඇතුළු මූලාශ්‍රය විස්තර අනුව පැහැදිලි වේ (සිංහල මහාවංසය, 2003, 88:10-16, පූජාවලිය, 1999, පිටු. 799,800, රාජරත්නාකරය, 1995, පි. 116 සහ දළදා වංසය, 1916, පි. 11).

හතරවන විජයබාහු රජුගෙන් පසුව නැවතත් දේශපාලනික වශයෙන් ගැටුම් මතු වූ අතර රාජධානිය ලෙස යාපහුව තෝරා ගන්නා ලදී. පළමුවන බුවනෙකබාහු රජු විසින් දඹදෙණි දළදා මාලිගයේ තැන්පත් කර තිබුණු දළදා වහන්සේ යාපහුවට වැඩම කරවා එහි ඉදි කළ දළදා මැඳුරෙහි තැන්පත් කර ඇත. රජුගේ දළදා අනුග්‍රහය සම්බන්ධයෙන් **මහාවංසය, දළදා වංසය, රාජරත්නාකරය** සහ **සුළුරාජාවලිය** වැනි මූලාශ්‍රයවලින් හඳුනාගත හැකි ය (සිංහල මහාවංසය, 2003, 90:42, දළදා වංසය, 1916, පි. 12, රාජරත්නාකරය, 1995, පි. 116 සහ සුළුරාජාවලිය, 1914, පි. 18). තත් අවධියේ දී දළදා වහන්සේ විදේශීයයන් විසින් පැහැර ගනු ලැබූ බව ද මූලාශ්‍රය විස්තරයෙහි සඳහන් වන අතර මේ අවස්ථාවේ දී දළදා වහන්සේ පැහැරගෙන ගොස් ඇත්තේ පඬි රටින් පැමිණි පිරිසකි (සිංහල මහාවංසය, 2003, 90:43-47). තුන්වන පරාක්‍රමබාහු රජු පාණ්ඩ්‍ය දේශයට ගොස් දළදා වහන්සේ නැවත ලංකාවට වැඩම කරවීමට සමත් වූ අතර ඔහු පොළොන්නරුවේ පැරණි දළදා ගෙය ප්‍රතිසංස්කරණය කර දළදා වහන්සේ එහි තැන්පත් කළේ ය (එම, 90:48-59). මෙසේ නැවත වරක් දළදා වහන්සේ පොළොන්නරුවට වැඩම කෙරුණු නමුත් කලත් ගත වූ පසු කුරුණෑගල අගනුවර කරගත් දෙවන බුවනෙකබාහු රජු විසින් දළදා වහන්සේ තමන් භාරයට ගැනීමට සමත් වූ බව සුළුරාජාවලියෙහි සහ රාජරත්නාකරයෙහි සඳහන් කර ඇත (සුළුරාජාවලිය, 1914, පි. 19 සහ රාජරත්නාකරය, 1995, පි. 117). රජුගේ ඇවෑමෙන් බලයට පත් වූ හතරවන පරාක්‍රමබාහු රජු ද දළදා වහන්සේ සම්බන්ධයෙන් අනුග්‍රහය දැක් වූ බව හඳුනාගත හැකි අතර රාජාංගණයෙහි නව දළදා මැඳුරක් ඉදි කරවන ලද බව කියවෙයි (සිංහල මහාවංසය, 2003, 90:66-72). පාලකයන් මෙලෙස දළදා වහන්සේ වෙත අනුග්‍රහය දැක්වීමෙහි ලා බලපෑ ප්‍රධාන ත ම සාධකය වනුයේ එය මෙරට රාජත්වයේ සංකේතයක් වශයෙන් සැලකීම ය.

රජුගේ මූලිකත්වයෙන් සිදු කෙරුණු මෙම දළදා මාලිගය ඉදි කිරීමේ පුවත දළදා වංසයෙහි ද විස්තර කර ඇත (දළදා වංසය, 1916, පි. 12). මීට අමතරව රාජරත්නාකරය, සුළුරාජාවලිය වැනි මූලාශ්‍රය කිහිපයක ද රජු දළදා පූජා පවත්වන ලද බව විස්තර කර තිබේ (රාජරත්නාකරය, 1995, පි. 118 සහ සුළුරාජාවලිය, 1914, පි. 19). රාජධානි නිරිතදිගට සංක්‍රමණය වූ අවධියේ දී ශාසනික කටයුතු උදෙසා අනුග්‍රහය දක්වන ලද පාලකයන් අතරින් කැපී පෙනෙන හතරවන පරාක්‍රමබාහු රාජ්‍ය කාලයේ දී ශාසනික කටයුතු හා සමගාමී ව සාහිත්‍ය කටයුතු ද දියුණු විය. උගත් ගිහි-පැවිදි පඬිවරුන් විසින් මේ අවධියේ දී පොත්-පත් රචනා කළ අතර දළදා වහන්සේ සහ දළදා පුද පූජා විස්තර අලළා ද කෘති කිහිපයක් රචනා වීම සිදු විණි. දළදා සිරිත සහ දළදා පූජාවලිය තත් අවධියේ දී ලියැවුණු කෘති ලෙස පිළි ගැනේ. මහාවංසයෙහි දැක්වෙන පරිදි දළදා සිරිත පරාක්‍රමබාහු රජු විසින් ලියන ලද්දක් බව කියවුණ ද දෙව්රද දම්පසඟිනා විසින් මෙම කෘතිය ලියන ලද බව දළදා සිරිතෙහි ඇතුළත් පාඨයකින් ම පැහැදිලි වේ (සිංහල මහාවංසය, 2003, 90:77-79 සහ දළදා සිරිත, 1961, පි. 54). පාලි දාඨාවංසය ඇසුරු කර ගනිමින් දළදා වහන්සේ දිවයිනට වැඩම කරවීමේ සිට කුරුණෑගල අවධිය දක්වා තොරතුරු සහ දළදා වහන්සේ වෙනුවෙන් ඉටු කළ යුතු පුද පූජා විස්තර කරමින් මෙම කෘතිය රචනා කර තිබේ.

දළදා පූජාවලිය ද තත් අවධියේ ලියැවුණු කෘතියක් ලෙස සැලකෙන අතර මෙම ග්‍රන්ථයේ කතෘ කවුරුන් ද යන්න අවිනිශ්චිත ය. පාලි දාඨාවංසය සිංහලයට පරිවර්තනය කරමින් මෙම කෘතිය රචනා කර ඇති අතර දාඨාවංසයට අමතර ව එළු දළදා වංසය, මහාවංසය, දීපවංසය, ජිනාලංකාරය, දළදා සිරිත සහ රසවාහිනිය වැනි ප්‍රාථමික මූලාශ්‍රය කිහිපයක් ම මෙම ග්‍රන්ථය රචනා කිරීමේ දී පාදක කරගෙන ඇත. මේ ආකාරයෙන් හතරවන පරාක්‍රමබාහු රාජ්‍ය කාලයේ දී දළදා වහන්සේ පිළිබඳ ව කැපී පෙනෙන අනුග්‍රහයක් හිමි වූ බව හඳුනාගත හැකි අතර නියම කළ පරිද්දෙන් දිනපතා දළදා වහන්සේ උදෙසා පුද සත්කාර කිරීම නොකඩවා සිදු වූ බව පෙනේ. දළදා වංසය පරිශීලනය කිරීමේ දී රජුගේ අනුග්‍රහයෙන් ලියන ලද දළදා සිරිත සහ දළදා පූජාවලිය හැරුණු විට "දාඨාධාතුචරිත්ත" නම් කෘතියක් සම්බන්ධයෙන් ද සඳහන් වන නමුත් සෙසු මූලාශ්‍රයන්හි එවැනි කෘතියක් පිළිබඳ ව කිසිදු තොරතුරක් ඇතුළත් නොවේ (දළදා වංසය, 1916, පි. 12). දළදා සාහිත්‍යයක් නිර්මාණය වීමෙහි ලා ද බලපෑවේ ආගමික වශයෙන් මෙන් ම දේශපාලන ක්ෂේත්‍රය තුළ ද දළදා වහන්සේ වෙත ඉහළ පිළි ගැනීමක් ලැබීම ය. කුරුණෑගල නුවර රජ පැමිණි පස්වන විජයබාහු රජුගේ පුත්‍රයන් වූ හතරවන බුවනෙකබාහු සහ පස්වන පරාක්‍රමබාහු අතර රාජ්‍ය පාලනය බෙදී ගිය බැවින් දේශපාලනික වශයෙන් ව්‍යාකූලත්වයක් ඇති විණි. ගම්පොළ මුල් කරගෙන පාලන කටයුතු සිදු කළ හතරවන බුවනෙකබාහු රජු ඇවෑමෙන් බලයට පත් තුන්වන වික්‍රමබාහු රාජ්‍ය කාලයේ දී දළදා වහන්සේ උදෙසා පුද සත්කාර පැවැත් වූ බව හඳුනාගත හැකි ය.

නමුත් කුරුණෑගල දළදා මාලිගාවෙහි තැන්පත් කර තිබුණු දළදා වහන්සේ ගම්පොළ වෙත වැඩම කළේ කුමන අවස්ථාවක දී ද? කවුරුන්ගේ මූලිකත්වයෙන් ද? යන්න පැහැදිලි නොවන අතර මූලාශ්‍රය විස්තරවල ද මේ පිළිබඳ ව සඳහන් නොවේ. කෙසේ නමුත් තුන්වන වික්‍රමබාහු රාජ්‍ය කාලයේ දී දළදා වහන්සේ වෙත ධන ධාන්‍යයෙන් අනුග්‍රහය දක්වන ලද බව හඳුනාගත හැකි අතර විගුලවත්ත සෙල්ලිපිය මෙන් ම නියම්ගම්පාය විහාර ලිපිය ද මෙහි ලා නිදසුන් ය (ධීරානන්ද හිමි, 2016, පිටු. 190-195). ඒ අනුව තුන්වන වික්‍රමබාහු රජුගේ පාලන කාලයේ දී දළදා වහන්සේ රජුගේ භාරයෙහි පවතින්නට ඇති බව අනුමාන කළ

හැකි අතර මෙම සෙල්ලිපිවල තොරතුරු එවැනි අනුමානයකට හේතු සපයයි. විගුලවත්ත සෙල්ලිපියේ එන තොරතුරු අනුව රජු ගම්පොළ පිහිටි කුඹුරු යායක් අස්වද්දා එයින් ලැබූ අස්වැන්න දළදාවට පිදූ බව කියවෙයි (විජයවර්ධන, 2012, පිටු. 208-210). දැනට පුරාවිද්‍යා කැණීම් මගින් අනාවරණය කරගෙන ඇති නියම්ගම්පාය විහාරයෙහි දළදා වහන්සේ තැන්පත් කර තිබූ බැවින් ද තත් අවධියේ දී දළදා වහන්සේ ගම්පොළ ප්‍රදේශයේ වැඩ සිටි බව නිවැරදි අනුමානයක් යැයි හැඟේ. ගම්පොළ තුන්වන වික්‍රමබාහු රජුගෙන් පසු ව බලයට පත් පස්වන බුවනෙකබාහු රජු ද ජයවර්ධන කෝට්ටේ ප්‍රදේශය සිය අගනුවර ලෙස පවත්වාගෙන යමින් දළදා වහන්සේ උදෙසා ද පුද පූජා පවත්වන ලද බව මහාවංස විස්තරයෙහි දැක්වෙයි (සිංහල මහාවංසය, 2003, 91:06-09).

පස්වන බුවනෙකබාහු රජුගේ ඇවෑමෙන් පසු බලයට පත් වීරබාහු කුමරු විසින් ද දළදා වහන්සේ උදෙසා අනුග්‍රහය දැක් වූ බව හඳුනාගත හැකි අතර අස්ගිරි තල්පතෙහි ඇතුළත් විස්තරය අනුව රජුගේ කාලයේ දී දළදා වහන්සේ ජයවර්ධන කෝට්ටේ වෙත වැඩම කරවා ඇත (අස්ගිරි තල්පත, 1997, පි. 09). නමුත් වෙනත් මූලාශ්‍රයක මෙබඳු තොරතුරක් සඳහන් නොවන අතර අස්ගිරි තල්පතෙහි ඇතුළත් විස්තරය නිවැරදි නම් පස්වන බුවනෙකබාහු රාජ්‍ය කාලයේ දී දළදා වහන්සේ ගම්පොළ ම තැම්පත් කර තිබුණා විය යුතු ය. නමුත් සෙසු කිසිදු ප්‍රාථමික මූලාශ්‍රයක මෙවැනි තොරතුරක් වාර්තා නොවූයේ ඇයි ද? යන සැකය නිසා නිශ්චිත ව ම මෙම අදහසට එකඟ වීම දුෂ්කර ය. වීරබාහු රජු දළදා වහන්සේ උදෙසා බොහෝ පුද සත්කාර සිදු කළ බව එළු දළදාවංසයෙහි ද විස්තර කර තිබේ. දළදා වහන්සේ සම්බන්ධයෙන් රාජ්‍ය අනුග්‍රහය හිමි වුණු අවස්ථා අතරින් මීළඟට සාකච්ඡා කිරීමට ඇත්තේ කෝට්ටේ හයවන පරාක්‍රමබාහු රාජ්‍ය කාලය පිළිබඳ ව ය. දළදා වහන්සේ ද ඇතුළු ව බෞද්ධාගමෙහි චිරස්ථිතිය පිණිස කැපී පෙනෙන සේවයක් ඉටු කළ හයවන පරාක්‍රමබාහු රජු කෝට්ටේ නුවර තෙමහල් දළදා මන්දිරයක් ඉදි කර ඇති අතර සැළලිහිණි සන්දේශය, ගිරා සන්දේශය සහ හංස සන්දේශය වැනි සන්දේශ කාව්‍යයන්හි ද මෙම දළදා මන්දිරයෙහි රමණීයත්වය වර්ණනාවට ලක් කර තිබේ (සැළලිහිණි සන්දේශය, 1990, පි. 19, වියරණ විනිස සහිත ගිරා සඳෙස, 2007, පි. 32 සහ හංස සන්දේශය, 1979, පිටු. 23,24).

දළදා මන්දිරයක් ඉදි කළ රජු රන් කරඬු කිහිපයක් ද දළදා වහන්සේ උදෙසා පූජා කර ඇති අතර මහාවංස විස්තරයේ දී රජුගේ දළදා අනුග්‍රහය සම්බන්ධයෙන් දීර්ඝ විස්තර ඉදිරිපත් කරයි (සිංහල මහාවංසය, 2003, 91:17-20). රාජරත්නාකරය, සුළුරාජාවලිය සහ දළදා වංසය වැනි මූලාශ්‍රය තුළ ද රජුගේ දළදා පූජා සම්බන්ධයෙන් විස්තර සඳහන් වේ (රාජරත්නාකරය, 1995, පි. 118, සහ සුළුරාජාවලිය, 1914, පි. 20 සහ දළදා වංසය, 1916, පි. 12). ආගමික ශාසනික කටයුතු සම්බන්ධයෙන් ස්වර්ණමය කාල පරිච්ඡේදයක් කෝට්ටේ හයවන පරාක්‍රමබාහු රාජ්‍ය කාලයේ දී ඇති වුණු බව නොරහසක් වන නමුත් රජුගේ ඇවෑමෙන් පසු යළිත් දේශපාලනික ව්‍යාකුලතාවයන් ඇති විණි. ධර්ම පරාක්‍රමබාහු රාජ්‍ය කාලයේ දී ත් දළදා වහන්සේ උදෙසා රාජ අනුග්‍රහය හිමි වූ අතර දුෂ්කරතා මධ්‍යයේ වුවත් හත්වන විජයබාහු රජු ද දළදා වහන්සේ උදෙසා සිදු කළ පුද පූජා ඉටු කිරීමට උනන්දු වූ බව පෙනේ. නමුත් කෝට්ටේ පාලකයා ලෙස බලයට පත් ධර්මපාල කුමරු පෘතුගීසි පක්ෂය ගැනීම සහ බෞතීස්ම වීම වැනි කරුණු නිසා බෞද්ධාගම පරිහානිය කරා ගමන් කළ අතර තත් අවධියේ දී දළදා වහන්සේගේ භාරකාරිත්වය සම්බන්ධයෙන් ක්‍රියා කළ සියනෑ කෝරළේ හිරිපිටියේ දීවනරාළ අප්‍රසිද්ධ ව ම දළදා වහන්සේ සීතාවක ප්‍රදේශයට වැඩම කරවී ය. මේ සිදුවීම

හා සමගාමී ව එතෙක් කෝට්ටේ රාජධානියෙහි තැන්පත් කර තිබූ දළදා වහන්සේ කෝට්ටේ රාජධානියට අහිමි විය. මේ ආකාරයෙන් අනුරාධපුර කිත්සිරිමෙවන් රාජ්‍ය කාලයේ සිට කෝට්ටේ ධර්මපාල රාජ්‍ය කාලය දක්වා දළදා වහන්සේ රාජ්‍යයේ රජුගේ භාරයෙහි පවත්වාගෙන යමින් පුද සිරිත් නොකඩවා ඉටු කිරීම සිදු වූ බවත් දළදා වහන්සේ උදෙසා රාජානුග්‍රහය හිමි වූ බවත් හඳුනාගත හැකි ය. මුල් අවධියේ දී දළදා වහන්සේ වනාහි බෞද්ධාගමික පූජනීය සංකේතයක් වශයෙන් සලකා වන්දනාමානයට ලක් කෙරුණු නමුත් පොළොන්නරු යුගයේ සිට ක්‍රමානුකූල ව දළදා වහන්සේගේ භාරකාරිත්වය රාජ්‍ය බලය සංකේතවත් කරන පළමු පෙළේ සාධකයක් බවට පත් විය. කිත්සිරිමෙවන් රාජ්‍ය සමයේ සිට කෝට්ටේ ධර්මපාල රාජ්‍ය කාලය දක්වා වූ සමයේ දී මෙරට රාජත්වයට පත් රජුන් 116ක් අතරින් කැපී පෙනෙන පාලකයන් සංඛ්‍යාවක් දළදා වහන්සේ උදෙසා පූර්වයේ සිට සිදු කෙරුණු පුද පූජා සහ චාරිත්‍ර ඉටු කළ බව මූලාශ්‍රය විස්තර පරීක්ෂා කිරීමෙන් හඳුනාගත හැකි ය. දළදාවේ භාරකාරිත්වය පවත්වාගෙන යමින් දළදා වහන්සේ ආරක්ෂා කිරීම, පුද සත්කාර කිරීම ද දේශපාලන අධිකාරිය ප්‍රදර්ශනය කිරීම හා බැඳී පැවති අතර දළදා වහන්සේගේ භාරකාරිත්වය ආරක්ෂා කර ගැනීමට පාලකයන් උනන්දු විය.

නිගමනය

ඉහත සාකච්ඡා කළ කරුණු මගින් කිත්සිරිමෙවන් රාජ්‍ය කාලයේ සිට ධර්මපාල රාජ්‍ය කාලය තෙක් ලාංකේය පාලකයන් දළදා වහන්සේ උදෙසා සිදු කළ අනුග්‍රහයන් හඳුනාගැනුණු අතර දේශපාලන බලය ස්ථාවර කර ගැනීමේ අභිලාසයෙන් දළදා වහන්සේ භාවිත කිරීමට ඇතැම් පාලකයන් නොපසුබට වූ බව පැහැදිලි ය. දේශපාලන ව්‍යාකූලත්වය වැනි තත්ත්වයන් හමුවේ දළදාවේ භාරකාරිත්වය මගින් ජනතා සහයෝගය දිනා ගැනීමට ද අවස්ථාව සැලසිණි. අභිෂේකය සම්පූර්ණ වීමට දළදාවේ භාරකාරිත්වය වැදගත් විය. පොළොන්නරු රාජධානි සමයේ දී මේ තත්ත්වය කැපී පෙනෙන ලෙස ප්‍රදර්ශනය විය. දළදා මාලිගා ඉදිකිරීම සම්බන්ධ ව අවධානය යොමු කිරීමේ දී ද පාලකයන් සෑමවිට ම එහි ආරක්ෂාව සම්බන්ධයෙන් අවධානය යොමු කළ බව හඳුනාගත හැකි ය. දළදා මන්දිර ඉදි කිරීමේ දී රජ මාලිගයට සමීප ස්ථානයක එය ඉදි කිරීම සාමාන්‍යයෙන් සිදු වී ඇති අතර පුරාවිද්‍යා කැණීම් මගින් හඳුනාගත් තොරතුරු මගින් ද ලිඛිත සාධක මගින් ද ඒ බව තහවුරු වේ. දළදා මාලිගය රජ මාලිගය සමීපයේ ඉදි කිරීම පූර්ව පාලකයන් පූර්වාදර්ශයට ගනිමින් සිරිතක් මෙන් සිදු කළ අතර දළදා වහන්සේ මාලිගය සමීප ස්ථානයක තැන්පත් කිරීම මගින් දළදාව රජුගේ භාරයෙහි පවතින බව සියලු දෙනාට ඒත්තු ගැන්වීමක් හා සමාන විය. ජීවමාන බුදුන් වහන්සේ ලෙස වන්දනයට පාත්‍ර වන දළදා වහන්සේ තම අනුග්‍රහය යටතේ සිය මාලිගය සමීපයේ තබා ගැනීම රජුගේ බලය වර්ධනය කිරීමට ඉවහල් වූ අතර එය හුදෙක් බෞද්ධ ජනතාවගේ සහයෝගය රජු වෙත ලැබීමට ද හේතු විය. රාජකීය ආරක්ෂක විධි විධාන යටතේ දළදා වහන්සේ වඩා හිදුවීම ද දේශපාලන බලය ස්ථාවර කරගැනීමේ දී දළදා වහන්සේ වැදගත් වූ බවට නිදසුනකි. රාජ්‍යයේ පළමු පුරවැසියා වශයෙන් දළදා වහන්සේ උදෙසා සිය අනුග්‍රහය සහිත ව පුද පූජා පැවැත් වීම සහ දළදා ප්‍රදර්ශන ආදියට අනුග්‍රහය දැක්වීම හරහා ද රට වැසියාගේ සහයෝගය සහ පක්ෂපාතීත්වය ලබා ගැනීමට ඉඩකඩ ලැබුණි. බුදුදහම සහ බෞද්ධ ඉගැන්වීම් ප්‍රමුඛ කරගත් ලංකා සමාජය තුළ "පාලකයා බෞද්ධයකු විය යුතු ය" වැනි ආකල්ප හමුවේ ජීවමාන බුදුන් වහන්සේ ලෙස සැලකෙන දළදා වහන්සේ උදෙසා අනුග්‍රහය දක්වමින් රට වැසියාගේ සහයෝගය දිනා ගැනීමට පාලකයෝ උත්සාහ කළහ. ශ්‍රී ලාංකේය

දේශපාලන ඉතිහාසය පරීක්ෂා කර බැලීමේ දී බලය තහවුරු කර ගැනීමේ සංකේතයක් ලෙස දළදාව භාවිත කෙරුණු බව අනාවරණය වේ. එහි දී අභිෂේකය සහ පාලන බලය නීත්‍යානුකූල වීමට දළදා වහන්සේගේ භාරකාරිත්වය අත්‍යවශ්‍ය සාධකයක් සේ සැලකුණි. දළදා වහන්සේ උදෙසා අනුග්‍රය දැක්වීම, දළදා මන්දිරය රජ මාලිගය සමීපයේ ඉදිකිරීම සහ එය සිරිතක් මෙන් ඉදිරියට පවත්වාගෙන යාම, රාජකීය ආරක්ෂක විධිවිධාන යටතේ දළදා වහන්සේ වඩා හිඳුවීම, රාජානුග්‍රහය සහිත ව දළදා පුද පූජා පැවැත් වීම, දේශීය-විදේශීය තර්ජන හමුවේ දළදා වහන්සේ රැක ගැනීම උදෙසා කටයුතු කිරීම වැනි කාර්යයන් පාලකයන්ගේ මැදිහත් වීමෙන් සිදු වීම හා සමගාමී ව මෙරට දේශපාලන ව්‍යුහය තුළ දළදා වහන්සේ වෙත ඉහළ පිළි ගැනීමක් හිමි වූ බව පැහැදිලි ය. පාලකයා දළදාවේ භාරකරු වශයෙන් ක්‍රියා කිරීම ම ශ්‍රී ලාංකේය දේශපාලන ව්‍යුහය බෞද්ධාගම පෙරටු කරගත් බෞද්ධ පාලන තන්ත්‍රයක් වශයෙන් සකස් වීමෙහි ලා හේතු වූ මේ අනුව හඳුනාගත හැකි ය.

ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය

අමරවංශ හිමි, කොත්මලේ. 2017. **ලක්දිව සෙල්ලිපි.** ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ.

අස්ගිරි තල්පත. 1997. මැන්දිස් රෝහණදීර (සංස්.). මහරගම, තරංජි ප්‍රින්ට්ස්.

ආනන්ද, පන්නිල. 1967. **දළදා ඉතිහාසය.** මංගල මුද්‍රණාලය.

එළු අත්තනගලු වංසය. 2008. වී.ඩී.එස්. ගුණවර්ධන. (සංස්.). ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ.

කහඳ, ජී. එෆ්. 1986. **දළදා පුරාණය සහිත සිරි දළදා ගීත.** සීමා සහිත ලේක්හවුස් ඉන්වෙස්මන්ට් සමාගම.

ධීරානන්ද හිමි, කහටපිටියේ. 2016. **ගම්පොළ යුගය.** ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ.

දළදා පූජාවලිය. 1893. කේ.එම්. පෙරේරා. (සංස්.). විද්‍යාසාගර යන්ත්‍රණාලය.

දළදා වංසය. 1916. ආර්. ඩී. අල්විස්. (සංස්.). ලංකාප්‍රදීප මුද්‍රණාලය.

දළදා සිරිත. 1961. වැලිවිටියේ සොරත. (සංස්.). ඇම්. ඩී. ගුණසේන සහ සමාගම.

දාඨාවංස. 2000. රන්ජිත් වනරත්න. (සංස්.). සමයවර්ධන මුද්‍රණාලය.

දීඝනිකායට්ඨකථා I කොටස. 2008. දයා ගුණසේකර සහ පී. එල්. කේ. පෙරේරා. (පරි.). බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය.

දීඝ නිකාය 2 කොටස. 2005. ත්‍රිපිටක සම්පාදක මණ්ඩලය. (සම්.). බෞද්ධ සංස්කෘතික දෙපාර්තමේන්තුව.

නලාටධාතුවංසය. 1972. කඹුරුපිටියේ නන්දරතන හිමි. (සංස්.). (අමුද්‍රිත).

නිකාය සංග්‍රහය. 1922. සයිමන් ද සිල්වා. (සංස්.). රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව.

පූජාවලිය. 1951. කිරිඇල්ලේ ඤාණවිමල හිමි. (සංස්.). ඇම්. ඩී. ගුණසේන සහ සමාගම.

මුදියන්සේ, නන්දසේන. 1997. **ලංකාවේ ද්‍රවිඩ සිහිවටන.** ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ.

රාජරත්නාකරය. 1995. කරුණාදාස රූපසිංහ. (සංස්.). ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ.

රාජාවලිය. 1923. වටුවත්තේ පේමානන්ද හිමි. (සංස්.). මහාබෝධි මුද්‍රණාලය.

වජිර හිමි, කඹුරුගමුවේ. 2008. **දළදා ඉතිහාසය සහ සංස්කෘතිය.** ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ.

විජයවර්ධන, කුසුම්සිරි. 2012. **සිරිලක දළදා මාලිගා.** දයාවංශ ජයකොඩි සහ සමාගම.

වියරණ විනිස සහිත ගිරා සඳෙස. 2007. රංජිත් සේනානායක, (සංස්.). නීට් ග්‍රැෆික්.

සන්න සහිත දාඨාවංසය. 2000. වැගම පියරතන හිමි. (සංස්.). ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ.

සැළලිහිණි සන්දේශය. 1990. සිරිසේන විතානගේ. (සංස්.). ගොඩගේ සහ සමාගම.

සිංහල ධාතුවංශය. 2012. විජේරත්න, විමල් විජේරත්න. (සංස්.). ඇස්. ගොඩගේ සහ සමාගම.

සිංහල මහාවංසය. 2003. බෞද්ධ සංස්කෘතික දෙපාර්තමේන්තුව. (සංස්.). බෞද්ධ සංස්කෘතික දෙපාර්තමේන්තුව.

සුළුරාජාවලිය. 1914. සී. ඩී. එස්. කේ. ජයවර්ධන, (සංස්.). විද්‍යාලෝක මුද්‍රණාලය.

සෙනෙවිරත්න, අනුරාධ. 2001. **සිරි දළදා වරුණ**. ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ.

හංස සන්දේශය. 1979. ජී. බී. එස්. සේනානායක. (සංස්.). ප්‍රදීප ප්‍රකාශකයෝ.

හත්ථවනගල්ල විහාර වංසය. 1982. උතුරාවල ධම්මරතන හිමි, (සංස්.). සමයවර්ධන මුද්‍රණාලය.

හේරත්, ධර්මරත්න සහ කාරියවසම්, සුගත්. 2014. දළදා ඉතිහාසය හා පුද සිරිත්. හෙට්ටිආරච්චි, එස්. බී. සහ තවත් අය (සංස්.). **අසිරිමත් කෝට්ටේ-ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ ඉතිහාසයක්.** කොළඹ. රාජ්‍ය මුද්‍රණ දෙපාර්තමේන්තුව.

Epigraphia Zeylanica Vol. II, 1928. D. M. De. Z. Wikramasinghe. (Ed.). Oxford university press.

Gunawardhana, R.A.H.L. 1978, ***Robe Plough***, Arizona.

Harvey, G.E. 1925, ***History of Burma***, London, Green & Co.

අනුරාධපුර යුගයේ ආරාමික රෝහල් පද්ධතිය තුළ පැවති සනීපාරක්ෂක හා අපද්‍රව්‍ය කළමනාකරණ තාක්ෂණය පිළිබඳ අධ්‍යයනයක්.

ආර්. එම්. නිමේෂා සුරංජී

පාලි හා බෞද්ධ අධ්‍යයනාංශය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය

nimeshasuranji6@gmail.com

සංක්ෂිප්තය

අනුරාධපුර යුගය ශ්‍රී ලංකාවේ සෞඛ්‍ය සේවා ඉතිහාසයේ සුවිශේෂී යුගයක් ලෙස සැලකේ. එම යුගයේ ආරාමික රෝහල් පද්ධතිය තුළ රෝගීන්ගේ ප්‍රතිකාර කටයුතු පමණක් නොව, සනීපාරක්ෂාව සහ අපද්‍රව්‍ය කළමනාකරණය පිළිබඳ ද විධිමත් ක්‍රමවේදයන් අනුගමනය කර ඇති බවට පුරාවිද්‍යාත්මක සාධක, ඓතිහාසික මූලාශ්‍ර සහ සාහිත්‍ය මූලාශ්‍ර මගින් අවධානය යොමු කර ඇත. එහෙත් මෙම සනීපාරක්ෂක හා අපද්‍රව්‍ය කළමනාකරණ තාක්ෂණයන් පිළිබඳ විධිමත් අධ්‍යයන සාපේක්ෂ වශයෙන් සීමිතය. ඒ අනුව, අනුරාධපුර යුගයේ ආරාමික රෝහල් පද්ධතිය තුළ භාවිතයට ගෙන තිබූ සනීපාරක්ෂක හා අපද්‍රව්‍ය කළමනාකරණ තාක්ෂණයන්ගේ ස්වභාවය, සංවිධානය සහ ඒවායේ ඓතිහාසික වැදගත්කම විමර්ශනය කිරීම මෙම පර්යේෂණයේ ප්‍රධාන අරමුණ වේ.

මෙම අධ්‍යයනය ගුණාත්මක පර්යේෂණ ක්‍රමවේදය අනුගමනය කරන අතර, ද්විතීයික මූලාශ්‍ර ලෙස වංශකතා තොරතුරු, ශිලා ලේඛන වාර්තා සහ කැණීම් වාර්තා භාවිතා කරනු ලැබේ. ප්‍රාථමික මූලාශ්‍ර ලෙස, අදාළ රෝහල් බිම්වල නටබුන් සහ වාස්තු විද්‍යාත්මක සැලසුම් නිරීක්ෂණය කරනු ඇත. මෙහි දී විශේෂ අවධානයක් යොමු කරනු ලබන්නේ එකල පැවති පෙරහන් පද්ධති සහ අපද්‍රව්‍ය බැහැර කිරීමේ නල පද්ධතින් වෙත ය. මෙහි දී විශේෂයෙන් ම වැසිකිළි පද්ධතිවල දක්නට ලැබෙන්නා වූ පිටාර ටැංකි සහ ස්ථර කිහිපයකින් යුත් අවසාදිත ටැංකි හරහා ජලය පිරිපහදු කොට ස්වභාවධර්මයට මුදා හැරීමෙන් එකල පැවති ඉහළ ඉංජිනේරුමය ඥානය ප්‍රකටව පෙනෙ යි.

එමෙන් ම මෙම අධ්‍යයනය මගින් අනාවරණය කරගන්නා වූ කරුණු අතර, රෝහල් ගොඩනැගිලි සැලසුම් කිරීමේ දී ස්වභාවික ආලෝකය සහ වාතාශ්‍රය උපරිමයෙන් ලබා ගැනීම සඳහා භාවිත කළ වාස්තු විද්‍යාත්මක උපක්‍රම රෝග පාලනයට සෘජුව ම දායක වී ඇති බව පෙනී යයි. එමෙන් ම, ඖෂධීය ඔරු පිරිසිදු කිරීමේදී භාවිත කළ ක්‍රමවේද සහ රෝහල් භූමිය තුළ ජලය එකතැන පල් නොවන සේ සකස් කළ කාණු පද්ධති මගින් මදුරුවන් වැනි රෝග වාහකයින් බෝවීම වැළැක්වූ ආකාරය විද්‍යාත්මක පසුතලයකින් යුක්ත ය. මෙම පර්යේෂණය මගින් අවසාන වශයෙන් පෙන්වා දෙනුයේ, අනුරාධපුර යුගයේ පැවති වෛද්‍ය ක්‍රමය තුළ සනීපාරක්ෂාව යනු හුදෙක් පිළිවෙතක් නොව, රෝගීන් සුවපත් කිරීමේ ක්‍රියාවලිය හා බද්ධ වූ අත්‍යවශ්‍ය තාක්ෂණික මෙවලමක් වූ බව ය. මෙම දේශීය දැනුම නූතන තිරසාර රෝහල් කළමනාකරණ ආකෘතීන් සඳහා ද පූර්වාදර්ශයක් ලෙස යොදා ගැනීමට හැකිවනු ඇත.

ප්‍රමුඛ පද -: මිහින්තලය, අනුරාධපුර, සනීපාරක්ෂාව, අපද්‍රව්‍ය, කළමනාකරණය, තාක්ෂණය

හැඳින්වීම

ලක්දිව ඉතිහාසයේ ස්වර්ණමය යුගය ලෙස හැඳින්වෙන්නේ අනුරාධපුර යුගය යි. මෙම යුගය හුදෙක් වාරි තාක්ෂණයෙන් හෝ ආගමික පුනරුදවලට පමණක් සීමා වූවක් නොව, විධිමත් සෞඛ්‍ය කළමනාකරණ පද්ධතියකින් ද පොහොසත් වූ සමයක් වන්නේ ය. ලොව පැරණිතම රෝහල් පද්ධතීන් පිළිබඳ සාධක හමුවනු ලබන්නේ මෙම යුගයේදී ය. **ආරාමික රෝහල් යනු හුදෙක් රෝගීන්ට ප්‍රතිකාර කළ මධ්‍යස්ථාන පමණක් නොව මෙහි ඉතා දියුණු සනීපාරක්ෂක හා අපද්‍රව්‍ය කළමනාකරණය පිළිබඳ ඉංජිනේරු විද්‍යාවන් අත්හදා බැලූ පරිශ්‍රයන් ද විය (ගයිගර්, 1912).** පවතින ඓතිහාසික හා පුරාවිද්‍යාත්මක සාහිත්‍යය තුළ අනුරාධපුර යුගයේ වෛද්‍ය විද්‍යාව හෝ වාස්තු විද්‍යාව පිළිබඳ සලකා බැලීම් බහුලව පැවතිය ද, එම රෝහල් පද්ධතිය තුළ ක්‍රියාත්මක වූ අපද්‍රව්‍ය කළමනාකරණ තාක්ෂණය සහ එහි විද්‍යාත්මක පදනම පිළිබඳව ගැඹුරු ශාස්ත්‍රීය ගවේෂණයන් සිදු වී ඇත්තේ ඉතාමත් අල්ප වශයෙනි. එබැවින් මෙම පර්යේෂණ පත්‍රිකාව මගින් පුරාවිද්‍යාත්මක සාධක නූතන පාරිසරික ඉංජිනේරු විද්‍යාව සමග ගලපමින් එම අඩුව පිරවීමට උත්සාහ කරන්නේ ය.

අනුරාධපුර යුගයේ රෝහල් පරිශ්‍රයන් වන, මිහින්තලයේ ආරාමික රෝහල, ආලාහන පිරිවෙන සහ මැදිරිගිරිය වැනි ස්ථානයන්හි නටබුන් පිරික්සීම මගින් පෙනී යන්නා වූ සුවිශේෂී කරුණක් නම්, මේවායෙහි රෝගී සත්කාරයන්ට සමාන්තරව සනීපාරක්ෂාව සඳහා ලබා දී තිබූ ඉහළ ප්‍රමුඛතාවය යි. මෙහි රෝහල් ගොඩනැගිලි සැලසුම් කිරීමේ දී ආසාදන පාලනය සඳහා ස්වභාවික ආලෝකය සහ ක්‍රමවත් වාතාශ්‍රය ලැබෙන පරිදි මධ්‍ය මිදුලවල් සහිත වාස්තු විද්‍යාත්මක රටා භාවිත කර ඇත්තේ ය. එමෙන් ම, **රෝහලකින් පිටවන අපවිත්‍ර ද්‍රව්‍ය සහ ඖෂධ අපද්‍රව්‍ය පරිසරයට මුදා හැරීමට පෙර ඒවා පිරිපහදු කිරීම සඳහා අවශ්‍ය අවසාදිත ටැංකි සහ ස්ථර කිහිපයකින් යුත් වැලි හා ගල් පෙරහන් භාවිත කර තිබීම මෙහි පවත්නා උසස් තාක්ෂණික ලක්ෂණයක් වන්නේ ය (බන්ඩාරනායක, 1974).** මෙය නූතන අපජල පිරිපහදු මූලධර්මයන්ට අතිශය සමාන වන්නකි.

මෙම පර්යේෂණය මගින් මූලික වශයෙන් ප්‍රශ්න කරනු ලබන්නේ, අනුරාධපුර යුගයේ ආරාමික රෝහල් පද්ධතිය තුළ රෝගී සත්කාරය හා බැඳුණු සනීපාරක්ෂක ප්‍රමිතීන් පවත්වාගෙන යාම සඳහා භාවිත කළ දේශීය තාක්ෂණික ක්‍රමවේද සහ අපද්‍රව්‍ය බැහැර කිරීමේ පද්ධතීන්හි විද්‍යාත්මක පදනම කෙබඳු ද යන්න යි. මෙහි දී විශේෂයෙන් ම මූත්‍රා ගල් වැනි අංගයන්හි ඇති ජල විද්‍යාත්මක සැලසුම් මගින් දුර්ගන්ධය සහ විෂබීජ පැතිරීම අවම කිරීමට ගත් උත්සාහය මෙහි දී තාක්ෂණිකව විග්‍රහ කෙරේ. හුදෙක් ඓතිහාසික විස්තර කිරීමකට එහා ගිය ගවේෂණාත්මක අධ්‍යයනයක් ලෙස, මෙම පර්යේෂණය මගින් අතීත ඉංජිනේරු ඥානය සහ වෛද්‍ය විද්‍යාව අතර පැවති ඒකාබද්ධතාවය පරීක්ෂා කරයි. මෙමගින් අනාවරණය කරගන්නා කරුණු, නූතන තිරසාර සහ පරිසර හිතකාමී රෝහල් පද්ධතීන් නිර්මාණය කිරීම සඳහා මූලාකෘතියක් ලෙස භාවිත කිරීමේ විභවය හඳුනා ගැනීම පර්යේෂණයට පසුබිම් විය.

අරමුණ

අනුරාධපුර යුගයේ ආරාමික රෝහල් පද්ධතිය තුළ භාවිත වූ සනීපාරක්ෂක හා අපද්‍රව්‍ය කළමනාකරණ තාක්ෂණයන්ගේ ස්වභාවය, සංවිධානය සහ ඓතිහාසික වැදගත්කම විමර්ශනය කිරීමයි.

ක්‍රමවේදය -: ගුණාත්මක පර්යේෂණ ක්‍රමවේදය භාවිත කරන ලදී.

මෙම පර්යේෂණය සඳහා ගුණාත්මක පර්යේෂණ ක්‍රමවේදය භාවිත කර ඇති අතර, අනුරාධපුර යුගයේ ආරාමික රෝහල් පද්ධතිය තුළ පැවති සනීපාරක්ෂක හා අපද්‍රව්‍ය කළමනාකරණ ක්‍රම පිළිබඳ තොරතුරු විවිධ මූලාශ්‍ර ඔස්සේ රැස් කර විශ්ලේෂණය කර ඇත. ඒ සඳහා වංශකතා, ශිලා ලේඛන, කැණීම් වාර්තා සහ පුරාවිද්‍යාත්මක මූලාශ්‍ර වැනි ද්විතීයික මූලාශ්‍ර මෙන්ම රෝහල් නටබුන් හා ඒවායේ වාස්තු විද්‍යාත්මක සැලසුම් වැනි ප්‍රාථමික සාධක ද යොදාගෙන තිබේ. එම තොරතුරු අතරින් රෝහල් සැලසුම්, ස්වභාවික ආලෝකය හා වාතාශ්‍රය, ජල කළමනාකරණය, අපද්‍රව්‍ය බැහැර කිරීම, ස්වභාවික පෙරහන් සහ සනීපාරක්ෂක ක්‍රම වැනි ප්‍රධාන කරුණු හඳුනාගෙන ඒවා විෂය අනුව වෙන්කර ගනිමින් සන්ධාරණාත්මක ආකාරයෙන් විශ්ලේෂණය කර ඇත. විවිධ මූලාශ්‍රවලින් ලැබුණු කරුණු එකිනෙක සම්බන්ධ කරමින් හා සංසන්දනය කරමින් අනුරාධපුර යුගයේ රෝහල් පද්ධතිය තුළ පැවති සනීපාරක්ෂක හා අපද්‍රව්‍ය කළමනාකරණ ක්‍රමවේදයේ ස්වභාවය හඳුනාගෙන ඇත.

ප්‍රතිඵල

ඉහත ක්‍රමවේදය මඟින් අනුරාධපුර යුගයේ ආරාමික රෝහල්වල සනීපාරක්ෂාව හා අපද්‍රව්‍ය කළමනාකරණය ක්‍රමානුකූලව සංවිධානය වූ තාක්ෂණික පද්ධතියක් බව හඳුනාගෙන ඇත. විශේෂයෙන් ස්වභාවික ආලෝකය හා වාතාශ්‍රය උපරිම ලෙස ලබාගැනීම සඳහා රෝහල් ගොඩනැගිලි සැලසුම් කිරීම, අපද්‍රව්‍ය හා අපිරිසිදු ජලය සෘජුව පරිසරයට මුදා නොහැර විශේෂ පෙරහන් ක්‍රම භාවිත කිරීම, වැලි, බොරළු හා අඟුරු වැනි ස්වභාවික ද්‍රව්‍ය මඟින් ජලය පිරිසිදු කිරීම සහ මළ හා මූත්‍රා අපද්‍රව්‍ය සඳහා වෙනම කළමනාකරණ ක්‍රම භාවිත කිරීම වැනි ක්‍රම පැවති බව හෙළි වී තිබේ. ඒ අනුව අනුරාධපුර යුගයේ පැවති සනීපාරක්ෂක හා අපද්‍රව්‍ය කළමනාකරණ තාක්ෂණය හුදෙක් සාම්ප්‍රදායික ක්‍රමයක් නොව, වාස්තු විද්‍යාව, ජල කළමනාකරණය, ස්වභාවික පෙරහන් සහ පරිසර ආරක්ෂාව එකිනෙක සම්බන්ධ වූ ක්‍රමවත් පද්ධතියක් බව පර්යේෂණයෙන් පෙන්වා දී ඇත. එමෙන්ම එම දේශීය තාක්ෂණික දැනුම වර්තමාන තිරසර හා පරිසර හිතකාමී රෝහල් කළමනාකරණයට පූර්වාදර්ශයක් ලෙස සැලකිය හැකි බව ද පර්යේෂණයේ නිගමනය වී ඇත.

සාකච්ඡාව

රෝගී සත්කාරය හා බැඳුණු වාස්තු විද්‍යාත්මක සනීපාරක්ෂක සැලසුම්

අනුරාධපුර යුගයේ ආරාමික රෝහල්වල සනීපාරක්ෂක ප්‍රමිතීන් පවත්වාගෙන යාම සඳහා භාවිත කළ මූලික ම දේශීය තාක්ෂණික ක්‍රමවේදය වන්නේ එහි වාස්තු විද්‍යාත්මක සැලසුම්කරණය යි (දැරණියගල, 1912). මිහින්තලය, මැදිරිගිරිය සහ ආලාහන පිරිවෙණවැනි රෝහල්වල නටබුන් පරීක්ෂා කිරීමේදී මෙම

රෝහල් තුළ රෝගීන් රැඳී සිටින කුටි මධ්‍ය මිදුලක් වටා පිහිටුවා තිබීම හුදෙක් අලංකරණය සඳහා වූවක් නොවන බව පැහැදිළි වේ. මෙහි විද්‍යාත්මක පදනම වනුයේ වායු ආශ්‍රිත රෝග පාලනය සහ ස්වභාවික විෂබීජ නාශනය කිරීම ය. මධ්‍ය මිදුල හරහා ගලා එන්නා වූ සෘජු හිරු එළිය රෝහල් කුටි තුළට පතිත වීම මගින් එහි පවතින තෙතමනය ඉවත් වන අතර ම පාරජම්බුල කිරණ මගින් පෘෂ්ඨීය විෂබීජ විනාශ වීම සිදු වන්නේ ය.

එමෙන් ම මෙම කුටිවල දොරවල් සහ ජනේල පිහිටුවා තිබෙනුයේ හරස් වාතාශ්‍රය උපරිම ලෙස එන පරිදෙනි. මෙහි දී රෝගීන්ගේ ශ්වසන අපද්‍රව්‍ය සහ ක්ෂුද්‍ර ජීවීන් අඩංගු වාතය ගොඩනැගිල්ල තුළ සිර නොවී නිරන්තරයෙන් අලුත් වාතය සමඟ මිශ්‍ර වී බැහැර වීමට මෙම සැලසුම මහත්සේ උපකාරී වී ඇත. මෙහි ඇති තවත් විශේෂත්වයක් වනුයේ රෝහල් භූමිය පොළොව මට්ටමට වඩා සැළකිය යුතු උසකින් ඉදි කර තිබීම ය. මෙය පොළොවෙන් මතු වන තෙතමනය රෝගීන්ගේ කුටි තුළට පැමිණීම වැළැක්වීමට ගත් තාක්ෂණික පියවරක් වේ. මෙමගින් පෙනී යනුයේ අනුරාධපුර යුගය තුළ වෛද්‍යවරුන් සහ ශිල්පීන්, රෝගී සත්කාරයේ දී පරිසරයේ පවතින භෞතික සාධක සනීපාරක්ෂාව සඳහා හසුරුවා ගත් ආකාරය යි. පෙර පර්යේෂණයන් තුළ දී මෙම වාස්තු විද්‍යාත්මක ලක්ෂණ හුදෙක් ඉදිකිරීම් ලෙස හැඳින්වුව ද, මෙම පර්යේෂණය මගින් ඒවා සජීවී සනීපාරක්ෂක මෙවලම් ලෙස හඳුනා ගැනීමට හැකියාව ලැබුණි.

අපද්‍රව්‍ය බැහැර කිරීමේ පද්ධතීන්හි දේශීය පිරිපහදු තාක්ෂණය සහ විද්‍යාත්මක පදනම

පර්යේෂණ ගැටලුවේ දෙවන කොටස ලෙස අපද්‍රව්‍ය බැහැර කිරීමේ පද්ධතීන්හි විද්‍යාත්මක පදනම විමර්ශනය කිරීමේ දී, අනුරාධපුර යුගය තුළ රෝහල්වලින් පිටවන ජලය පිරිසිදු කිරීමට යොදාගත් බහු පෙරහන් තාක්ෂණය කැපී පෙනෙන්නේ ය. මෙහි දී රෝහල්වලින් විශේෂයෙන් ම බෙහෙත් ඔරු සහ නාන කුටිවලින් බැහැර වන ජලය සෘජුව ම බාහිර පරිසරයට මුදා නොහැර, ඒවා අදියර කිහිපයකින් යුත් පිරිපහදු ටැංකි වෙත යොමු කර තිබුණි (පරණවිතාන, 1983a). මෙම පද්ධතියේ විද්‍යාත්මක පදනම නූතන අපජල පිරිපහදු මූලධර්මයන්ට අතිශ්‍ය සමාන වන්නේ ය. මෙහි දී භාවිත කළ දේශීය තාක්ෂණය වනුයේ වැලි, බොරළු සහ අඟුරු ස්ථර හරහා ජලය පෙරීම ය. අඟුරු යනු ස්වභාවිකව සක්‍රිය කාබන් අඩංගු ද්‍රව්‍යයක් වන අතර, එමගින් ජලයේ දියවී ඇති ඖෂධීය රසායනික ද්‍රව්‍ය, විෂ සහ දුර්ගන්ධය උරා ගැනීම සිදු වේ.

මෙම පිරිපහදු ක්‍රියාවලිය හරහා රෝහල් අපද්‍රව්‍යවල අඩංගු විය හැකි ව්‍යාධිජනක ජීවීන් පසට හෝ භූගත ජලයට මිශ්‍ර වීම වළක්වා ඇත. මෙය එකල පැවති පාරිසරික සෞඛ්‍යය පිළිබඳ ඉහළම ප්‍රමිතියක් වන්නේ ය. මීට අමතරව, මෙම අපද්‍රව්‍ය ගෙන යන මැටි නල ඇතුළතින් ඔප දමා තිබීම සහ නිවැරදි බෑවුම් සහිතව සකස් කර තිබීම තුළින් ජලය එකතැන පල්වීම වැළැක්වීමට කටයුතු කර ඇත. ජලය පල්වීම යනු මදුරුවන් වැනි රෝග වාහකයන් බෝවීමට බලපාන ප්‍රධාන සාධකයක් වන අතර, මෙම ජලාපවහන පද්ධතිය සෘජුව ම වසංගත පාලනය සඳහා දායක වී ඇත. මෙම පර්යේෂණය මගින් තහවුරු වන තවත් විශේෂ කරුණක් නම්, මෙම පිරිපහදු කළ ජලය රෝහල් වත්තේ ඇති වෘක්ෂලතා සඳහා යොදා ගැනීම යි. මෙය අපද්‍රව්‍ය ප්‍රතිචක්‍රීකරණය පිළිබඳ එදා පැවති දේශීය තාක්ෂණික ඥානය ප්‍රකට කරන්නකි. මේ අනුව පෙනී යන්නේ අනුරාධපුර යුගයේ රෝහල් පද්ධතිය තුළ සනීපාරක්ෂාව පවත්වා ගැනීම සඳහා ඉතා සංකීර්ණ එහෙත් පරිසර හිතකාමී විද්‍යාත්මක ක්‍රියාවලියක් ක්‍රියාත්මක වූ බව යි.

මුත්‍රා සහ මළ අපද්‍රව්‍ය කළමනාකරණයේ රසායනික හා ජෛව විද්‍යාත්මක පදනම

රෝහල් පරිශ්‍රයක සනීපාරක්ෂාව පවත්වා ගැනීමේ දී වඩාත් ම අභියෝගාත්මක වන්නේ මානව අපද්‍රව්‍ය බැහැර කිරීම ය. පර්යේෂණ ගැටලුවට අනුව, මේ සඳහා භාවිත කළ දේශීය තාක්ෂණික ක්‍රමවේදය වන කැසිකිලි ගල් සහ වළලු ළිං පද්ධතිය තුළ ගැඹුරු විද්‍යාත්මක පදනමක් ගැබ්ව පවතින්නේ ය. කැසිකිලි ගල් පවතින සියුම් කැටයම් හුදෙක් අලංකාරය සඳහා නොව, මුත්‍රා විසුරුවා නොහැර කෙලින් ම පහළ ඇති කුටීරය වෙත යොමු කිරීම සඳහා නිර්මාණය කොට ඇත (පරණවිතාන, 1983b). මෙම පද්ධතියේ සනීපාරක්ෂක ප්‍රමිතිය පවත්වා ගැනීම සඳහා හුණු සහ දැව අළු භාවිත කර ඇති බව පර්යේෂණාත්මකව අනුමාන කළ හැකි ය. හුණු යනු ප්‍රබල ක්ෂාරීය ද්‍රව්‍යයක් වන අතර, එමගින් අපද්‍රව්‍යවල ඇති ක්ෂුද්‍ර ජීවීන් විනාශ කිරීම සහ ඇමෝනියා වායුව මගින් ඇතිවන අධික දුර්ගන්ධය පාලනය කිරීම සිදු වනු ඇත.

තව ද, මළ අපද්‍රව්‍ය සඳහා භාවිත කළ වළලු ළිං පද්ධතියේ විද්‍යාත්මක පදනම වන්නේ ස්වභාවික පස් පෙරහන් මූලධර්මය යි. මෙම ළිං වටා හුණු සහ වැලි තට්ටු යෙදීමෙන්, අපද්‍රව්‍ය පසට උරා ගැනීමට පෙර ඒවායේ ඇති විෂබීජ පෙරීමට ලක් කර ඇත. මෙය වර්තමාන අපජල ටැංකි පද්ධතියට වඩා බෙහෙවින් දියුණු සහ පරිසර හිතකාමී තාක්ෂණයක් වන්නේ ය. රෝහල් භූමිය තුළ ජල මූලාශ්‍ර සහ මෙම අපද්‍රව්‍ය බැහැර කරන වළවල් අතර පවත්වාගෙන ගොස් ඇති විද්‍යාත්මක දුරස්ථභාවය මගින් රෝහල් වැසියන්ගේ පානීය ජලය ආරක්ෂා කර ඇත. එමගින් පෙනී යනුයේ අනුරාධපුර යුගයේ දී වෛද්‍ය විද්‍යාව සහ සනීපාරක්ෂක ඉංජිනේරු ශිල්පය එකිනෙක බද්ධ වී තිබූ ආකාරය යි.

මෙම පද්ධතීන් පවත්වාගෙන යාම සඳහා කැප වූ වෙන ම සේවක පිරිසක් සිටි බවට මහාවංශය වැනි මූලාශ්‍රවල එන තොරතුරු තුළින් පෙනී යන්නේ මෙය තනි පුද්ගල කාර්යයකට වඩා ආයතනික මට්ටමින් නඩත්තු කළ විධිමත් පද්ධතියක් වන්නේය. මෙම සාකච්ඡාව මගින් පර්යේෂණ ගැටලුවේ විමසන දේශීය තාක්ෂණයේ විශිෂ්ටත්වය සහ එහි පවතින නොමැකෙන විද්‍යාත්මක පදනම මැනවින් තහවුරු වන්නේය.

ඖෂධීය අපද්‍රව්‍ය කළමනාකරණය සහ ජල සනීපාරක්ෂාව

රෝහල් පද්ධතිය තුළ රෝගී සත්කාරයට භාවිත කළ බෙහෙත් ඔරුවල පවතින අපද්‍රව්‍ය කළමනාකරණය කිරීම පිළිබඳව පර්යේෂණ ගැටලුව ඔස්සේ විමසීමේ දී, එම ඔරු තුළ පවතින ජලය බැහැර කිරීමේ නල පද්ධතියේ පිහිටීම වැදගත් වන්නේ ය. ප්‍රතිකාරයෙන් පසු එම ජලය ගලා යාමට සලස්වා ඇත්තේ රෝහල් භූමියෙන් පිටත පිහිටි පිටාර වළවල් වෙත යි. මෙහි පවත්නා විද්‍යාත්මක පදනම වනුයේ, රෝගීන්ගේ සිරුරෙන් පිටවන විෂබීජ මිශ්‍ර ජලය රෝහල් භූමියේ පස සමඟ මිශ්‍ර වීම වැළැක්වීම ය. මෙහි දී මැටි නළ භාවිත කරමින් මෙම අපද්‍රව්‍ය භූගතව ප්‍රවාහනය කිරීම මගින් රෝග වාහකයන වන මදුරුවන්, කෘමීන් වැනි සත්වයන් එම ජලය හා ස්පර්ශ වීමට ඇති අවස්ථාව අවහිර කොට ඇත. මෙම තාක්ෂණය එකල පැවති සංවෘත අපද්‍රව්‍ය පද්ධති පිළිබඳ තාක්ෂණික ප්‍රමිතියට කදිම සාක්ෂියක් වන්නේ ය.

සනීපාරක්ෂක ප්‍රමිතීන් නඩත්තු කිරීමේ චර්යාත්මක තාක්ෂණය

තව ද දේශීය තාක්ෂණික ක්‍රමවේද හුදෙක් භෞතික පද්ධතිවලට පමණක් සීමා නොවේ. රෝහල් භූමියට ඇතුළුවීමේ දී සහ පිටවීමේ දී අනුගමනය කළ පිරිසිදු කිරීමේ චාරිත්‍ර පවා තාක්ෂණික පදනමක් සහිත

වන්නේ ය. උදාහරණයක් ලෙස, රෝහල් දොරටුව අසළ පිහිටි පා දෝවනී ගල් හුදෙක් චාරිත්‍රයක් නොව, පිටතින් පැමිණෙන අපද්‍රව්‍ය සහ විෂබීජ රෝහල් අභ්‍යන්තරයට පැමිණීම වැළැක්වීමේ පෙරහන් ඒකකයක් ලෙස ක්‍රියා කොට ඇත. මෙහි පවත්නා වූ විද්‍යාත්මක පදනම වනුයේ පෘෂ්ඨීය විෂබීජ පාලනය කිරීම යි. මෙමගින් රෝහල් පරිශ්‍රය තුළ ඉතා ඉහළ සනීපාරක්ෂක මට්ටමක් පවත්වා ගැනීමට හැකි වී ඇති බව මෙම පර්යේෂණය මගින් තහවුරු වේ.

අධ්‍යයනයට ලක්කළ කරුණු අනුව, අනුරාධපුර යුගයේ රෝහල් පද්ධතියේ විද්‍යාත්මක පදනම අංශ තුනක් ඔස්සේ සාරාංශගත කළ හැකි ය. එනම්, භෞතික සැකැස්ම, රසායනික විෂබීජ නාශනය සහ ස්වභාවික පෙරහන් පද්ධතිය යන ආකාර ත්‍රිත්වය යි. පර්යේෂණ ගැටලුවෙන් විමසූ පරිදි, මෙම දේශීය තාක්ෂණයන් පද්ධතියක් ලෙස ක්‍රියාත්මක වෙමින් රෝගී සත්කාරය සඳහා සුදුසු සනීපාරක්ෂක පරිසරයක් නිර්මාණය කර ඇත. මීට පෙර බොහෝ ශාස්ත්‍රීය ලිපිවල අවධානය යොමු වූයේ වෛද්‍ය උපකරණවල ඓතිහාසික වටිනාකම කෙරෙහි පමණක් වුව ද, මෙම පර්යේෂණය මගින් එම පද්ධතීන් ක්‍රියාත්මක වූයේ කුමන විද්‍යාත්මක පසුතලයන් මත ද යන්න සාධක සහිතව ඉදිරිපත් කොට ඇත. තව ද විශේෂයෙන් ම, ස්වභාවික සම්පත් වන වැලි, අඟුරු, හුණු ආදී අමුද්‍රව්‍ය භාවිත කරමින් වර්තමාන රෝහල්වල පවතින අධික වියදම් සහිත අපද්‍රව්‍ය කළමනාකරණ ක්‍රියාවලීන් එදා සාර්ථකව සිදුකර තිබූ ආකාරය මෙම අධ්‍යයනයේ සුවිශේෂී අනාවරණ වන්නේ ය.

නිගමනය

අනුරාධපුර යුගයේ ආරාමික රෝහල් පද්ධතිය පිළිබඳ සිදුකළ මෙම විමර්ශනාත්මක අධ්‍යයනය මගින් තහවුරු වනුයේ, එකල පැවති සනීපාරක්ෂක හා අපද්‍රව්‍ය කළමනාකරණ ක්‍රමවේද හුදෙක් සම්ප්‍රදායික හුරුවන් නොවන අතර එය ගැඹුරු විද්‍යාත්මක පදනමක් සහිත තාක්ෂණික පද්ධතීන් බවය. මෙහි පර්යේෂණ ගැටලුවට අනුව, රෝගී සත්කාරය හා බැඳුණු සනීපාරක්ෂක ප්‍රමිතීන් පවත්වා ගැනීම සඳහා වාස්තු විද්‍යාත්මකව හිරු එළිය සහ වාතාශ්‍රය හැසිරවීමත්, අපජල පිරිපහදුව සඳහා අඟුරු, හුණු සහ වැලි වැනි ස්වභාවික පෙරහන් භාවිත කිරීමත් මගින් වර්තමාන හරිත රෝහල් සංකල්පයට අතිශය සමාන දියුණු මට්ටමක් පෙන්නුම් කරනු ලැබේ.

විශේෂයෙන් ම කැසිකිලි ගල් සහ වළලු ළිං පද්ධති තුළින් ප්‍රකට වන රසායනික විෂබීජ නාශක ක්‍රමවේද සහ ජල මූලාශ්‍ර ආරක්ෂා කිරීමේ තාක්ෂණය, එකල ලාංකීය සමාජය සතු වූ පාරිසරික ඉංජිනේරු ඥානය විදහා දක්වනු ලැබේ. මෙම දේශීය තාක්ෂණික ක්‍රමවේද මගින් රෝහල් පරිශ්‍රය තුළ ආසාදන පාලනය ඉතා සාර්ථකව සිදු කර ඇති බව පෙනී යන්නේ ය. පෙර පර්යේෂණවල පැවති අධ්‍යයන හිඩස ලෙස සනීපාරක්ෂක තාක්ෂණයේ විද්‍යාත්මක පදනම නූතන ලෝකයේ පවතින තිරසාර සෞඛ්‍ය කළමනාකරණ අභියෝග සඳහා පූර්වාදර්ශයක් ලෙස යොදාගත හැකි බව මෙම පර්යේෂණයේ අවසන් නිගමනය වන්නේ ය. මෙහි දී අතීත වෛද්‍ය විද්‍යාව සහ තාක්ෂණය අතර පැවති මෙම අන්‍යෝන්‍ය සබැඳියාව ශ්‍රී ලංකාවේ ප්‍රෞඩ වෛද්‍ය ඉතිහාසය ලෝකයට ගෙන යාමට කදිම සාධකයක් වනු ඇත.

මූලාශ්‍රය නාමාවලිය

සෙනවිරත්න, අනුරාධ, 2002. **පුරාණ අනුරාධපුරය.** කොළඹ: එස්. ගොඩගේ සහ සහෝදරයෝ.

ගුණවර්ධන, ටී. එස්. ඩී. එස්., 1994. **ශ්‍රී ලංකාවේ වෛද්‍ය ඉතිහාසය.** කොළඹ: සූරිය ප්‍රකාශකයෝ.

ලියනගමගේ, අමරදාස සහ ගුණවර්ධන, රණවීර (සංස්.), 1965. **අනුරාධපුර යුගය.** කොළඹ: ඇම්. ඩී. ගුණසේන සහ සමාගම.

දහනායක, සුමනසිරි, 1999. **අනුරාධපුර යුගය.** කොළඹ: එස්. ගොඩගේ සහ සහෝදරයෝ.

Bandaranayake, S. (1974) **Sinhalese Monastic Architecture: The Vihāras of Anurādhapura.** Leiden: Brill.

Deraniyagala, S.U. (1992) **The Prehistory of Sri Lanka: An Ecological Perspective**. Colombo: Department of Archaeological Survey.

Geiger, W. (trans.) (1912**) Mahāvaṃsa or The Great Chronicle of Ceylon**. London: Pali Text Society.

Paranavitana, S. (1970) **Inscriptions of Ceylon, Volume I.** Colombo: Department of Archaeology.

Paranavitana, S. (1983) **Inscriptions of Ceylon, Volume II, Part I.** Colombo: Department of Archaeology.

Paranavitana, S. (1983) **Inscriptions of Ceylon, Volume II, Part II.** Colombo: Department of Archaeology.

පැරණි රෝහණය සම්බන්ධ මෑතකාලීන පුරාවිද්‍යාත්මක පර්යේෂණ පිළිබඳව විමර්ශනාත්මක අධ්‍යයනයක්

කේ.ඩබ්. වරුෂි සචින්තිකා සිල්වා

ඉතිහාසය හා පුරාවිද්‍යා අධ්‍යයනාංශය, රුහුණ විශ්වවිද්‍යාලය.

warushisachinthika0302@gmail.com

සංක්ෂිප්තය

පැරණි රෝහණය ශ්‍රී ලංකාවේ ඓතිහාසික යුගයේ දී ප්‍රාදේශීය රාජධානියක්, උප රාජධානියක් සහ ස්වාධීන රාජධානියක් ලෙස ගොඩනැගුණු භූ දේශපාලනික කලාපයකි. මේ අනුව එහි පැරණි රෝහණය සම්බන්ධයෙන් ඓතිහාසික හෝ පුරාවිද්‍යාත්මක හෝ සාහිත්‍යයමය මුහුණුවරකින් විවිධාත්මකව පර්යේෂණ සිදු කෙරී ඇත. ඒ අනුව මෙහි දී ප්‍රස්තුතයට පත්වන්නේ පැරණි රෝහණය සම්බන්ධ මෑතකාලීන පුරාවිද්‍යාත්මක පර්යේෂණ පිළිබඳව සිදුකෙරෙන විමර්ශනාත්මක අධ්‍යයනයකි. ඒ අනුව පැරණි රෝහණය සම්බන්ධ මෑතකාලීන පුරාවිද්‍යාත්මක පර්යේෂණ විශේෂයෙන් වර්ෂ 1990 න් පසුව සිදු කෙරුණු පර්යේෂණ සම්බන්ධව අවධානයට ගෙන ඇත. පර්යේෂණ ගැටලුව වශයෙන් මෑතකාලීනව සිදු කෙරී ඇති විශේෂයෙන් ම මෑතකාලීනව පැරණි රෝහණය සම්බන්ධව සිදුකළ පර්යේෂණවල ප්‍රවණතා මොනවාද යන්න දක්වා ඇත. මෑතකාලීන පසුව රෝහණය සම්බන්ධව සිදුකළ පුරාවිද්‍යා පර්යේෂණ මොනවාද? එහි පර්යේෂණවල න්‍යායාත්මක භාවිතය කෙබඳුද? පර්යේෂණ ක්‍රම සඳහා භාවිත වූ නූතන විධික්‍රම සහ ශිල්ප ක්‍රම මොනවාද? සහ මෙම පර්යේෂණ සඳහා බලපෑ බහුවිෂයාත්මක ප්‍රවේශ මොනවාද? යන්න මෙකී පර්යේෂණයෙ හි උප ගැටලු වෙයි. පර්යේෂණයෙහි ප්‍රධානතම අරමුණ වන්නේ මෑතකාලීනව රෝහණය සම්බන්ධ පුරාවිද්‍යාත්මක පර්යේෂණ අධ්‍යයනය කිරීමෙන් ඒවායෙහි ස්වභාවය සහ සමකාලීන පුරාවිද්‍යාත්මක ප්‍රවණතා හඳුනා ගැනීමයි. මෑතකාලීන පුරාවිද්‍යාත්මක පර්යේෂණ ලැයිස්තුගත කිරීමෙන් එම කාලයට අයත් පර්යේෂණ මොනවාදැයි හඳුනා ගැනීමයි. ගුණාත්මක පර්යේෂණ ක්‍රමවේදයට අදාළව ප්‍රාථමික මූලාශ්‍රය, ද්විතීයික මූලාශ්‍රය සහ අන්තර්ජාල මූලාශ්‍රය පදනම්ව සිදු කරනු ලැබී ය. ඒ අනුව ප්‍රාථමික මූලාශ්‍රය ලෙස රෝහණය පිළිබඳව මුල් ම තොරතුරු අධ්‍යයනය කිරීමට මහාවංසය, දීපවංසය පරිශීලනය කළ අතර රෝහණය සම්බන්ධ කැණීම් වාර්තා (Excavation Reports) පරිශීලනය කිරීම ද සිදු විය. ද්විතීයික මූලාශ්‍රය ලෙස සඟරාමය ලිපි, පර්යේෂණ නිබන්ධන රෝහණය සම්බන්ධ පොත්, පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ රෝහණය සම්බන්ධ වාර්තා, මධ්‍යම සංස්කෘතික අරමුදල සහ පුරවිද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ රෝහණය සම්බන්ධ වාර්තා අධ්‍යයනය කළ අතර Research gate, Academia, JSTOR වැනි වෙබ් අඩවි සහ විද්‍යුත් පුස්තකාල පරිශීලනය කරනු ලැබී ය. ශ්‍රී ලංකාවේ පසුකාලීන පර්යේෂණ අවධානයේ දී රජරට පර්යේෂණයන්හි අවම බවක් දැක ගත හැකි විය. බ්‍රිතාන්‍ය යටත්විජිත සමයේ ලංකාවට පැමිණි යටත්විජිත නිලධාරීන් ශ්‍රී ලංකාවේ විවිධ ක්ෂේත්‍ර කෙරෙහි අවධානය යොමු කිරීමේ ප්‍රතිඵලයක් ලෙස වර්ෂ 1860 දශකය වන විට රෝහණය සම්බන්ධයෙන් යටත්විජිත නිලධාරීන් යටතේ අධ්‍යයනය ආරම්භ විය.

1960 වර්ෂය වනවිට ශ්‍රී ලාංකික විද්වතුන්ගේ පර්යේෂණ අවධානය රෝහණය කෙරෙහි යොමුවන්නට විය 19 වන සියවසේ සිට විසි වන සියවස දක්වා බ්‍රිතාන්‍ය යටත්විජිත නිලධාරීන් සහ ශ්‍රී ලාංකීය විද්වතුන් යටතේ සිදුවූ ඓතිහාසික ප්‍රවේශයක් සහ වාර්තාමය ස්වරූපයකින් සිදුකළ අධ්‍යයනයි. රෝහණය සම්බන්ධයෙන් සිදු කළ පර්යේෂණවල සැමවිටම නව දැනුම සහ තාක්ෂණය උපයෝගී කරගනිමින් බහු විෂයාත්මක ප්‍රවේශයකින් ඒක රේඛීයව ගමන් නොකළ පර්යේෂණ ලෙස හඳුනාගත හැකි ය. ඒ අනුව සෑම විටම රෝහණය සම්බන්ධ පර්යේෂණ පර්යේෂණයක් දැකිය නොහැකි අතර බහු රේඛීය මාර්ගයක ගමන් කරන බව පැහැදිලි වෙයි.

හැඳින්වීම

පැරණි රෝහණය ශ්‍රී ලංකාවේ ඓතිහාසික යුගයේ දී ප්‍රාදේශීය රාජධානියක්, උප රාජධානියක් සහ ස්වාධීන රාජධානියක් ලෙස ගොඩනැගුණු භූ දේශපාලනික කලාපයකි. ඓතිහාසික අවධියේ දී රෝහණයේ ආරම්භය සහ විකාශනය පිළිබඳව සිදුවීම් මහාවංසය සහ ධාතුවංසය ආදී වංසකතාවල සඳහන් වෙයි. පුරාවිද්‍යාත්මක සාක්ෂි අනුව, රෝහණයේ ප්‍රාග් ඓතිහාසික යුගයෙන් ආරම්භවන ජනාවාස ක්‍රියාකාරකම්, පසුව ලෝහ යුගය, අනුරාධපුරය සහ පොළොන්නරුව යුගය දක්වා අඛණ්ඩ සංවර්ධනයක් පිළිබඳව දැක්වේ. විශේෂයෙන් තිස්සමහාරාම, කතරගම, සිතුල්පව්ව, මහගම වැනි ස්ථාන මෙම කලාපයේ පුරාවිද්‍යාත්මක වැදගත්කම සඳහා වන සාක්ෂ්‍යය දරයි. ඒ අනුව රෝහණය සම්බන්ධයෙන් විවිධ දෘෂ්ටිකෝණවලින් පර්යේෂණ සිදු වී ඇති අතර වර්ෂ 1990 ට පෙර පර්යේෂණ පුරාසක්තවේදී දෘෂ්ටිකෝණයකින් වාර්තාමය ස්වරූපයකින් සිදු කර තිබේ. විසිවන සියවසේ දී ගෝලීය වශයෙන් පුරාවිද්‍යාවේ න්‍යායාත්මක විධික්‍රම සහ ක්‍රමවේදවල වර්ධනය ශ්‍රී ලංකාවේ පුරාවිද්‍යා පර්යේෂණවල පුරාවිද්‍යාත්මක ප්‍රවේශය පදනම් කොට රෝහණය සම්බන්ධයෙන් පුරාවිද්‍යා පර්යේෂණ රැසක් සිදුකොට තිබේ. දක්ෂිණ ශ්‍රී ලංකාවේ ප්‍රාග් සහ පූර්ව ඉතිහාසය, ඓතිහාසික රෝහණය, රෝහණයේ නාගරීකත්වය, ආර්ථික පසුබිම සහ වෙළඳ කටයුතු, සමුද්‍ර පුරාවිද්‍යාව, දක්ෂිණ ශ්‍රී ලංකාවේ යටත්විජිත සමය ආදී විවිධ තේමා සහ පරාසවල රෝහණය සම්බන්ධ පර්යේෂණ රැසක් බිහි වීම මෙහි ප්‍රතිඵල වෙයි. පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව, මධ්‍යම සංස්කෘතික අරමුදල, පුරාවිද්‍යා පශ්චාත් උපාධි ආයතනය සහ තවත් විවිධ ආයතන යටතේ රෝහණය සම්බන්ධ පුරාවිද්‍යා අධ්‍යයන සහ ව්‍යාපෘති මෙකල ආරම්භ විය. 1990 වර්ෂයෙන් පසු සිදුකළ පර්යේෂණවල ස්වාභාවය අධ්‍යයනය කිරීමෙන් රෝහණය සම්බන්ධ පර්යේෂණ සඳහා බලපෑ න්‍යායන්, ප්‍රවණතා, විධික්‍රම සහ ශිල්ප ක්‍රම ආදිය ප්‍රමාණය කළ හැකි ය. ඒ ඔස්සේ මෑතකාලීන පර්යේෂණවල ස්වාභාවය සහ එහි ප්‍රවණතා පිළිබඳව හඳුනාගත හැකි ය. මේ අනුව රෝහණය පිළිබඳ නව පුරාවිද්‍යා දැනුම ඒකරාශී කරගැනීමට, ශ්‍රී ලංකාවේ ප්‍රාදේශීය ඉතිහාසය අධ්‍යයනය ශක්තිමත් කිරීම, පුරාවිද්‍යා පර්යේෂණ සඳහා නව දෘෂ්ටිකෝණයක් ලබා දීමට මෙන්ම අනාගත පර්යේෂකයින්ට මාර්ගෝපදේශයක් සැපයීමට මෙම පර්යේෂණය වැදගත් වෙයි.

පර්යේෂණ ගැටලුව

- මෑතකාලීනව පැරණි රෝහණය සම්බන්ධව සිදුකළ පර්යේෂණවල ප්‍රවණතා මොනවා ද?

උප ගැටලු

- මෑතකාලීනව රෝහණය සමබන්ධව සිදු කළ පුරාවිද්‍යා පර්යේෂණ මොනවා ද?
- එකී පර්යේෂණවල න්‍යායාත්මක භාවිතය කෙබඳු ද?
- පර්යේෂණ ක්‍රම සඳහා භාවිත වූ නූතන විධික්‍රම සහ ශිල්ප ක්‍රම මොනවා ද?
- මෙම පර්යේෂණ සඳහා බලපෑ බහුවිෂයාත්මක ප්‍රවේශ මොනවා ද?

පර්යේෂණ අරමුණු

ප්‍රධාන අරමුණ

- මෑතකාලීනව රෝහණය සම්බන්ධ පුරාවිද්‍යාත්මක පර්යේෂණ අධ්‍යයනය කිරීමෙන් ඒවායෙහි ස්වභාවය සහ සමකාලීන පුරාවිද්‍යාත්මක ප්‍රවණතා හඳුනා ගැනීම.

උප අරමුණු

- පුරාවිද්‍යාත්මක පර්යේෂණ ලැයිස්තුගත කිරීමෙන් එම කාලපරිච්ඡේදයට අයත් පර්යේෂණ මොනවාදැයි හඳුනා ගැනීම.
- එක් එක් පර්යේෂණ සංසන්දනාත්මකව අධ්‍යයනය කිරීම මගින් එම පර්යේෂණ විෂයෙහි බලපෑ න්‍යායාත්මක අදහස් සහ පර්යේෂණ ක්‍රමවේද පිළිබඳව අධ්‍යයනය කිරීම.
- පර්යේෂණ ක්‍රමවේද පරීක්ෂා කිරීමෙන් ඒ සඳහා භාවිත නූතන විධික්‍රම සහ ශිල්පක්‍රම හඳුනාගැනීම.
- පර්යේෂණවල ප්‍රවණතා අධ්‍යයනය කිරීමෙන් ඒ සඳහා බලපෑ බහුවිෂයාත්මක ප්‍රවේශය විස්තර කිරීම.

පර්යේෂණ ක්‍රමවේදය

ගුණාත්මක පර්යේෂණ ක්‍රමවේදයට අදාළව ප්‍රාථමික මූලාශ්‍රය, ද්විතීයික මූලාශ්‍රය සහ අන්තර්ජාල මූලාශ්‍රය පදනම්ව සිදු කරනු ලැබී ය. ඒ අනුව ප්‍රාථමික මූලාශ්‍රය ලෙස රෝහණය පිළිබඳව මුල් ම තොරතුරු අධ්‍යයනය කිරීමට මහාවංසය, දීපවංසය පරිශීලනය කළ අතර රෝහණය සම්බන්ධ කැණීම් වාර්තා (Excavation Reports) පරිශීලනය කිරීම ද සිදු විය. ද්විතීයික මූලාශ්‍රය ලෙස සඟරාමය ලිපි, පර්යේෂණ නිබන්ධන රෝහණය සම්බන්ධ පොත්, පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ රෝහණය සම්බන්ධ වාර්තා, මධ්‍යම සංස්කෘතික අරමුදල සහ පුරවිද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ රෝහණය සම්බන්ධ වාර්තා අධ්‍යයනය කළ අතර Research gate, Academia, JSTOR වැනි වෙබ් අඩවි සහ විද්‍යුත් පුස්තකාල පරිශීලනය කරනු ලැබී ය. ඒ අනුව එම මූලාශ්‍රයවලට අනුව දත්ත රැස් කිරීම, දත්ත අර්ථකතනය, දත්ත විශ්ලේෂණය සහ අවසාන වශයෙන් දත්ත ඉදිරිපත් කිරීම සිදුකරන ලදි.

පර්යේෂණ ඉතිහාසය

1990 වර්ෂයට පෙර රෝහණය සම්බන්ධයෙන් පුරාසක්තවේදී දෘෂ්ටිකෝණයකින් සිදු කළ පර්යේෂණ හඳුනාගත හැකි වෙයි. එම පර්යේෂණ වාර්තාමය ස්වරූපයකින් සහ ඓතිහාසික ප්‍රවේශයකින් සිදුකර තිබේ. විසිවන සියවසේ දී ගෝලීය වශයෙන් පුරාවිද්‍යාවේ න්‍යායාත්මක, විධික්‍රම සහ ක්‍රමවේදවල සිදු වූ වර්ධනය ශ්‍රී ලංකාවේ පුරාවිද්‍යාත්මක පර්යේෂණවල පුරාවිද්‍යාත්මක ප්‍රවේශයක් නිර්මාණය වීමට හේතු සාධක විය. මෙම වර්ධනය රෝහණය සම්බන්ධයෙන් සිදුකළ පුරාවිද්‍යා පර්යේෂණ කෙරෙහි ද බලපෑම් එල්ල කරන ලදි. දක්ෂිණ ශ්‍රී ලංකාවේ ප්‍රාග් සහ පූර්ව ඉතිහාසය, ඓතිහාසික රෝහණය, රෝහණයෙ නාගරිකත්වය, ආර්ථික පසුබිම, සහ වෙළඳ කටයුතු, සමුද්‍ර පුරාවිද්‍යාව, දක්ෂිණ ශ්‍රී ලංකාවේ යටත් විජිත සමය ආදී තේමා සහ පරාසවල රෝහණය සම්බන්ධ පර්යේෂණ රාශියක් බිහිවීම මෙහි ප්‍රතිඵලයකි. පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව, මධ්‍යම සංස්කෘතික අරමුදල, පුරාවිද්‍යා පශ්චාත් උපාධි ආයතනය සහ තවත් ආයතන යටතේ රෝහණය සම්බන්ධ පුරාවිද්‍යා අධ්‍යයන සහ ව්‍යාපෘති ආරම්භ විය.

වර්ෂ 1990 - 2005 සිදුකරන ලද පර්යේෂණ

වර්ෂ 2005 - 2015 සිදුකරන ලද පර්යේෂණ

වර්ෂ 2015 - 2021 සිදුකරන ලද පර්යේෂණ

- **වර්ෂ 1990 - 2005 දක්වා කාලවකවානුවේ රෝහණය සම්බන්ධයෙන් සිදුකළ අධ්‍යයනය**

1990 දශකයේ සිට 2005 දක්වා කාලවකවානුවේ පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව, මධ්‍යම සංස්කෘතික අරමුදල සහ පුරාවිද්‍යා පශ්චාත් උපාධි ආයතනය, විවිධ විදේශීය ආයතන සහ එක්ව රෝහණය පිළිබඳව ව්‍යාපෘති මට්ටිමේ අධ්‍යයන ආරම්භ කරන ලදි.

- Maritime Archaeology in Sri Lanka the Galle Barbour Project - 1992
- Ancient Ruhuna (Sri Lanka – German Archaeological Project) Vol I - 2001
- Sri Lanka Maritime Archaeological Unit Report on the Avondster Project - 2001

වර්ෂ 1960 වනවිට ලෝකයේ දියයට පුරාවිද්‍යාව ක්‍රමයෙන් වර්ධනය වූ අතර එය ශ්‍රී ලංකාවේ දියයට පුරාවිද්‍යා පර්යේෂණ ආරම්භය කෙරෙහි බලපෑමක් එල්ල කරන ලදි. ශ්‍රී ලංකාවේ බ්‍රිතාන්‍ය ජාතිකයින් යටතේ අනාවරණය වූ දියයට පුරාවිද්‍යා සාධකවල ප්‍රතිඵල ලෙස දියයට පුරාවිද්‍යාව කෙරෙහි අවධානය යොමු විය. දක්ෂිණ ශ්‍රී ලංකාවේ ප්‍රධාන වරායක් වූ ගාලු වරාය ආශ්‍රිතව එවකට පැවති රජය මගින් ගාලු වරාය සංවර්ධන ව්‍යාපෘති සඳහා හානි ඇගැයීම් පුරාවිද්‍යා ගවේෂණයක අවශ්‍යතාවයද පෙන්වා දෙන ලදි. මෙම පසුබිමේ දී 1992 -1998 කාල වකවානුවේදී පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව, මධ්‍යම සංස්කෘතික අරමුදල පුරාවිද්‍යා පශ්චාත් උපාධි ආයතනය සහ බටහිර සමුද්‍ර කෞතුකාගාරයේ සහයෝගය ඇතිව පැරණි ගාලුවරාය ආශ්‍රිතව ගවේෂණ ආරම්භ විය. එහි ප්‍රතිඵලය ලෙස 1992 වර්ෂයේ Maritime Archaeology in Sri Lanka, The Galle Barbour Project ව්‍යාපෘති වාර්තාව ඉදිරිපත් කරන ලදි. ගාලු වරායේ ගිලුණු නෞකා පිළිබඳ දත්ත පද්ධතියක් නිර්මාණය කිරීම සහ අනාගත දියයට පුරාවිද්‍යා පර්යේෂණ සඳහා පුහුණු

කණ්ඩායමක් නිර්මාණය කිරීම ගාලු වරාය ව්‍යාපෘතියේ ප්‍රධාන අරමුණ විය. මෙය ශ්‍රී ලංකාවේ ප්‍රථම දියයට පුරාවිද්‍යා ව්‍යාපෘතියයි. විශ්වවිද්‍යාල විද්‍යාර්ථීන් දියයට පුරාවිද්‍යා කටයුතු සඳහා පුහුණු කළ අතර දියයට පුරාවිද්‍යා විධික්‍රම සහ සංරක්ෂණ ක්‍රමවේද හඳුන්වාදීම ද ව්‍යාපෘති ඔස්සේ සිදුවිය. මුහුදු පත්ල ගවේෂණය සඳහා භාවිත කළ සාම්ප්‍රදායික ක්‍රමවේද අතර සරල රේඛීය රැහැන් ඇද (Swim Line Search) වෘත්තාකාර පථයක නිරීක්ෂණය (Circular Search) Towed Search ඇතුලත් වෙයි. තවද (Circular Search) Towed Search වැනි උපකරණ ද මේ සඳහා උපයෝගී විය. මෙම ක්‍රමවේද පුරාවිද්‍යා කටයුතු සඳහා සෘජුව නිර්මාණය වූ ගවේෂණ ක්‍රමවේද නොවන අතර විවිධ විෂයන් මගින් උකහාගත් දැනුමේ ප්‍රතිඵල යි. ගවේෂණයේ දී හමුවන දියයට පුරාවිද්‍යා ස්ථාන වාර්තාව කිරීම සඳහා භූගෝලීය තොරතුරු පද්ධතිය සහ ගෝලීය ස්ථානගත කිරීමේ පද්ධතිය භාවිතකර තිබේ. ගාලු වරාය ව්‍යාපෘතියේ හමුවූ පුරාවස්තු සංරක්ෂණය කිරීම සංරක්ෂණ දෙපාර්තමේන්තුව යටතේ සිදුවූ අතර දියයට ගවේෂණ තුළින් හමුවන පුරාවස්ත සංරක්ෂණය කරනු ලබන ආකාරය පිළිබඳ පුහුණු වැඩමුළුවක් ද මේ යටතේ සිදුවිය පුරාවස්තු මත සිදුවී ඇති පාරිසරික හානිය ගණනය කිරීම සඳහා E.corr ක්‍රමවේදය සහ Ph Profile පරීක්ෂා කිරීම සිදුකරන ලදි. තව ද හමුවූ ලී කොටස් හඳුනාගැනීම ලී කැබලිවල අඩංගු ජල ප්‍රමාණය පරීක්ෂා කිරීම සහ කාබනික අවශේෂ විශ්ලේෂණය වැනි පර්යේෂණද මෙම ව්‍යාපෘතියෙහි අන්තර්ගත වෙයි. දැව විශේෂ හඳුනා ගැනීම සඳහා U max මේ දෙයද භාවිත කරන ලදි ගාලු වරාය ව්‍යාපෘතියේ පුරාවස්තු විශ්ලේෂණ කටයුතු සඳහා මාර්තා පිකට් ප්‍රනාන්දු සහ මොයිරා තම්පෝ වැනි විද්වතුන් සහ සම්බන්ධ විය හඳුනාගත් පුරාවිද්‍යා ක්ෂේත්‍ර තුළින් හමුවූ ගිලුණු නැවූ අවශේෂ මත පදනම්ව ඒවා වර්ග කර ඇත, කාලය සීමා සහිතවීම දෘශ්‍යතාවය අඩුවීම මතුපිට සොයාගැනීම හිඟවීම සහ ගවේෂණ දිනවල දී ජලයේ පැවති අපැහැදිලිභාවය හේතුවෙන් සියලු ම පුරාවස්තු හඳුනා ගත නොහැකි වුව ද හඳුනාගත් පුරාවස්තු ගණනය කර ප්‍රතිශත ලෙස දක්වා තිබේ. තව එම පුරාවස්තු සියල්ල විස්තර සහිතව අංකනය කර විධිමත් අයුරින් වාර්තාව තුළ දැකිය හැකි ය. පුරාවස්තු ව්‍යාප්තිය පිළිබඳ ප්‍රස්තාර ඔස්සේ පැහැදිළි කළ අතර සෙරමික් බඳුන් පිළිබඳ නාමාවලියක් සකස් කර ඇති ආකාරය දැකගත හැකි ය. පැරණි ජලයාත්‍රාවන්හි පරිණාමය හඳුනා ගැනීම සහ දෝණි සහ පාරු පිළිබඳ මානවවංශ විද්‍යාත්මක නිරීක්ෂණ භාවිත කර තිබේ පුරාවිද්‍යාත්මක කරුණු සාධනය කර ගැනීම සඳහා මානවවංශ විද්‍යාත්මක නිරීක්ෂණ භාවිත කිරීමට ලෝකයේ ප්‍රවණතාවක් ලෙස නැගී යා තත්ත්වයකි මෙම ක්‍රමවේද 1990 වර්ෂය වන විට ලංකාවේ පුරාවිද්‍යා පර්යේෂණවල දැකිය හැකි වෙයි.

1991 වර්ෂයේ දී ශ්‍රී ලංකා පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව සහ බටහිර ජර්මනියේ බොන් විශ්වවිද්‍යාලය සහ ජර්මානු පුරාවිද්‍යා ආයතනය එක්ව Ancient Ruhuna (Sri Lanka - German Archaeological Project) ව්‍යාපෘති ආරම්භ කරන ලදී මෙම ව්‍යාපෘතියේ ව්‍යාපෘති වාර්තාව 2001 වර්ෂයේ දී ප්‍රකාශයට පත් විය. රෝහණය පැරණි නාගරික ගොඩැල්ල වූ තිස්සමහාරාම අකුරුගොඩ ප්‍රදේශය සහ ඒ ආශ්‍රිතව ව්‍යාප්තව පවතින ඓතිහාසික ස්ථාන කිහිපයක් පදනම් කරගනිමින් ව්‍යාපෘතියේ දී ගුවන් ඡායාරූප සහ පරිගණක තාක්ෂණික ක්‍රමවේද ඔස්සේ තිස්සමහාරාම නාගරික ගොඩැල්ල සහ පැරැණි රෝහණය සම්බන්ධ සිතියම් සහ ත්‍රිමාණ භූමි ආකෘති නිර්මාණය කර SCOp21 වැනි මෘදුකාංග (SCOP21 Program System) භාවිත කර

ඇතැයි පමණක් නොව අධින ප්‍රදේශය පිළිබඳව නිර්මාණය වූ පැරණි රෝහණය පිළිබඳ සඳහන් සිතියම් මධ්‍යයනය සඳහා භාවිත කර ඇත.

ගාලු වරාය ව්‍යාපෘතිය මගින් දියයට පුරාවිද්‍යා කටයුතු කෙරෙහි ඇතිකළ උනන්දුව නැවත නැවතත් දියයට පුරාවිද්‍යා ව්‍යාපෘති සහ පර්යේෂණ කිරීමට අඩිතාලම සකස් කරන ලදි. එහි ප්‍රතිඵලය ලෙස වර්තමානය දක්වා වරින්වර විවිධ අරමුණු ඔස්සේ දියයට පුරාවිද්‍යා අධ්‍යයන සිදුවිය. ගාලු වරාය ව්‍යාපෘති අවසානයෙහි දිගුවක් ලෙස 1859 වර්ෂයේ දී ගාලු වරාය ආශ්‍රිතව මුහුදුබත් ඇවොන්ස්ඩ්ටර් නෞකාව සම්බන්ධයෙන් පර්යේෂණ ආරම්භ කරන ලදි. මෙම ව්‍යාපෘතිය පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව, ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුව, මධ්‍යම සංස්කෘතික අරමුදල, පුරාවිද්‍යා පශ්චාත් උපාධි ආයතනය, ඒකාබද්ධව දියත් කර ඇත. ඇවොනඩ්ටර් නෞකාව ආශ්‍රිතව සිදු කළ ගවේෂණ සහ කැණීම් පදනම් කරගනිමින් Sri Lanka Maritime Archaeological unit report on Avondster Project (2001-2002) ලෙස වාර්තාවක් ඉදිරිපත් කරන ලදි. මෙම අධ්‍යයනය ශ්‍රී ලංකාවේ ගිලුනු නෞකාවක් සම්බන්ධයෙන් සිදුකළ පළමු අධ්‍යයනය යි.

රෝහණය සම්බන්ධයෙන් 1995 කාලවකවානුව තුළ සිදුකළ පර්යේෂණ අධ්‍යයනය කිරීමේ දී පැරැණි රෝහණය ඓතිහාසිකත්වය සහ දියයට පුරාවිද්‍යා පර්යේෂණ කෙරෙහි අවධානය යොමු වී ඇති බව පැහැදිලි වෙයි. බහු විෂයාත්මක ප්‍රවේශය මත භෞතික විද්‍යාව, රසායනික විද්‍යාව වැනි ස්වාභාවික විද්‍යාවන්හි විධික්‍රම භාවිතයට නැඹුරු වී තිබේ. Chemical Analysis, X – ray Different Analysis, Electronic Microprobe ,U max, සහ C14 Dating ක්‍රමවේද මේ සඳහා නිදසුන් වේ. තවද පුරාවිද්‍යාව සඳහා පරිගණක තාක්ෂණයේ භාවිතය සහ දුරස්ථ සංවේදී ක්‍රමශේෂ කටයුතු සඳහා භාවිත කිරීම මේ අවධියේදී දැකිය හැකි ප්‍රවණතා කිහිපයකි.

- **2005 - 2015 දක්වා කාලවකවානුවේ රෝහණය සම්බන්ධයෙන් සිදුකළ අධ්‍යයනය**

වර්ෂ 2005 කාලවකවානුවේ දී විවිධ පරාස සහ විවිධ තේමා ඔස්සේ රෝහණය සම්බන්ධයෙන් සිදුකළ පර්යේෂණ දැකගත හැකිවෙයි. දක්ෂිණ ශ්‍රී ලංකාවේ ප්‍රාග් ඉතිහාසය රෝහණය නාගරිකත්වය මහනුවර යුගයට සිතුවම් සම්ප්‍රදාය දක්ෂිණ ශ්‍රී ලංකාව ලංකාවේ දියයට පුරාවිද්‍යාව පුරාවිද්‍යා උරුම සංරක්ෂණය ආදී විවිධ තේමාවන් ඉන් කිහිපයකි. මෙම අවධියේදී රෝහණය සම්බන්ධයෙන් සිදුකළ පුරාවිද්‍යා පර්යේෂණවල න්‍යායාත්මක වර්ධනයක් දැකගත හැකි අතර පර්යේෂණය ස්වභාවය අනුව න්‍යායන්ගේ භාවිතයෙහි වෙනස්වීම් දැකගත හැකිවෙයි. 2010 - 2015 කාලවකවානුව තුළ රෝහණය සම්බන්ධයෙන් සිදුකළ පුරාවිද්‍යා පර්යේෂණ පහත පරිදි වෙයි.

- An Excavation of a Shell – midden at Pallemala in Southern Littoral area of Sri Lanka: Some Evidence of Prehistoric CH Occupation in C.4 th millennium BC - 2006
- Urban Origins in Southern Sri Lanka - 2006
- Magama The Ancient Capital of Ruhuna - 2009
- Niagiriseya Survey (the Interim Report) - 2011

- The ‘stone Four Legged Quern’ (bench) recovered in the oldest Maritime Archaeological Site at Godawaya (AMBALANTOTA) in Sri Lanka – 2011
- SEM – EDS analysis of copper, glass and iron recovered from the 1st century AD Shipwreck Site of Godawaya, southern Sri Lanka – 2012
- The ancient Sea – port at Kirinda in Ruhuna – 2013
- Katuwana. A Dutch Fort in Southern Sri Lanka – 2013
- The Discovery and Excavation of a Human Burial From the Miniethiliya Shell Midden in Southern Sri Lanka – 2014
- An Early Historic Assemblage offshore of Godawaya, Sri Lanka: Evidence for Early Regional Seafaring in South Asia – 2014
- යටත්විජිත යුගයේ ඉදිකිරීම්වල වාස්තුවිද්‍යාත්මක අගය පිළිබඳ විමර්ශනයක් (මාතර කොටුව ඇසුරෙන්) - 2015
- මහනුවර යුගයේ පහතරට සම්ප්‍රදායේ බිතුසිතුවම් මුහුණදෙන ප්‍රධාන සංරක්ෂණ ගැටලු පහක් - 2015

මෙම වකවානුවේ දී පර්යේෂණ අධ්‍යන තුළින් ස්වභාවික විද්‍යාවන්හි විධික්‍රම මෙන්ම සමාජ විද්‍යාවන්ගේ දැනුම ද රෝහණය සම්බන්ධයෙන් සිදුකළ පර්යේෂණ සඳහා භාවිත කළ ආකාරය දැකගත හැකි වෙයි. SEM - EDS Analysis, Thin Section Micrograpy, X-ray, Floresence, C14 Carbon Dating සහ Anthromeric වැනි රසායනික විද්‍යාත්මක භෞතික විද්‍යාත්මක සහ මානව විද්‍යාත්මක ක්‍රමවේද මෙන් ම මානවවංශ විද්‍යාත්මක නිරීක්ෂණ සමාජ විද්‍යාවේ සහ භූගෝල විද්‍යාවේ භාවිත වන ක්‍රමවේද පර්යේෂණය තුළ අන්තර්ගත වෙයි. තවද ප්‍රාග් ඓතිහාසික අධ්‍යයනවල දී මානව විද්‍යාත්මක ප්‍රවේශය මගින් අධ්‍යයනය කිරීමට උත්සාහ කර තිබේ. පල්ලෙමලල සහ මිණි ඇතිලිය බෙලිකටු නිධි ආශ්‍රිතව හමුවී ඇති මානව වස්තු කොටස් මානව විද්‍යාත්මක ප්‍රවේශයක් කිරීම සඳහා නිදසුන් ය. එමෙන් ම සාගරික ප්‍රවේශය ඔස්සේ සිදු කළ අධ්‍යයන දැකිය හැකිය. ක්ෂේත්‍ර අධ්‍යයන තුළින් හමුවන විදේශීය පුරාවස්තු වරාය ආශ්‍රිත කැණීම් සහ ගවේෂණ දී දියයට පුරාවිද්‍යා අධ්‍යයන තුළින් පැරණි රෝහණය සමග පැවති සාගරික සම්බන්ධතා මගින් සිදුවූ සංවර්ධනය පිළිබඳ අධ්‍යයනය කිරීමට උත්සුකව ඇත. එපමණක් නොව පුරාවිද්‍යාව සඳහා පරිගණක තාක්ෂණය භාවිතය සහ දුරස්ථ සංවේදී ක්‍රමවේද භාවිත කිරීමෙහි වර්ධනයක් දැකිය හැකි ය.

- **2015 - 2021 දක්වා කාලවකවානුවේ රෝහණය සම්බන්ධයෙන් සිදුකළ අධ්‍යයනය**

2015 - 2021 අවධියේදී රෝහණය සම්බන්ධ පර්යේෂණවල පුරාවිද්‍යාවේ උප විෂයන්වල වර්ධනයක් දැකිය හැකි වෙයි. එම විෂය ක්ෂේත්‍ර ලෙස උද්භිද විද්‍යාව, ලෝහ විද්‍යාව සහ සත්ත්ව විද්‍යාව වැනි ස්වභාවික විද්‍යාවන්ගේ ප්‍රභවය වූ විෂයන් වේ. ස්වාභාවික විද්‍යාවන්ගේ භාවිත විධික්‍රම සහ ක්‍රමවේද මෙම පර්යේෂණ සඳහා භාවිත කොට ඇත. තව ද මෙම පර්යේෂණවලින් දකුණු දිග සහ නැගෙනහිර ශ්‍රී ලංකාවේ ආරාමික

සන්ධර්භය කෙරෙහි අවධානය යොමු කර ඇති අතර උරුම කලමනාකරණ ප්‍රවේශයක් තුළ සිදුවන මහා පරිමාණ ව්‍යාපෘති දැකිය හැකිවෙයි.

- දක්ෂිණ ලංකාවේ ප්‍රාග්, මූල හා මුල් ඓතිහාසික අවධිවල තාක්ෂණික සංස්කෘතික පරිවර්තනයක් - 2016
- Out of context in Association Human Remains Salvaged from the Mini – athiliya Shell Midden, Sri Lanka – 2018
- Scientific evidences to show ancient lead trade with Tissamaharama Sri Lanka : A Metallurgical Study – 2018
- Perliminary Report Rajagala Archaeological Research Project – 2018- 2019
- Nutrition Constituents and Food Culture of Early Human in Dry zone: Based on Faunal Remain Analysis of Rajagala Mahalena Excavation site – 2021
- Galss Beads in Ancient Ruhuna - 2021

නිගමනය

ඓතිහාසික අවධියෙහි රචනා වූ මහාවංසය ධාතුවංසය වැනි ඓතිහාසික අධ්‍යයනයන් තුළ රෝහණය සම්බන්ධ වැදගත් සිදුවීම් වාර්තාමය ස්වරූපයකින් අධ්‍යයනය කර ඇත. ශ්‍රී ලංකාවේ පසුකාලීන පර්යේෂණ අවධානයේ දී රජරට පර්යේෂණයන්හි අවම බවක් දැක ගත හැකි විය. බ්‍රිතාන්‍ය යටත්විජිත සමයේ ලංකාවට පැමිණි යටත්විජිත නිලධාරීන් ශ්‍රී ලංකාවේ විවිධ ක්ෂේත්‍ර කෙරෙහි අවධානය යොමු කිරීමේ ප්‍රතිඵලයක් ලෙස වර්ෂ 1860 දශකය වන විට රෝහණය සම්බන්ධයෙන් යටත්විජිත නිලධාරීන් යටතේ අධ්‍යයනය ආරම්භ විය. 1960 වර්ෂය වනවිට ශ්‍රී ලාංකික විද්වතුන්ගේ පර්යේෂණ අවධානය රෝහණය කෙරෙහි යොමුවන්නට විය 19 වන සියවසේ සිට විසි වන සියවස දක්වා බ්‍රිතාන්‍ය යටත්විජිත නිලධාරීන් සහ ශ්‍රී ලාංකීය විද්වතුන් යටතේ සිදුවූ ඓතිහාසික ප්‍රවේශයක් සහ වාර්තාමය ස්වරූපයකින් සිදුකළ අධ්‍යයනයි. 1965 වර්ෂයෙන් පසු රෝහණය සම්බන්ධ පර්යේෂණවල ශාස්ත්‍රීය නැඹුරුවක් දැකගත හැකි වූ අතර පුරාවිද්‍යාත්මක ප්‍රවේශය ක්‍රමයෙන් වර්ධනය විය. මේ සඳහා පුරාවිද්‍යාවේ බහුවිෂයාත්මක හා න්‍යායාත්මක සංවර්ධනය සහ පුරාවිද්‍යා පුරාවිද්‍යා විධික්‍රමවල සිදුවූ වර්ධනය හේතු සාධක වී තිබේ. 2008 - 2021 වර්ෂවල දී සිදු කළ පර්යේෂණ අධ්‍යයන මගින් රෝහණය වර්තමාන පර්යේෂණ දිශානතිය ස්වභාවික විද්‍යාවන් කෙරෙහි යොමු වී ඇති බව හඳුනාගත හැකි භෞතික විද්‍යාව, රසායනික විද්‍යාව, සත්ත්ව විද්‍යාව, ලෝහ විද්‍යාව වැනි ස්වාභාවික විද්‍යාවන් උපයෝගී කරගනිමින් පර්යේෂණ කර තිබේ. එමෙන්ම පුරාවිද්‍යාව සඳහා පරිගණක තාක්ෂණය භාවිතය සහ දුරස්ථ සංවේදී ශිල්ප ක්‍රම භාවිතය මත වර්ධනයක් ද සිදුවන ලදි. රෝහණය සම්බන්ධයෙන් සිදු කළ පර්යේෂණවල සැමවිටම නව දැනුම සහ තාක්ෂණය උපයෝගී කරගනිමින් බහු විෂයාත්මක ප්‍රවේශයකින් ඒක රේඛීයව ගමන් නොකළ පර්යේෂණ ලෙස හඳුනාගත හැකි ය. ඒ අනුව සෑම විටම රෝහණය සම්බන්ධ පර්යේෂණ පර්යේෂණයක් දැකිය නොහැකි අතර බහු රේඛීය මාර්ගයක ගමන් කරන බව පැහැදිලි වෙයි.

ආශ්‍රිත මූලාශ්‍රය නාමාවලිය

සිංහල මූලාශ්‍රය

ගීගනගේ, ඒ. (සංස්.). (1998). **මහාවංශය.** කොළඹ: රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව.

විජේසේකර, න. (සංස්.). (2000). **දීපවංශය.** කොළඹ: සංස්කෘතික දෙපාර්තමේන්තුව.

බණ්ඩාර, සෙනරත්. (2010). **ශ්‍රී ලංකාවේ පුරාවිද්‍යාව.** කොළඹ: සූරිය ප්‍රකාශන.

පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව. (2005-2020). **වාර්ෂික වාර්තා.** කොළඹ: පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව.

පෙරේරා, කේ. (2015). රෝහණය: **ඉතිහාසය හා සංස්කෘතිය.** කොළඹ: ගොඩගේ ප්‍රකාශන.

ඉංග්‍රීසි මූලාශ්‍රය

Silva, R. (1996). ***Ancient Ruhuna: Sri Lankan Civilization in the Southern Region***. Colombo: Archaeological Department.

Deraniyagala, S. U. (1992). ***The Prehistory of Sri Lanka***. Colombo: Department of Archaeology.

Coningham, R., & Gunawardhana, P. (2013). ***Anuradhapura: The British-Sri Lankan Excavations*.** Oxford: Archaeopress.

Weisshaar, H.-J., & Wijeyapala, W. H. (2001). **Excavations at Tissamaharama**. *Ancient Lanka Journal*, 5, 23–45.

Bandaranayake, S. (2012). ***Sri Lankan Archaeology: Theory and Practice*.** Colombo: Central Cultural Fund.

Gurukkal, R. (2010). Rethinking Classical Indo-Roman Trade. ***Oxford Journal of Archaeology*,** 29(3), 283–300.

Online / Journal Sources

Perera, N. (2019). **Nature of prehistoric archaeological research in Sri Lanka** (1992–2019). *ResearchGate*. https://www.researchgate.net

Central Cultural Fund. (2018). **Archaeological research reports.** https://www.ccf.gov.lk

හස්එබූ කහාපණ කාසි හා එහි දක්නට ඇති සංකේතයන්හි සංස්කෘතික පසුබිම පිළිබඳව අධ්‍යයනයක්

[1]එච්. එම්. යසංග ප්‍රවීන් වික්‍රමසිංහ
පුරාවිද්‍යා අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය

[2]කේ. සඳුනි අප්සරා කෝට්ටගේ
ඉතිහාසය හා පුරාවිද්‍යා අධ්‍යයනය අංශය, රුහුණ විශ්වවිද්‍යාලය

සංක්ෂිප්තය

හස්එබූ කහාපණ ලෙස හැඳින්වෙන විවිධ සංකේත සටහන් කර ඇති රිදී කාසි ශ්‍රී ලංකාවෙන් දැනට හමුවන පැරණිතම කාසි ලෙස සැලකේ. මෙම පත්‍රිකාවේ ප්‍රධාන අරමුණ වන්නේ එම කාසිවල දක්නට ඇති සංකේතවල සංස්කෘතික පසුබිම පිළිබඳව අධ්‍යයනයක් සිදු කිරීම යි. ඊට අමතරව මෙම කාසිය සම්බන්ධ අනෙකුත් පසුබිම් කරුණු පිළිබඳව සාකච්ඡා කෙරේ. මෙම අරමුණු ඉටු කර ගැනීම සඳහා සාහිත්‍ය මූලාශ්‍රය අධ්‍යයනය කිරීම ප්‍රධාන ක්‍රමවේදය වූ අතර එහි ස්වරූපය ගුණාත්මක අධ්‍යයන මුහුණුවරක් ගනු ලබයි. ඒ අනුව මෙම පත්‍රිකාවේ හස්එබූ කහාපණ කාසිය සම්බන්ධයෙන් හැඳින් වූ නාමය, ලෝහ සංයුතිය, බර, නිෂ්පාදනය කිරීමේ ක්‍රමශිල්පය, කාසි හමු වූ ස්ථාන ආදී කරුණු පිළිබඳව සාකච්ඡා කර ඇති අතර සූර්ය, බාහු හයේ සංකේතය, ඇත්, පර්වත, වෘක්ෂ, වෘෂභ, මත්ස්‍ය, ත්‍රිරත්න, චක්‍ර ආදී සංකේත ද හඳුනා ගැනීමට අපහසු සංකේත පිළිබඳව ද අධ්‍යයනය කර ඇත. ඒ අනුව මෙම සංකේත මගින් අතීත සමාජයේ පැවති දේශපාලනික, සමාජීය, ආර්ථික, ආගමික ආකල්පයන් නිරූපණය වන බව නිගමනය කළ හැකි ය.

ප්‍රමුඛ පද: ශ්‍රී ලංකාවේ පැරණි කාසි, හස්එබූ කහාපණ, සංකේත, සංස්කෘතික පසුබිම, අතීත සමාජය

හැඳින්වීම

ලෝකයේ විවිධ රටවල විවිධ කාලවකවානුවල භාණ්ඩ හුවමාරු කිරීමේ මාධ්‍ය ලෙස කාසි භාවිතය ආරම්භ වී ඇත. ක්‍රි. පූ. 600 පමණ වන විට ඉන්දියාවේ ද, ක්‍රි. පූ. 300 වන විට ශ්‍රී ලංකාවේ ද කාසි භාවිතය ආරම්භ වන්නට ඇති බවට පුරාවිද්‍යාත්මක සාක්ෂි ඇත. මේ නිබන්ධනයේ සාකච්ඡාවට ලක් කරන්නේ " හස්එබූ කහාපණ" කාසිය මුල්වරට භාවිතය ආරම්භ වනුයේ උතුරු ඉන්දියාවේදී ය. ක්‍රි. පූ. 600 පමණ සිට මෙම කාසි ඉන්දියාවේ භාවිත වී ඇත. ඉන්දීය විද්වතුන් විසින් මේවා "පුරාණ කාසි" හා "ධරණ කාසි" යන නම්වලින් ද, බටහිර විද්වතුන් විසින් "Punch Mark Coins" හෙවත් "හස්එබූ කාසි" යනුවෙන් හඳුන්වා ඇත. ඊට හේතුව මෙම කාසිවල විවිධාකාර විසිතුරු සලකුණු අන්තර්ගතව තිබීම යි. මෙම කාසි නිෂ්පාදනය කර ඇත්තේ රිදී හෝ තඹ ලෝහ තලා සකස් කරගන්නා ලද ලෝහ තහඩු අඟල් භාගයක් පමණ පළල තීරුවලට කපා පසුව එම තීරු තමන්ට අවශ්‍ය ජ්‍යාමිතික හැඩතලවලට කපා නියමිත බර ප්‍රමාණය වැඩි නම් ඒ ප්‍රමාණය අගින් කපා හැර අවසානයේ දී ඊට සංකේත වෙන් වෙන් ව යෙදීමෙනි (ප්‍රේමතිලක, 1970, පි. 3). අභිලේඛන හා සාහිත්‍යය මූලාශ්‍රවල මෙම කාසි හඳුන්වා ඇත්තේ "කහවණු", "කහාපණ", "කර්ෂාපණ" ආදී වූ නම්වලිනි.

අරමුණ

මෙම අධ්‍යයනයේ ප්‍රධාන අරමුණ වනුයේ හස්එබූ කහාපණ කාසිවල සටහන් වී ඇති සංකේත, එහි සංස්කෘතික පසුබිම හා ඒ පිළිබඳව අතීත සමාජයේ වූ ආකල්පය තේරුම් ගැනීම ය. ඊට අමතරව ශ්‍රී ලංකාවෙන් හා ඉන්දියාවෙන් හමු වන හස්එබූ කහාපණ කාසි භාවිත වූ කාලය, හැඳින් වූ නාම, ලෝහ සංයුතිය, බර, නිෂ්පාදනය කිරීමේ ක්‍රමශිල්පය, හමුවූ ස්ථානය ආදී සෙසු අංශ කෙරෙහි ද අවදානය යොමු වේ.

ක්‍රමවේදය

මෙම අධ්‍යයනය ප්‍රධාන වශයෙන් ගුණාත්මක අධ්‍යයන ප්‍රවේශයක මුහුණුවරක් ගන්නා අතර දත්ත රැස් කිරීමේ දී සාහිත්‍ය මූලාශ්‍ර අධ්‍යයන කිරීම මූලික වශයෙන් භාවිත විය.

ප්‍රතිඵල හා සාකච්ඡා

- කාසි භාවිත වූ කාලය

පැරණි ඉන්දියාවේ හා ශ්‍රී ලංකාවේ හස්එබූ කහාපණ කාසි භාවිත වී පැවති කාලය පිළිබඳව විමසා බැලීමේ දී ප්‍රධාන වශයෙන් පුරාවිද්‍යාත්මක සාධක හා පැරණි කලා නිර්මාණාත්මක සාධක උපයෝගී කර ගත හැකි ය.

මෙතෙක් සිදු කරන ලද පුරාවිද්‍යාත්මක කැණීම් අනුව ඉන්දියාවේ මුල්වරට භාවිත වූ කාසිය ලෙස සැලකෙනුයේ රිදී "ඉන්ගොට්" හා "බෙන්ට්බාර්" නම් වූ කාසි වර්ගයන් ය (ප්‍රේමතිලක, 1970, පි. 03). ඉන්ගොට් කාසියේ වෘත්තාකාර තිත් තුනක් ද බෙන්ට්බාර් කාසියේ එක් පැත්තක මුද්‍රාවක් මඟින් ඔබ්බවන ලද සලකුණු කිහිපයක් යෙදී තිබෙනු දක්නට හැකි ය. C.J. Brown ට අනුව මේවා ක්‍රි. පූ. 6 වන සියවසට පමණ අයත් වන කාසි වර්ගයන් ය. නමුත් මෙම කාසි හමු වී ඇති ප්‍රමාණය ද හමු වී ඇති ස්ථාන ද සීමාසහිත වේ. එබැවින් මේවා විශාල ප්‍රදේශයක් තුළ සුලභ ව ව්‍යාප්ත වූ කාසි බවට කිව නොහැකි ය. හස්එබූ කහාපණ කාසි ද මෙම කාසි භාවිතය පැවති කාලයේ දී ම සමාජයේ ව්‍යවහාරව පැවති බවට ජෝන් මාර්ෂල් විසින් තක්ෂිලාවේ හීර් ගොඩනැගිල්ලේ සිදු කරන ලද කැණීම්වලින් තහවුරු විය. ප්‍රාග් මෞර්යය යුගයට අයත් ගොඩනැගිල්ලක් වූ එහි රිදී බෙන්ට්බාර් කාසියක් සමඟ හස්එබූ කාසි විශාල ප්‍රමාණයක් ද හමු වී ඇත.

ඉන්දියාවේ කාසි භාවිතය ආරම්භ වීම පිළිබඳ ප්‍රධාන මතවාද දෙකක් ඇත. එකක් නම්, පිටස්තර විදේශීය බලපෑම මත ඉන්දියාවේ කාසි භාවිතය ආරම්භ වී ඇත. එහි දී ඇතැම් නාණක විද්‍යාඥන්ට අනුව ඉන්දියාවේ කාසි භාවිතය ආරම්භ වනුයේ ක්‍රි. පූ. 4වන සියවසේදී සිදු වූ ඇලෙක්සැන්ඩර්ගේ ආක්‍රමණයෙන් සිදුවූ ග්‍රීක බලපෑම නිසාය. එච්. එච්. විල්සන් මෙම මතය දැරූවෙකි (ප්‍රේමතිලක, 1970, පි. 04). එහිදී සාක්ෂියක් ලෙස තක්ෂිලාවේ සිදු කළ කැණීමකින් හස්එබූ කාසි රැසක් සමඟ ක්‍රි. පූ. 245 කාලයට අයත් ඩයොඩෝටස් නම් බැක්ට්‍රියානු පාලකයාගේ කාසියක් හමු වීම දැක්වීය හැක. නමුත් ක්‍රි. පූ. 4 සියවසේ දී ඇලෙක්සැන්ඩර් රජු විසින් ඉන්දියාව ආක්‍රමණය කිරීමේ දී එවකට තක්ෂිලාවේ ස්වදේශික පාලකයා විසින් මුද්‍රා යෙදූ රිදී තලෙන්තු අසූවක් තැගි කළ බව ලතින් ලේඛකයෙකු වූ ක්වින්ටස් කර්ටියස් වාර්තා කර ඇත (ප්‍රේමතිලක, 1970, පි. 04). ඒ අනුව ක්‍රි. පූ. 4 වන සියවස වන විට ද රිදීකාසි භාවිතව තිබී ඇති බව

පැහැදිලි වේ. ජෝන් ඇලන්ගේ අදහස වනුයේ ඉන්දියාවේ කාසි නිර්මාණය වීම සඳහා ඇකිමීනියානු (පර්සියන්) අධිරාජ්‍යයේ භාවිතා වූ "සිග්ලොයි" බලපෑම ලැබුණු බව යි. මෙම කාසිය ක්‍රි. පූ. 5 සියවසේ අග හෝ 4 වන සියවසේ මුල භාවිත වූ කාසියකි. ජේ. කෙනඩිට අනුව ක්‍රි. පූ. 6 වන සියවසේ දී ඉන්දියාව හා බටහිර ආසියාතික ප්‍රදේශ අතර මුහුදු වෙළඳ සබඳතා ආරම්භ වීම සමඟ ඇති වූ බැබිලෝනියානු ආභාසය මත ඉන්දීය හස්එබූ කාසි නිර්මාණය වන්නට ඇතැයි අදහස් කරනු ලබයි.

පැරණි ඉන්දීය කාසි පිළිබඳ අදහස් දක්වන එඩ්වඩ් තෝමස්, ඊ. ජේ. රැප්සන් ආදීන් පවසන්නේ ඉන්දියාවේ මුල් ම කාසි විදේශීය ආභාසයකින් තොරව ඉන්දියාව තුළ ම ප්‍රභවය වී විකාශයට පත් වූ බව ය (ප්‍රේමතිලක, 1970, පි. 04). ඇලෙක්සැන්ඩර් කනිංහැම්ගේ මතය අනුව මෙම කාසි ක්‍රි. පූ. 6 වන සියවසේ දී එනම් බුද්ධකාලීනව භාවිත වූ කාසි ය. පැරණි කාසි පිළිබඳව දීර්ඝ අධ්‍යයනයක් සිදු කළ ජේ. එන්. බැනර්ජි මහතා පෙන්වා දෙනුයේ මුල් ම ඉන්දියානු කාසිවල නිෂ්පාදන ශිල්පක්‍රමය හා ලිඩියානු, පර්සියානු, ග්‍රීක කාසිවල ශිල්පක්‍රම අතර පොදු ලක්ෂණ කිසිවක් නොමැති බවත් ඒ අනුව මෙම කාසි ඉන්දියාවේ ම ප්‍රභවය වූ බවත් ය (ප්‍රේමතිලක, 1970, පි. 05). මේ සියලු අදහස් පිළිබඳව තුලනාත්මක විග්‍රහයක් සිදු කළ ඒ. එස්. අල්ටේකාර් පවසන්නේ ඉන්දීය හස්එබූ කහාපණ කාසිවල පූර්වත ම සීමාව ක්‍රි. පූ. 800 පමණ වන බවත්, ඇලෙක්සැන්ඩර් රජු ඉන්දියාවට පැමිණෙන විට තක්ෂිලා ප්‍රදේශයේ භාවිත වී පැවතියේ මේ කාසි බවත්, මෞර්ය අධිරාජ්‍යය ව්‍යාප්තවීම සමඟ මෙම කාසි ඉන්දියාව පුරාවට මෙන් ම වෙනත් අසල්වැසි රටවල ද ව්‍යාප්ත වූ බව ය. ඒ අනුව මෙම කාසි මහා ජනපද පැවති යුගයේ හා මගධ - මෞර්යය අධිරාජ්‍යය පැවති යුගයේ දී බහුලව භාවිත කර ඇත.

ඉන්දියාවෙන් හමු වූ හස්එබූ කහාපණ කාසි පිළිබඳව පුළුල් විමර්ශනයක් සිදු කළ P. L. Gupta හා T. R. Hardaker විසින් මෙම කාසිවල කාලානුක්‍රමික විකාසනය අනුව කාණ්ඩ කිහිපයකට වර්ග කර ඇත. ඔහුගේ මතය අනුව ක්‍රි. පූ. 6වන සියවසේ පැවති ජනපද රාජ්‍යයන්වල මුල්වරට නිර්මාණය කළ මෙම කාසි වර්ගය නන්ද රාජවංශ යුගයේ ද, පසුව මෞර්ය අධිරාජ්‍යය යටතේ ද මුළු ඉන්දියාව පුරා ව්‍යාප්ත වූ බව ය. මෞර්ය අධිරාජ්‍යය බිඳවැටීමෙන් පසුව ද යම් කාලයක් මෙම කාසි නිකුත් කිරීම පැවති බව යි. නමුත් එහි දී කාසියට සලකුණු ඔබ්බවීම වෙනුවට ලෝහ උණුකර අච්චු මඟින් කාසි නිකුත් කිරීම දක්නට ඇත. පසුව ඉන්දු ග්‍රීකයන්, ඉන්දු සීතියන් හා කුෂාණ පාලකයන් විසින් පාලකයාගේ රූපය හා දෙවියන්ගේ රූපය සහිත කාසිය හඳුන්වා දුන් පසු මෙම කාසි ආකෘතිය අභාවයට යන්නට ඇති බව ඔවුන් පෙන්වා දේ (Gupta & Hardaker, 2014, p. 62-63).

ඇතැම් ඉන්දියානු කලාකෘතිවල ද හස්එබූ කාසි පිළිබඳව සාක්ෂි ඇත. ක්‍රි. පූ. 3 වන සියවසට අයත් යැයි සැලකෙන භාරුත්හි කැටයම්වල ඇති අනේපිඬු සිටුතුමා ජේතවනාරාමය මිලට ගැනීම සම්බන්ධ කැටයම මින් එකකි. එහි ගැල් මඟින් රැගෙන ආ විවිධ හැඩැති කාසි බිම අතුරා ඇති ආකාරය මැනවින් දක්වා ඇත. මේවා හස්එබූ කාසිවලට අතිශයින් ම සමාන හැඩයක් ගනී (සිරිසෝම, 1986, පි. 08). එසේ ම ක්‍රි. පූ. 3වන සියවසට අයත් වේදිසාවෙන් හමු වූ වර්තමානයේ කල්කටා කොතුකාගාරයේ ප්‍රදර්ශනය කර ඇති " කල්පද්‍රැම" ටැම් හිසෙහි අෂ්ටනිධි නිරූපණය කිරීමේ දී දක්වා ඇති කාසි මෙම හස්එබූ කාසිවල ස්වරූපයට සමාන වේ.

ශ්‍රී ලංකාවේ සිදු කරන ලද පුරාවිද්‍යාත්මක කැණීම්වලින් මෙන් ම වෙනත් අවශ්‍යතා සඳහා සිදු කරන පොළව හැරීම්වලින් ද හස්එබූ කාසි හමු වී ඇත. ආචාර්ය දැරණියගල විසින් අනුරාධපුර ඇතුල්නුවර ගෙඩිගේ හි සිදු කළ කැණීමෙන් 4A හා 4B යන ස්තරවලින් හමු වූ හස්එබූ කාසි ක්‍රි. පූ 2 හා ක්‍රි. ව. 2 වන සියවසට අයත් බවට කාලනිර්ණය කර ඇත (සිරිසෝම හා අමරසිංහ, 1986, පි. 07). මෙම කාලය හස්එබූ කාසි වළංගුව පැවති කාලය ලෙස ද ඇතැම් විද්වතුන් සලකනු ලැබේ. ශ්‍රී ලංකාවෙන් හමු වන කලාකෘතිවල ද මෙම කාසිය යැයි සැලකිය හැකි කැටයම් කිහිපයක් දක්නට ඇත. මිහින්තලේ කන්ඨක චෛත්‍යයේ වාහල්කඩේ දකුණු රූකම් කණුවේ කල්ප වෘක්ෂයේ ඉහළ ම ඇති වරුණ යැයි දැනට හඳුනාගෙන ඇති රූපයේ අතින් විසුරු වන කාසිවල රූකම් දෙස බැලීමේ දී ඒවා ද හස්එබූ කහාපණවලට සමාන එක ම හැඩයක් නොමැති විවිධාකාර වූ හැඩැති කාසි බව පෙනේ. එසේ ම අනුරාධපුර අභයගිරි දාගැබේ 2වන සියවසට අයත් යක්ෂ රූපයක් සහිත කැටයමේ දෙපසින් පාගාගෙන සිටින කාසි සමූහයක් ද, යක්ෂ රූපයේ දකුණතට ඉහළින් කාසි මල්ලක් වැනි යමක් ද දැක්වේ. මෙම කාසි ද විවිධ හැඩවලින් යුක්ත වේ (සිරිසෝම හා අමරසිංහ, 1986, පි. 08). අනුරාධපුර දක්ඛිණ ථූපයේ උතුරු වාහල්කඩේ කුඩා රූකම් කණුවේ ඇති වෛශ්‍රවණ රූපයට පහළින් ඇති රූකමේ විසුරුවන ලද කාසි මුට්ටියක් අතැතිව සිටින බහිරවයෙකුගේ වැනි රුවක් දැකගත හැකි ය. එම කාසිවල රූපයන් විවිධාකාර වූ විසිතුරු හැඩැති ඒවා ය. මෙම රූකම් හා භාරුත්හි කැටයමේ ඇති රූකම් අතර ඇත්තේ සමානතාවයකි. නමුත් මෙම රූකම්වල දක්වා ඇති කාසි හස්එබූ කහාපණ කාසිදැයි නිශ්චිත වශයෙන්ම නිගමනය කළ නොහැක. මේවා හස්එබූ කහාපණ කාසිනම් ක්‍රි. ව. 5 - 6 සියවස් වනවිට නිර්මාණය කරන ලද රූකම් තුළ මෙම කාසි නිරූපණය වීමට එම කාසි ඒ කාලය තුළද යම් තරමකට භාවිතා වී තිබෙන්නට ඇත (Weisshaar, Dissanayaka & Wijeypala, 2008, p. 44). තිස්සමහාරාමයෙන් හමුවූ හස්එබූ කහාපණ කාසි එකතුව තැන්පත් කරතිබූ මැටි බඳුන් වර්ගය භාවිතය ඇරඹී ඇත්තේ ක්‍රි. ව. 5වන සියවසේ අවසාන භාගයේ වීමෙන් මෙම කරුණ තහවුරු වේ (Weisshaar, Dissanayaka & Wijeypala, 2008, p. 44). ඇතැම් විට මේවා මුදල් ලෙස සංසරණය නොවූව ද පැරණි කාසි එකතු කිරීමට අභිරුචියක් දැක් වූ පිරිස් විසින් ඒවා තමන් සන්තකයේ තබාගත්තා විය හැකි ය.

- හැඳින්වූ නාමය

මෙම කාසි අතීතයේ දී හැඳින් වූ නාමය පිළිබඳව විවිධ වූ මතවාද ඇත. ඇතැම් ඉන්දීය ලේඛනයන්හි මෙම කාසි "පුරාණ කාසි" හා "ධරණ කාසි" යන නම්වලින් හඳුන්වා ඇත. පුරාණ කාසි ලෙස හස්එබූ කහාපණ හඳුන්වන්නට ඇත්තේ පසුකාලීනව ඉන්දියාව ආක්‍රමණය කළ ග්‍රීක, කුෂාණ, ඇකිමීනියන් ආදී වූ විදේශිකයන් තම ප්‍රදේශයන්හි තමන්ගේ කාසි නිකුත් කිරීම ආරම්භ වූ පසු පෙර කාලයේ ස්වදේශිකයන් විසින් නිකුත් කළ කාසි හැඳින්වීමට විය හැකි ය (ප්‍රේමතිලක, 1970, පි.08). වර්තමාන නාණක විද්‍යාඥන් මෙම කාසි හස්එබූ කාසි හෙවත් "Punch Mark Coins" ලෙස හඳුන්වන්නේ එම කාසිවල නිෂ්පාදන තාක්ෂණය මුල්කොටගෙන ය. මෙම කාසි ව්‍යවහාරව පැවති අවධියේ ඒවා හැඳින් වූ නාමය පිළිබඳව විමසීමට නම් ඒ සඳහා සමකාලීන සාහිත්‍යය හා අභිලේඛන මූලාශ්‍රවල ඇති තොරතුරු විමසා බැලිය යුතු ය.

සෘග් වෛදික යුගයේ දී ගනුදෙනු කටයුතු සඳහා භාවිත කළ බවට සැලකෙන ''නිෂ්ක" නම් ආභරණයක් පිළිබඳව සඳහන් වේ. පසුකාලීනව මෙය කාසියක් ලෙස භාවිතා කළ බව පෙනේ (සිරිසෝම හා අමරසිංහ, 1986, පි. 05). භාරතීය නීති සංග්‍රහයක් වන මනුස්මෘතිය හා යඥවල්ක්‍යයේ "කර්ෂාපණ" නමින් හැඳින්වෙන්නා වූ කාසිවර්ගයක් පිළිබඳව සඳහන් වේ. මෙය පාලියට හැරවීමේ දී "කහාපණ" ලෙස ද සිංහලයට හැරවීමේ දී "කහවණු" ලෙස ද හඳුන්වයි (Weisshaar, Dissanayaka & Wijeypala, 2008, p. 45). නමුත් එයින් අදහස් වනුයේ තඹ කාසි වර්ගයක් පිළිබඳව බව ප්‍රේමතිලක මහතාගේ මතය යි (ප්‍රේමතිලක, 1970, පි. 08). නමුත් මේ වචනය පිළිබඳව අදහස් දක්වන සිරිසෝම මහතා ප්‍රකාශ කරනුයේ මෙම "කර්ෂාපණ" යන වචනයේ මුල් පදය වන "කර්ෂ" යන පදයෙන් රන් හෝ රිදී එක්තරා ප්‍රමාණයක බර පිළිබඳව අදහස් වන බවයි (සිරිසෝම හා අමරසිංහ, 1986, පි. 05). මෙහි ''පණ" යන්නෙන් වෙළඳාම හෝ මුදල් හුවමාරුව අදහස් වන්නට ඇතිබව ඔහුගේ මතයයි. ඒ අනුව "කර්ෂාපණ" යන්නෙන් වෙළඳාම සඳහා හෙවත් භාණ්ඩයක මිල නියම කිරීම සඳහා යෙදුන වස්තුවක් ය යන්න හැඟවෙන බව ඔහු පෙන්වාදේ.

ශ්‍රී ලංකාවේ අභිලේඛන මූලාශ්‍ර තුළ විවිධ පූජාවන් හා විහාර දීමනා පිළිබඳව සඳහන් කිරීමේදී සෑම විටම පාහේ දක්නට ලැබෙන්නේ "කහවණ", "කහවණු" යන වචනයයි. මේ පිළිබඳව අදහස් දක්වන්නා වූ ජර්මන් පුරාවිද්‍යාඥයෙක් වූ Reinhold Walburg මහතා පෙන්වා දෙන්නේ ක්‍රි. පූ. 3වන සියවසේ සිට ක්‍රි. ව. 9 වන සියවස දක්වාම මෙරට සෙල්ලිපිවල භාවිතා වී ඇත්තේ ඉහත වචන ද්විත්වය බවත් "කහාපණ" යන වචනය භාවිතා වී ඇත්තේ පසුකාළීනව ලියැවුනු චූලවංශයේ බවත් ය. එහිදී මහා පරාක්‍රමබාහු රජු පාන්ඩ්‍ය දේශය ආක්‍රමණය කොට එම රටේ කහාපණ වල පරාක්‍රමබාහු රජුගේ නම ඇතුළත් කළ බවයි (Weisshaar, Dissanayaka & Wijeypala, 2008, p. 46). කෙසේවුවද මෙයින් පෙනෙන්නේ ක්‍රි. පූ. 3 සියවසේ සිට ක්‍රි. ව. 9 සියවස දක්වා භාවිතා කළ විවිධාකාර වූ කාසිවර්ග සියල්ලම කහවණු ලෙස හඳුන්වා ඇති බවය (සිරිසෝම හා අමරසිංහ, 1986, පි. 07). නමුත් ලාංකීය විද්වතුන් විසින් මෙම කාසිය හැඳින්වීමට බොහෝවිට භාවිතාකර ඇත්තේ "හස්එබූ කහාපණ" යන වචනයයි. සිරිසෝම මහතාගේ "ශ්‍රී ලංකාවේ පුරාණ කාසි 01 - හස්එබූ කහාපණ" නම් කෘතියේද ටී. ජී. කුලතුංග මහතාගේ "ශ්‍රී ලංකාවේ කාසි හා මුදල් ව්‍යවහරය" ඇතුළු තවත් ග්‍රන්ථ බොහෝමයක එම නාමය දැකගත හැකිය.

ශ්‍රී ලංකාවේ මෙන්ම ඉන්දියාවේ පැරණි යුගයේදී කාසි නිෂ්පාදනය සඳහා රන්, රිදී, තඹ, ලෝකඩ ආදී ලෝහයන් තනි තනිව හෝ මිශ්‍ර ලෝහ ලෙස යොදාගෙන ඇත. කෙසේ වුවද කාසිය නිෂ්පාදිත ලෝහය නොසලකා පොදුවේ සෑම කාසියක්ම කහවණු, කහපණ, ආදී නම්වලින් හඳුන්වා ඇතිබව මේ අනුව පෙනේ.

- ලෝහ සංයුතිය

අතීතයේ භාවිතා වූ කාසිවල ලෝහ සංයුතිය පිළිබඳව සැලකීමේදී සාහිත්‍යය මූලාශ්‍ර තුළින් විවිධ තොරතුරු හමුවේ. බෞද්ධ සාහිත්‍යයට අනුව කහවණුව සකස්කර ඇත්තේ රන්, රිදී, තඹ ලෝහවර්ග ඇතුලත් සංයෝගයකිනි (සිරිසෝම හා අමරසිංහ, 1986, පි. 26). නමුත් මනු නීතියේ සඳහන් අන්දමට " කර්ෂාපණය" යනු තඹ ලෝහයෙන් කළ කාසියකි (ප්‍රේමතිලක, 1970, පි. 08). උම්මග්ග ජාතකයට අනුව කහවණුව තුල මාඨ රත්තරන් හා සමාන අනුපාතයකින් සංයෝග කරනලද බාල ලෝහ ප්‍රමාණයක් ඇත (සිරිසෝම හා අමරසිංහ, 1986, පි. 26). ලීලානන්ද කල්දේරා මහතාට අනුව මෙය රිදී කාසියකි. නමුත් මීට

ප්‍රතිවිරුද්ධ මතයක් දැරූ මැදඋයන්ගොඩ විමලකිත්ති හිමියන් පැවසූයේ බුදුරදුන් වැඩසිටි සමයේදී මගධයේ භාවිතා වූ කහාපණය යනු රත්තරන් හතරෙන් පංගුවක් ද, රිදී හතරෙන් පංගුවක් ද, ඒ දෙකොටසටම සමාන තඹ ප්‍රමාණයක් ද අඩංගු වූ ලෝහ මිශ්‍රණයකින් සැදුම්ලත් කාසියක් බව ය.

හස්එබූ කහාපණ නිර්මාණය සඳහා ප්‍රධාන වශයෙන් රිදී හා තඹ ලෝහවර්ග භාවිතාකර ඇත. ඒ අතරින් වැඩි වශයෙන් හමුවන්නේ රිදීයෙන් කරනලද හස්එබූ කාසි වේ. තඹ කාසි හමුවන්නේ ඉතා අඩු වශයෙනි. නමුත් ඉන්දියාවේ රිදී යනු ඉතා දුර්ලභ ලෝහයකි. එහි වැඩි වශයෙන් පැවතියේ රත්තරන් ලෝහයයි. නමුත් කාසි නිර්මාණය කිරීම සඳහා රන් භාවිතා කිරීම ආරම්භ කරනු ලැබුවේ කුෂාණ රාජවංශයයි. බොහෝවිට ඉන්දියාවට ආනයනය කරනලද රිදී ලෝහයෙන් මෙම කාසි තනන්නට ඇත. කෙසේවුවද රිදීකාසි වැඩි ප්‍රමාණයක් හමුවීමටත් තඹකාසි අඩු ප්‍රමාණයක් හමුවීමටත් හේතුව වන්නට ඇත්තේ රිදී ලෝහය උදාසීන හා බොහෝ කාලයක් පැවතෙන ලෝහයක් වීමත් තඹ ලෝහය වේගයෙන් ප්‍රතික්‍රියා කරන හා ඉක්මනින් දිරාපත්වන ලෝහයක් වීම නිසා විය හැකිය.

මෙම කාසිවල ලෝහ සංයුතිය පිළිබඳව එම්. එච්. සිරිසෝම මහතා කොළඹ විශ්වවිද්‍යාලය සමඟ එක්ව විද්‍යාත්මක පරීක්ෂණයක් සිදුකෙරිණි. එහිදී නියැදිය සඳහා යොදාගෙන ඇත්තේ අනුරාධපුර පුරාවිද්‍යා කොතුකාගාරයේ පැවති කාසි හා මිනුවන්ගොඩ ප්‍රදේශයෙන් හමුවූ කාසි ආදර්ශ පහකි. එමඟින් අනාවරණය වූයේ සමහර කාසිවල රිදී වැඩි ප්‍රමාණයක් ද, තඹ සුළු ප්‍රමාණයක් ද, ඇතැම් කාසිවල රිදී හා තඹ ලෝහ සමාන ප්‍රමාණයෙන් භාවිතාකර ඇති බවත්, ඇතැම් කාසි වල තඹ වැඩි ප්‍රමාණයක් ද, රිදී මධ්‍යස්ථ ප්‍රමාණයක් ද ඇති බවය. ඊට අමතරව ඊයම් හා ටින් වැනි වෙනත් ලෝහ වර්ගද සුළු වශයෙන් ඇති බව පෙනී ගොස් ඇත (සිරිසෝම හා අමරසිංහ, 1986, පි. 26).

කාසිවල ලෝහ සංයුතිය පිළිබඳ සැලකීමේදී ඉන්දියාවේ හස්එබූ කාසි පිළිබඳව වර්ගීකරණ නාමාවලියක් සෑදූ P. L. Gupta හා T. R. Hardaker විසින් මෙම කාසි කාලානුක්‍රමිකව වර්ගීකරණයක් කළ අතර එහිදී කාණ්ඩ අංක 0 සිට 7 දක්වා (series 0 - VII) කාසි නිර්මාණය සඳහා ඉහල තත්වයේ වැඩි රිදී ප්‍රතිශතයකින් යුතු ලෝහ සංයුතියක් යොදාගෙන ඇති බවත්, මෞර්යය අධිරාජ්‍යය බිඳවැටීමෙන් පසු අවධියේ කාසි අයත් කාණ්ඩ අංක 8 (seriesVIII) හි කාසිවල රිදී ප්‍රතිශතය අඩු බවත් තඹලෝහය වැඩි බවත් ඇතැම්විට තඹ ලෝහයේ කාසියට රිදී ආලේපකර ඇති බවත් පෙන්වා දේ (Gupta & Hardaker, 2014, p. 187).

- බර

ඉන්දියාවේ හා ලංකාවේ සාහිත්‍යය මූලාශ්‍ර තුළ අතීතයේ කහවණු නැතිනම් කහාපණ කාසිවල බර ප්‍රමාණයන් පිළිබඳව තොරතුරු ඇත. විනය පිටකයේ රූපීය සික්ඛාපද පැනවීමේදී එකල ගිහි සමාජයේ සොරකමකට මුදලින් දඩ ගෙවීමට සිදුවීම පිළිබඳව විස්තර දැක්වීමේදී "එකල්හි රජගහනුවර මාසක පහක් පාදයකි. මාසක විස්සක් කහාපණයකි" ලෙස විස්තර කර ඇත (කුලතුංග, 2014, පි. 86). මෙම කරුණ සනාථ කරමින් H. W. Codrington මහතා ද මාසක යනු මූලධනයකින් විස්සෙන් එකක් ලෙස දක්වා ඇත (Codrington, 1993, p. 15). සමන්තපාසාදිකාවේ ද ඇත්තේ කහාපණයෙන් හතරෙන් පංගුවක කොටසක්

පාදයක් ලෙසය. නමුත් මෙම පාදයක, මාසකයක හෝ කහාපණයක අතීතයේ පැවති එම සම්මත බර ප්‍රමාණය වර්තමාන මිනුම් ඒකක වලට පරිවර්තනය කරගැනීමට තරම් ප්‍රමාණවත් සාධක මේ තුළින් ලැබෙන්නේ නැත. එබැවින් මෙතෙක් සොයාගෙන ඇති කාසිවල සාමාන්‍ය බර ප්‍රමාණය ගණනය කිරීමට සිදුවේ.

නමුත් බර පිළිබඳව සැලකීමේදී මෙම කාසි නිෂ්පාදනයේදී අනිවාර්යයයෙන්ම සම්මත බර ප්‍රමාණයකට අනුව නිපදවන්නට ඇත. ජෝන් ඇලන් දක්වා ඇති පරිදි හස්එබූ කාසිවල සාමාන්‍යය බර 3.3g - 3.4g අතර ප්‍රමාණයකි. P. L. Gupta හා T. R. Hardaker දක්වා ඇති පරිදි එම අගය 3.4g පමණ වේ (Gupta & Hardaker, 2014, p. 86).

නමුත් ශ්‍රී ලංකාවෙන් හමුවන කාසිවල සාමාන්‍ය බර මීට වඩා වෙනස්ය. අනුරාධපුර කෞතුකාගාරයේ ඇති කාසිවල සාමාන්‍යය බර වනුයේ 2.6g ක් වන අතර මිනුවන්ගොඩින් හමු වූ කාසි එකතුවේ සාමාන්‍යය බර 2.48g කි. ඔහු පරීක්ෂා කළ මුළු කාසි එකතුවේ කාසියක වැඩි ම බර 3.36g ක් වන අතර අඩුම බර 0.06g පමණ වී ඇත (සිරිසෝම හා අමරසිංහ, 1986, පි. 26).

- නිෂ්පාදනය කිරීමේ ශිල්පක්‍රමය

මෙම කාසි නිෂ්පාදන ක්‍රියාවලිය පිළිබඳව සැලකීමේදී අදියර කිහිපයක් භාවිතා කර ඇත. ප්‍රථමයෙන්ම කාසියට සුදුසු හැඩයන්ට ගැළපෙන ලෙස ලෝහය සකස් කරගත යුතුය. තඹ කාසි නිර්මාණය කිරීමේදී ඒ සඳහා ලෝහ දණ්ඩක් ගෙන එය අවශ්‍යය පරිදි කුඩා පෙතිවලට කපා ඒ මත අවශ්‍ය සලකුණු එබ්බවූ බව ඇතැම් විද්වතුන්ගේ මතයයි (ප්‍රේමතිලක, 1970, පි. 08). නමුත් රිදී හස්එබූ කාසි නිර්මාණය කිරීමේදී තුනීයට තලන ලද රිදී තහඩුවක් නිමවා අවශ්‍යය ප්‍රමාණයේ හැඩයන් කපාගෙන ඇත (සිරිසෝම හා අමරසිංහ, 1986, පි. 26).

මෙම කාසි බොහෝමයක කොන් කැලි ලෝහ කපන කටුවක් භාවිතාකර කපාදමා ඇතිබව කාසි නිරීක්ෂණය කරනවිට පෙනීයයි. විද්වතුන් ගේ මතයන්ට අනුව මෙය සිදුකර ඇත්තේ බර සමාන කරගැනීමට ය.

කොන් එකක්, දෙකක්, තුනක් හෝ කොන් හතරම කපාදැමූ කාසි මේ අතර ඇති අතර එකම කොනක් හෝ නොකැපූ කාසිද ඇතැම්විට දක්නට ලැබේ. නමුත් මේ ආකාරයට කොන් කපාදැමීම දැකිය හැක්කේ චතුරස්‍රාකාර හෝ සෘජුකෝණාස්‍රාකාර කාසිවල පමණි. වෘත්තාකාර හෝ ඔවලාකාර කාසි වල මෙවැනි ලක්ෂණයක් දක්නට නොලැබෙන අතර එම හැඩයේ කාසිවල බර සමාන කරගත් ආකාරය පිළිබඳව පැහැදිලි අදහසක් නොමැත.

මේ ආකාරයට අවශ්‍ය හැඩයට කපා බර සමාන කරගත් පසු කාසිවල සලකුණු ඔබ්බවා තිබේ. මෙහිදී ද ක්‍රම කිහිපයක් අනුගමනය කරතිබේ. වඩාත් වැඩි වශයෙන් සිදුකර ඇත්තේ ලෝහයෙන් තනාගත් මුද්‍රාවන් අභිමුඛයේ හා ප්‍රතිමුඛයේ වෙන් වෙන් වශයෙන් එබ්බවීම ය. එහිදී මුද්‍රාවට මිටියකින් සිදුකළ පහරදීම් මඟින් ඇතිකරන පීඩනය ආධාරයෙන් මෙම සංකේත කාසියේ සටහන් වේ. පසුකාලීනව තමන්ට

අවශ්‍යය සංකේත සියල්ල එක් මුද්‍රාවකට ගෙන සළකුණු කිරීමද සිදුවී ඇත (සිරිසෝම හා අමරසිංහ, 1986, පි. 26).

මීට අමතරව උණුකළ ලෝහය පූර්වයෙන් සකස්කල අච්චුවලට වක්කිරීම මඟින් කාසි මුද්‍රණය කරගැනීමේ ශිල්පයක්ද තිබී ඇත. එමඟින් කාසි කිහිපයක් එකවර මුද්‍රණය කරගැනීමට හැකිවී ඇත. ඉන්දියාවේ මථුරා, ශිශුපාලගර්, කොන්ඩපූර් යන ස්ථාන වලින් මෙවැනි මුද්‍රාවන් කිහිපයක් හමුවී ඇත. මේ පිළිබඳ අදහස් දක්වන්නා වූ දුර්ගා ප්‍රසාද් පවසන පරිදි නියම හස්එබූ කාසි කිසිදුවිටෙක මේ ආකාරයෙන් නිර්මාණය නොකරන බවත් මේවා නීති විරෝධී ලෙස කාසි අච්චුගැසීමට උපයෝගී කරගත් ඒවා බවත් පෙන්වා දේ. ශ්‍රී ලංකාවේ අනුරාධපුර ඇතුළුනුවර හා තිස්සමහාරාමයේ සිදුකළ කැණීම්වලින් මෙවැනි ටෙරාකොටා අච්චු කීපයක සාධක අනාවරණය කරගැනීමට පුරාවිද්‍යාඥයින්ට හැකිවිය (Weisshaar, Dissanayaka & Wijeypala, 2008, p. 44). මෙම අච්චු නිර්මාණය කර ඇත්තේ හස්එබූ කාසියක් මෘදු මැටි පුවරුවක් මත එබ්බවීමෙනි. තිස්සමහාරමයේ කැණීමෙන් හමුවූ අච්චුව සමඟ එම අච්චුව ආධාරයෙන්ම නිර්මාණය කර ඇතැයි සිතිය හැකි කාසි කිහිපයක් හමුවී ඇති අතර එමඟින් මෙම කාසිවල ලක්ෂණ හඳුනාගත හැකිය. මෙම කාසිවල කැපූ කොන් කොටස් සැබෑඩකාසිවල මෙන් තියුණු බවක් දක්නට නැති අතර ඉතා සුමට ලෙස නැමී ඇත. එසේම මෙම කාසිවල එක් මුහුණතක් සම්පූර්ණයෙන්ම පැතලි අතර, අනෙක් මුහුණත තරමක් උත්තල ස්වභාවයකින් යුක්ත වේ. සැබෑ කාසිවලට වඩා ඝනකමින් යුක්ත වූ මෙම කාසිවල අභිමුඛයේ අපැහැදිලි සංකේත තුනක හෝ හතරක හෝඩුවාවන් හමුවේ (Weisshaar, Dissanayaka & Wijeypala, 2008, p. 44). මෙම කාසිවල කොන් කපාදමා ඇත්තේ ඒවාගේ බර සමාන කරගැනීමේ අපේක්ෂාවෙනි. නමුත් කාසි අච්චු ආධාරයෙන් කාසි මුද්‍රණය කිරීමේදී ද එසේ කොන් කපා ඇති ලෙස අච්චුව සකස්කර ඇත්තේ එහි මූලික පරමාර්ථය වූ බර සමාන කිරීම සඳහා නොව කාසියේ හැඩය ලබාගැනීම සඳහා වියයුතුය.

මීට අමතරව එකදු සංකේතයක් හෝ සටහන් නොවූ කාසි ද ඇත. ඇතැම් විට මේවා නිෂ්පාදන ක්‍රියාවලියේදීම අවශ්‍යය හැඩයට පමණක් කපා සංකේත සටහන් නොකර සිටියා විය හැකිය. එසේ නොමැතිනම් දීර්ඝ කාලයක් සංසරණය වීම හේතුවෙන් සලකුණු ගෙවීගියා වීමටද පුළුවන. එසේත් නැතිනම් එකම කාසි අච්චුව උපයෝගී කොට නැවත නැවත කාසි මුද්‍රණය කිරීමේදී එහි ඇති සංකේතවල තියුණු බව අඩුවීම හේතුවෙන් එම සංකේත පැහැදිලිව කාසිමත මුද්‍රණය නොවීම මීට හේතුවූවා වියහැකිය (Weisshaar, Dissanayaka & Wijeypala, 2008, p. 44). මෙවැනි කාසිද රවුම්, චතුරස්‍ර, ඍජුකෝණාස්‍ර ස්වරූපයෙන් ඇති අතර රිදී, රිදී ආලේපිත හා තඹ ලෝහයෙන් නිර්මාණය කරඇත. නමුත් මෙවැනි කාසි පිළිබඳව ඉන්දීය හස්එබූ කාසි නාමාවලි තුළ වාර්තාකර නැත.

- කාසි හමුවූ ස්ථාන

හස්එබූ කාසි ඉන්දියාවේ වයඹදිග, උතුරු ප්‍රදේශවල මෙන්ම දක්ෂිණපථයේ බොහෝ ප්‍රදේශ වලින් ද හමුවේ. ලංකාවේද මෙම කාසි විවිධ ප්‍රදේශ වලින් හමුවී ඇත. නිල පුරාවිද්‍යා වාර්තාවලට අනුව පහත දක්වා ඇති ස්ථාන වලින් මෙම කාසි සම්බන්ධව තොරතුරු වාර්තා වී ඇත (Weisshaar, Dissanayaka &

Wijeypala, 2008, p. 42-43). මීට අමතරව මෙරට විවිධ පෞද්ගලික කාසි එකතුකරන්නන් සතුව ද හස්ඵබූ කාසි එකතුන් ඇත.

- අනුරාධපුර ඇතුළුනුවර
- අභයගිරිය
- ජේතවනය
- නුවරවැව
- තොළුවිල
- වෙස්සගිරිය
- තිස්සමහාරාමය
- බුත්නෙහෙපොළ
- දැදිගම
- දෙහිගස්ලන්ද
- ඇඹිලිපිටිය
- ගොඩවාය
- හිරිපිටිය
- කත්තරෝඩෙ,
- කොට්ටුකච්චිය
- මාන්තායි
- මිනුවන්ගොඩ
- මීරිගම
- මුලතිව්
- පොම්පරිප්පු
- රිදියගම
- සීගිරිය
- මාතලේ

- සංකේත

පසුකාලීන ඉන්දීය කාසි හා බටහිර කාසි මෙන් මෙම කාසිවල අක්ෂර හෝ පාලකයන්ගේ රූප දක්නට නැත. ඒ වෙනුවට ඇත්තේ විවිධාකාර වූ සංකේත පමණි. එබැවින් මෙම කාසිවල අභිමුඛය (obverse) හා ප්‍රතිමුඛය (reverse) හඳුනාගනු ලබන්නේ එම සංකේත අනුව ය. එහිදී සංකේත වැඩියෙන් ඇති මුහුණත අභිමුඛය (obverse) ලෙසද, සංකේත අඩුවෙන් ඇති මුහුණත ප්‍රතිමුඛය (reverse) ලෙසද හඳුනාගනු ලබයි. අභිමුඛයේ බොහෝවිට සංකේත පහක් දක්නට ඇති අතර විවිධ කාසිවල අභිමුඛයේ සංකේත අඩුවැඩි වීම දක්නට ඇත. ප්‍රතිමුඛයේ සංකේත බොහෝවිට එකක් හෝ දෙකක් ඇති අතර ඒවා අභිමුඛයේ සංකේත වලට වඩා කුඩා ස්වරූපයක් ගනී. නමුත් ප්‍රතිමුඛයේ සංකේත බොහෝ ගණනක් ඇති අවස්ථා ද විශාල සංකේත ඇති අවස්ථා ද දක්නට ලැබේ.

මෙම කාසිවල සංකේත යෙදීමට හේතුව පිළිබඳව විවිධ අදහස් පර්යේෂකයන් විසින් ඉදිරිපත් කර ඇත. වී. ඒ ස්මිත් පෙන්වා දෙන්නේ මෙම කාසි පාලකයන්ගේ අවසරය මත රිදීකරුවන් හා වෙළඳ ශ්‍රේණි විසින් නිකුත්කර ඇති පෞද්ගලික කාසි බවයි. එහි ප්‍රතිමුඛයේ ඇති සලකුණු කාසි නිකුත් කිරීම පාලනය කළවුන් විසින් නිකුත් කළ කාසි බවත්, අභිමුඛයේ ඇති සළකුණු එම කාසි තමන් අතට පත්වූ පසු කාසි නිකුත් කරන්නන් විසින් වෙන වෙනම යෙදූ ඒවා බවත් ඔහු අනුමාන කරයි. ඊ. ජේ. රැප්සන් ද මෙම මතය පිළිගන්නා නමුත් කාසිවල ප්‍රතිමුඛයේ ඇති සංකේත වලින් ඒ කාසිය නිකුත් කරන ලද ප්‍රදේශය සංකේතවත් වන බව ඔහුගේ අදහසයි.

නමුත් මෙම කාසි පිළිබඳව විධිමත් වර්ගීකරණයක් සිදුකළ ජෝන් ඇලන් ප්‍රකාශකර සිටින්නේ මෙම කාසි නිකුත්කර තිබෙන්නේ විවිධ පුද්ගලයන්ගෙන් නොව විධිමත් පාලනාධිකාරියකින් බවත්, මෙහි අභිමුඛයේ නිරතුරුව යෙදී ඇති සංකේත පහ මඟින් රාජ්‍ය පාලනයේ යෙදී සිටි නිලධාරීන් පස්දෙනෙකුගෙන් යුතු මණ්ඩලයක් පිළිබඳ තොරතුරු හෙළිවන බව පෙන්වාදෙනු ලැබිණි. මෙගස්තීනීස්ට අනුව මෞර්යය පාලන තන්ත්‍රයේ දෙපාර්තමේන්තු බොහෝමයක් පාලනය වූයේ මෙවැනි මණ්ඩලයක් මඟිනි (ප්‍රේමතිලක, 1970, පි. 10).

හමුවූ ස්ථානයන් පිළිබඳව වාර්තාවන් සහිත හස්එබූ කාසි තොග කිහිපයක් අධ්‍යයනය කළ D. B. Spooner , D.R. Bhandarkar ආදී පර්යේෂකයන් වෙන වෙනම නිගමන වලට පැමිණ ඇත. එහිදී මෙම සලකුණු අතර ඇතැම් සලකුණු නිත්‍ය වශයෙන් හැම කාසියකම පාහේ යෙදී තිබීම පිළිබඳ අවධානයට ලක්විය. ඒ පිළිබඳව අදහස් දක්වන එච්. සී. වොල්ෂ් පවසන්නේ එම සංකේත යෙදීම විවිධ පුද්ගලයින් විසින් විවිධ අවස්ථාවන් වල සිදුවූවක් නොවන බවත් එය සම්මත කාසි ක්‍රමයක් බවත් අභිමුඛයේ ඇති හස් සලකුණු පාලකයා විසින් යෙදූ ඒවා බවත් කාසිය නිකුත්කළ රාජ්‍ය, එහි පාලකයා, කාසි නිපදවූ ස්ථානය, ආදිය මෙයින් නියෝජනය කරන බවත් ඇතැම් විට ආගමික වැදගත්කමකින් යුතු සංකේතයන් තිබෙන්නට ඇති බවත් ඔහු නිගමනය කරයි.

මෙම සංකේත මඟින් නිරූපණය වන්නේ කුමක්ද යන්න පිළිබඳව තේරුම් ගැනීමට හැකි වැදගත් කරුණක් විසුද්ධිමග්ගයේ බන්ධනිද්දේසයේ දැක්වේ. එහි ධර්ම කරුණක් සම්බන්ධයෙන් උපමාවක් ගෙනහැර දක්වන විට දක්ෂ රන්කරුවෙක් හට කහවණුවක් දෙස බැලීමෙන්, ඊට තට්ටුකර නාදය ශ්‍රවණය කිරීමෙන්, අතේ දැරීමෙන්, සුවඳ ආඝ්‍රාණය කිරීමෙන්, දිවගා බැලීමෙන් එය අසවල් ගමේදී, නියම්ගමේදී, නුවරදී, පර්වතයේදී හෝ නදී තීරයේදී කරන ලද්දේය, අසවල් ශිල්පියා විසින් කරවන ලද්දේ ද යන්න පිළිබඳව දැනගත හැකිබව කියනු ලබයි. ඒ අනුව කාසිය නිෂ්පාදනය කළ ප්‍රදේශය හා ශිල්පියාගේ ලාංඡනය එම කාසිවල සංකේත අතර ඇත. එසේම ධර්මසේන හිමියන් ලියූ සද්ධර්මරත්නාවලියේ ඇති කුම්භඝෝෂක කතාවස්තුවට අනුව උපායමාර්ගයෙන් කුම්භඝෝෂකගේ නිවසේ පැවති කාසි ලබාගත් රජු එමකාසි ඔහුටම ගෙනහැර පාමින් විමසන විට එම කාසි තම පවුලට අයත් කාසි බව ඔහු හඳුනාගත්තේය. ඒ අනුව එම කාසිය අයත් වෙළඳකුලයේ හෝ පවුලේ ලාංඡනය කාසිය මත තිබී ඇත.

මෙම කාසිවල ඇති ප්‍රධාන සංකේත 5 ට අමතරව සටහන් වී ඇති කුඩා සංකේත බොහෝවිට එම කාසිවල බර හා ලෝහයේ ප්‍රමිතිය සහතික කිරීම උදෙසා මුද්‍රණය කරන්නට ඇතිබව P. L. Gupta හා T. R. Hardaker ගේ මතය වී ඇත (Gupta & Hardaker, 2014, p.33).

කෞටිල්‍යගේ අර්ථශාස්ත්‍රයට අනුව මෞර්යය පාලන තන්ත්‍රයේ කාසි නිපදවීම භාරව " ලක්ෂණාධ්‍යක්ෂක" නම් නිලධාරියෙක් සිටි අතර "රූපදර්ශක" නම් නිලධාරියෙක් විසින් එම කාසි ගනුදෙනු සඳහා පිළිගත් මාධ්‍යක් බව හා රාජ්‍ය භාණ්ඩාගාරය විසින් පිළිගනු ලබන බව සහතික කළ යුතුය. එසේ සහතික කිරීම සිදුකිරීමේදී මෙම කාසිවල ඇති ආකාරයට සංකේතයක් යෙදුවා විය හැකිය (ප්‍රේමතිලක, 1970, පි. 11).

- සංකේතයන්හි සංස්කෘතික පසුබිම

එකිනෙකට වෙනස් සංකේත 600කට වඩා ප්‍රමාණයක් මෙම හස්ඵලූ කාසිවල දක්නට ඇත. මේ සංකේත අතර බොහෝදුරට ඇත්තේ ශාක හා සත්වරූප, මිනිස්රූප, විවිධ ජ්‍යාමිතික හැඩතල ආදියයි. මෙම සංකේත අතර ඇතැම් ලකුණු සමකාලීන හා පසුකාලීන විවිධ කලා හා වාස්තුවිද්‍යාත්මක නිර්මාණ ආදියේ ද දැකගත හැකිය. ලංකාවේ ක්‍රිස්තු පූර්ව යුගයේ සෙල්ලිපිවල, වාහල්කඩ ස්ථම්භ හා වෙනත් රූකම් නිර්මාණ වල විවිධ සංකේත ආදිය දක්නට ලැබෙන නමුත් ඒවා පිළිබඳව ප්‍රමාණවත් තරම් දුරට පර්යේෂණ සිදුවී නැත (සිරිසෝම හා අමරසිංහ, 1986, පි. 17). එබැවින් මෙම කාසිවල ඇති සංකේත වල සංස්කෘතික හා සංජානනීය සංකල්ප තේරුම්ගැනීමට නම් ඉන්දියානු හස්ඵලූ කාසිවල ඇති සංකේත හා එම සංකේත වල ප්‍රභවය, විකාශය, භාවිතය පිළිබඳව සිදුකර ඇති පර්යේෂණයන් දෙස අවධානය යොමුකළ යුතුය.

ලෝකයේ කාසිවල සංකේත යෙදී ඇති ආකාරය ප්‍රධාන වශයෙන් ආකාර 2කට බෙදියහැක.

- ස්වභාවධර්මයේ දක්නට ඇති විවිධ ශාක, සත්වරූප, විවිධ ජ්‍යාමිතික හැඩතල, විවිධ දෙවිවරු හා දෙවඟනන්ගේ රූප ඇතුළත් කාසි
- රාජ්‍ය අධිකාරියේ මුද්‍රාව හෝ රාජ්‍ය පාලකයාගේ රුව සහිත කාසි (මෙම කාසිවල බොහෝවිට එක් පසෙක රජ රූපයද අනෙක් පස දේවරූප හෝ දෙවිවරුන්ගේ සංකේතයන් දැක්වේ.).

මේ අතරින් ක්‍රි. පූ. 6වන සියවසේ මහාජනපද යුගයේ පැවති කාසි, මගධ හා මෞර්ය අධිරාජ්‍යය අවධියේ කාසි, පශ්චාත් මෞර්ය යුගයේ නිකුත් වූ කාසි මෙම පළමු වැනි වර්ගයට අයත් වේ. දෙවන වර්ගයට අයත් කාසි එනම් පාලකයාගේ රුව සහිත කාසි නිකුත් කිරීම ආරම්භ වනුයේ ක්‍රි. පූ. 2වන සියවසෙන් පසු වයඹදිග ඉන්දියාවට පැමිණි ග්‍රීක, ශක, පාර්තියන්, කුෂාණ වංශිකයන්ගේ පාලන යුගයන් තුළ ය.

මෙම සංකේත ගණනාවක් පරීක්ෂා කළ ඩබ්ලිව්. තියෝබෝල්ඩ් විසින් ඒවා පහත ආකාරයට වර්ගකර ඇත.

- මිනිස් රූප
- ආයුධ, ගොඩනැගිලි, දුන්න, හීය, ස්තූපය වැනි සටහන්
- සත්ත්ව රූප, ඇතා, වෘෂභයා, කඟවේණා ආදීන්
- ගස්, අතු හා ඵල වර්ග
- සූර්යය, ග්‍රහ හා ශෛව ඇදහිලි සම්බන්ධ සංකේත සටහන්
- වෙනත් හඳුනාගත නොහැකි විවිධ සංකේත සටහන්

ඉන්දියාවේ භාවිතා වූ සංකේත පිළිබඳව සැලකීමේදී ඉන්දුනිම්න ශිෂ්ටාචාරය වැදගත් ය. මෙම සභ්‍යත්වය සම්බන්ධව අවශේෂ හමුවන්නා වූ මොහෙන්ජදාරෝ, හරප්පා, ලෝතාල්, සුක්තජෙන්දෝර්, කලිබන්ගන්, චන්හුදාරෝ ආදී වූ ස්ථාන වලින් හමුවූ ලෝකඩ මුද්‍රා, පින්තාරු කරන ලද මැටි බඳුන් ආදියේ සලකුණු කර හා පින්තාරු කර ඇති විවිධ වූ සංකේත හා සලකුණු 2200කට වැඩි ප්‍රමාණයක් පර්යේෂකයන්

විසින් හඳුනාගෙන ඇත. ඒ අතර ඇති ගවයා, සිංහයා, අලියා, යුනිකෝන්, කිඹුලා, මොණරා, මාළුවා ආදී විවිධ සත්ත්ව රූප මෙම රිදී හස්එබූ කාසිවලද දක්නට ලැබේ. මීට අමතරව එම කාසි හා ඉන්දු නිම්නයේ දක්නට ඇති ඇතැම් ජ්‍යාමිතික සංකේතයන්හි යම් යම් සමානකම් ද ඇත. මෙම සලකුණු වලින් සන්නිවේදනය කෙරෙනුයේ කුමක්ද යන්න පිළිබඳව නිශ්චිත අදහසක් විද්වතුන්ට නොමැත.

ඉන්දියාවෙන් හමුවන නියෝලිතික් යුගයට අයත් වළං කැබලි ආදියේ ද විවිධ සංකේත සටහන්ව ඇත. ඉන්දියාවේ බුර්සහොම්, නාගර්ජුනකොණ්ඩ, පික්ලිහල්, කල්හුල් ආදී ස්ථානවලින් ද මෙවැනි සංකේත අඩංගු මැටි වළං කැබළි හමුවී ඇත. මේවා අතුරින් බොහෝමයක සූර්ය සංකේතය හඳුනාගැනීමට හැකිය. මීට අමතරව ඉන්දියාවේ කැල්කෝලිතික යුගයට අයත්වන ස්ථාන හා දකුණු ඉන්දීය මෙගලිතික් සුසාන ආශ්‍රිතව හඳුනාගත් විවිධාකාර සංකේත 513ක් පමණ හඳුනාගෙන ඇති අතර එම සලකුණු අතුරින් 68ක් පමණ වූ සංකේත හස්එබූ කාසිවල ඇති සංකේත වලට යම් සමානකමක් පෙන්වනු ලබයි. ඒ අතුරින් සිරස්, තිරස්, වක්‍ර රේඛා, හරස්කැපුම් රේඛා, චතුරස්‍ර හා වෘත්තාකාර හැඩ, ස්වස්තික, නන්දිපාද, උජ්ජේනි සලකුණු, දමරු හැඩැති ලකුණු, සූර්ය සංකේත, දුන්න හා ඊතලය, වැනි සංකේත හස්එබූ කාසිවල සංකේත ලෙස ද පසුකාලීනව භාවිතා වී ඇත.

මෙම කාසිවල සංකේත මඟින් යම් ආගමික අදහස්, මතවාද නියෝජනය වෙතැයි මතයක් ද ඇත. විශේෂයෙන්ම එකල පැවති වෛදික හා බ්‍රාහ්මණ දහම, එහිම පසුකාලීන වර්ධනයක් වූ හින්දු දහම, බුදුදහම හා ජෛන දහම මෙන්ම ඉන්දියානු සමාජය පුරා පැවති විවිධ ඇදහිලි වලට අදාළ සංකේතයන් මෙම කාසි තුළට ඇතුළත් වී ඇතැයි මොවුන් විශ්වාස කරනු ලබයි. විශේෂයෙන්ම මුල් යුගයේ කලාකරුවා බුදුන් වහන්සේගේ රුව මානව රූපීමය වශයෙන් නිර්මාණය කිරීමට බියක් දැක්වූ අතර ඒ වෙනුවට ධර්ම චක්‍රය, ශ්‍රී පාදය, ස්තූපය, වජ්‍රාසනය වැනි සංකේත මඟින් බුදුන්වහන්සේගේ රුව දැක්වීමට කටයුතු කෙරිණි. ඇලෙක්සැන්ඩර් කනිංහැම් විසින් ප්‍රකාශ කරන ලද්දේ මෙම සංකේත අතුරින් චෛත්‍යය ලකුණ, ගරාධිය සහිත වෘක්ෂ ලකුණ ආදිය නියත වශයෙන්ම බෞද්ධ සංකේත බවයි. එසේම හින්දු දහමේ විවිධ දෙවිවරුන් සංකේතවත් කරන අවි ආයුධ, සත්ත්වරූප ආදි සංකේත ද ජෛන දහමේ සංකේත ද ඇත. එම සංකේත වලට සමාන සංකේත මෙම හස්එබූ කාසිවල ඇති සංකේත අතර දක්නට ඇත.

මෙම සංකේත අතුරින් වඩාත් බහුලව හමුවන්නා වූ සංකේත කිහිපයක සංස්කෘතික අගය මෙහිදී විමසුමට ලක්කර ඇත.

- සූර්ය සංකේතය

හස්එබූ කාසි අති බහුතරයක සුලභව හමුවන්නා වූ සංකේතයක් ලෙස සූර්ය සංකේතය හැඳින්විය හැකිය. මෙහි ස්වරූප කිහිපයක් දක්නට ඇත.

සූර්යයා වනාහී අතීතයේ සිටම ගෞරවයට හා වන්දනයට ලක්වූ සංකේතයකි. ඉන්දියාවේ හමුවන ප්‍රාග් ඓතිහාසික ගුහා චිත්‍ර මෙන්ම නියෝලිතික, කැල්කොලිතික හා මෙගලිතික් යුගවලට අයත් මැටිබඳුන්, පින්තාරු කළ මැටිබඳුන් ආදියේ මෙම සංකේතය දැකගත හැකිය. වෛදික යුගයේදී සූර්යයාට දේවත්වයක් ආරෝපණය කොට වන්දනාමාන කෙරිණි. ඔහුව ආදිත්‍යය, සූර්ය, භානු, මිත්‍ර, රවි, පූෂ, බාව, භාස්කර, අර්ක, හිරණ්‍යගර්භ ආදී විවිධ සංස්කෘත නාමයන් හිරු හෙවත් සූර්යයා වෙනුවෙන් භාවිතා විය.

කෘෂිකර්මාන්තයට සූර්යයාගෙන් ලැබුනා වූ පිටිවහල හේතුවෙන් එම ජනයා සූර්යයාට දේවත්වයක් ආරෝපණය කරන්නට ඇත. සූර්ය සංකේතය පසුකාලීනව බටහිර ක්ෂත්‍රප කාසි තුල මෙන්ම මෝගල් රාජ්‍ය අවධියේ නිකුත් කළ කාසි වලද සූර්ය සංකේතය ඇත.



ඡායාරූප අංක 01

විස්තරය - ජහන්ගීර් මෝගල් අධිරාජ්‍යයාගේ කාසියක්

මූලාශ්‍රය - https://www.ashmolean.org/coin-emperor-jahangir



ඡායාරූප අංක 02

විස්තරය - බටහිර ක්ෂත්‍රප කාසියක්


මූලාශ්‍රය https://hassalesk.life/product_details/1028334.html

ශ්‍රී ලංකාවේ රන් කහවණු කාසියේ අභිමුඛයේ සංකේත අතර චන්ද්‍ර ලකුණ සමඟ සූර්යය ලකුණ ඇත. එමෙන්ම මෙරට සෙල්ලිපි, සන්නස්පත්‍ර ආදියේ ද මෙම සංකේත ද්විත්වය එක්ව යෙදේ. එමඟින් අදහස් කරනු ලබන්නේ "ඉරහඳ පවතින තාක් කාලයක්" යන්නයි.

- බාහු හයක් ඇති සංකේතය

හස්එබූ කාසිවල සූර්යය සංකේතය සමඟ තවත් බහුලව යෙදෙන සංකේතය වනුයේ මෙයයි. මෙහි මධ්‍යයේ ඇති කුඩා වෘත්තයකට සම්බන්ධව ඒ වටා ඇති විවිධ වූ අංග 6ක් දක්නට ඇත. සිරිසෝම මහතා මෙම සංකේතය හඳුන්වා ඇත්තේ "මල සංකේතය" ලෙස ය (සිරිසෝම හා අමරසිංහ, 1986, පි. 30). මෙහි මධ්‍ය ලක්ෂය වටා ඊතල තුනක් සමඟ නන්දිපාද ලකුණු තුනක් හෝ ඕවලාකාර වළලු තුනක් බොහෝවිට දක්නට ලැබේ. නමුත් සුළු සුළු වෙනස්කම් සහිතව මෙවැනි ලකුණු තිහකට වඩා ප්‍රමාණයක් පර්යේෂකයන් විසින් හඳුනාගෙන ඇත.

මේ පිළිබඳ අදහස් දක්වන ඇතැම් විද්වතුන්ගේ මතය වනුයේ මෙය මගධ රාජ්‍යයේ සලකුණ ලෙස භාවිතා වන්නට ඇති බවයි (Guptha & Hardaker, 2014, P. 51).




ඡායාරූප අංක 03

විස්තරය - විවිධ ආකාරයේ වෙනස්කම් සහිත බාහු හයේ සංකේත

මූලාශ්‍රය - (Guptha & Hardaker, 2014, P. 276)

○ පර්වත සංකේත



ඡායාරූප අංක 04

විස්තරය - විවිධ වෙනස්කම් ඇති පර්වත සංකේත

මූලාශ්‍රය - (Guptha & Hardaker, 2014, P. 280)

ආරුක්කු දෙකක් මත ඇති තවත් ආරුක්කුවක් ලෙස මෙම සංකේතය නිරූපණය කර ඇත. ඇතැම්විට එක මත එක ආරුක්කු කිහිපයක් ඇති අවස්ථාද එම ආරුක්කු මත විවිධ වූ සංකේත, සතුන් ඇති අවස්ථා ද දක්නට ඇත. බොහෝ දේශීය හා ඉන්දීය විද්වතුන් විසින් මෙය හඳුන්වන්නේ ස්තූප සංකේතය නැතහොත් චෛත්‍යය සංකේතය ලෙස ය. විශේෂයෙන් ම අශෝක රජු සමයේ ඉදිකළ විශාල බෞද්ධ ස්තූප මෙම ලකුණෙන් සංකේතවත් වනබව ඔවුන්ගේ අදහසයි. ඩී. පී. හෙට්ටිආරච්චි මහතාගේ අදහස වනුයේ, මෙමඟින් බුදුරදුන්ගේ පරිනිර්වාණය හා ධාතු බෙදීම දැක්වෙන බවයි. මීට වෙනස් මතයක් ඉදිරිපත් කරමින් මැදඋයන්ගොඩ විමලකිත්ති හිමියන් පවසනුයේ මෙමඟින් හින්දූන්ගේ ත්‍රිකූට පර්වතය නිරූපණය වන බවයි. මෙම පර්වත සංකේතය මත ඇතැම්විට දක්නට ඇති අඩසඳ ලකුණ පිළිබඳව අවධානය යොමුකරන ජේ. එන්. බැනර්ජී මහතා අදහස් කරනුයේ, මෙමඟින් ශිවගේ තිශෘංග පර්වතය හා ශශාංඛශේඛර නිරූපණය කරන බවයි. නමුත් ජෝන් ඇලන් හා ආනන්ද කුමාරස්වාමීට අනුව මෙම සංකේතය මඟින් කඳු, පර්වතයන් සංකේතවත් වන බවත් මෙසපොතේමියාව, චීනය, මධ්‍යය ආසියාව වැනි ප්‍රදේශ තුළ මෙය කඳු සංකේතවත් කිරීම සඳහා උපයෝගී කරගත් බව ය.

කඳු හා පර්වත සම්බන්ධයෙන් අතීත ජනයා සෑමවිට කුතුහලයක් දැක්වීය. මේවාට අතිමානුෂීය බලවේග අරක්ගෙන ඇති බවටත්, දෙවිවරුන්ගේ හා යක්ෂයන්ගේ වාසස්ථාන බවටත් ඔවුහු විශ්වාස කළෝය. හින්දු සාහිත්‍යයට අනුව ශිවදෙවියන්ගේ වාසභවන වනුයේ කෛලාසකූටය වන අතර විෂ්ණු දෙවියන්ගේ වාසභවන වන්නේ වෛකුණ්ට පර්වතයයි. බෞද්ධ සාහිත්‍යයට අනුව මහාමේරු පර්වතය වනාහි චාතුර්මහාරාජික දෙව්ලොව හා තාවතිංස දෙව්ලොව පිහිටා ඇති පර්වතයකි. අසුරයන් වාසය කරනුයේ මහාමේරුව පතුලේය. ශ්‍රී ලංකාවේ ගත්කළ සුමන සමන් දෙවියන් ශ්‍රී පාදයට අරක්ගෙන සිටින අතර ජයසේන නම් යක්ෂයා රිටිගල පර්වතයට අධිගෘහිතව වාසය කරයි. මිහිඳු මහරහතන් වහන්සේ විසින් ස්තූප වන්දනය හඳුන්වාදෙනු ලැබුවේ ද එතෙක් මෙරට ජනයා හුරුපුරුදු වී සිටි පර්වත වන්දනයට ආදේශකයක් ලෙස ය. එවැනි පසුබිමක් මත මෙම සංකේතය දෙරටේම කාසිවල දැක ගැනීමට හැකිවේ. විශේෂයෙන්ම පසුකාලීන ශුංග යුගයේ කාසි, ඉන්දු-ග්‍රීක කාසි මෙන්ම තක්ෂිලාවේ කාසිවලද මෙම සංකේතය දැකගැනීමට හැකිය. ශ්‍රී ලංකාවේ භාවිතා වූ ඇතා හා ස්වස්තික කාසියේ ද මෙම පර්වත සංකේතය සලකුණු කොට ඇත.

- වෘක්ෂ සංකේතය



ඡායාරූප අංක 5

විස්තරය - වශිෂ්ඨිපුත්‍ර ශ්‍රී පුළුමවී නම් සාතවාහන රජුගේ කාසියක්

මූලාශ්‍රය - https://upload.wikimedia.org/wikipedia/commons/7/71/Satavahanas._Sri_Vasisthiputra_Pulumavi.jpg




ඡායාරූප අංක 6

විස්තරය - ශ්‍රී ලංකාවේ භාවිතා වූ ඇතා හා ස්වස්තික කාසියක්

මූලාශ්‍රය - https://www.cbsl.gov.lk/sites/default/files/cbslweb_images/notes_coins/Eliphant%20%26%20Swasthika%20coins_1.png

හස්එබූ කාසිවල හමුවන සංකේත අතර බහුල වශයෙන් හමුවන තවත් සංකේතයක් ලෙස වෘක්ෂ සංකේතය පෙන්වාදිය හැකිය. ප්‍රධාන වශයෙන් ගරාදි වැටක් සහිත වෘක්ෂ සංකේත හා ගරාදි වැටක් රහිත වෘක්ෂ සංකේත ලෙස කොටස් දෙකකට බෙදිය හැකිය. මෙහි ගරාදි වැට යනුවෙන් හඳුන්වනුයේ එම වෘක්ෂයේ පාමුල වටකොට ඇති කොටු දැලකි. එය බොහෝවිට කොටස් 4කට බෙදා ඇත. මීට වඩා වැඩි කොටු ගණනක් ඇති වෘක්ෂ සංකේත ද දැකගත හැකිය. ඇතැම් වෘක්ෂයන්ගේ අතුබෙදී ඇති ආකාරය පමණක් දැක්වෙන අතර ඇතැම් වෘක්ෂයන්ගේ පත්‍රයන්ද දක්වා ඇත. මේ අතරින් ගරාදිය සහිත වෘක්ෂ සංකේතය පසුකාලීන ඉන්දීය සාතවාහන, උජ්ජේනි හා කුරාස් කාසිවලද, ශ්‍රී ලංකාවේ ඇතා හා ස්වස්තික කාසියේද, ගස හා ස්වස්තික කාසියේද දැකගත හැකිය.

නමුත් එමඟින් මෙම සංකේතය මඟින් පෙන්වනු ලබන්නේ කුමන වර්ගයේ ගසක් ද යන්න කිවනොහැක. ඩී. බී. ස්ප්‍රුනර්ට අනුව මෙහි බෞද්ධයන්ගේ ඇසතු වෘක්ෂය හෙවත් බෝ ගස නිරූපණය කරනු ලබයි. ඩී.පී. හෙට්ටිආරච්චිට අනුව මෙමඟින් සිදුහත් තවුසා බුද්ධත්වයට පත්වීම නිරූපණය කරනු ලබයි. ජේ. එන් බැනර්ජිගේ අදහස වනුයේ, මෙම පැරණි සංකේත මඟින් හින්දු සාහිත්‍යයේ සඳහන් චෛත්‍යය වෘක්ෂ හා ස්ථාල වෘක්ෂ නිරූපණය කරන බවය. නමුත් එස්. එස්. සිංගේ මතය වනුයේ මෙම සංකේත මඟින් තමන්ගේ ආහාරපාන ලබාගැනීමේදී විශේෂ වැදගත්කමක් හිමිවූ වෘක්ෂලතා ආදිය නිරූපණය වන බවයි.



ඡායාරූප අංක 07

විස්තරය - ගරාධි වැට රහිත වෘක්ෂ සංකේත හා ගරාධි වැට සහිත වෘක්ෂ සංකේත.

මූලාශ්‍රය - (Guptha & Hardaker, 2014, P. 279)

කෙසේවුවද මෙරට මෙන්ම භාරතයේ ද වෘක්ෂය යනු වන්දනීය හා පූජනීය තත්වයේ ලා සලකනු ලැබූ දෙයකි. ඉන්දු නිම්න ශිෂ්ටාචාරයේ වෘක්ෂ වන්දනය පැවති බවට එයින් හමුවන මුද්‍රාවන්ගෙන් සාක්ෂි හමුවේ. එක් මුද්‍රාවක ඇසතු වෘක්ෂයට වන්දනාකරමින් සිටින මිනිසුන්ගේ රූපයක් ඇති අතර තවත් මුද්‍රාවක ගසක් පාමුල සිදුකරන බිළි පූජාවක රූපයක් දැක්වේ. ඇතැම් මුද්‍රාවක කාන්තාවකගේ ගර්භාෂයෙන් මතුවන පැළයක රූපයක් ඇති අතර තවත් මුද්‍රාවක ඇත්තේ ගසක අතු අතර සිටින අං සහිත දෙවියාගේ රූපයයි. ඒ අනුව මේ වෘක්ෂ වන්දනය පසුකාලීන භාරතීය වෛදික සමාජයටද පැමිනෙන්නට ඇත. විශේෂයෙන්ම වෘක්ෂ වලට අධිගෘහිත දෙවිවරුන් සිටි බව සුජාතා සිටුදියණියගේ කිරිපිඬු දානය පිළිබඳ ඇති විස්තරයෙන් පැහැදිලි වේ. හින්දු ආගමට අනුව විවිධ දෙවිවරුන්ට සම්බන්ධ වෘක්ෂයන් ඇත. එහිදී විෂ්ණු දෙවියන්ගේ වාසස්ථානයක් ලෙස තුල්සි පැළෑටියද, ලක්ෂ්මී දේවියගේ වාසස්ථානයක් ලෙස සලකනු ලබන අතර අශුභ කාරණා දුරුවීම සඳහා ද, මළවුන්ගේ ශාන්තිය උදෙසා ද ඇසතු ගස ජලයෙන් නෑවීම හින්දූන් විසින් සිදුකරනු ලබන දෙයකි. ශ්‍රී ලංකාවේ ද මහින්දාගමනයට පෙර සිටම වෘක්ෂ වන්දනාව පැවති බව පණ්ඩුකාභය රජු විසින් වෛශ්‍රවණ දෙවියන් වෙනුවෙන් නුග ගසක් ද, ව්‍යාධි දෙවියන් වෙනුවෙන් තල් ගසක් ද වෙන්කිරීමෙන් පැහැදිලි වන කරුණකි. දේවානම්පියතිස්ස රජුකළ ශ්‍රී මහ බෝධි ශාඛාව වැඩමවීමත් සමඟ මෙරට බෝධි වන්දනය ප්‍රචලිත වූ අතර තම තමන්ට ඇති ග්‍රහඅපල ආදිය දුරුකරගැනීම සඳහා බෝධි වෘක්ෂය ඇතුලු විවිධ වෘක්ෂවලට සත්කාර කිරීම වර්තමානයේද දක්නට ලැබෙන ප්‍රවණතාවයකි.



ඡායාරූප අංක 8

විස්තරය - උජ්ජේනි කාසියක්

මූලාශ්‍රය - https://coinindia.com/ujjain379.jpg




ඡායාරූප අංක 9

විස්තරය - තක්ෂිලා කාසියක්

මූලාශ්‍රය - https://web.archive.org/web/20161220220036/https://www.cngcoins.com/Coin.aspx?CoinID=259870

○ ඇත් සංකේතය

මෙම කාසිවල සංකේත අතර විවිධ සත්ත්වරූප පැවතිය ද ඒ සෑම සත්ත්ව රූපයකටම වඩා ඇත් සංකේතය යෙදී ඇත. එහිදී ප්‍රධාන වශයෙන් දකුණුපසට හැරී ඇති ඇත් රූපය සහිත සංකේතය වැඩි වශයෙන් දක්නට ඇත. ඇත් සංකේතය පසුකාලීනව බටහිර ක්ෂත්‍රප, ත්‍රිශ්නි හා වේමකී ජනපද කාසි වලද, දකුණු ඉන්දීය චෝල, චේර හා පාන්ඩ්‍ය රාජ්‍යයන්ගේ කාසිවලද ශ්‍රී ලංකාවේ ඇතා හා ස්වස්තික කාසිවලද මෙම ඇත් සංකේතය දක්නට ඇත.



ඡායාරූප අංක 10

විස්තරය - විවිධ වෙනස්කම් සහිත ඇත් රූප

මූලාශ්‍රය - (Guptha & Hardaker, 2014,P.278)



ඡායාරූප අංක 11

විස්තරය - ඉන්දු ග්‍රීක රජෙක් වූ 1වන ඇපලොඩෝටස් රජුගේ කාසියක්

මූලාශ්‍රය - https://commons.wikimedia.org/wiki/File:Apollodotus_bull_with_nandipada.jpg



ඡායාරූප අංක 12

විස්තරය - ඉන්දු ග්‍රීක රජෙක් වූ ඇන්ටියාසිඩස් රජුගේ කාසියක්


මූලාශ්‍රය - https://coinindia.com/MIG0274-344.01.jpg

ඇත් සංකේතය දෙරටේම කලාශිල්පවල සුලභව දක්නට ඇති සංකේතයකි. ඉන්දියාවේ අශෝක රජුගේ ස්ථම්භයන් හි නිරූපණය කළ ප්‍රධාන සත්ත්වයන් හතරදෙනා අතර ඇත් සංකේතයද ඇත. ඊට අමතරව සාංචි තොරණේ හා භාරුත් හි ගරාදියේ කැටයම්වලද ඇත් රූපය දක්නට ඇත. ලංකාවේ සඳකඩපහණේ ඇති සතුන් හතරදෙනා අතර ඇත් රුවද ඇත. මීට අමතරව අනුරාධපුර රන්මසු උයනේ කැටයම් වලද, අභිෂේක ලක්ෂ්මිය සංකේතවත් කර ඇති කැටයම් වලද ඇත් රූපය දක්නට ඇත.

අතීතයේ සිටම ඇතා යනු මංගල ලකුණක් ලෙස සලකා ඇත. කඹුරුපිටියේ වනරතන හිමිට හා සෙනරත් පරණවිතානට අනුව ඇතාගෙන් සංකේතවත් වනුයේ මේඝය හෙවත් වැස්සයි. මීට අමතරව රජු සතු මංගල හස්තියා රාජ්‍ය සතු වැදගත් වස්තුවක් ලෙස සලකා තිබේ. යම් ලෙසකින් රාජ උරුමය පිළිබඳව

ගැටලු ඇතිවූ අවස්ථාවන්හි ඊට සුදුසු පුද්ගලයා තෝරාගනු ලබන්නේ මංගල හස්තියා විසිනි. හින්දු සාහිත්‍යයට අනුව ඉන්ද්‍ර දෙවියන්ට ඓරාවත නමින් හස්තියෙක් ද ඇත. මහමායා දේවිය සුදු ඇත්පැටවෙකු නෙළුම් මලක් ගෙන තම කුසට ඇතුල්වන ආකාරය සිහිනෙන් දුටු අතර, එහි අර්ථය වූයේ පින්වත් දරුවෙකු සිය කුසපිළිසිඳගත් බවය. මේ අනුව ඇත් සංකේතය යනු, සමාජය තුළ පැවති සුභ ලකුණක් ලෙස සලකා ඇත.

- වෘෂභ සංකේතය



ඡායාරූප අංක 13

විස්තරය - විවිධ වෙනස්කම් ඇති වෘෂභ සංකේත

මූලාශ්‍රය - (Guptha & Hardaker, 2014,P.278)

ඇතා මෙන්ම තවත් බහුලව යෙදී ඇති සංකේතයක් ලෙස වෘෂභ සංකේතය හඳුනාගත හැකිය. එහිදී හස්එබූ කාසිවල වැඩි වශයෙන් දැකගැනීමට හැක්කේ දකුණුපසට හැරී ඇති වෘෂභ රූපයයි. මීට අමතරව වම්පසට හැරී ඇති වෘෂභ රූපයන්, කඳු සලකුණ මත සිටින වෘෂභ රූප, නන්දිපාද ලකුණ ආදී වෙනත් සලකුණු සමඟ ඇති වෘෂභ රූපසටහන් ද මෙම සලකුණු අතර ඇත. ගව රූපය පසුකාලීන කාසි බොහෝමයක දැකගත හැකිය. එහිදී තනි ගවරූපය මෙන්ම ශිව දෙවියන් සමඟ සිටින ගව රූපයද මෙම කාසිවල සලකුණු කරඇත. එහිදී කුෂාණ රාජවංශයේ රජවරුන් වූ වීමා කැඩ්ප්‍රයිසිස්, වසුදේව, දෙවන කණිෂ්ක වැනි පාලකයන්ගේ කාසිවල ගවයා ඇත්තේ ශිව දෙවියන් සමඟ නිරූපණය කොට ය. මීට අමතරව චත්‍රපානි ශිවාජිගේ කාසි, මෝගල් කාසි ආදියේ ගවයා තනිව යොදා ඇත. ශ්‍රී ලංකාවේ සේතු කාසිවලද ගව රූපය තනිව යෙදී ඇත.

ගවයා ඇත අතීතයේ සිටම කෘෂිකාර්මික සමාජය තුළ ඉතා වටිනා සත්ත්වයෙක් ලෙස සලකනු ලැබිණි. අතීත ඉන්දුනිම්න ශිෂ්ටාචාරයේ මුද්‍රා අතර විශාල මොල්ලිය සහිත ගව රූපය නිරන්තරයෙන් හමුවන සලකුණකි. වෛදික සමාජය තුල ගවයා විනිමය හුවමාරු ඒකකයක් ලෙස ද භාවිතා වී ඇත. පුද්ගලයෙක් සතු ගව සම්පත මඟින් ඔහු සතු ධනය තීරණය විය. කෘෂිකර්මාන්තයට අවශ්‍යය සී සෑම වැනි කටයුත්තේ සිට කිරි, ගිතෙල් ආදී පස්ගෝරස ලබාගැනීමට ද, ගැල් ඇදීම වැනි ප්‍රවාහන කටයුතු ද, ගොම පොහොර ලබාගැනීමේ කටයුතු ද ගවයාගෙන් ඉටුකර ගැනීමට හැකිවිය. බෞද්ධ සාහිත්‍යයේ ජාතක කතා පොතේ නන්දිවිසාල ජාතකයේ ඇති පරිදි බෝසතාණන් වහන්සේ එක් ආත්මභාවයක නන්දිවිසාල නම් ගවයෙක් වී උපත ලබා ඇත. හින්දු දහමට අනුව ශිව දෙවියන්ගේ වාහනය වන්නේ ද නන්දි නම් ගවයෙකි.

එබැවින් ශිව භක්තිකයන් විසින් ගවයා පූජනීයත්වයෙන් සලකා ඇත. ඉන්දියාවේ අශෝක ස්ථම්භ වලද, ශ්‍රී ලංකාවේ සඳකඩපහණේ ද ගව රූපය දක්නට ලැබෙන්නේ මෙම අදහස් හේතුවෙන් විය හැකිය.



ඡායාරූප අංක 14

විස්තරය - කුෂාණ වංශික දෙවන කනිෂ්ක රජුගේ ශිව දෙවියන් හා නන්දි ගවයා සහිත රන් කාසිය

මූලාශ්‍රය - https://www.mygoldguide.in/history-india%E2%80%99s-gold-coins




ඡායාරූප අංක 15

විස්තරය - කෞෂම්බියේ වරුණ මිත්‍ර රජුට අයත් කාසියක්

මූලාශ්‍රය - https://virasatauctions.com/auction/lot/31-ancient-kaushambi-monarchical-coin-king-varun-mitra-copper-unit-576

- නන්දිපාද හෙවත් ත්‍රිරත්න ලාංඡනය



ඡායාරූප අංක 16

විස්තරය - විවිධ ස්වරූපයෙන් ඇති නන්දිපාද ලකුණු

මූලාශ්‍රය - (Guptha & Hardaker, 2014,P.280)


නන්දිපාදය, ත්‍රිරත්න, ටොරීන් ආදී විවිධ නම්වලින් මෙම සලකුණ හඳුන්වනු ලබයි. මෙය පූර්ව බ්‍රාහ්මීය හෝඩියේ "ම" අක්ෂරයේ ස්වරූපයට සමාන වේ. ජෝන් මාර්ෂල්ගේ මතය වන්නේ මෙමඟින් වෘෂභ හිසක් දැක්වෙන බව ය. බී. චටොපාද්‍යයට අනුව මෙය සශ්‍රීකත්වය දැක්වෙන්නා වූ සංකේතයකි.

ඇතමුන් මෙම ලකුණ ගවයෙකුගේ කුර සටහනකට සමාන බැවින් නන්දිපාදය යන නමින් හඳුන්වයි. තවත් අයෙක් මෙමඟින් සූර්යයා හා චන්ද්‍රයා නිරූපණය වේ යැයි අදහස් කරනු ලබයි. එස්. එස්. සිං ප්‍රකාශ කරනුයේ, පසුකාලීනව ත්‍රිශූලය නිර්මාණය වූයේ මෙම සලකුණ තවදුරටත් පරිණාමය වීමෙන් බවයි. බෞද්ධ උගතුන්ගේ අදහස වනුයේ මෙමඟින් බුද්ධ, ධම්ම, සංඝ යන ත්‍රිරත්නය සංකේතවත් වන බවයි. ඉන්දියානු බෞද්ධ කලාශිල්පයන් වූ සාංචි තොරණේ ද, අමරාවතියේ ඇති ශ්‍රී පතුල් වලද මෙම සංකේතය දක්වා ඇත.

හස්එබූ කාසිවල මෙම සංකේතය තනි තනිව යෙදී ඇති අවස්ථාවන්හි විශාලව සටහන් කර ඇත. මීට අමතරව මෙම සංකේතය තවත් කුමක් හෝ ප්‍රධාන ලකුණක් මැදිකරගෙන ඒ දෙපසින් ඇති අවස්ථා ද ඇත. එවිට එය යම් මධ්‍යස්ත ප්‍රමාණයෙන් සටහන් කරඇත. බොහෝ අවස්ථාවන් වල එක් ප්‍රධාන සංකේතයකට පරිවාර සංකේත ලෙස කුඩා ප්‍රමාණයේ නන්දිපාද ලාංඡන කිහිපයක් සමඟ දක්වා ඇති ලාංඡන දැකගැනීමට හැකිය. මෙම සලකුණ ද පසුකාලීන ඉන්දීය කාසි කිහිපයකම දක්නට ඇත. ඒ අතර ඉන්දු සීතියන් පාලකයෙකු වන දෙවන අසෙස් ගේ කාසි, ඉන්දු ග්‍රීක රජෙක් වූ ඇපොලොඩෝටස් ගේ කාසි දක්නට ඇත. ලංකාවේ ඇතා හා ස්වස්තික කාසියේද, ශ්‍රී ලක්ෂ්මී කාසියේද මෙම සංකේතය දක්නට ඇත.

- චක්‍ර සංකේතය

චක්‍ර සංකේත විවිධාකාර ලෙස මෙම සංකේත අතර දක්නට ඇත. බොහෝවිට වෙනත් සලකුණු වලින් වියුක්තව ස්වාධීන ලෙස මෙම සලකුණ දක්නට ඇත. නමුත් එක් සංකේතයක චක්‍රයක් අතින් දරාගෙන සිටින මානව රූපයක් දක්නට ඇත. මේ සම්බන්ධව විවිධ අදහස් හා මතවාද විද්වතුන් විසින් දක්වා ඇත. ඇතැම් විද්වතුන්ට අනුව මෙමඟින් බෞද්ධයන්ගේ ධර්මචක්‍රය නිරූපණය වේ. බුදුරජාණන් වහන්සේ ගේ පළමු ධර්මදේශනය වූ දම්සක්පැවතුම් සූත්‍රය දේශනාකිරීම මෙමඟින් නිරූපණය වන බව මේ සම්බන්ධ බෞද්ධ මතය වේ. ඇතැම් විද්වතුන්ට අනුව මෙමඟින් විෂ්ණු දෙවියන් සතු ආයුධයක් වන සුදර්ශන චක්‍රය නිරූපණය වෙතැයි ද ඒ අනුව මෙය විෂ්ණු නිරූපණය කරන සංකේතයක් වන බවටද මතයක් ඇත.



ඡායාරූප අංක 17

විස්තරය - විවිධ ආකාරයේ වෙනස්කම් සහිත චක්‍ර සංකේත

මූලාශ්‍රය - (Guptha & Hardaker, 2014,P.280)

චක්‍ර සංකේතය ඉන්දියාවේ අශෝක යුගයේ වාස්තුවිද්‍යා නිර්මාණයන් හි විශේෂයෙන් දැකගත හැකිය. විශේෂයෙන්ම අශෝක කුළුණු වල ඇති කැටයම් අතර මෙය බහුලව දැකගත හැකිය. ඉන්දීය

බෞද්ධ කලා නිර්මාණ තුළ බුදුන්වහන්සේ ගේ රුව සංකේතවත් කිරීම සඳහා ද මෙය යොදාගෙන ඇත. පසුකාලීනව නිකුත්කළ සාතවාහන, කොෂම්බි, උජ්ජේනි, බටහිර ක්ෂත්‍රප කාසිවල ද මෙම චක්‍ර සංකේතය දක්නට ඇත.

- මත්ස්‍ය සංකේත

ඉහත දැක්වූ වෘෂභ හා ඇත් සංකේත හැරුණුවිට සංකේත අතර වැඩිපුරම දක්නට ලැබෙන සත්ව සංකේතය වන්නේ මත්ස්‍ය සංකේතයයි. බොහෝවිට චතුරස්‍රයක මත්ස්‍ය රූප යුගලයක් හෝ ඍජුකෝණාස්‍රයක එකිනෙක මුහුණලා ඇති මත්ස්‍ය රූප යුගලයක් දැකගැනීමට හැකිය. මීට පරිබාහිරව විවිධ සංකේත සමඟ ඇති අනුකොටසක් වශයෙන් මත්ස්‍ය සංකේතය යෙදුණු අවස්ථා රාශියකි. පසුකාලීනව නිකුත්වූ පාණ්ඩ්‍ය කාසි වලද මත්ස්‍ය රූපය දක්නට ඇත.



ඡායාරූප අංක 18

විස්තරය - විවිධ ආකාරයේ වෙනස්කම් සහිත මත්ස්‍ය සංකේත

මූලාශ්‍රය - (Guptha & Hardaker, 2014,P.279)



ඡායාරූප අංක 19

විස්තරය - පාන්ඩ්‍ය අධිරාජ්‍යයේ ජටාවර්මන් සුන්දර පාන්ඩ්‍යගේ කාසියක්

මූලාශ්‍රය - https://www.classicalnumismaticgallery.com/currentviewlot.aspx?itemid=24466&auctionid=44&lotno=107

මත්ස්‍ය රුව අතීත ඉන්දුනිම්න ශිෂ්ටාචාරයේ මුද්‍රාවලද බහුලව දක්නට ඇති සංකේතයකි. ශ්‍රී ලංකාවේ ක්‍රි. පූ. යුගයේ සෙල්ලිපිවල ද මෙය දැකගත හැකිය. මෙය අෂ්ටමංගල ලකුණු වලද දැකගැනීමට හැකිය. විෂ්ණු පුරාණයේ ඇති පරිදි මත්ස්‍ය අවතාරය විෂ්ණුගේ දස අවතාර අතරින් එකකි. ශිව පුරාණයට අනුව මත්ස්‍යාගේ ස්වාමියා වූයේ ශිව ය. එසේම අතීත ජනයාගේ ප්‍රධාන ජීවනෝපායක් වූ ධීවර කර්මාන්තය මෙමඟින් නියෝජනය වන්නේ යැයි මතයක් ද ඇත.

- **වෙනත් සත්ත්ව සංකේත.**

ඉහත දැක්වූ සත්ත්ව සංකේත වලට අමතරව තවත් විවිධ වූ සත්ව සංකේත දක්නට ඇත. ඒ අතර වඩාත් හමුවන සංකේතයක් ලෙස හාවාගේ හෝ බල්ලාගේ යැයි පෙනෙන සංකේතය දැක්විය හැකිය. මෙය ස්වරූප කිහිපයකින්ම ඇත. ඒ අතරින් කඳු සංකේතය මත නැඟසිටින රූපය හා සත්ත්වයා වටා නන්දිපාද ලකුණු ඇති රූපය වඩාත් සුලභව දැකගැනීමට හැකිය. මෙම සංකේතය හාවානම් එමඟින් චන්ද්‍රයා නිරූපණය වනවා විය හැකිය. නැත්නම් මිනිසාට වඩාත් සමීප සත්ත්වයා මෙන්ම මිනිසාගේ ආරක්ෂකයා වූද සත්ත්වයා වූ බැවින් බල්ලාගේ රුව මෙම සංකේතයෙන් නිරූපණය වනවා විය හැක. නමුත් මේ පිළිබඳ නිශ්චිත අදහසක් විද්වතුන් අතර නැත.

මීට අමතරව කඳු සංකේතය මත සිටින මොණර රූපයද මෙම සත්ත්ව සංකේත අතර හමුවන තවත් රූපයකි. ඇතැම් හින්දු උගතුන්ගේ මතය වනුයේ මෙමඟින් ශිවගේ හා පාර්වතියගේ පුත්‍රයා වූ ස්කන්ධ කුමාර නිරූපණය වන බවයි. ස්කන්ධ කුමාරයාගේ වාහනය වනුයේ මොණර පක්ෂියා ය. නමුත් බොහෝ නාණක විද්‍යාඥයන්ගේ අදහස වනුයේ මෙමඟින් මෞර්යය රාජවංශය නියෝජනය කරන බවයි.



ඡායාරූප අංක 20

විස්තරය - විවිධ ආකාරයේ වෙනස්කම් සහිත හාවාගේ හෝ බල්ලාගේ යැයි සැළකෙන සංකේත

මූලාශ්‍රය - (Guptha & Hardaker, 2014,P.278)

මීට අමතරව නාගයා, බස්සා, රයිනෝ, කිඹුලා, ගෙම්බා, ඉබ්බා, ගෝනුස්සා, පත්තෑයා, මකුළුවා වැනි සත්ත්ව රූප මෙම සංකේත අතර ඇත.

- මානව රූප



ඡායාරූප අංක 21

විස්තරය - විවිධ ආකාරයේ වෙනස්කම් සහිත මානව රූප

මූලාශ්‍රය - (Guptha & Hardaker, 2014,P.278)

එතරම් සුලභ නොවූවද මෙම සංකේත අතර මානව රූපද දක්නට ඇත. මේ අතර ස්ත්‍රී හා පුරුෂ රූප වෙන්ව හඳුනාගත හැකිය. නමුත් ස්ත්‍රීරූප යැයි මෙම මානව රූප හඳුනාගන්නේ එම රූපවල කොණ්ඩය පිටුපසට ගුලියක් සිටින සේ ගැටගැසීමේ ලක්ෂණය නිසා ය. නමුත් අතීතයේ ස්ත්‍රී පුරුෂ භේදයක් නොමැතිව කොණ්ඩය දිගට වැවීම සිරිතක්ව පැවති දෙයකි. එබැවින් එය නිශ්චිත නැත. නමුත් මෙම මානවරූප බොහෝමයක් විවිධ ආයුධ අතැතිව සිටින බැවින් ඔවුන් යුධ සෙබළුන් හෝ ආරක්ෂකයින් යැයි සිතිය හැක.

- හඳුනාගත නොහැකි සංකේත

මීට අමතරව විවිධාකාර වූ රේඛා, හැඩතල, වෘත්ත, ත්‍රිකෝණ, නොයෙක් ජ්‍යාමිතික හැඩයන්, තිත් ලකුණු ආදියෙන් යුක්ත විවිධාකාර සංයුක්ත රූපසටහන් ඇති සංකේත විශාල ප්‍රමාණයක් ඇති නමුත් ඒවා හඳුනාගැනීමට නාණක විද්‍යාඥයන් අපොහොසත් වී ඇත.

ඉහත කරුණු සලකා බැලීමෙන් පෙනෙන්නේ මෙම කාසිවල ඇති සංකේත තුළින් අතීත ජනයාගේ සිතුම් පැතුම්, විශ්වාස ආදී වූ සංජානනමය කරුණු පිළිඹිබු වන බව යි.



ඡායාරූප අංක 22

විස්තරය - නිශ්චිතව හඳුනා නොගත් සංකේත

මූලාශ්‍රය - (Guptha & Hardaker, 2014,P.276)

නිගමනය

ඉහත කරුණු අධ්‍යයනය කිරීමෙන් පැහැදිලි වන්නේ හස්එබූ කාසිවල දක්නට ඇත්තේ හුදු විසිතුරු භාවය හෝ කාසියේ මූල්‍ය වටිනාකම නිරූපණය සංකේත පමණක් නොව පුරාණ ජන විඤ්ඤාණයේ වූ දේශපාලන, ආර්ථික, සමාජීය, ආගමික මතවාදයන්හි නිරූපණයක් බව යි. එසේ ම මෙම සංකේත දේශපාලනික හා ආගමික අර්ථයන් සන්නිවේදනය කිරීමේ ප්‍රචාරාත්මක උපායක් ලෙස ද භාවිත වී ඇති බව පැහැදිලි ය. කෙසේ වුවද හස්එබූ කහාපණ කාසිවල දක්නට ලැබෙන සමස්ත සංකේත ප්‍රමාණය හයසියයට අධික ය. ඒ සම්බන්ධව ප්‍රමාණාත්මක ගැඹුරු අධ්‍යනයක් සිදු වී නොමැති අතර එවැනි අධ්‍යයනයක් මගින් මෙම සංකේත පිළිබඳ තවදුරටත් කරුණු අනාවරණය කර ගත හැක.

ආශ්‍රිත ග්‍රන්ත නාමාවලිය

අතුකෝරළ, අජිත්. (2022), අභිලේඛන හා නාණකවිද්‍යා අංශයේ තැන්පත්කර ඇති හස්එබූ කහාපණ කාසි එකතුව පිළිබඳ ව පර්යේෂණ වාර්තාව, පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව. https://www.archaeology.gov.lk/index.php/coin-book

කුලතුංග ටී. ජී. (2015), ශ්‍රී ලංකාවේ කාසි හා මුදල් ව්‍යවහාරය, මධ්‍යම සංස්කෘතික අරමුදල.

ප්‍රේමතිලක, පී., එල්. (1970), පුරාණ ඉන්දියාවේ කාසි, සීමාසහිත ඇම්. ඩී. ගුණසේන හා සමාගම, කොළඹ

සිරිසෝම, ඇම්., එච්., හා අමරසිංහ, ගීතා. (1986), **ශ්‍රී ලංකාවේ පුරාණ කාසි - 1 හස් එබූ කහාපණ**, පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව, කොළඹ 7.

Allan, John. (1936), **Catalogue of the Coins of Ancient India**, A Catalogue of the Indian Coins in The British Museum, London,

Battacharya, P.,N. (1940), **A Hoard of Silver Punch- Marked Coins from Purnea**, Government of Indian Press, Calcutta.

Bopearachchi, Osmund,. & Wickremesinhe, Rajah M. (1999), **Ruhuna An Ancient Civilisation re-visited: Numismatic and Archaeological Evidence on Inland and Meritime Trade**, Nugegoda.

Codrington, H.,W. (1993), **Ceylon Coins and Currency**, Department of National Museum.

Gupta, Parmeshwari Lal and Hardaker, Terry R. (1985), **Indian silver punch-marked coins: Magadha - Mauryan Karshapana Series**, Indian Institute of Research in Numismatic Studies 1.

Guptha, P.,L. and Hardaker, T.,R. (2014), **Punchmarked Coinage of the Indian Subcontinent: Magadha – Mauryan Series**, IIRNS Publications Pvt. Ltd.

Walburg, Reinhold. (2011) **Indian silver punch-marked coins in ancient Ceylon – a case study**: The Tissamahārāma hoards

https://www.academia.edu/27908959/Indian_silver_punch_marked_coins_in_ancient_Ceylon_a_case_study_The_Tissamah%C4%81r%C4%81ma_hoards

Weisshaar H., J.(ed.). Dissanayake S.(ed) & Wijeyapala W(ed). (2008), **COINS AND TOKENS FROM ANCIENT CEYLON**, The Commission for the Archaeology of Non-European Cultures, Germany

https://www.ashmolean.org/

https://hassalesk.life/product_details/1028334.html

https://upload.wikimedia.org/wikipedia/commons/7/71/Satavahanas._Sri_Vasisthiputra_Pulumavi.jpg

https://www.cbsl.gov.lk/sites/default/files/cbslweb_images/notes_coins/Eliphant%20%26%20Swasthika%20coins_1.png

https://coinindia.com/ujjain379.jpg

https://web.archive.org/web/20161220220036/https://www.cngcoins.com/Coin.aspx?CoinID=259870

https://commons.wikimedia.org/wiki/File:Apollodotus_bull_with_nandipada.jpg

https://coinindia.com/MIG0274-344.01.jpg

https://www.mygoldguide.in/history-india%E2%80%99s-gold-coins

https://virasatauctions.com/auction/lot/31-ancient-kaushambi-monarchical-coin-king-varun-mitra-copper-unit-576

https://www.classicalnumismaticgallery.com/currentviewlot.aspx?itemid=24466&auctionid=44&lotno=107